SLU NOVELS

UPLOADED BY ELIFE

# ගඟ අද්දර

## පළමුවන කොටස

රළ පෙළින් යුත් අති නීල මහ සයුර පරයන උස් පහත් නානා තුරුලිය ගොමුවන් ගෙන් හොබනා වනෝද්‍යාන මධ්‍යයේ රාජ රාජ මහාමාත්‍යාදීන් වැනි දිය රැළි උස් කඳුගැට පංතීන් පිරිවර කොටගත් අපමණ සුරනර නා ආදීන් ගෙන් වැඳුම් පිදුම් ලබන සිරිපා සටහන් නැමති ඉඳුනිල් මිණි ඔටුණු පැලඳ, මහේශාක්‍ය ලීලාවෙන් වැජඹෙන නර ශ්‍රේෂ්ඨයෙකු වැනි වූ සමන්තකූට පර්වත රාජයාණන් සුපිරිසිදු දිය දහරින් නහවා වැඳ පුදා, දශ දිග සුවඳ දෙන නානා වර්ණ සුපුෂ්පිත සවර්ණාභරණයන් සිය ගත පැළඳ වන බමරුන් වයන සත්සර නදට එකඟව ගයන නීල කොබෝ කෝකිලාදීන්ගේ ගීත නාදයෙන් දෙසවන් හා ඊටම අනුව රඟ දෙන දිවි වලස් ගෝන මුවාදීන්ගේ කෙළි මඬුලු වලින් දෙනුවන් ද, පිනවමින් අගනා නව රත්නයන් අතුරන ලද මාර්ගයෙහි ගමනාරම්භ කරමින් තමාට සෙත් පැතුම්වස් වෙතට පැමිණෙන ඇළ දොළ හෝ නැමති පරිවාර ස්ත්‍රීන් සමාදරයෙන් පිළිගෙන සිප වැලඳ ගනිමින් දෙපස සිටි අපා, දෙපා, සිව්පා, බහුපා යන සියලු සතුනට සාන්තියක් ද සලසා සිය පෙම්වතා සොයා යමි යන අභිලාශයෙන් සිය ගමනට බාධා කරන කුඩු මහත් ගල් කුළු පවා උදුරා දෙපසට තල්ලු කරමින් එඩිතරව ඉදිරියට ම ගමන් කරන මැ! අන් තැනැත්තියක් නොව ලඬිකාමාතාවගේ ගංගා ලලනාවන්ගෙන්

ELIFE @ sl-unlimited

ජගත් රූප සුන්දර බවට හා ගෞරවාදර භක්තියට අවිවාදයෙන් ලක්වූ කල්‍යාණි නමැති සිරිබර නදී-කාන්තාව ය.

කෙත් වත් සරු කෙරමින් දැඩි ආත්ම විශ්වාසයෙන් ඉදිරියට යන මේ සුරූපී ලලනී සමහර තැනකදී නාටිකාඞ්ගනාවක ගේ විලාශයෙන් කැරකෙමින් යන්නීය. තවත් සමහර තැනකදී මදසාන්ත ගතියකින් ගමන් කරන්නී ය.

තමා හා සමාන දුටුවන්ගේ මනනුවන් ඇදගන්නා රූ රැජිනියන්ගෙන් හා රූ රාජයන්ගෙන් ගහන හංවැල්ල ඈ ගම්මානයන් පසු කරන විට සැමියා සොයා යන නව යෞවන මදයෙන් උදම් වූ හර බර දඟකාර සුන්දර තරුණියකගේ විලස් පාන්නීය.

සෑම තැනම එකසේ හැසිරීම උගත් ශීලාචාර ජනයාගේ අපහාසයට ලක්වෙන අශෝභන ක්‍රියාවක්ය යන මහඟු ආදර්ශය ලොවට විදහා පාන්නට දෝ මෝතොම, ඉහත දක් වූ ගමන් විලාශය අමතක කර දමා අප සම්මා සම්බුදු මැණියන් වහන්සේගේ සිරි පා පියුම් පහස තෙවරක් ම ලැබූ ආනුභාසම්පන්න පූජනීය සථානයක් වන කැළණි රජමහා විහාරසථානය ළංවත්ම සාන්ත උවැසියක ගේ විලස් පාන්නීය.

තවද සිය හිතවත් මනාලයා වසන තැනට ඇත්තේ සවල්ප දුරක් නිසා මහත් අභිමානයෙන් ඉදිරියට පා තබන මෙම යුවතියට මඟ දෙපස මනාව වැඩී ඇති බක්මී කුඹුක් ඈ වනස්පති වෘක්ෂයෝ ද උණ බට කෙසෙල් ඈ කුඩා පඳුරු සහිත වෘක්ෂයෝ ද සයුර දෙසින් එන මඳපවන් ලැබ දුර කතර ගෙවා එන මෙම ලලනියගේ ගිම් නිවනු වස් චාමර, විජිනිපත්ගෙන පවන් සලන්නෝ වැනි වූහ. ගඟ අසබඩ තිබෙන වෘක්ෂයන් කරා පියාඹන කොක් පඞ්ක්තීන් ද නාද කරමින් ඒ මේ අත පියාඹන කොරවක් ලිහිණි ඈ පක්ෂි සමූහය ද සේසත් නංවා ගෙන



ආසිරි ගී ගයමින්, සැමියා විසින් සිය සොඳුරිය කැඳවා ගෙන එනුවස් පෙර මඟට එවන ලද පෙරහැරක සිරි ගත්තෝ ය.

දුක සැප දෙකේදීම කවදත් නිසල බැව් පෙන්වන විශාල ගල්පර ගඟ දෙපස නැගී පෙනෙනු ඇත. කාලයාගේ ඇවෑමෙන් මෙම ගල්වලට කිසිදු හානියක් නොමැති වීම මවිතයට කරුණක් යයි නොසිතුවත් මෙයින් එක් මහඟු ආදර්ශයක් සිතාගැනීම වටනේ ය. එනම්, ගුණවත් මහත්මෝ තමහට පැමිණි ලාභා ලාභ, දුක සැප, කීර්ති ප්‍රශංසා, යනාදියෙහි දී කිසිදු වෙනසක් නොමැතිව මෙම ගල්පර මෙන් නොසැලෙන්නේ ය යන්නයි.

එදින හවස කැළණි ගම්මානයේ නදිය අසල අමුතුම අලංකාරයක් දක්වී, දිනරද තෙම සාගරයේ ගිලෙන්නට පෙර පැලදිග අහස් කුස රත් ලසකින් වසා ඒ මැදට වී සියරැස් පතුරුවා ගිනි ජාලාවක් මැදට දමූ රනින් රත් කළ යගුළියක විලස් පෑවේය. එයින් නැගි රක්ත වර්ණ අලෝකය, ගඟෙහි කුඩා දිය රැළි මත වැටී බැබලීම, දුටවන් නෙත් සතන් පුබුදුවන චමත්කාර සුන්දර යුවතියක් හැඳ පෙරව සිටි රන්වන් සාරියක රැළි, මඳ සුළඟ වැදී ලීලෝපේත වන්නාක් විය. මුහුද දෙසින් හමා එන සන්ධ්‍යා සිසිල් සුළං ගඟ බඩ වෘක්ෂලතාවන් වඩාත් වේගයෙන් සොලවා දම්මේ ය. ගඟදිය ද එන මාරුතයන්ට අභියෝග කරමින් දෝ වඩාත් තදින් පහළට ගලා ගියාය. මෙසේ කෙමෙන් කාලය ඉක්මෙත්ම අවට දර්ශනය නිසල ය. දීප්තිමත් ය. චමත්කාර ජනකය. සොබා දහම නැමති අති දක්ෂ කලාකරුගේ විශිෂ්ට චිත්‍රපටියක් බඳුය. ඇසට පෙනෙන තෙක් මානයේ හාත්පස සෑමදෙයක් ම මනෝහරය. ගං ඉවුරෙහි ඇති කිරල ගස්වල විලිකුන් කිරල ගෙඩිවල සුවඳින් මුසු මද පවන ගඟ අද්දර සිටින්නන්ගේ ගත සිත පිනවීය.

අහෝ සවභාව ධර්මයාගේ විපර්‍යාසයක හැටි! මෙතෙක් වේලා අවට පැතිර තිබූ නිශ්චලතාවය සිඳී බිඳී යන බව

UPLOADED BY ELIFE

පෙනුණේය. ඒ ඒ තැන්වල සිටි බට්ටිච්චි, සූටිච්චි, පොල්කිච්චි, දෙමලිච්චි, මලිති, කොබෝ ආදී නානා පක්ෂීහු තම තමන්ට සුපුරුදු හඬින් කෑ කෝ ගසමින්ද අත්තෙන් අත්තට ඒ මේ අත පනිමින්ද අවුල් සහිත මහා තරඟයක් කරන්නාක් මෙන් සිය කැදලි කරා පියාඹන්නට වූහ. හාත්පස සිදුවන මේ කිසිවකට කන් නොදෙන්නාක් මෙන් ගලක් මතට වී බක තපස් රකිමින් මෙතෙක් වේලා ජලය දෙස බලා සිටි පිලිහුඩුවා දියෙහි මතුවුන මසෙකු දුක ඊතලයක වේගයෙන් දියට පාත්වී දිගු හොටෙන් ඒ අසරණ කුඩමසා අල්ලා ගෙන අසල වූ ගසක අත්තකට පියාඹා ගියේය. දවස පුරා ගැල් ඇද විඩාවට පත් ගොනුන් දියට දමා සීතල දියේ ගිල්වා අහේනිය සෝද හරින්නට මෙන් ගැල්කරුවෝ ලහි ලහියේ ගඟ කරා ගැල් දක්කාගෙන ආහ. උදේ සිට හවස් වෙනතෙක් ගොඩ මඩ ආදී ගොවි පලවල් වල හා කර්මාන්ත ශාලාවල එදින වැඩ නිමා කොට දිය නා පිරිසිදු වී සිය නිවෙස් කරා යාමට ගඟ දෙසට එන ගොවි කම්කරු ජනයාගෙන් ද අඩුවෙක් නොවීය. ගඟ දිය මත වැතිර ඇති විශාල ගල් පරයක් මතට වී එක මාළුවෙකු වත් අල්වාගෙන සිය මන දෙළ සපුරාලීමේ අටියෙන් බිලීබාන ගැටවරයෝද හවස් භාගයේ ගෙයි දෙරේ වැඩ නිමාකොට කැළණි විහාරයට යන අදහසින් ගඟ අසල පිහිටි ඕළු නෙළුම් මානෙල් ඈ සුවඳ විහිදෙන ජලජ කුසුමයන් නෙලාගැනීම සඳහා පැමිණි සුරඟන පරදන නරඟනෝද බොහෝ වූහ. මල් නෙලන්නියන් හා බිලීබාන ගැටවරයන් අතර ඇතිවන නුරා බැලුම් හා භාග්‍යයන්ද සමහර මහළු ස්ත්‍රීන්ට හා පුරුෂයනට ඇස්වල කටු ගසන්නාක් මෙන් විය. සමහර ස්ත්‍රීහු ඇනුම් කෙටුම්ද කීවෝය. "නුඹලාගේ ඔය හොර බිලීයට ඔය තරුණියන් මෙන් අපි අසු නොවෙමු. තව තවත් නුඹලාගේ හොර මැර අපි දුටු වෙමු" කියා උඩ පැන නැවත යට ගිලෙන්නෝය.

ඉහත සඳහන් මනහර සන්ධ්‍යා දිනයෙහි කුඩා ළමෝ දෙදෙනෙක්ද ගඟ අසබඩට වී සෙල්ලම් කරමින් සිටියහ. එයින්



නිර්මලා නම් කුඩා දැරිය හත් අවුරුද්ද ඉක්ම වූවා පමණි. සිය ගෙදර මෙහෙකාරියන් සවස දිය නෑමට එන අවස්ථාවලදී ගඟ අද්දර විනෝදය සඳහා පැමිණීමට ඈ පුරුදුව සිටියාය. එකොළොස් වියෙහි සිටි රංජිත් නිර්මලාගේ පියාගේ සොහොයුරියගේ එකම පුතා විය. ළමා කාලයේදී දෙදෙනාම සෙල්ලම් කිරීම ආදියෙන් එක්වම කාලය යැව්වෝය. රංජිත් කුඩාවූවත් දක්ෂ ලෙස පීනීමට පුරුදුව සිටි බැවින් නිර්මලා ඔහු දියේ කරන හපන් කම් නැරඹීමට වඩාත්ම ලැදි කමෙක් දැක්වූවාය. ලොව සෑම දෙයක්ම සෙවාත්සාහයෙන් දැන ගැනීම වඩාත් මැනවැයි රංජිත් පිළිගත්තේ ඔහුට දක්ෂ ලෙස වතුරේ ක්‍රීඩා කිරීමට හැකි වීමෙන් පසුවය. මෙදින හවස ඔහු ගඟට පැමිණියේ කෙසෙල් කඳන් කීපයක් එක්කාසු කර බැඳ ගත් පහුරකුත් කරගහගෙනය. කල් ඇතුවාම නිර්මලාද දියේ පා කිරීම පිණිස කඩදාසි බෝට්ටු කීපයක් තනා ගෙනවිත් එක එක බෝට්ටුව වතුරට දමමින් ඒවා ශීඝ්‍රයෙන් පහළට ගසා යනවා දකිමින් ප්‍රීති වූවාය.

"අයියා," යනුවෙන් ඇගේ සුරතල් කටහඬ ඇසෙන්නට විය. "ඇයි මේ බෝට්ටු ඔක්කොම පහළට යන්නේ? ඒවාට ඉහළට යන්ට බැරිද?" යි ඈ ඇසූ ප්‍රශ්නයකි.

"නෑ නංගී! ඒවා කවදාවත් ඉහළට අරින්ට බෑ. ඒවා ගඟේ ජලය සමඟ පහළට යනවා පමණයි." වැඩිමලා උත්තර දුන්නේ ය.

නිර්මලාද මඳක් නිසලව ඇගේ බෝට්ටු පහළට යනවා බලා සිටියාය. නැවත ඇගේ සුරතල් කටහඬ ඇසෙන්නට විය. "අයියා, එක බෝට්ටුවක් වතුර යටට යනවා. එකක් වතුරට වැටෙන්ඩත් ඉස්සරවෙලා කැඩිලා යනවා, එකක් කෙළින් පහළට බහිනවා, ඒ ඇයි?"

"ඒවා එහෙම තමයි" කියමින් රංජිත් අතරමඟ රැඳුන බෝට්ටු කීපය ගෙනවුත් නිර්මලා අත තැබීය.

UPLOADED BY ELIFE

"අනේ මට තේරෙන්නෙ නෑ. මම ඔක්කොම බෝට්ටු හැදුවේ එක විදියටයි" කියා සුසුමක් හැර නැවත වරක් අත තුබූ බෝට්ටු සවල්පය වතුරෙහි පා කළාය. පෙර සේම බෝට්ටු කීපයක් අතර මඟදී කැඩී බිඳී ගියේය. බෝට්ටු සෙල්ලම නිමවූවිට නිර්මලා අසල ගලක් මත වාඩි වී රංජිත් ඔරු පදින සැටි බලමින් ප්‍රීති වූවාය. ඇගේ සුරතල් සිනහව ගඟ හරහා හමන සුළඟ සමඟ එක්වී ඇසෙන විට ගීතරාවයක් බඳු සුමිහිරි විය.

"නංගී කියන්නේ මම මේ ඔරුවෙන් ගඟ හරහා යනවාද? නැද්ද?" රංජිත් සිය හපන්කම පෙන්වීමට පෙර නිර්මලාගෙන් ප්‍රශ්න කෙළේය.

"ඔට්ටුයි යන්න බෑ"

"එහෙනම් බලන්නැ"යි කියා දක්ෂ ඔරු පදින්නෙකු මෙන් රංජිත් සිය කෙසෙල් කඳන් පහුර ගඟ හරහා පදවන්නට විය. නිර්මලා විශ්මයෙන් ඔහුගේ හපන්කම් බලා සිටියාය. ආපසු ජයග්‍රාහියෙකුසේ මෙගොඩට ආ රංජිත්ට නිර්මලාගේ සිඟිති මුවගින් පිටවූ තවත් ප්‍රශ්නයක් විය.

"අයියා බලන්ඩ, මේ ගල අයිනේ පෙණ එකතු වන සැටි. ඒවා හරි ලස්සනයි."

"නංගී ඕවා එකතු වෙලා ගොඩ ගැහිලා වතුරට සේදිලා යනවා." රංජිත් කීය.

"සැමදම එක තරමමයි. මේවා වැඩිවෙලා ගඟ පිරී යන්නෙ නැත්තෙ ඇයි?"

රංජිත් ඇ ළඟ තුබූ පෙණ පිඬු සමූහයක් අතට ගෙන ඒවා කැඩී බිඳී යන සැටි පෙන්වීය. "මේ පෙණ පිඬු වල සැටි තමයි, අද ඇතිවන පෙණ පිඬු හෙට නැතිව යනවා. හෙට අළුත් පෙණ පිඬු ඇති වෙනවා."



"මොකද අයියා! එහෙම වෙන්නේ?" නිර්මලා යළිත් ප්‍රශ්න කළාය.

"මේ ලෝකෙ හැටි තමයි. ඇතිවෙනවා. නැතිවෙනවා, මෙය නවත්වන්නට කිසිවකුටත් බැහැ."

කාරණය වටහා ගන්ට තැත් කරන්නාක් මෙන් නිර්මලා මදක් තුෂ්ණිම්භූතව සිට අවට සංදර්ශනය නරඹන්නට වූවාය. හදිස්සියෙන්ම ඇ ගලෙන් දියට වැටී ගියෙන් ඇඳ සිටි ඇඳුම් මඳක් තෙත් විය. ඇද වහා වතුරෙන් ගොඩට විත් ඇඳුම ඒ මේ අත මිරිකන්නට වූවාය. රංජිත් ඇ ළඟට පැමිණියේ ඇට සිදුවූ අකරතැබ්බයට සහනයක් ලබාදීමේ බලාපොරොත්තුවෙන්ය.

"මම මේ ගලෙන්, වැටෙන්ට තිබුණ නිසාද"යි? නිර්මලා නැවත ප්‍රශ්න කළාය.

"නංගී ගලෙන් වැටුනේ ගල උඩ අඩමානයෙන් සිටිය නිසාය" යි කියමින් රංජිත් සිනාසෙන්නට විය. නිර්මලාට මඳක් කේන්තිය ඇති වුවද ඒ බැව් සඟවා රංජිත් සමඟම සිනාසෙන්නට වූවාය. කෙසේවත් රංජිත් සමඟ අමනාපයක් ඇති කර ගතහොත් එයින් පාඩු වන්නේ ඇටමම ය. රංජිත් නොමැති නම්, සවස සෙල්ලම් කරන්නේ කා සමඟද? දිය කෙළි බලා ප්‍රීති වන්නේ කාගෙන්ද? මේ බැව් මනාව අවබෝධ කොටගත් නිර්මලා සිය යහළුවාට දක්වූයේ මහත් ආදර ගෞරවයකි.

"මම වැටුනාම, අයියා කියනවා අඩමානේ ඉඳලා වැටුනා කියලා; බෝට්ටු පෙරළෙන කොට අයියා කියනවා ඒ ලෝකෙ හැටි කියල, අයියා කියන එකක් වත් මට තේරෙන්නේ නෑ" කියමින් නිර්මලා ගොඩ දමා තිබුණ කෙසෙල් කඳන් ඔරුවට නැඟ ගත්තාය.

UPLOADED BY ELIFE

මඳක් ඈතින් සිටි මේරි නෝනා මහ හයියෙන් කෑ ගසන හඬක් ඇසුනි.

"මම දැක්කා, හාමුට වෙච්චදේ. මට නොපෙනුනා කියලා හිතාගන්ඩ එපා. ගලෙන් වැටිලා ගවුමත් තෙමාගත්තා නේද? හිටින්ඩ, මම ගිහිල්ලා හාමිනේට කියන්නම්, මීට පස්සෙ අපි නාන්ඩ එනකොට, හාමු එවන්ඩ එපා කියලා" මේ වචන ඇසූ නිර්මලා, බියෙන් මෙන් ගඟ දියෙන් ඈත් වූවාය. රංජිත් කෙසෙල් කඳන් ඔරුව රැගෙන නැවතත් දියට බට.

"අයියා! වැඩිය දුර යන්න එපා. ඔරුව කැඩුනොත්"

"එතකොට මට පීනන්ට පුළුවනි"යි රංජිත් හඬදුනි. රංජිත් දක්ෂ ලෙස එහා මෙහා ඔරුව පදවනවා දුටු, නිර්මලාගේ සිත දැල්වෙන ප්‍රදීපයක් මෙන් ආලෝකමත් විය. ඈ නොයෙක් සුරතල් වදන් කියමින් රංජිත් පොළඹවන්නට වූවාය. "අනේ මමත් ආසයි, අයියත් එක්ක ඔරු පදින්න" වරක් ගොඩට ආ රංජිත්ට ඈ කන්නලව් කළාය.

"මේ ඔරුව හයිය නෑ, නංගිවත් රැගෙන යන්න, අර පෙනෙන්නේ නැද්ද ගෙදර වැඩ කරන උදවිය බලා ඉන්න හැටි! මම ලොකුවෙලා හදන්නම් කෝ ඔරුවක්! එතකොට නංගිවත් අරන් එගොඩටම ගිය හැකියි."

"අර දුර පේන ඔරුව වාගේ එකක්" නිර්මලා ඈතට අත දිගු කළාය.

"ඔව් ඊටත් වැඩිය හොඳ එකක්."

මහඟු දෙයක් අතපත් එකකුසේ, නිර්මලා සෑහීමට පත්වූවාය.

ගඟ අසලට කළුවර වැටෙත්ම ඈත පෙනෙන පාලම යුද කඳවුරක සිරි ඉසිලීය. මහ හඬින් කෑගසන වෙළෙන්දන්ගේ



හඬ සමඟ මුසුවූ කාර්, බස් ලොරි කරත්තවල ශබ්දය අවට පැතිර ගියේ මෙතෙක් වෙලා ගඟ දෙපස තුබූ නිසල බව සුනු විසුනු කරමිනි.

නිර්මලාද සිය වැඩකරුවන් තවත් ගඟේ නාන බව දැක, රංජිත් සමඟ කථා කරන්නට වූවාය. සිය සොහොයුරියට තමාගේ හපන්කම් පෙන්වීම තරම්, මිහිරක් රංජිත්ට තවත් නොමැත.

"ඔන්න මම වතුරයට ගිහිල්ලා උඩ එනවා"යි කියා රංජිත් ගඟේ මඳක් ඈතට ගොස් දිය යට ගිලුනේය. මොහොතක් විශ්මයෙන් බලා සිටි නිර්මලා රංජිත් නුදුටුයේ මහා හයියෙන් කෑගසන්නට වූවාය. රංජිත්ද දිය යටින් සෑහෙන දුර ප්‍රමාණයක් ගොස් ආපසු මතු වී නිර්මලා කළ මෝඩකම දැක ඈට මහා හයියෙන් සිනාසෙන්ට වූයේය.

"හරි හපනා නේද? ඔය වතුරේ ගිලෙන්ඩ ගිය අයියා බේරාගත්ත හැටි තමයි, ගොඩට වෙලා මහ හයියෙන් කෑගහන්නේ, වතුර බයකරන්ට ද?"

නිර්මලා ලජ්ජාවෙන් මිරිකෙන්නට වූවාය. "ඉතින් මම දන්නෙ නෑනෙ පීනන්ඩ."

"පීනන්ඩ දැනගන්නේ මොකටද? මහ හයියෙන් කෑගහන්න දන්න කොට" මෙසේ රංජිත් නැවතත් ඈට සමච්චල් කළේය. "බලන්ඩ ළඟ සිටිය මාළුත් ඔයාගේ කෑගැහිල්ල අහලා පැනලා අහකට ගියා." නිර්මලා ගේ නෙත් ගංවතුර දෙසට යොමුවිය.

"අර බලන්න, කෑගැහිල්ලට බයේ ඉරත් බැහැලා ගියා."

බැසගිය හිරු අහසෙහි එලා තුබූ වණීවත් ඇතිරිල්ල දෙස බලමින්ම නිර්මලා ගලෙන් බිමට පැන්නාය. ලූසිහාමිත් මේරි නෝනාත් දිය නා ගොඩට වී කොණ්ඩා මිරිකමින් ඇඟ තෙත්

UPLOADED BY ELIFE

සිඳගන්නට වූහ. "අන්න ලූසිඅම්මයි, මේරි අක්කයි, නාලා ඉවරයි. ඉතින් මම ගෙදර යනවා" නිර්මලා මෙසේ පවසත් ම රංජිත් ඈ ළඟට අවුත් සෙමින් කථා කෙළේය.

"නිමාලිට ලජ්ජා හිතුනා නේද? ඒක තමයි ඔය ගෙදර දුවන්ඩ හදන්නේ. වෙනදට ලූසිහාමියි මේරි අක්කයි කට කැඩෙනකම් අඬ ගැසුවත් ගොඩට ගන්ඩ බෑ."

ඊට පිළිතුරු වශයෙන් නිර්මලී තෙත වැලි ස්වල්පයක් ගෙන රංජිත් දෙසට විසිකළාය.

"ඔන්න මම යනවා මේවර ගඟේ යට ගිහිල්ලා එන්නෙම නෑ." මෙසේ කියමින් රංජිත් ගඟ දෙසට අඩියක් තැබුවේ ය.

"ආං එහෙනම් අයියා කියන්ඩ මම ගඟට වැටුනොත් මොකද කරන්නේ කියල?"

"ගඟේ වතුර මුහුදට යනකල්ම කෑගහනවා" කියමින් රංජිත් සිනාසුණි. තව වැලි රොත්තක් රැගෙන ඈ රංජිත් දෙසට වීසිකරන්ට තැත් කලද ලජ්ජා මුසු යම් කිසි පැකිලීමක් ඈ තුළ ඇති වී වහා වැලිපිඩ බිමට දැම්මාය. රංජිත් ඈ ඉදිරියට පා තැබීය.

"මම මේ ගඟ දෙපැත්තේ ඉඳගන නංගිට ගඟේ වැටෙන්ට ඉඩ දෙනවා ද?

"අයියා මොකද කරන්නේ?"

"නංගිව වතුරට වැටුනොත් මම කොහොම හරි වතුරට පැනලා බේරාගන්නවා."

"හොඳයි මාව බේරා ගන්ඩ බැරි උනොත්?" ඇගේ චතුර නෙත් යුවළ මහත් සේ ඇරිනි.



"නංගිව බේරාගන්ට බැරිවෙන්නේ නෑ මට." රංජිත් සිය සොහොයුරිය දෙස මඳක් විමසිල්ලෙන් බලාසිට මෙසේ කීය; "බේරාගන්ට බැරිවුනොත් ...... මමත් නංගී පස්සේම එනවා."

එකෙණෙහි නිර්මලාගේ මුහුණෙහි ඇති වූයේ මහත් ප්‍රහේලිකාවකි. ඈ මඳක් සිනාසෙන්ට මෙන් තැත්කලාය.

"එන්ඩ, එන්ඩ, හාමු! රාළහාමි බනින්නේ අපටයි" මෙසේ කියමින් මේරි අක්කා ඈ අත ළඟින් අල්වා ගේ දෙසට පා නඟන්නට වූවාය.

"පුංචි මහත්තයත් එන්ඩ, දැන් රෑ වුණා වැඩියි." ලූසිහාමි ගේ මුවින් පිටවිය. රංජිත්ද කෙසෙල් කඳන් ඔරුව ගොඩට ඇද කැබලි වලට කඩා දමා ගංඉවුරෙන් ඈතට වීසි කොට වැඩකාරියන් පිටුපස ගමන් ගත්තේය.

* * *

දශ නව වන ශත වර්ෂයේ මුල්භාගයේ ඉංග්‍රීසින් ලක්දිව අත්පත් කොට ගැනීමට නොකළ ප්‍රයත්නයක් නැත. පළමුකොට කොළඹට ගොඩබැස මුහුදුබඩ පළාත් අල්වාගත් මොවුහු දෙවනුව කැළණි ගඟ ඔස්සේ ගමනාරම්භනය කළෝය. මෙම දුර්දාන්ත සමයෙහි සිංහලයාට විරුද්ධව ඔත්තු සැපයූ කීප දෙනෙක් සිංහලයන් අතර වූහ. කැළණි ගඟබඩ පිහිටි කඩුවෙල නම් ග්‍රාමයෙහි නිවැසි බඩා නැමති එක් ජාති ද්‍රෝහියෙක් හංවැල්ලේ බලකොටුව සම්බන්ධව ඉංග්‍රීසීන්ට ඔත්තු සැපයුවෙන් ඔහුට මහත් වරප්‍රසාද අත්විය. ලක් ජනතාව ඉංග්‍රීසින්ට හිසනැමූ වර්‍ෂ 1815 දී කඩුවෙල බඩාට ආරච්චි නාමයක්ද ඔවුහු ප්‍රදානය කළෝය. ඒ අතරම ගම් කීපයක අය බදු රැස්කිරීමද ඔහුට භාරවිය. මෙසේ ඔහුගේ තත්ත්වය කෙසේ උසස් වුවත් රට ජාතියට ද්‍රෝහි කම් කළ තැනැත්තෙක්ය යන්න අවට ගම් පුරා රැව් පිළිරැව් දෙන්නට වන. රට ජාතිය විකුණා සිය උදරය පුරවා

UPLOADED BY ELIFE

ගන අඹුදරුවන් සමඟ සුර සැප විඳින ජාතිභ්‍රෂ්ටයෝ අදත් නොසිටිතියි නොසිතිය හැකිය. කඩුවෙල බඩාට දූවරුන් සතර දෙනෙක්ද පුතුන් සතර දෙනෙක්ද වූහ. එක් පුතෙකු හැර අනිකුත් සියල්ලෝම වරින්වර ජලරකුසාට බිලිවූහ. "සිංහලයා පාවාදුන්න සාපය තමයි ඔය මිනිහාට පඩිසන් දෙන්නේය" යි එකල ගැමියන් අතර පැවති කථාවකි. බාලපුතාද ටික කලක් කඩුවෙල ආරච්චි වසම කළේය. ඔහුට සිටියේ දූවක් පමණි. ඔහුගේ ඇවෑමෙන් බෑනා කඩුවෙල ආරච්චි තනතුරට පත්විය.

කඩුවෙල ආරච්චිගේ ජුවානිස් අතපත්තු ඉහත සඳහන් කඩුවෙල බඩාගෙන් පැවත එන්නෙකි. සිය පවුල තරම් වංශවත් අනාදිමත් පවුලක් කැළණි ගඟ දෙපස නැත යන පුහු මාන්නාධික හැඟීම ඔහු කෙරෙහි නිතර බල පෑවේය. ඔහු තරමක ඉඩම් හිමියෙක් ද විය. සිය මුතුන් මිත්තන් ආරච්චිකම් කළ අවදියේ රැස් කරන ලද වස්තු සම්භාරයත් මොහු සතුය. පවුල වැඩි නොවූයෙන් වස්තුව ද බෙදී යන මඟෙක් නැත. තමා ශ්‍රේෂ්ඨ සිංහලයෙකු යයි  වරෙක ඔහු කියයි. සිංහලයාට කළ සේවයට ඉංග්‍රීසින් විසින් ගමක් ප්‍රදානය කරනු ලැබුවේ යයි තව වරෙක උදම් අනයි. නමුත් සිංහලයාට සේවය කළ සිංහලයන් හට ඒ කාලයේ අත් වූයේ දඟ ගෙයත් මරණයත් බව එකල තතු දන්නෝ දනිති.

ඇත්ත වශයෙන් කඩුවෙල ආරච්චිගේ ජුවානිස් අතපත්තු මහතාට අසල්වාසීහු කිසි විටෙකත් ගරු නො කළහ. එහෙත් ඔහු යටතේ වැඩ කිරීමට සිදු වන නිසා දුප්පත් ගම්වාසීන්ට යම් යම් අවසථාවන්හිදී මහත් සේ බියෙන් කටයුතු කරන්නට සිදු වූ බව අසත්‍යයක් නොවේ.

අතපත්තු මහතා කුඩා වියේ දී ඇති දැඩි වූ ගම් පෙදෙස අත්.හැර දමා විවාපත් නොබෝ කලකින් කොළඹ වික්ටෝරියා පාලම අසල පිහිටා තිබූ අති රමණීය එල බරින් සරු සියඹලා-



ගහවත්ත නම් අක්කර තිස් පහක වතුයාය සහ එහිම තනවා තුබූ විශාල මනහර මන්දිරය මිල දී ගෙන එහි පදිංචියට ගියේ ය. සිය උපන් ගම්මානය අත්හැර දමා මෙසේ කරන ලද්දේ කොළඹ අසලට ළංවීමේ දැඩි ආශාව විය යුතුය. තිස් පස් වියේදී නගරය අසල පදිංචි වීමේ බලාපොරොත්තුවෙන් සිටි ජුවානිස් අතපත්තුට සියඹලාගහවත්ත අත්පත් කොට ගත හැකි වූයේ අහම්බෙනි. මේ ඉඩම ලබා ගැනීමේදී වුවද ඔහු කළේ නොසෑහෙන කපටිකමකි. එම වත්ත හිමි ඉංග්‍රීසි ජාතිකයාට හදිස්සියේ ම එංගලන්තයේ පදිංචියට යාමට සිදුවූයෙන් ඔහුගේ මෙම ඉඩම විකිණීමට නීතිඥ මහතෙකුට භාර කළේය. නීතිඥයා ද අතපත්තු මහතාගෙන් විශාල පගාවක් ගෙන වටිනාකමට අඩක් අඩුවෙන් එය අතපත්තු මහතාට විකුණා දම්මේ ය. ආත්මාර්ථයෙන් මත් වූ තණ්හාවෙන් මුලාවූ පරහට දයාවෙන් සුන්වූ අහංකාර පුද්ගලයනට සිය සිතැඟි ඉටු කර ගැනුම් වස් කපටි ඥානයත් කපටි උපායවලුත් හිසමත රජකෙරේ.

අවුරුදු පනසකට පෙර ගඟ හරහා පාලම සවිකරන අවසථාවේ එහි වැඩ භාරගෙන කටයුතු කළ ප්‍රධාන (කාර්මික විශේෂඥයා) ඉංජිනේරුවා විසින් මේ මන්දිරය ඉදිකරන ලද්දෙකැයි ප්‍රකටය. ගෘහය පැරණි තාලයේ වුවද නවීන නිර්මානයට වඩා චමත්කාර ලෙස එහි සැලැස්ම දමා තිබුණි. ගඟ අසල උස් භූමියක සාද තිබූ මෙම ගෘහය කිසි විටෙකවත් ගංවතුරකට යට කළ නොහැක. එහෙත් ගඟ හරහා හමන සිසිල් මඳ නල අඩුවෙක් නැතිව ගෙය පුරා පැතිර යන සේ දෙර-ජනේල සවිකර තිබුණි. මේ මන්දිරය ඉදි කළ ගෘහ නිර්මාණකයා සොබා සෞන්දර්‍යය ගැන මනා පැහැදීමකින් සිටියෙකු බව මෙම ගෘහය කියාපාන්නීය. ඉර බැස යන වේලෙහි ගඟ හරහා පෙනෙන චමත්කාර දර්ශනය නිරුත්සාහයෙන්ම නැරඹිය හැකි සේ ගඟ පැත්තෙහි කුඩා ආලින්දයකින් යුක්ත වූ කොට තාප්පයක් ඉදිකොට ඇත. ඒ අසල වූ පියගැට පෙළ එම චමත්කාර දර්ශණය දෙගුණ තෙගුණ කෙරේ. ගේ අවට භූමිය නානා වර්ණ පුෂ්ප-ලතාදියෙන් අඩු නොවීය. එහි වඩාත් ම සිත් ගත්තේ ගේ ඉදිරියේ

6873

UPLOADED BY ELIFE

සඳ තිබූ කුඩා පුෂ්කරණිය හා එහි මැදි ඉදිකොට තිබුණු වතුරමලය, ගේ ඉදිරිපස විශාල ගේට්ටු දෙකක් ද විය. ගේ වටකර අක්කර විස්සක පමණ බිමෙහි පොල්ද අක්කර දහයක කුඹුරු ද ඉතිරි හරියේ කොස්, දෙල්, අඹ, දඹ, දෙඩම්, නාරං යනාදී පලතුරු ගස්ද පිළිවෙළකට වවා තිබුණෝය. මේ අතර ගඟෙන් ඈත්වූ අක්කර තුනක පමණ ඇත්තේ රඹුටන් ගස් පමණකි. රඹුටන් වාරයට ගස් ටික බදු දී අතපත්තු මහතා දහස් ගණන් මුදල් ලබාගත්තේ ය. අතපත්තු මහතාට සිටියේ එකම දුවය. ඇගේ නම නිර්මලාය. සියඹලා ගහ වත්ත තමාට අත් වූ අවදියේ නිර්මලා දෙවස ඉක්මවූවා පමණි. මේ තරම් අඩු මුදලකට මෙම විශාල වතුයාය අත් කර ගත හැකි වුයේ තම සුරතල් දියණියගේ වාසනා මහිමය නිසා යයි අතපත්තු මහතා උදම් ඇනූ වාර බොහෝ ය. නිර්මලා කුඩා අවදිය ගත කළේ පියාගේ සොහොයුරියකගේ පුත්‍රයෙක් වූ රංජිත් සමඟ ය. සිය ගේ දෙර අත්හැර දමා යම්තම් පස් වස ඉක්ම වූ රංජිත් කඩුවෙල සිට කැළණි පෙදෙසට ඒමට එකම හේතුව ඔහුගේ අධ්‍යාපනය නිසා විය යුතුය. රංජිත් නිර්මලාට වඩා සිව් වසෙක් වැඩිමහල් ය. කුඩා කල සිට දෙදෙනා කෙළිදෙලෙන් ගත කෙළේ ඉතාමත් ප්‍රීතියෙනි. සණ්ඩු දබර කරගත් අවසථා බොහෝ වුවද නැවත දෙදෙනා යහළුවන්නේ පෙරටත් වඩා අතිමිත්‍ර කමක් දක්වමිනි. රංජිත් වැඩිමහල් බැවින් ද, පිරිමි දරුවෙකු බැවින් ද නිර්මලා ආරක්ෂා සහිතව රැකබලා ගත්තේ ය. නිතර විහිළු බස් දෙඩමින් ද වැඩෙහි හෝ සෙල්ලමෙහි සිය දක්ෂකම් පාමින් ද, රංජිත්ට නිර්මලාගේ සිත් දිනා ගැනීමට හැකි විය. එක් නිවාඩු දිනක රංජිත්ගේ මව ඔහු කැඳවා ගත යාමට පැමිණි වේලෙහි නිර්මලා මහා හයියෙන් හඬන්ට වූයෙන් මවට සිය පුතු නතර කොට යාමට පවා සිදු විය. මෙසේ කුඩා අවදියේ මේ දෙදෙන වෙන් කිරීම කිසිවෙකුටත් කළ නොහැකි විණ.

එහෙත් සියලු දෙයකම කෙළවරක් ඇත. දෙළොස් වියට පත් රංජිත්ට ගමේ පාසැලෙන් කොළඹ ආනන්ද මහා විද්‍යාලයට



ශිෂ්‍යත්වයක් ලබා ගැනීමේ වාසනාව උදාවූයෙන් දෙදෙනාගේ සම්බන්ධත්වය මඳක් ඈත් විය. ගෙදර පාඩම් ඉගෙන ගනු ලැබූ නිර්මලා ද එම අවුරුද්දේදීම නේවාසික ශිෂ්‍යාවක ලෙස කොල්ලුපිටියේ ක්‍රිස්තියානි කාන්තා විද්‍යාලයට ඇතුළ් කරනු ලැබීය. ලක්දිව ඉහළ යයි කියා ගන්නා ධනවතුන්ගේ ළමෝ විශේෂයෙන් මෙහි ශාස්ත්‍රය හැදෑරූ අය වූහ.

ආනන්ද විදුහලේ නේවාසික ශිෂ්‍යයකු වූ රංජිත් නිවාඩු දිනයන්හි කඩුවෙල සිය මවගේ ගෙදරට ගිය බැවින් දෙදෙන හමුවූයේ කලාතුරකිනි. හදිස්සියකින්. එකට මුණ ගැසුනද, එකිනෙකා කෙරෙහි ඇති කරගත් කුහුල ගතියකින් දෙදෙනම පෙලෙන්නට වූහ. තවද මේ දෙදෙනාගේ කුඩා විය ඇසුරු කොට වැඩිමහල්ලන් දෙඩන කථාබස් තව තවත් දෙදෙනා ඈත් කිරීමට කරුණු විය. වරක් දෙදෙනා කෙඩෙංගු කාමරයකට ගොස් බඩපුරා අග්ගලා සොරා කෑ සැටිද; කවුද අග්ගලා සොරා කෑවේ කියා අම්මා ඇසූ විගස අයියා නොවෙයි කෑවේ මමයි කියා නිර්මලා කී සැටිද, නංගී නොවෙයි කෑවේ මමයි කියා රංජිත් ප්‍රති උත්තර දුන් සැටිද, නමුත් දෙදෙනාගේ මුහුණුවල අග්ගලා කුඩු තිබුණෙන් සොරු එතැනම අසුවූ සැටිද, මව මතක් කර දුන්විට දෙදෙනාම යටැසින් බලා ලජ්ජාවෙන් මෙන් ඉවත බලාගත්හ. එදින පටන් ගෙදර සිදුවන සෑම සුළු සොරකමකටම ප්‍රථමයෙන්ම සැක කරනු ලැබුවේ මේ දෙදෙන බව මව නැවතත් සඳහන් කළාය. දෙදෙන එකතු වී කළ දඟ වැඩ අප්‍රමාණය. එහෙත් ළදරු සුරතල් පරිසරය නමැති පිරිසිදු තැනිතලාවෙන් ඈත් වූ ඔවුනට ඒ දෙස ආපසු බැලිය හැක්කේ සිතේ ඇතිවන කුහුල් ගතියෙනි. එකට අග්ගලා සොරා කෑවා කියා මතක් වනවිට ද ඔවුන් තුල ඇතිවනුයේ අප්‍රසන්න හැඟීම්ය. වැඩිමහල්ලන්ගේ සමච්චල් ඔවුනට නුරුස්සන්නේ මේ නිසාමය.

කාලයත් සමඟම නිර්මලා සහ රංජිත් ළදරු වියෙන් ළමාවියට එළඹ නැවත පසුනොබලාම නව යොවුන් බවට පත්වූහ.

UPLOADED BY ELIFE

අනද විදුහලේ පශ්චාත් ඉගැනුම ඇරඹූ රංජිත් තේනබදු සිය දක්ෂතාවයත් බුද්ධියත් මෙහෙයවා සය අවුරුද්දක ඇවෑමෙන් ගෞරව සහිතව ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සාමාර්ථය ලබා නැවත දැවුරුද්දක් නිකුත්වන්නට පෙර විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමේ විභාගයෙන්ද සාමාර්ථය ලබාගත්තේය. විශ්ව විද්‍යාලයට ඇතුල්වීමේ භාග්‍යය ඔහුට හිමි වුවද රංජිත් අන් අතකට සිය ජීවිතය යොමු කෙළේය.

ඊට ප්‍රධාන කාරණය නම් සිය වැන්දඹු මවට යම්කිසි සහනයක් ලබාදීමේ පරම චේතනාවය. විශ්ව විද්‍යාලයට ඇතුළ් වුවහොත් අවුරුදු තුනක් නොකඩවා ඉගෙන ගතයුතු යයිද, ඊට මහත් වියදමක් දරන්නට සිදුවනු ඇතැයිද, හේ සිතා ගත්තේය. රංජිත් වෙනුවෙන් ලොකු මුදලක් වැය කළයුතුයයි වරක් සිය මාමා අඟවන ලදැයි රංජිත්ට මව විසින් එවන ලද ලියමනක සඳහන් කොට තිබුණි. සිය මාමණ්ඩිට පිය උරුමයෙන් අත්වූ ඉඩම්වලින් අඩක් තම මවටද අත්විය යුතු බැව් රංජිත් හොඳින් දන්නා දෙයකි. එසේ වුවද ඉඩම් සම්බන්ධව මේ අවසථාවේ යම් කිසි භේදයක් පවුලේ ඇති කිරීම රංජිත්ගේ අරමුණ නොවේ. එහෙත් මෙවැනි තීරණාත්මක අවසථාවක ඔහුගේ අනාගතය පිළිබඳ ඇති වූ එකම බලාපොරොත්තුව අතපත්තු මහතා බව රංජිත්ට සැකෙවින් අවබෝධ විය. ඒ අනුව හේ දිනක් ජුවානිස් මාමා හමුවීමට සියඹලා ගහ වත්තට පැමිණියේය. කොතෙක් මාමණ්ඩියගෙන් උදව් බලාපොරොත්තු වුවද, ඒ ගැන කිසිදු කථාවක් නොකිරීමට හෙතෙම ඉටාගත්තේය.

අනද විදුහලේ බෞද්ධ පරිසරයත්, ෂේක්ස්පියර්, ෂෙලී කීට්ස්, මිල්ටන් යන ප්‍රසිද්ධ කිවියන්ගේ ශ්‍රෙෂ්ඨතාවට පිළිබිඹු කරවන උදර රචනාත් සිය චරිත දෝවනයය මහෝපකාර විය. විසිවසක් ඉක්මගිය රංජිත්ගේ උරය පුළුල්ය. උසය, සම වයස් අන්‍ය තරුණයන් ඉදිරියේ හේ යෝධයකු සේ කැපී පෙනෙන්නට විය. එමෙන්ම දුටුවන් නෙත් සිත් වශීකරන සුළු පියකරු



බැල්මකින් යුත් නෙත් සඟළක් ඇති මනාව පිරුණු මුහුණක් ද ඔහු සතු විය.

පාසැලේ තමාට ගත කිරීමට සිදුවූ අන්තිම දිනය රංජිත්ට ඉසිලිය නොහැකි තරම් ශෝකාකූල අවස්ථාවක් විය. අට වසකට පසු පාසැලෙන් ඈත්වීමේ වියෝදුක ඔහු හද දෙදරා ගියේය. මෙම කාලය තුළ පාසැලේ ගුරු පිරිස ඔහුගේ මව්පියන් සේ විය. පාඨශාලාවත් ශිෂ්‍ය නිවාසයත් සිය ගේදොර මෙන් පියකරු විය. ඇසුරට වන් මිත්‍රයෝ සහෝදරයන් වැනි වූහ. මෙම අට වස තුළ ඔහු පාසැලෙන් දිනාගත් ත්‍යාග ගිනිය නොහැකි තරම්ය. ඉංග්‍රීසි, සිංහල, ගණිතය, නවීන විද්‍යාව, ආගම ධර්මය ආදී සෑම විෂයකින්ම ඔහු ප්‍රථම අංකය දිනා ගත්තේය. එමෙන්ම ක්‍රීඩා භූමියෙහි දී ද හේ පෑ දස්කම් දුටුවන් මවිත කරවන සුළුය. පාසැලේ ප්‍රධාන මහතා ඔහු අතට දුන් අස්වීමේ සහතිකයෙහි මෙසේ සඳහන් කොට තිබුණි; 'රංජිත් තේනබදු වැනි උසස් වැදගත් පැසසිය යුතු සකලාඞ්ගයන්ගෙන්ම පරිපූර්ණ වූ ශිෂ්‍යයෙකු මින් පෙර ඇති නොවීය. මීට පසුත් ඇතිවේද යන්න අඩමානය.' ප්‍රධානාචාර්යවරයාගෙන් සමු ගැනීමට ගියවිට දෙදෙනාගේම ඇස් තෙත් විය. "රංජිත් ඔබට දිය හැකි අවවාදයක් මා ළඟ නැත. ඔබ මුහුණ පා ඇත්තේ ජීවිතය සාර්ථක කරගන්නාවුන්ගේ එකම මාර්ගය දෙසටය. ඔබගේ මතු ජීවිතය ගැන ශුභ ප්‍රාර්ථනා කිරීම පමණය මට ඔබ වෙනුවෙන් කළ හැකි එකම දෙය."

අන්තිම වරට රංජිත් සිය පාසැල් මාතාවගෙන් ඈත් වූයේ වියෝගිනි ජාලා ඇවිලෙන හද පත්ල, අනාගත බලාපොරොත්තු නැමති ශීත ජලයෙන් මැඩ පවත්වා ගැනීමට තැත් කරමිනි.

සිය බෑනනුවන්ගේ හදිසි පැමිණීම ගැන ජුවානිස් අතපත්තු මහතා කලබල වූ නමුදු ඒ කිසිවක් හේ නොහැඟවීය. සනීප පුටුව උඩට වී දෙකකුල් පුටු බාපත් පිට රඳවාගෙන සුරුට්ටුවක් උරමින් නිදල්ලේ බලා සිටි මාමා දුටු රංජිත්ට ඔහුගේ අභිප්‍රායයන්

UPLOADED BY ELIFE

සැකවින් අවබෝධ විණ. සිය අනාගතය ගැන සිත හදා ගැනීමට මෙයද ඉවහල් වුණි. කටේ හුවා තුබූ දුම්වැටිය ඒ අත මේ අත හපමින් අසල තිබූ පඩික්කමට කෙළ ගසමින් මඳවේලාවක් බලාසිටි අතපත්තු මහතා අන්තිමට නිහඬතාවය බිඳ හැරියේය.

"ආං උඹ අද මෙහි ආවේ ඇයි? ස්කෝලෙ අද නිවාඩුද?"

"නැහැ මම ඊයෙ පාසැලෙන් අස් වුණා."

පුදුමයෙන් මෙන් අතපත්තු මහතා හුස්මක් ඉහළට ඇද්දේය.

"අස්වුණා, ඒ මොකද?"

"මම විශ්ව විද්‍යාලයට ඇතුළත් කරගත් බැව් දන්වා ලියමනක් එවා තිබෙනවා."

ජුවානිස් මුදලාලි තව වරක් නිසලවී සුරුට්ටුව උරන්ට වූයේය. දූන්නම් සුරුට්ටුව උරන්නේ මඳක් වේගයෙනි. ඒ සුළු කාලය තුළ දී රංජිත්ගේ නෙත් බමරු ගෙයි එහා මෙහා හැසිරෙන්නට වූහ. පළමුකොට ඔහුගේ සිතට ආයේ මෙය මනුෂ්‍ය වාසයක්ද? නැතහොත් නවීනතම අරුමෝසම් බඩු තබා තිබෙන ප්‍රදර්ශනාගාරයක්ද? යනුයි. මීට හත් අට වසකට පෙර තුබූ එක බඩු කෑල්ලක්වත් දූන් මෙහි පෙනෙන්නට නැත. ඒ වෙනුවට අමුතු තාලයේ නොයෙක් නොයෙක් භාණ්ඩයන්ගෙන් ගේ පුරවා තිබුණි. විසිත්ත කාමරයේ එක් අල්මාරියක් පුරවා තිබුණේ අලංකාර කුඩා වීදුරු භාණ්ඩයන්ගෙනි. ඒ බඩු දෙස රංජිත් ඉතා ඕනෑකමින් බලා සිටියේය. අගනා ඒ බඩු සියල්ලක්ම වාගේ අන් රටවල ප්‍රභූ මහතුන් විසින් පරිහරණය කරනු ලැබූ ඒවාය. පසුගිය සතියේ පොතක් බලන අවස්ථාවේ එහි 'එක එක මිනිසාට ඇත්තේ එක එක පිස්සුවකි' යයි සඳහන් කොට තිබුණ බැව් තමාට මතක් විය. සිය මාමණ්ඩිටත් වැලඳී ඇත්තේ මෙවැනි උමතු රෝගයකැයි මෙහිදී ඔහුට කල්පනා විය. ඉස්සර



කාලේ රජවරු පාවිච්චි කළේ යයි කියනු ලැබූ සේසත් කීපයක්ම අසල බිත්තියක හේත්තු කොට දමා තිබුණි. විසිත්ත කාමරයෙහි ඉදිරිපස විශාල කරුවල කොට දෙකක සවිකොට තුබූ ඇත්දත් යුවළ සිය සිත ඇදී ගිය තවත් භාණ්ඩයකි. රංජිත්ගේ සිත අවුරුදු කීපයක් ආපසු ගොස් සියඹලා ගහ වත්තෙහි තමා ගතකළ ළදරු ජීවිතය චිත්‍රපටියක් මෙන් දෘශ්‍යමාන විය. ඒ දවස්වල තුබුණේ ප්‍රීතිමත් ගෙදරකි. අවට ඇතිවූ ව්‍යාජ හැඩහුරුකම බලත්ම මීට කොපමණ විශාල මුදලක් වැයවන්ට ඇත්දැයි රංජිත්ගේ සිතේ ඇති වූ තවත් ප්‍රහේලිකාවකි. තමාගේ උගත්කමේ හැටියට මෙය පෙනෙන්නේ ලොකු මදිකමක් හැටියටය. තම දරුවෙකු නම් අවට පෙනෙන දේවල නිස්සාරත්වය ගැන සිය මාමාට කීමට ඉඩක් ඇත. එහෙත් දූන් තත්ත්වය ඊට ඉඳුරාම වෙනස්ය. එබැවින් ඔහුට කළහැකි එකම දෙය නිසලව සිටීම පමණකැයි හේ සිතුවේය.

සෑහෙන වේලාවක් කල්පනාවෙන් සිටි මුදලාලි සුරුට්ටු කොටය කෙළ පිඩක් සමඟ පඩික්කමට බහා ආපසු රංජිත්ට කථා කිරීමට සැරසුණි.

"නුඹ ස්කෝලෙන් අස් වුණා! ඉතින් උඹ මොකද කරන්ඩ යන්නේ?"

රංජිත් කිසිවක් කථා නොකෙළේය.

"ඔය උඹ ඇතුළු උනා කියන තැන, තව අවුරුදු කීයක් ඉගෙනගන්නට ඕනෑද?"

"අඩුම ගණනේ තුන් අවුරුද්දක්" රංජිත් පහත් සවරයකින් කීවේය.

"තුන් අවුරුද්දක්!" මුදලාලි ගුගුලේය. "අට අවුරුද්දක් ඉවරයි, ආයිත් තුන් අවුරුද්දක්? ඊට පස්සේ කියයි තව අවුරුද්දක් කියල, මේවාට තමයි කියන්නෙ ඉවර නැති වැඩ කියලා"....

UPLOADED BY ELIFE

මාමණ්ඩියට සියල්ලක්ම කීමට ඉඩහැර රංජිත් නිහඬව බලා සිටියේය.

"උඹේ තාත්තා මැරුණ දවසේ ඉඳලාම මම තමයි උඹේ කටයුතු සියල්ලක්ම ඉටුකරන්නේ, මාසයකට වරක් උඹේ බෝඩිංකාසි රුපියල් පනහක් ගෙව්වේ මම තමයි. ඒ ඇර උඹේ අම්මා කීපවතාවක්ම මගෙන් මුදල් අරන් තියෙනවා උඹේ වියදමට කියලා. මම අහන්නෙ බලන්නෙ නැතුව දුන්නා ඒ දවස්වල නම්, ඊයේ පෙරෙයිද මුදල් වගයක් ඉල්ලූ වේලෙහි උඹේ අම්මා කීව මට වැඩිකල් කරදර වෙන්ට උවමනාවක් නැත කියා උඹ මේ අවුරුද්දේ ස්කෝලෙන් අස්වෙනවා කියලා. ඒ දවස්වල වාගේ නෙවෙයි එන්ඩ එන්ඩම මුදල් අඩුවෙන කාලෙ, දැන් රබර් මිල බැහැලා! පොල් මිල බැහැලා! ඒ මදිවාට මිනිසුන්ගෙන් වැඩ කරවන එක හරිම අමාරුයි." රංජිත් හිස සලමින් වීදුරු අල්මාරියෙහි තැන්පත් කොට තුබූ අගනා භාණ්ඩයන් දෙස විමසිල්ලෙන් බලාසිටියේය. ඉහත සඳහන් වචනවලින් තමාගේ මව තමා වෙනුවෙන් කරදරයකට මූණ පා ඇති බව රංජිත්ට තවත් අවබෝධ වූ කරුණකි. සිය මාමණ්ඩියට තව තවත් කියන්ඩ හැර තෙමෙ කට පියා සිටියේ, එසේ කිරීම නුවණට හුරුය යන්න ප්‍රත්‍යක්ෂ වූ හෙයිනි.

"ඔය උඹ ඇතුළු වුණා කියන අලුත් තැනට ගියාම තව අවුරුදු කීපයක්ම රස්තියාදු වෙන්ඩ වෙනවා."

"මා ඔබේ පුතෙකු වී විශ්ව විද්‍යාලයට ඇතුල්වීමේ භාග්‍යය අත්වූවා නම් ඔබ මෙවැන්නක් කියාවිද?" යන්න රංජිත්ගේ සිතට නැඟුණේය.

"උඹ දැන් ඉගෙන ගත්තා ඇති, උඹට දැන් ඕනෑ හොඳ රක්ෂාවක් ලබාගන්නා එකයි, එහෙම නේද හොඳ? උඹේ අම්මත් නුඹ ගැන හරිම කරදර වෙන පාටයි, ඊයෙත් මට ඇවිත් කීවා. උඹේ වයසෙ හැටියට කොළඹ ඉන්න එක වැඩිය හොඳ නෑ කියලා."



රංජිත් බර කල්පනාවකය. කොළඹ මධ්‍යම බැංකුවේ ගණන් පුරුදු කිරීම සඳහා ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන්ගෙන් ගෞරව සහිතව සාමාර්ථය ලැබූ අපේක්ෂකයන් දෙදෙනෙකුට ඉඩ ඇති බව පත්‍රයෙහි පිටුවක සඳහන් කොට තිබුණි. රංජිත් ඒ ලිපිනය සිය දිනපොතෙහි ලියා ගත්තේය. එය මහත් වාසනාවක් හැටියට ඔහුට දැන් ප්‍රත්‍යක්ෂ විය. විශ්ව විද්‍යාල ප්‍රවේශ පඩික්තියෙන් සමර්ථවීමද රැකියාව ලැබීමට උපකාරවන බව ඔහුට පැහැදිලිය.

"උඹට දැන් හොඳයි ආණ්ඩුවේ රක්ෂාවක් ලබාගෙන මෙහෙ ඉඳලා වැඩට යන එක. උඹේ අම්මා කියන්නේත් ටික දවසක් යනතෙක් උඹව මෙහෙ නවත්වා ගන්ඩය කියාමයි, උඹේ අම්මා කියන එක හරි තමයි. ඉඩමක් දෙකක් අයිති ඇඟපත ලක්ෂණ ඉලන්දාරින්ට සැහෙන තැනක් නොවෙයි කොළඹ, උන් නිකම්ම වල්වෙනවා විතරයි, උඹට මම කියන එක හොඳ නොවෙද?"

අඩක් පමණක් අසාසිටි වුවද රංජිත් "ඔව්" කියා නැවත නිහඬ විය.

"ආ! උඹ මෙහෙ ඉන්නකම් කිසිම වියදමක් දරන්ට උවමනාවක් නෑ. උඹ හම්බ කරන යමක් ඇත්නම් ඒ සියල්ලම උඹ අත ඉතුරුවෙනවා. මටත් හොඳයි, උඹ මෙහෙ ඉන්න එක."

අලුත් රක්ෂාව සම්බන්ධව සිත් ගිය රංජිත් අන්තිමට වචන සොයා සිය මාමණ්ඩියට කථා කෙළේ මෙවර ස්ථිර සවරයකිනි.

"විශ්ව විද්‍යාලීය ප්‍රවේශ පඩික්තියෙන් සමර්ථ වූවත් එහි යන්ඩ නියමයක් නෑ. මගේ බලාපොරොත්තුව යම් කිසි රැකියාවක් කොට අන් අතක මගේ දියුණුව ගැන වැඩ කිරීමටයි. මගේ අනාගත ශුභ සිද්ධියට වැඩක් වන පරිදි සුදුසු රක්ෂාවක් ලැබුණොත් අද වුවද මම එය භාර ගන්නවා."

මෙසේ කියා රංජිත් දෙරට බටුයේය. ගෙට ගොඩ වන විට නුදුටු තව තවත් අමුතු දේ දැන් තමා ඉදිරියේ දිස්වන්නට වන.

UPLOADED BY ELIFE

වත්ත සහ ගේ දෙර අලංකාර කිරීම සඳහා අතපත්තු මහතා නොදරා ඇති ප්‍රයත්නයක් නැති බැව් පෙනී ගියේය. තමා ගෙට ගොඩ වූයේ කොළඹට නුදුරු ගේට්ටුවෙන්ය. අනිත් ගේට්ටුව වසාදමා තිබුණි. මහත් කල්පනාවකින් යුතුව රංජිත් ගෙයින් බැහැරව පිටු පසට ගොස් එයින්ද ඈත්ව වරක් තමාට සුපුරුදු රඹුටන් කැලයට පා තැබීය. ඒ මොහොතේ දී නිශ්ශබ්ධ‌ක හැඟීම් නමැති කටු පඳුරේ ඔහුගේ සිත පටලැවෙන්නට වන. මීට සවල්ප වේලාවකට පෙර ඔහු වැළඳගෙන තුබූ බලාපොරොත්තු සියල්ලක්ම ඔහුගෙන් ඉවත් වී ඇත. ඔහුගේ සිතිවිලි ඔහුටම සමච්චල් කරන්නාක් මෙන් වරක් ඔහුට පෙනී ගියේය. රඹුටන් කැලයට පා තබත්ම, හිස් වූ යුද පිටියකට වන් තැනැත්තෙකුගේ සිතට ඇතිවන කල්පනාවන් යම් සේද ඔහුටද එබඳුම සිතුවිලි ඇති විය. රඹුටන් වාරය අවසානය. එකම පලතුරක්වත් එහි නොවීය. මිනිසාගේ මාත්සය්‍ය භාවයේ දරුණු කම හුවා පාන්නක් මෙන් ගස්වල අතු කැඩී බිඳී විනාශ වී තිබුණි. රඹුටන් එල නෙලා ගෙන ඒ මේ අත විසිරුවා දමා තිබූ අතු රිකිලි වලින් පොළොව වැසී ගොස්ය. අඩක් වෙළුනු කොළ මත පා තබමින් රංජිත් ගස් උඩ බැලීය. අත පය කඩා ගෙන කිසිවක් කර කියා ගත නොහී වේදනාවෙන් පෙළෙන සෙබලුන් සමූහයකගේ අවජේනක විලාශය ගස් වලින් පෙනී ගියේය. අහෝ! මගේ සිතත් දැන් මේ වාගේ නොවේද? මේ ගස් වලට කල්පනා කරන්ට හැකි නම් ඒවාට ඇති වන්නේ මට මේ අවසථාවේ ඇති වී තිබෙන නිශ්ශාබ්ධ‌ක හැඟීම් නොවේද? රංජිත් තමාටම කියා ගත්තේය. ඒ අතරම දිග සුසුමක් ඔහුගෙන් නොදැනුවත්වම පිටවිය. ගැල් සියගණන් වත්ත උඩින් එහා මෙහා දක්කා අගල් සෑරී සමහර තැන් මඩ වගුරු බවටද පත්වී තිබුණේය. මෙය තාවකාලික දර්ශනයක් පමණකි. රඹුටන් වාරය ඉවරවී මුදල් ගණන් කරන අවසථාවේදී කටු කම්බි ගසා පාරවල් වසා දමනු ඇත. රංජිත් පරීක්ෂාකාරීව හාත්පස බලන්නට විය. තමා ගෙදර නැති මේ අට වස තුළදී සිය මාමණ්ඩිගේ වතුයාය දිගින් හා පුළුලින් වැඩිවී ඇති බව ඔහුට පැහැදිලිය. තමා පසුකර ආ



තේක්ක ගස් පෙළ සියඹලා ගහ වත්තේ එක් මායිමකි. ඔහු අඩි සියයක් පමණ ගස් පෙළ පසු කොට ඇත. තමා ඉන්නේ කාගේ වත්තේ දැයි නිශ්චය කරගත නොහී ආපසු හැරී තෙමේ තේක්ක ගස් පෙළ දෙස බලා සිටියේය. එකෙණෙහි ඔහු අසල යම් කිසිවෙකුගේ හඬක් ඇසී වහා ඒ දෙස බැලීය. සියඹලා ගහ වත්තේ පරණ පුරුදු සේවකයකු වූ සැමී තමා අසල විය. රාජකරුණා මුදියන්සෙලාගේ හමීඩ් කඩුවෙලදී ජුවානිස් මුදලාලිගේ වත්තෙහි පොල් කැඩු මෙහෙකරුවෙකි. කවුරුත් ඔහුට සැමී කියා ආමන්ත්‍රණය කිරීමට පුරුදුව සිටියෝය. අවුරුදු දහයක පමණ කාලයක සිට ඔහුට පොල් ගස් යාම තහනම් කොට තිබේ. බිමට වැටුන පොල් අහුලා ගොඩ කිරීම සහ කරත්තය දක්කා ගෙන හන්දිය අසලට යෑම විනා අන් කිසි බර වැඩක් ඔහු නොකරයි. දිනක හෝ ගසක පොල් කඩමින් සිටියදී පය ලිස්සා බිමට වැටිණ. වාසනාවකට මෙන් ඔහු වැටුණේ ගසයට තුබූ වතුර වළකටය. වළේ ජලය පිරී තිබුණ බැවින් ඔහු යන්තම් මරණයෙන් නිදහස් විය. නමුත් එදින සිට ගමන් කරන්නේ වම් කකුල අද්දවමිනි.

කට පුරා තමා සිංහලයෙකුයයි කීමට ඔහු කවදත් ප්‍රිය කරයි. ඔහුගේ නමද එසේම යයි විටින් විට පෙන්වා දෙයි. එහෙත් ඔහු කථා කරන විට ඔහුගේ උත්පත්තිය කුමක්ද කියා දැන ගැනීම අසීරු කාරණයක් නොවේ.

"මේ සැමී නේද? කොහොමද සැමී දැන් සැප සනීප? දැන් ආයිමත් මං මෙහෙ ඉන්ඩ එනවානේ" කියමින් රංජිත් තම පැරණි වැඩකරුවාට ආමන්ත්‍රණය කළේය. සැමීට තවත් බාධකයෙක් ඇත. එය ඔහුගේ කන නොඇසීමයි.

"අනේ මේ පුංචි මාත්තිය නේද?" සැමී කෑ ගැසීය. "මට ඉතුනා අවතාරද කීලා! කොජ් ඉඳලා පුංචි මාත්තියා ආවේ! දෙන් පුංචි මාත්තියානේ ලොකු මාත්තිය. ඉතින් කවදද අපි ළඟට යෙන්නේ, අනේ මාත්තියා දෙකපු කල්."

UPLOADED BY ELIFE

සැමී කථා කිරීමට පටන් ගත හොත් තව කෙනෙකුට කථා කිරීමට ඉඩක් නැත. ඔහුම කථා කරයි. ඔහුට කට වහපන් කියා සැරකළත්, ඔහු තව තවත් කථා කරයි. ඉතින් ඔය ඇති පලයන් ඉවතට කීවොත් මහත් හයියෙන් කථා කරයි. ඒ ඔහු පුරුදුව සිටින සැටිය. සැමීගේ කථාවෙන් බේරෙන්ට වුවමනා වූ විට ඔහුගෙන් මඟහැර යා යුතුයි. ප්‍රශ්නයක් ඇසුවොත් ඊට ලැබෙන්නේ ඉඳුරාම වෙනස් උත්තරයක් බැවින් රංජිත් කට පියාගෙනම ඔහු කියන දේට සවන් දෙන්ට විය.

"මාත්තියා යෙන්ඩ තුබුනේ කලින් තමයි. මෙදසැරේ රඹුටන් ආවේ මා පොළවේ වෙලි එනවා වාගේ තමයි මුදලාලි එක ගා, වික්කා රුපියල් පනාට. ඉතින් මෙතන රඹුටන් ගා කීයද දන්නවාද? එක සිය විසි පා තමා. ඉතින් සල්ලි ගණන් බලන්ට පුංචි මත්තියා හපනා නොවේ. එකිසියවිසිපාට........" රංජිත් මඳක් තැති ගැනින.

"යේක විතරක් නෙමෙයි, මේක වත්තක් මුදලාලිගෙ, තේක්කු ගස්වලට එයායින් තියෙන වත්ත තමා," කියමින් අත දිගු කළේය.

මෙන්න රංජිත් මොහොතකට කලින් විසඳන්නට තැත් කළ ප්‍රහේලිකාව! ඉතා ඕනෑ කමින් හේ සැමී දෙස බලා සිටියේය.

"මතක ද මේ රම්බටන් වත්ත, මාත්තියා පුංචි කාලේ මේක අයිති තුබුනේ සීමොන් අයියාට, දුව දෙන්නය කියලා සීමොන් අයියා වත්ත තීලා රුපියල් දක් ණයට ගත්තා. දෙක අවුරුද්දකට ඉස්සරවෙලා ණයට පොලියට අක්කර පාම, මුදලාලිට ගියා. මුදලාලි ගත්ත දවසෙ ඉදලාම රම්බටනුත් වැඩී, එක තමයි වාශනාව, කියන්නේ."

සැමී මෙසේ කියා ඉනේ සඟවා තුබූ දුම්කොළ කැබෙල්ලක් ගෙන කටේ දමා ගෙන හපන්නට විය.



රංජිත් ඔහුගෙන් ඈත්වීමට තැත් කළේය. සැමී ඔහු පසුපස ගමන් ගති. රංජිත් දැන් යන්නේ ගඟට මඳක් ඈතින් තුබූ කුඹුර දෙසට ය. "දැන් මුදලාලිගේ කාලෙ ඔඳයි, වැලි අල්ලනවා, රත්තරන් වනවා" මෙසේ කියමින් සැමී අත් නොහැරම රංජිත් පසුපස ගමන් ගත්තේය.

"මුදලාලි සල්ලි ලබෙන්ඩ ලබෙන්ඩ ලෝබ වෙනවා. දෙන්නම් අරිම ලෝබයි. අපිලා වගේ දුප්පත් මිනියාට දෙන්නේ බෝම ටික තමා. ලොකු ලොකු එත්තට ලොකුවට සල්ලි තමා දෙනවා තමා. මට දෙන් කීනවා, ගස් යට ඉදිල වෙටිල තියෙන කොස් ගෙඩි වල ඇට අරන් දල වීකුණන්ඩය කියලා. අනේ මම කීනවා ඒ වෙඩේ මට නම් බේ කීල. මේ පැත්තේ දුප්පත් මිනියා තමා කොස් එට වේලෙ කාල තමයි ජීවත් වෙන්නේ."

තමනට නුවමනා ඕපාදූප නො අසා සැමීගෙන් ඈත් වීමට රංජිත් කල්පනා කොට තවත් ඈතට ගමන් ගත්තේය. සැමීද එම පාරේම ගමන් කරන්ට විය.

"දෙන් ඉතින් මාත්තියා කිව්වා නේ එයිද මේ නවතින්ඩ ආවේ කියලා," රංජිත් උත්තර දීමට ලෑස්ති විය. එහෙත් ඔහුගේ වචන සැමීගේ වදන් පහරින් යටවිය. ලොකුමාත්තියාගේ දුව, බලන්ඩ ඕනෑ දෙන් අරිම ලස්සනයි. නිවාඩුවට තමයි ඇයිත් ඉටියා. අපොයි මුදලාලි ඔයනවා දුව කසාද බෙඳල දෙන්ඩ උස පවුල් වලින් තමයි, ඔයන්නේ. අපිලා තමයි දකින්නේ."

ආපසු හැරී රංජිත් රඹුටන් කැලයට පා තැබුවේය. සැමී පසු පස විය. "මේක ශුඩ කරන්න තමයි දවස දයක් විතර ඕනෑ. රාළහාමිගේ වාශනාව තමයි. අපිලාට තමයි වෙඩ. අනික් සෙරේ රම්බටන් එදෙන්නේ මීටත් වැඩි. එතකොට බලන්න ඕනේ ගස්වල එටි" මෙය ඇසෙත්ම රංජිත් සිය මානසික තත්වය විග්‍රහ කරන්ට වූයේය. කුමක්ද සැමී කීවේ? වේදනාවෙන් පහර

UPLOADED BY ELIFE

ලැබූ මේ ගස් සියල්ලක්ම තව වරක් සශ්‍රීකව එල දරණ බව නොවේද? මෙය ලෝක සවභාවයයි. පෑරී වේදනාවෙන් ඉපිලී ගිය මගේ සිතද එසේම විය යුතුය. ඒ මොහොතෙහි අමුතු සැනසිල්ලක් තමාටද අත්විය. "ගිය හකුරට නාඬන්නේ තියෙන හකුර රැකගන්නේ" යන පැරණි පිරුළ සිතට ගනිමින් හේ අඩියට දෙකට රඹුටන් වත්තෙන් ඈත්වී මීට අවුරුදු කීපයකට පෙර උදේ සවස හොඳට පා තබා පුරුදු වෙල්යාය දෙසට පිය නඟා ගඟ හරහා හමන ශීත සුළං නැමති අමෘතයෙන් ගත සිත පිනවා ගත්තේය.

යෝධයෙකුගේ ශූරතාවය දක්වමින් යෞවන භාවය ජීවිතය සමඟ සටන් මෙහෙයවන්නේ ය. තමා ඉදිරියේ මැවී ඇති නොයෙකුත් බාධකයන් අභිබවා ඉදිරියට ම පා තැබීමට අධිෂ්ඨාන කරගත් රංජිත් ආපසු සියඹලා ගහ වලව්වට පිය නැඟුවේය. එදින රැවෙන්නට පෙර හේ ඉහත සඳහන් කළ රක්ෂාව උදෙසා ඉල්ලුම් පතක් යැව්වේය. සතියක් නික්මෙන්ට පෙර සම්මුඛ පරීක්ෂණයට ඔහු කැඳවනු ලැබීය. තවත් සතියක් නික්මෙත්ම මධ්‍යම බැංකුවේ උප ගණකාධිකාරී පදවිය තමාට අත්වූ බව සඳහන් කළ ලිපියක් රංජිත්ට ලැබිණ.

මෙසේ දෙවන වරට ද සියඹලා ගහ වත්ත රංජිත්ගේ වාස භූමිය විය. කොළඹ මධ්‍යම බැංකුවේ රක්ෂාව ලබා එහි ඇලී සිටීම රංජිත්ගේ අදහස නම් නොවීය. තමා ඉදිරියේ අවුරුදු ගණනාවක් ම ඇති බැවින් සිය අපරිමිත දක්ෂතාවය මෙහෙයා රක්ෂාවෙහි දියුණුවක් ලබා ගැනීම ඔහුගේ එකම අදහසය. සවස බැංකුවේ වැඩ නිම කළ හෙතෙම කොළඹට නුදුරුව පිහිටි එක් කාර්මික විද්‍යායතනයකට ගොස් විශේෂ ගණකාධිකාරයෙකු වීමට ඉගෙන ගත්තේය. එම පඬක්තිය නිමවී ගෙදර එන විට සමහර දිනවල රෑ නමය පසුවී ඇත. ඒ වේලාවෙහි කැළණියට ඒමට බස් රථයක් සොයා ගැනීම ලෙහෙසි නුවූයෙන් රංජිත්ට මුහුණ පෑමට සිදුවූ කරදර බොහෝය. කොළඹ වික්ටෝරියා



පාලම අසල තොටුපළෙන් එගොඩ වුවහොත් ගෙදරට එන මාර්ගය සැතපුම් තුනක් පමණ කෙටි වේ. මෙය සැකෙවින් වටහා ගත් හේ තමාගේ පරිහරණය සඳහා කුඩා ඔරුවක් සාද ගත්තේය. යම්තම් දෙදෙනෙකුට යා හැකි වුවද ඔරුව ඉතා ශක්තිමත් ලෙස තනා තුබුණි. අධික වර්ෂාව ඇති වූ රාත්‍රී කාලය හැර අනිකුත් සෑම අවසථාවකදීම කොළඹ සිට සියඹලා ගහ වත්තට ඒම පිණිස රංජිත් සිය ඔරුව උපකාර කොට ගත්තේය.

අවුරුද්දකුත් ඉකුත් වෙන්ට පෙර රංජිත් ගණකාධිකාර උපාධියේ පළමුවන කොටසින් සාමාර්ථය ලැබීය. සිය කාර්යයෙහි දක්ෂතාව සහ නිපුනත්වය සැකවින් අවබෝධ කොටගත් බැංකුවේ ප්‍රධාන කළමනාකාර තැන ද, වැඩි කලක් යන්ට පෙර රංජිත් තමාගේ පුද්ගලික ලේකම් ධූරයට පත් කළේය.

දැන් රංජිත් තේනබඳු ස්ථිර රැකියාවක් හිමි භාරදූර පදවියක් උසුලන සෑහෙන වැටුපක් ලබන තැනැත්තෙකි. ඔහු සවභාවයෙන් වැඩි වියදම් කරුවෙක් ද නොවීය. මත්පැන් බීම, රාත්‍රියේ නිදිමරමින් රඟමඬුලුවල රස්තියාදු වීම, දූ කෙළීම ආදී මිනිහා ප්‍රපාතය කරා ගෙන යන දුශ්චරිතයන් ඔහුට නුහුරුය. විවේකීව සිටින අවසථාවන්හි නැතහොත් අධික ලෙස මොලය වෙහෙසවන්ට සිදු වුවහොත් පමණය ඔහු සිගරැට්ටුවක් දල්වා ගන්නේ! මෙයද වැඩිහිටියෙක් ඉදිරියෙහි කිසි විටෙකත් නොකිරීමට ඔහු කල් ඇතුවම ඉටා ගත්තේය. දිනක් තමන් අත දල්වා තුබූ සිගරැට්ටුව, මාමා දුටු විගස ඉවතට ඇද වීසිකළේ තමාගේ බියසුළු ගතියක් පෙන්වීමට නොව වැඩිහිටියන් ඉදිරියේ ගරු කිරීමක් වශයෙනි. සතියේ වැඩ නිමවී සෙනසුරාද සවස සිය මෑණියන් බැහැ දකිනු වස් කඩුවෙලට ගොස් ආපසු පැමිණියේ ඉරිද රෑ වූවාට පසුව ය. පොත් හලකට ගොස් කියවීමට සෑහෙන පොත් රාශියක් ගැනීම ඔහුගේ සිරිත විය. පොත් කියවීමත් දියෙහි පීනමින් ප්‍රීතිවීමත් බෙහෙවින්ම ඔහු ප්‍රිය කළේය.

UPLOADED BY ELIFE

යම් යම් අවසථාවන්හි විවිධාකාර ජීවිත රාශියක් එක වර ගත කරන පුද්ගලයින් මිනිසා අතර ඇතැම් විට දක්නට ලැබීම පුදුමයක් නොවේ. ජුවානිස් අතපත්තු මහතාද එවැනි අමුතුම තාලයට හැඩ වැඩ ගැහුනු පුද්ගලයෙකි. මුදල් වලට ආශා කිරීම ඔහුට සහජයෙන් අත්වූ දයාදයකි. සියඹලාගහවත්තට පදිංචියට ඒමට බොහෝ කලකට පෙරසිටම විශාල ධනපතියෙක් වීමේ දැඩි ආශාවෙන් ඔහු වැඩ කළේය. දැන් ඔහු සමාජය පිළිගන්නා මහා ධන කුවේරයකි. මෙතැන් පටන් ඔහුගේ ජීවිතය විවිධාකාර වූයේය. ප්‍රථමකොට ධනය රැස්කර තබා එයින් තෘප්තිමත් නොවී එය ඇසුරින් මහජන කීර්ති ප්‍රශංසා ලබා ගැනීමෙහි මහත් ලැදියාවෙක් දක්වන්නට විය. මේ අනුව ඔහු ප්‍රසිද්ධියේ මහජන වැඩට බටුයේය. පළමුව සමාජ සේවයද, දෙවනුව සිය ජාතියත් සමයත් ආරක්ෂා වන කටයුතු වලද නිතර වීමෙන් හේ තව තවත් ප්‍රසිද්ධියට පත් විය.

කැළණි ගඟ බඩ සිටින්නකුට සමාජ සේවය නො අඩුව ඉටු කළ හැක. ඒ කෙසේද යත්! තද වර්‍ෂා කාලවල ගඟ අද්දර පහත් බිම් ගංවතුරෙන් යටවී අසරණ ජනතාව අතරමං වේ. මෙසේ දුකට පත් වූවෝ ධනවතුන්ගේ නොමසුරු ආධාර විශේෂයෙන්ම බලාපොරොත්තු වෙති.

දුප්පතාගේ ඉඩම් කැබෙල්ල සුළු ණයකට යට කර ගැනීම නැමති අයුතු ක්‍රියාවන්හි යෙදුන අතපත්තු මහතාම ගංවතුරෙන් ගෙවල් යටවී අනාථ වූ පුද්ගලයනට පිහිට වීමට ප්‍රථම පියවර ගති. හැදෙන වැඩෙන දරුවාට ආගම ධර්මය ඉතා අවශ්‍යයයි පිළිගත් අතපත්තු මහතා අසල ගම්වාසී දුප්පත් දරුවනට ආගම ධර්මය පුහුණු කිරීම පිණිස දහම් පාසැල් විවෘත කිරීමට ආධාර දුනි. නමුත් ඔහුගේ එකම දුවණිය ශාස්ත්‍රොත්ග්‍රහණය සඳහා බෞද්ධ ප්‍රතිපත්තීන් ගෙන් තොර ඉංග්‍රීසි ප්‍රතිපත්තීන්ට ප්‍රධාන තැන දෙන මිෂනාරි පාඨශාලාවකට යවන ලදී.



පුහු නම්බු ප්‍රශංසා ලබා ගන්නා අටියෙනුත් ස්ථානය රැක ගැනීම පිණිසත් වැඩ කරන්නන් අද ලක්දිවද නැත්තේ නොවේ. සියලු පුතුන් මිෂනාරි පාසැල් වලට යවා බටහිර පන්නයටම හැඩ ගසමින් තමා මහජන වේදිකාවලට පමණක් සියරට වතින් සැරසී චිත් වැදිබණ දෙසන ප්‍රධාන පඞ්ක්තියේ උදවිය අද අප අතර බොහෝ වේ. අතපත්තු මහතා ද දක්ෂ ලෙස මොවුන් අනුගමනය කෙළේය.

අතපත්තු මුදලාලි මහතා ආගම දියුණු කරනුවස් විහාරස්ථාන කීපයකම බලගතු දයකයෙක්ද විය. තමා ත්‍යාගවන්තයෙක් යයි අවට ප්‍රසිද්ධවෙත්ම ඒ ඒ ගම්වල කෙරෙන සෑම පොදු කටයුත්තකදීම අතපත්තු මහතාට ප්‍රධාන තැන දීමට මහජනයා අමතක නොකළහ. මෙසේ ප්‍රධාන තැන අත්වීමෙන් බලයද තමා සතු විය. බලය හිමි වූ ඔහු එයින් නොනැවතී තේජස් වික්‍රමයද තමන් සතුකර ගැනීමෙහි නිරත විය.

සියඹලා ගහ වත්තට දෙවන වරටත් පදිංචියට ආ රංජිත් ප්‍රථම කොට සිය මාමණ්ඩිය කෙරෙහි මහත් ලැදියාවක් ඇති කර ගත්තේය. එය තාවකාලිකව සිතේ ඇති කර ගත් පැහැදීමක් පමණි. අතපත්තු මහතා ගත කරන්නට යෙදුන දෙයාකාර ජීවිතය වටහා ගත් හෙතෙම සිය මාමා කෙරෙහි මහත් කලකිරීමට පත්විය. පළමුවෙන් වැඩි සැලකිල්ලක් නොපෙන්නුවද පසුව රංජිත් සිය මාමාගේ ඉසුරුමත් භාවයේ රහස සොයන්ට වූයේය. සිය මොළයත් කාර්‍යක්ෂම භාවයත් යොදවා වෛපුල්‍යත්වය ලබා ගත්තන්ගේ ජීවිතය පැසසුම් කටයුතු නමුත් මොහුගේ ඓශ්වර්‍යමත් භාවයේ පදනම වූයේ පරාර්ථය කෙසේ වුවද ආත්මාර්ථය පමණක් මුදුන් පත් කරගත් මාර්ගයන් ගෙන් නිසා මොහුගේ ඉසුරුමත් බව පැසසිය නොකටයුතු බව රංජිත්ට වැටහිණ.

රංජිත් උගත් පරිදි මනාලෙස වතුවල ගණන් හිලව් නොවැරදිව තබා ගැනීමට සිය මාමාට උදව් දුන්නේය. මෙයින්

UPLOADED BY ELIFE

පැහැදීමට පත් අතපත්තු මහතා සිය බෑණනුවන් විශ්වාස කොට ගණන් පොත් සියල්ලම ඔහු ඉදිරියේ තැබීය. මෙයින් රංජිත්ට තවත් කරුණු අවබෝධ විය.

දෙවසක් ඉක්මිණ. නිවාඩු දිනයන්හි රංජිත් සහ නිර්මලා එක පියස්ස යට ජීවත් වූ නමුදු වැඩි ආශ්‍රයක් ඇති කර ගැනීමට ඔවුන්ට කාලයක් නොමැති විය. පාසැල් ජීවිතාවසානයේ ගෙදරට ආ රංජිත්ද ප්‍රථම වරට නිර්මලා දුටු විගස හදතුල ඇතිවූ කම්පනය දුරුකර ගත්තේ සිත සමග දැඩි සටනක් ඇති කිරීමෙනි.

මෙතෙක් කල් මාමා සමඟ එක ගෙයි විසූ රංජිත්ට ඔහුගේ අදහස් මැන ගැනීම අමාරු කාර්‍යයක් නොවීය. සිය ගේ දෙර නවීන හැඩ හුරුකම් අනුව සකස් කරන ලද්දේත්, හෙල සංස්කෘතියටත්, සභ්‍යත්වයටත් පටහැණිවූ සමාජයේ එක්තරා පඞ්ක්තියක් පමණක් අනුග්‍රහය කරනු ලැබූ ක්‍රිස්තියානි පාසලකට සිය දියණිය අරිනු ලැබුවේත් යම්කිසි අදහසක් මුදුන් පත් කර ගන බැව් රංජිත් තේරුම් ගත්තේය. කරුණු මෙසේ බැවින් ළදරු වියේදී කිසිදු වෙනස් ගතියක් නොපෙන්වා මහත් ලැදියාවෙන් ක්‍රියා කළ සිය සොහොයුරියට මේ වේලාවේ විශේෂ සැලකිලි පෙන්වා නුවමනා සථානයකට පා තැබීම නොකට යුතුයයි රංජිත්ගේ අදහස විය. කුඩා කල නිර්මලාට තුබූ ආදරයට වඩා අමුත්තක් නොදක්වීමට රංජිත් කල්පනා කළේ මේ කරුණු පදනම් කරගෙනය.

දිනක් අතපත්තු මහතා, සිය බෑණාට ආමන්ත්‍රණය කෙළේය.

"මගේ දූව නිර්මලාට දැන් වයස දහ අට ඉවර වෙලා. ජ්‍යෙෂ්ඨ විභාගයෙන් දෙවරක්ම අසමර්ථ වුණා, ඈට වැඩිදුර ඉගැන්වීමට මා තුළ කිසිම අදහසක් නෑ. එහෙත් සීනියර් විභාගයවත් නොමැතිව ඉගෙන ගත්ත එකේ තේරුමක් නෑ නොවේද? ඒ නිසා මම කීවා පාසැලෙන් අස්වෙලා ගෙදර



නැවතී තව වරක් විභාගයට පෙනී සිටින්ටය කියා. මේ මාසයේ අන්තිමට ඈ පාසැලෙන් අස්වෙලා ගෙදර එනවා. මේ ළමයාට පුළුවනි නොවේද, ඈගේ දුර්වලකම් බලා යම්කිසි ආධාරයක් දෙන්ඩ?"

මෙය අසා හුන් රංජිත්ගේ සිත අධික ලෙස චලනය වන්නට විය. නමුත් ඒ බැව් නොඅඟවා ඔහු යම්තම් "ඔව් මට පුළුවනි," යන්න පමණක් කීවේය. අතපත්තු මහතාගේ මුහුණ මඳක් එළිය විය. "මම ඔය ගැන කල්පනා කළා කීප විටක්ම, ගෙදරදී පුළුවන් කොට ඈගේ දුර්වල වැඩ බලා යම්කිසි පුහුණුවක් දීමට මම ඒ ගැන මුදල් නාස්ති කරන්ට උවමනා නෑ නොවේද?"

මේ අවස්ථාවෙහි වුවද අතපත්තු මහතාට කල්පනා වූයේ මුදල් ගැනය. රංජිත්ද මෙයින් ඇති විය හැකි ආපදාවයන් ගැන මඳක් සිත යොමු කළේය. ඔහු නැවතී සිටින්නේ මාමාගේ සෙවනෙහිය. දැනට වුවත් ඔහු නොයෙක් අයුරින් සිය මාමාට උදව් උපකාර කරන්නේය. මේ අවසථාවේදී වුවද මාමාගේ සිත රිදවීම තරම් නොවෙයි. අතපත්තු මාමා කෙබඳු පුද්ගලයකු වුවද රංජිත් කෙරෙහි මහත් ඇතිකම් දක්වූ වාරවල් බොහෝය. රංජිත්ද මාමා අතින් සිදුවූ වරද අමතක කොට දමා යම් කිසි ගෞරවයකින් සැලකුවේ ඒ නිසාමය. වරක් අතපත්තු මහතා රංජිත්ට මෙසේද අවවාද කෙළේය.

"උඹ හම්බ කරන සල්ලි පොත්වලටයි, මිතුරන් එක්ක ගමන් බිමන් යන්ඩයි, නාස්ති කරන්ට එපා. මේ පළාත්වල ඉඩම් හරි ලාබෙට යනවා, උඹ දම්ම ඉඳලාම පටන් ගත්තොත් මගේ වයසට එනකොට සෑහෙන ඉඩම් හිමියෙක් වන්ට පුළුවනි!!" මේ අවවාදය රංජිත් මහත් කලකිරුණු සවභාවයකින් භාර ගත් නමුදු ඒ ගැන කිසිදු ප්‍රකාශයක් නොකළේය. මේ අවදියෙහි අතපත්තු මහතා රංජිත් කොතෙක් විශ්වාස කළාද කිවහොත්, බැංකුවේ මුදල් තැන්පත් කෙරුවේද මොහු විසිනි.

UPLOADED BY ELIFE

ජ්‍යෙෂ්ඨ පඬික්තියට පමණක් නොව ඊට වඩා උසස් විභාගයකට වුවද පුහුණුවක් ලබාදීම රංජිත්ට කළ හැකිය. මාමාගේ මේ ඉල්ලීම ඉතා ලාමක නොවේදැයි වරක් ඔහුගේ සිතට නැඟුනි. එහෙත් මාමා යමක් කීවොත්, ඊට විරුද්ධවීම රංජිත්ට කළ නොහැක. විසි වයස් තරුණයකුට මෙවැනි කාර්‍යයක් පැවරීම "ඉබ්බා දියේ දමන්ට ලෑස්ති වූ විට, අනේ මා මරන්ටය, දියට නම් දමන්ට එපා" කීවා සේ වුවද, රංජිත්ගේ සිතේ බලපෑ අරමුණු ඊට ඉඳුරාම වෙනස් විය.

"පරණ හිතෛෂිභාවය අමතක කොට දමා දැඩි අධිෂ්ඨානයකින් යුතුව සිය කාර්ය ඉටුකර දෙමි" යි රංජිත් තරයේ ඉටාගත්තේය. එහෙත් මෙයින් කුමකින් කුමක් වේද යන්න ඔහුටද ප්‍රහේලිකාවකි.

මේ කාරණාව ගැන කල්පනා කරත්ම රංජිත්ගේ සිත්හි නානා විද හැඟීම් වැඩ කරන්නට විය. සිය අසාන්ත භාවය සංසිඳවාගනු වස් තෙමේ මෙතෙක් නිශ්සාඵලෙස කිරීමට තැත්කළ එක් වැඩක් පසෙක තබා වත්තේ පහළට පා තැබීය. ගඟ හරහා වත්ත දෙසට හැමූ සිසිල් මඳනල ඔහු ගතකළ ළමා ජීවිතය විචිත්‍ර චිත්‍ර පටියක් මෙන් විදහා පෙනෙන්නට වූයෙන් නොදැනුවත්ව හේ තද සුසුමක් හෙළීය. එදා මම නිර්මලාට කොපමණ ආදරයෙන් සිටියාද? කොතෙක් විහිළුවෙන් මා ඇය මැඩපැවැත්වීමට තැත් කළාද? මෙසේ සිතත්ම ගස කොළ සොලවමින් තද සුළඟක් හැමීය. ඒ අතරම නිර්මලාගේ මුදු මොළොක් සිනාවද ඇසෙන්නාක් මෙන් විය. ඒ සමඟම ජීවමානව පෙනී සිටින්නාක් මෙන් නිර්මලාගේ සුරතල් මුහුණ ඔහු ඉදිරියේ පෙනී සිටියේය. "නිර්මලා අයියාට කොච්චර ආදරේද?" වරක් ඇසූකෙනෙහි "මේ ගඟටත් වඩා ආදරෙයි" කී සුරතල් වදන් ආපසු ඇසෙන්නාක් මෙන් විය. එකිනෙක මැඩගෙන බුරබුරා ඇවිලෙමින් පැන නඟින ගිනි සිළුමෙන් හදවත දැවි දැවී මොහොතින් මොහොත පැන නඟින සිතුවිලි



මාලාව මැඩලනුවස්, හාත්පස පඳුරු දමා සශ්‍රීක ලෙස ගඟ දෙසට නැමී තුබුණ උණ පඳුර දෙසට හේ නෙත් යොමු කළේය. ඉඩම මිලදී ගත්දිනම උණ පඳුර යට තිබූ අසුන වෙනසක් නොවී එතැනම තිබුණි. මඳ වේලාවක් හෙතෙම අසුන මත වාඩිවී කල්පනාවේ යෙදුණ. නිර්මලීගේ විභාගයට ඇත්තේ තෙමසක් පමණය. ඒ කාලය තුළ මගේ යුතුකම ඉටුකොට මාමාගේ සිත පහදනවා විනා අන් කිසිදෙයකට මා සිත යොමු නොකළ යුතුය. කුඩාකල මා නිර්මලී ගැන දැන සිටියද කාලයාගේ ඇවෑමෙන් ඈ තුළ කොතෙක් වෙනස්කම් ඇති වී දැයි කාට කිව හැකිද? පියාගේ ව්‍යාජතාවයන් ගෙන් අඩක්වත් ඈට ඇතිනම් ඔහුටද මා පෙනෙන්නේ නිවටයකු ලෙස නොවේද? මෙසේ සිතත්ම රුං යන අණු කරණයෙන් උණ අතු සැලෙන්නට විය. දූන් ඔහුගේ සිත මඳක් මැඩපවත්වාගෙන ඉවරය. එතැන නොරැඳී තෙමේ වහවහා ඕවිට දෙසට පා තබන්නට වූයේය. එදා සැමී කීදේ සත්‍යයකි. ජුවානිස් අතපත්තු අල්ලන සෑම දෙයක්ම රත්රන් වලට පරිවර්තනය වන යුගයක් දූන් ඔහුට ලබා ඇත. ඉන්නල පුරවාලූ කරත්ත කීපයක්ම ඕවිට දෙසින් නික්මෙන බව ඔහුට පෙණින. ඕවිටද පසුකොට කුඩා කඩුල්ලකින් පැන රංජිත් කුඹුර දෙසට ගමන් ගති. තමා ඉදිරියේ ඇසට නොපෙණෙන තෙක් අයිති මාමාටය. අවුරුදු කීපයකට පෙර මීට අයිතිකරුවන් කීපදෙනෙකු සිටියද දූන්නම් ඔවුන් සියල්ලම අනාථය. මුදල් ලබාගෙන පසුව එය ගෙවා ගන්ට බැරිවීමෙන් මෙසේ සිය ඉඩකඩම් අහිමි වූවන් හා ඔවුන්ගේ දරුමල්ලන් විඳින දුක් ගැහැටත් කියන ශෝකාලාපයනුත් මෙනෙහි කරත්ම රන්ජිත්ගේ සිත අධික තැවුලින් දෙදරා ගියේය. කුඹුරේ අන්තිම ගොයම් කරල පවා කපා ගොඩගසා හමාරය. දැකැත්තේ තියුණු මුවට අසුවී බිම ගොඩ ගැසී තුබු රන්වන් කරල් පැහැයෙන් යුත් ගොයම් පඳුරු යුදයෙන් පරාජය අත් වී බිම වැතිර සිටින සෙබළුන්ගේ සවභාවය දැක්වූහ.

රංජිත් පහත් වී බිම කපාදමා තුබූ ගොයම් මිටක් අතට ගෙන එහි වැලිමෙන් ඉසිරි ගිය වී වලින් පිරුණු කරල් විභාග

UPLOADED BY ELIFE

කරන්නට වූයේය. බොල් වී යන නාම මාත්‍රයක්වත් එහි පෙනෙන්නට නොවීය. සෑම වී ඇටයකම දහයියා පොත්ත පිපිරෙන තරම් සහල් ඇටය පිරී තිබුණි. ගොයම් මිට මඳක් ඈතට වීසිකොට අවරට බරවූ හිරුගේ රශ්මිය මුවා කරනුවස් අතක් නළල මත තබා තෙමේ ඈත බැලීය. කුඹුරේ තැනින් තැන වැටී තිබුණ වී කරල් අවුලමින් සිය ඔඩොක්කුව පුරවා ගන්නා බාලවයස් කෙල්ලන් ශදදෙනෙකු ඔහුගේ නෙතට ලක්විය. ඔවුන්ගේ දරිද්‍රතාවය එක බැල්මෙන්ම මැන ගත හැක. රංජිත් දකීමෙන් බියෙන් මෙන් ඔවුහු ඈත් වන්නට වූහ. රංජිත් ද ඔවුන් මඟහරිමින් මඳක් ඈතින් තුබූ කමත දෙසට ගියේය. චණ්ඩ සූර්‍ය්‍ය රශ්මිය නොතකා කමත අසල වැඩ කරන ස්ත්‍රීහු ගණනාවක් වූහ. හිරු රැසින් විඩාවට පත් වූ ඔවුන්ගේ මුහුණෙන් ගලායන ඩහදිය බිංදු ඔවුන් නියැළුණු දුෂ්කර කාර්‍ය්‍යයට සාක්ෂියක් බඳුය. එහෙත් ඔවුන්ගේ අහිංසක පියකරු භාවයට අතගැහීමට බියෙන්දෝ ඔවුන්ගේ පැහැපත් භාවය අධික පීඩාවන් මධ්‍යයේ ද කැපී පෙණින. හංස පැටියන් පරදවන ඉදිරියට නෙරා සිටි පුන් පියයුරුද මිටින් ගත හැකි සිහිනිඟවල් ද රියසක් යුරු පුළුලුකුලුද රඹ කඳන් බඳු වටොර යුග්මයන්ද සොබා දහම විසින් ඔවුනට දී ඇති එකම දායාදය වේ. හිසෙන් ගොයම් මිටියක් උසුලාගෙන කමත වෙත ආ එක් තරුණියක් එය බිම තබා තද සුසුමක් හෙළුවාය. සිය අහේනිය එතරම්ය යන බව සුසුමෙන් හඟවන්නට ඇත. ඉහළ ලී පුවරු දෙකක් මැද සිටි අයෙක් සුළඟ හමනවා බලාසිට කුල්ලට රැගත් වී රැස සීරුවෙන් බිම හලන්නට වූයේය. "මෙද සැරේ බොල් වී ඇටයක් සොයා ගන්නට අමාරුයි" යනුවෙන් අවට සිටින්නට ඇසෙනසේ ඔහු ශබ්ද නඟන්ට විය. "රාළහාමි! හොඳ පෝර ගෙනැත් දානවා" එකෙක් කීයේය. "අප්පු සිඤ්ඤෝයියාට අයිති කාලේ නම් හොඳ වී ගණනටම බොල් වී තිබුණා" පුවරුව මත සිටි අය ආපසු උත්තර දුන්හ.

ගොන් බාන දක්කන ගැටවරයන්ට නම් කමතේ වැඩ සියල්ලක්ම විනෝදයකි. දිග කෙවිටක් රැගෙන කොයි ලෙස



ගියත් එකලෙස ගොනුන්ට පහර දෙමින් වටයට යන කොලුවාට මෙ තරම් ප්‍රීතියක් තවත් නැත.

"ඔහොම යනවිට උඹට කලන්තයක් හැදෙන්නේ නැත්ද"යි වරක් රංජිත් කොලුවාගෙන් විමසීය. "නෑ අපට කලන්තේ හැදෙන්නේ නෑ. අපිට පුරුදුයි."

"හැබැයි ගොනුන්ට අමාරු වෙනකොට අමාරු උන්ගේ කකුල් ඒ මේ අත වැනෙනවා" මෙසේ කොලුවෙක් උත්තර දුන්නේ ගොනෙකුට කෙවිටි පහරක් දෙමින්ය.

"හිටු, හිටු" කියමින් අසල බලාහුන් කොළුපැංචෙක් පිදුරු සවල්පයක් අල්ලා ගොනෙක් පැහැරූ ගොම පිඩ ගෙන ඈතට වීසි කෙළේය.

හිරු අහසේ පහතට යත්ම වැඩකරුවන්ගේ සිත්හි ඇතිවූයේ සැනසුම් හැඟීමකි. එක් ඉලන්දාරියෙක් බීඩියක් ගෙන දල්වා මඳක් ඈතට වී එය උරන්නට වූයේය. "තොට කී දවසක් කියල තියනවද බොල කමතට ඇවිත් බීඩි බොන්ඩ එපා කියල, මම දන්නව දවසක මූ මුළු පිදුරු ගොඩටම ගිනි තියනවා." මහල්ලෙක් කෑගැසීය. "කමත කොහේද? මම බීඩිය උරන්නේ කොහේද?" කියමින් ගැටවරයා ප්‍රති උත්තර දුන්නේය. ලූසි හාමිගේ දරු තිදෙනා කමතට දුව ආවෝය. ඔවුන් සිටියේ අඩ නිරුවතිනි. ඇට පිහිටවීමට තිබූ එකම රඹුටන් වත්ත දූන් අන් සතුය. කෑම ටික පවා සපයා දීමට බැරි ඈ කෙසේ ඔවුන්ට ඇඳුම් ආයිත්තම් සපයා දෙන්නී ද? එහෙත් කමතට දුව ආ ඔවුන්ගේ සුරතල් සිනාවෙන් සියල්ල යට වී ගියේය. කුඩා කොලුපැටවුන් තිදෙනා දෙස බලත්ම රංජිත්ගේ සිත නොයෙක් අන්දමින් ක්‍රියා කරන්නට විය. පෙර පින් බලෙන් සියල් සිරින් අගතැන් පත්ව ඉපදීම එක් කරුණකි. එහෙත් අසරණයින්ගේ ඩහදිය ලේ බිංදුමත විරාජමානව ඉසුරුමත් වීම තවත් එකකි. ලූසිහාමි වැටී සිටින බැරෑරුම් තත්වය මේ බව මොනවට හෙළි කෙළේය. කාගේ

UPLOADED BY ELIFE

ඉඩමක් අත්කොට ගත්තත් ලුසිහාමි වැනි දරිද්‍රතාවයෙන් පෙළෙන වැන්දඹුවකගේ ඉඩමක් ඇට අහිමිකිරීම කොපමණ සාපයක්ද? ඔහු තමාට කියා ගත්තේය. "මේ ලෝකයේ මිනිසාට බෙදගෙන කෑමට ඕනෑතරම් ඇත. නමුත් බදගෙන කෑමට නම් කොහෙත්ම මදිය" යන අනගි කියමන එක් දාර්ශනිකයෙකුගේ මුවින් පිටවූයේ මෙවැනි අවසථාවක නොවේද? මේ කියමන කොපමණ සත්‍යයක්ද? මේ කුඹුරේ මහන්සිය නොබලා උදේ සිට රෑ වනතුරු වැඩ කළ කීදෙනෙක් ගෙදර ගොස් කුස පුරා අහරක් ලබත්ද? මොවුන් සියල්ලන්ම ඩහදිය වගුරුවන්නේ එකෙකු පමණක් ඉසුරුමත් කිරීම පිණිස නොවේද? අහෝ අසාධාරණයක මහිම!

මෙවැනි දේවල් වෙනවා කීම තබා සිතීමටවත් නොහැකි පුදුමයකි. ශාක්‍ය කුලයක රාජශ්‍රීන් විරාජමාන වූ සිද්ධාර්ථ ගෞතමයන් තමන් සතු සියලු සම්පත් අලුයම දමූ කෙළපිඬක් සේ නිරාලව අත්හැර දමා පාත්‍රය අතට ගෙන පිඬු සිඟා ඇවිද්දේ නිහතමානිත්වයේ ශ්‍රේෂ්ඨතාවය මිනිසාට පෙන්වා දීමට නොවේද? අහිංසකයන් දරිද්‍රතාවයෙන් පෙළෙමින් සිටියදී එකෙකු පමණක් ඒ මත යස ඉසුරු ලබා බැබලෙනවා දැකීම කොපමණ කනගාටුදායකද? මෙසේ විරාජමානව වෙසෙන සවල්ප දෙනාම ආගම් කර්තෘන්ගේ ශ්‍රේෂ්ඨ ධර්මයන් නැමැති නොසැලෙන පියස යට අනාවරණය ලබා ගැනීම කොපමණ සාවද්‍ය ක්‍රියාවෙක්ද? මෙසේ සිත යවමින් රංජිත් ආපසු කඩුල්ල ගෙවා තව වරක් රඹුටන් වනයට පිවිස, "මෙන්න මගේ ඉදිරි ගමනට දිරි දුන් ගස් කීපය" කියමින් කෘතඥ පූර්වකව රඹුටන් ගස් දෙස බලන්නට විය. රඹුටන් වාරයෙහි ගස්වලට වැදුනු පහර වලින්ම අමුතු පණක් ලද්දක් මෙන් ගස්වල අතු කොල රිකිලි ඔප දෙන්නට වන. යම්තම් රත් පැහැයෙන් යුත් ලාදළු ආදිය සුළඟට වැනීම රංජිත්ට අමතන්නාක් වැනි විය. මේ දුටු රංජිත්ගේ හද පිනා ගියේය.



හදිසියෙන්ම පිටුපස අඩි ශබ්දයක් ඇසී රංජිත් ඒ දෙසට හැරිත. සැමී නැවතත් තමා ළඟ සිටින බව දැක්කේය. ළඟට ඒමට පෙර කෙසේ නමුත් ඔහුගෙන් මඟහැර යාමට උත්සාහ කළ නමුත් නොහැකි විය. "ආ සැමී මේ පැත්තට ආවේ කාලෙකින්" කියමින් රංජිත් ඔහුගෙන් ඈත්වීමට දරූ ප්‍රයත්නය නිශ්ප්‍රභා විය. "රංජිත් මාත්තියා අපි ඉන්නේ එකගේ තමා, ඒත් දකින්ඩ තීන අමාරුව. ඇයි මාත්තියා සඳුදා පාන්දර යනවා තමයි. රේවෙලා සෙනසුරාද නේ ආපසු යෙන්නේ! ඉතින් අපිලාට කෝමද දකින්නේ?" රංජිත් සැමීට කථා කරන්ට ඉඩහැර කරබාගෙන සිටියේය.

"මාත්තියා දෙක්කා නේද කපුරුආමියි දූයි කඩුල්ල ළඟ."

රංජිත් පුදුම විය. රංජිත් කිසි දිනකවත් කපුරුහාමියෙකු හෝ ඇගේ දූ කෙනෙකු ගැන අසා නැත. සැමීට කථා කිරීමට ප්‍රශ්නයක් උවමනා නැත. ඔහු දිගටම කථා කරගෙන යයි. " කපුරුආමි තමා දෙන් අවුරුදු පාකට ඉස්සෙල්ල කඩුවෙල ඉඳලා තමයි ගෙන්නා ගත්ති." එක් කඩවසම් ලක්ෂණ ස්ත්‍රියක් සහ ළමා යෞවන මායිමේ ගැවසෙන ලක්ෂණ කෙල්ලකුත් රංජිත්ගේ ඇසට ලක්විය. රංජිත් ඒ දෙස බලත්ම සැමී ළංවී රංජිත්ගේ කනට කොඳුරා යමක් කීවේය. "ඒක තමයි ලාලආමිගේ ඔර ගානි."

රංජිත් බියවූ මුවෙකුසේ මුහුණ වහා ඉවතට ගත්තේය.

"ඉස්සර තමයි කපුරුආමී එක්ක විතරයි. දැන් තමයි, දූවත් එක්ක තමයි."

"උඹ ඉතින් සොය සොයා ඇවිදපන් අතන මෙතන තියෙන ඕපාදූප ඔක්කොම." මෙසේ කියා රංජිත් ඔහුගෙන් බැහැර වීමට තැත් කළේය. ඒ කිසිත් නොතකා සැමී ඔහු පිටු පස ගමන් ගත.

UPLOADED BY ELIFE

"අම්මපා මම කියන්නේ එත්ත තමයි. මගේ කටට ඔඳක් වෙන්න අපා ඕක බොරු නම්, ඉස්සෙල්ලා උදේ ඉඳලා රෑ වෙනකල් ආමිනේ එක්ක රණ්ඩු වෙනවා. ආයි දවසක් තමයි ආමිනේ කපුරුහාමිට ගාන්ඩත් ගියා තමයි. අපිලා තමයි බේරුවේ. දෙන්නම් ආමිනේ කීනවා ගානි එකක් බරිනම් ගානි ඔක්කොමලා තියා ගන්ඩ කීල. ආමිනේට කමක් නේ කියනවා, රාළආමි සල්ලි දෙනවා අති තරමට ආමිනේට, ඉතින් ආමිනේට කමක් නේ කීනවා."

තවත් වත්තෙහි සිට සැමීට කන්දීමෙහි නිශ්ඵලතාවය සැකවින් අවබෝධ කොටගත් රංජිත් වහා පිටුපස තිබෙන පියගැට පෙළින් ගෙට ගොඩ නැඟී සිය කාමරයට වැද දෙර වසා ගත්තේය.

ගින්දර සහ පුළුන් එකළඟ තිබීමෙන් මහා ඇවිලීමක් වන්නේය යන්න ඥානවන්ත කව්රුත් පිළිගත් ධර්මතාවයකි. එහෙත් අතපත්තු මහතා මේ ගැන කිසිත් නොතැකුවේය. කෙසේ නමුත් කාරිය ඉටුකර ගැනීම ඔහුගේ පරමාර්ථය විය.

සතර වටින් ආරක්ෂා ඇතිව නිර්මලාගේ ප්‍රථම පාඩම ඇරඹින. ලොකු පුටුවක් ඇද අතපත්තු මහතා ඒ මත හිඳ ගත්තේය. නිර්මලාගේ මවද මඳක් ඈත් වී දෙදෙනා දෙස බලා ගත් වනම සිටියාය. ගෙදර වැඩ කරුවෝ මඳ කලබල ස්වභාවයකින් ගෙදර හැසිරෙන්නට වූහ. කිසිදු පැකිලීමක් නොමැතිව රංජිත්ද සිය කාර්‍යයෙහි යෙදින. පළමුව ගණිත ශාස්ත්‍රය පමණක් උගැන්වීමට බලාපොරොත්තු වූ නමුදු පසුව හෙතෙම ඇගේ විභාගයට වුවමනා සෑම විෂයකින්ම හොඳ පුහුණුවක් ලබා දුන්නේය.

පළමුව රැකවරණය නොඅඩුව ලැබුනු නමුත් පසුව රංජිත් සහ නිර්මලා පමණක් තනිව පාඩම් කිරීමට පුරුදු වූහ. සමහර රාත්‍රිවල හතට පටන්ගත් පාඩම් මාලාව ඉවර වූයේ රෑ දහයත් පසුවූවාට පසුවය. මහත් ලජ්ජාවකින් සහ පැකිලීමකින් පාඩම්



ඇරඹූ නිර්මලා කීපදිනකට පසු සිය සිත්තුළ පැවති කුහුල් ගතිය අත්හැර දමා ජීවිතයේ ඉතා කුළුපග මිත්‍රරෙකුට මෙන් රංජිත්ට සලකන්නට වූවාය. පසුගිය ළමා කාලය යළි සිහිවෙත්ම දෙදෙනාම නොකැඩිය හැකි වූ එක් බැම්මකින් වෙලා ගනු ලැබූහ. පාඩම් කරන ගමන් ඔව්හු වෙන වෙන දේවල් ගැනද කථාකරමින් එකිනෙකා සම්බන්ධව කරුණු දැන ගැනීමෙහි නිරතවූහ. "ඔබ කොතෙක් දුරට සිංහල කළේදැයි" වරක් රංජිත් නිර්මලාගෙන් විමසීය.

"ඒ මගේ වරද නොවෙයි. මා යන පාසලේ වැඩිය සිංහල කෙරෙන්නේ නෑ."

"එසේ නම් ඔබේ පාසලේ සිංහලට තැනක් නෑ?" රංජිත් පිළිවිසීය.

"සිංහල විෂයයක් වශයෙන් කරනවා. එහෙත් ළමයින් කවුරුත් ඒ ගැන වැඩි සැලකිල්ලක් ගන්නේ නෑ."

රංජිත් මහ කල්පනාවකින් හිස සැලීය.

"ඔබ ඉගෙන ගත් පාසලේ සිංහල ළමයි නැතිද?"

"ඇයි නැත්තේ වැඩි දෙනෙක් සිංහල ළමයි තමා. එහෙත් ඒ අය මා දන්නා තරමටවත් සිංහල දන්නේ නෑ."

"පුදුමයි!" රංජිත්ගේ මුවින් පිටවිය. "තමන්ගේ රටේ ජීවත් වෙමින් තමන්ගේ බස නොදන්නවා කියන එක."

"මගේ පන්තියේ ළමයි කියනවා ඒ අය සිංහල ඉගෙන ගන්නේ ගෙදර සිටින වැඩකරුවන්ගෙන් කියලා" නිර්මලා ප්‍රකාශ කළාය. රංජිත් කථාව එතැනින්ම නවත්වා දිගු සුසුමක් හෙළීය.

UPLOADED BY ELIFE

එදා රෑ රංජිත් නින්දට ගියේ බර කල්පනාවක් සිතේ ඇතිකර ගනිමින්ය. නිර්මලාට සියබස ගැන ඇත්තේ ඉතා සුළු හැඟීමක් පමණි. ඇගේ ආගම සම්බන්ධව කිව යුත්තේත් ඒ ටිකමය. එහෙත් අතපත්තු මහතා කෙබඳු පුද්ගලයෙක්ද? හෙළබස සිංහලයාගේ උත්තම භාෂාව බවත්, ඉංග්‍රීසිය, මේ රටට පර භාෂාවක් බවත්, ඉංග්‍රීසියට ගැතිව සිටිනතාක් කල් සිංහලයාගේ වහල් බැමි කඩා දැමිය නොහැකි බවත්, යන ගැඹුරු අදහස් ඇති භාර දූර වචන යොදමින් දුප්පත් මහජනයා අතර මහත් ආන්දෝලනයක් කරන්නෙකි. එහෙත් ඔහුගේ එකම දියණිය ගැන කිය යුත්තේ කුමක්ද? බුදුරජාණන් වහන්සේගේ නිර්මල ධර්මය වැනි ධර්මයක් මේ ලෝකයේ නොමැත්තේයයි හඬ නගා කියමින් බාල පරම්පරාව බෞද්ධාගම කෙරෙහි ලැදියාවක් ඇතිකිරීමට හේ නොගන්නා මහන්සියෙක් නැත. එහෙත් තම එකම දරුවාගේ ආගම දැනීම බාල වියෙහිදී සිය වැඩකරුවන්ගෙන් උගෙන කටපාඩම් කොට ගත් ගාථාවකට සීමා වී තිබේ. මෙහි තේරුම කුමක්ද? මෙය තමාට නොතේරුනද මෙහි යම්කිසි අදහසක් තිබිය යුතුය. දැන් රංජිත්ට මෙහි අදහස තේරුම් යන්නේ ය. අතපත්තු මහතා මහජනයා ඉදිරියෙහි එක්තරා මහඟු ගුණධර්මයන්ගෙන් සමන්විත පුද්ගලයෙකු හැටියට කැපී පෙනී සිටීමට ආශා ඇත්තෙකි. එවැනි දුර්වලකමකින් පෙලෙන ඔහු ඉතා සියුම් ආකාරයකින් මහජනයා අතර ප්‍රසිද්ධියක් ලබාගැනීමේ කූටෝපක්‍රමයන් දනී. ඉන් එකක් නම් ආගමත් භාෂාවත් සම්බන්ධ ව්‍යාජ සටනක් ඇරඹීමය. මෙතෙක් සිය මාමාගේ ව්‍යාජ ගතිගුණ මැනවින් අවබෝධ කොටගත් රංජිත් ඔහුගේ දියණිය කොයි ආකාරයකින් සිය පියාණන් අනුගමනය කරන්දැයි දැනගැනීමෙහි නිරත විය. මෙය පළමුව සිතූ තරම් භාර දූර කාර්‍යයක් නොවීය. පියාගේ ව්‍යාජ ආටෝපය මධ්‍යයෙහි නිර්මලාගේ ඍජුගුණය වඩාත් කැපී පෙනෙන්නට විය. සිය පියාගේ අහංකාර ගතිගුණයන්ට අභියෝග කරන්නාක් මෙන් ඈ නිහතමානීභාවයේ අගතැන් පැමිණ සිටියාය. ඇතැම්විට පැහැපත් මුහුණක් අධික කුසීතභාවය සැඟවීමෙහි නියැලුණු



නමුදු නිර්මලාගේ අධ්‍යාත්මික පවිත්‍රතාවය ඇගේ සුන්දර රුව තවත් පැහැපත් කළේය. ඈ අහිංසකභාවයේ සංකේතයක් බඳු වූවාය. දිනක් ඈ රංජිත්ට මෙසේ පැවසුවාය. "කුමක්ද, තරහ වෙනවා කියන්නේ, මා එක්ක කවුරුත් තරහ නෑ." සිය පියා පොහොසතෙකුයයි මාන්නාධික හැඟීමක් ඈ තුළ කිසිවිටකත් නොවීය. ඉතා පහත් තත්වයේ මිනිසාටත් උසස් තැනැත්තාටත් ඈ ළඟ වූයේ එකම මනහර සිනාවය. දිනක් රංජිත් එක් පාඩමකට අයත් රූමත් ධනවත් කාන්තාවක් ගැන සඳහන් කරන අතර, "ඇයි නිර්මලා, ඔබත් මෙසේ ධනයෙන් ආඪ්‍යවූ කෙනෙකු නොවේදැයි, ඇසූවිට ඇගේ පැහැපත් මුහුණ මඳක් අඳුරු විය." අද ඇතිවී හෙට නැතිවී යන කිසි දෙයක් මා අගය කරන්නේ නැතැ"යි ගැඹුරු බසින් ඈ දෙඩන්ට වූවාය. බුදු දහම වචනයෙන් නොදනිතත් ඈ එය කොතෙක් පිළිපදීද යන්න වටහා ගැනීමට රංජිත්ට මෙයම සාධකයක් විය.

සියලු ගතිගුණයන්ට වඩා කැපී පෙනී ගියේ නිර්මලාගේ සැඟවී තුබූ බුද්ධිමත් භාවයම විය. යමක් තේරුම් කොට දීමට පෙර ඈට එය වටහා ගැනීමේ ප්‍රතිභා ශක්තියක් ඈ තුළ විය. යම් යම් දේ තත්වාකාරයෙන් අවබෝධ කොට ගත් නිර්මලා සිය පියාණන් ගත් අඩිපාර ගැන පිළිකුල් ගතියක් පෙන්වූ නමුදු පීතෘ ගෞරවය උඩ ඈ ඒ ගැන කිසිම අමනාපයක් නොදැක්වූවාය. රංජිත්ගේ ගතිගුණ සිය පියාණන්ට වඩා අතිශයින් ඈත් වූ බැවින් ඈ තව තවත් රංජිත් කෙරෙහි ඇල්ම ඇතිකර ගත්තීය. මෙසේ නොබෝ කලක් යන්ට පෙර අන්‍යෝන්‍ය ප්‍රේමය නැමති සියුම් හැඟීමෙන් දෙදෙනා වෙලාගනු ලැබීය. නමුත් ඒ බව ඔව්හු රහසේ තබාගත්හ. රංජිත් තමාගේ සිතට නැඟුණු අදහස් නිර්මලාට නොකීවක් මෙන්ම නිර්මලාද තමාගේ සිත්හී හටගත් යම් යම් අරමුණු වේදනාවෙන් මුත් සඟවා සිටීමට ඉටාගත්තාය.

ජ්‍යෙෂ්ඨ විභාගය අවසන් විය. ඒ සමඟම සිය දියණිය හා බෑණා අතර ඇතිවූ සමගිය අත් හැරේය යන්න අතපත්තු මහතාගේ එකම අභිප්‍රාය වූ නමුදු, දෙදෙනාගේ මිත්‍රත්වය

UPLOADED BY ELIFE

වැඩියක්ම කැපී පෙනෙන්නට වන. අතපත්තු මහතා මේ ගැන කලබල වූ නමුත් දෙදෙනාගේ මුහුණට කිසිවක් කීමට බියවිය. අතපත්තු මහතා එසේ බියවූයේ අන් කරුණක් නිසා නොව යම් යම් අවස්ථාවන්හිදී තෙමේ රංජිත්ගේ උදව් උපකාර බලාපොරොත්තුවූ නිසාය.

පියාගේ සිත්හි බලපෑ අදහස් කිසිවක් නොදත් නිර්මලා නිරන්තරයෙන්ම රංජිත් හමුවීම බලාපොරොත්තුවෙන් කල් ගත කළාය. සිය මාමාගේ අදහස් වටහා ගැනීම රංජිත්ට අමාරු කාරියක් නොවීය. සියඹලාගහ වලව්ව අත්හැර කොළඹ පදිංචියට යාමට රංජිත් සිතුවාර බොහෝ විය. ඔහු මෙසේ කළහොත් මාමා අමනාප වන්නේය. "ජේනවාද උගේ වැඩේ කරගන්න තෙක් සිටියා. දූන් මට වැඩ කරදීමට සිදුවෙයි කියා මෙහෙ අත්හැර ගියා" යන වචන අතපත්තු මහතා නොඅනුමානවම කියන්නේය. ඒ හැර නිර්මලා අත්හැර දමා යෑම නම් ඔහුට කළ නොහැක. ඔහු කීප විටක්ම නිර්මලා සිතින් ඉවත් කළ නමුත් එය නිෂ්ඵල කාරියක් බව හැඟෙන්නට වන.

කඩුල්ල හදන්ට පෙර එය පනින්නට ලෑස්තිවීම නුවණට හුරු ක්‍රියාවක් නොවේ. එන දෙයක් බලාගන ඒ අනුව ක්‍රියාකරමියි තරයේ ඉටාගත් රංජිත් සියඹලා ගහ වලව්වෙහිම රැඳී සිටියේය.

අතපත්තු මහතාගේ හිත ඉතාමත් අවුල්ව පවතින අවස්ථාවක ජ්‍යොෂ්ඨ විභාගයේ ප්‍රතිඵල නිකුත්විය. නිර්මලා ගෞරව සහිතව සාමාර්ථය ලබා තිබුණි. අතපත්තු මහතාගේ සිතේ කොතෙක් කුහුල තිබුණද කිවහොත් රංජිත්ට ස්තුති කිරීම පවා ඔහු අතින් නොකැරිණ. එහෙත් නිර්මලාගේ ගතිගුණ ඊට ඉඳුරාම වෙනස් විය.

සිය පියාගෙන් අතපසුවූ සැම දෙයක්ම නො අඩුව නිර්මලාගෙන් ලැබෙන්නට විය. "මට වෙහෙස මහන්සිය



නොබලා ඔබ කල උදව් උපකාරයට මට දෙන්නට කිසිවක් නෑ." නිර්මලා බැගෑපත්ව කීවාය.

"මා කළ සුළු දෙයට කිසිවකුගෙන් කිසිවක් බලාපොරොත්තු වන්නේ නෑ. නංගීට අත්වූ සාමාර්ථය මට ලැබුණු දෙයක් ලෙසටයි මා සිතන්නේ" රංජිත් පිළිතුරු දුන්නේය.

"ඇයි මට නංගි කියන්නේ, අද පටන් මම නිර්මලා, ඔබ රංජිත්, අප එකිනෙකාට කථා කරන විට සහෝදර ඇමතීම අත්හැර නියම මිතුරන් මෙන් කථා කරමු." හදිසියේම නිර්මලාගේ මුවින් පිටවිය.

මේ ඇසූ රංජිත්ගේ සිරුර රත්වී සිත්හි අධික වේගයක් ඇති වූයේ නමුදු ඒ බව නොහඟවා නිර්මලා සමඟම සිනා තෙපුලෙන් කතාකරන්ට විය.

සැඩ හිරු රැස් මැලවී ගොස් සියඹලාගහ වත්තෙහි මහා රූස්ස ගස්වල අතු අතරින් එළිය වැටෙන්නට විය. සන්ධ්‍යා සිසිල් මදනල ගඟ හරහා හමන්නට වන. නිර්මලා සහ රංජිත් ගඟ අද්දර විශාල පස් කණ්ඩියක් මත වාඩි වී පිළිසඳර කථාවෙහි යෙදී සිටියහ. "මේ ගඟ දෙපසෙහි බලන සැම අවස්ථාවක්ම මට දැනෙන්නේ මේ ගඟත්, මගේ ජීවිතයෙහි කොටසක් කියා. මා ඉපදුනෙත් ගඟ ළඟ, වැඩුනේත් ගඟ ළඟ. ඒ නිසාවත්ද?" රංජිත් මෙසේ කියා ගඟින් කොටසක් තමා ලබා ගත්තාක් මෙන් දිගු සුසුමක් ඉහළට ගත්තේය. "අනේ රංජිත් එසේ කියන්ට එපා, අද දවසේ කී දෙනෙක් ලතවෙනවාද, ගඟ අද්දර ජීවත්වීම භයානකැයි කියා, එහෙත් ඒ දුප්පත් ජනයාට යන්ඩ වෙන තැනක් නෑ. ගඟ ඉහළ ඉන්න අපට කිසිම අනතුරක් ජේන්නේ නෑ, නොවෙද?"

"මම ඔවුන් ගැන අනුකම්පා නොකරනවා නොවෙයි නිර්මලා! මා ඔබට කීවේ මගේ හැඟීම පමණයි."

UPLOADED BY ELIFE

"මම ගඟට රුචියක් දක්වන්නේ නැතුවා නොවෙයි. රංජිත්! ගංවතුර වරක් ගලා මේ අවට මිනිසුන් දුගී භාවයට පත්කොට මා පමණක් එයින් බේරී සිටිනවා යන එකයි මට ඉවසන්නට බැරි. ගඟ ඉදිරිපත් වන්නේත් නැති බැරි අයට පහර දෙන්ට නොවේද?"

"ඒ ලෝකේ හැටි තමයි, කාගේනුත් පහර වදින්නේ නැති බැරි අයට තමයි."

"ඇයි? එවැනි තත්ත්වයක් ඇතිවෙන්නේ ඇයි? එකෙකු දුකට භාජන වෙද්දී අනෙකා පහර දෙන්නේ ඇයි?" නිර්මලා සුසුම් ලෑවාය.

"ඕවා කියා දෙන්ට ගියොත්, නිර්මලා තවත් සුසුම් ලනවා පමණයි."

"එකකු දුක් විඳිනවා බලා සිටියදී මට නම් විඳින ඒ සැපතෙහි තේරුමක් නෑ."

"මම නිර්මලාට ලක්ෂණ කථාන්තරයක් කියන්ඩ බලා-පොරොත්තු වුණා. නිර්මලා වෙන දෙයක් ගැන කථා කරලා, දැන් මට කියන්ඩ ආ දේත් මතක නෑ." රංජිත් මෙසේ කීවේ නිර්මලාගේ අනුකම්පා සහගත සිත අන් අතකට හැරවීමේ බලාපොරොත්තුවෙනි.

"අනේ කියන්ඩ, රංජිත් කියන්ඩ, කුමක්ද ඔබ කියන්ඩ සිටිය ලස්සන කතන්දරය." නිර්මලා මහත්සේ කොතුහල වූවාය.

රංජිත් අන් අතකට හැරී වාඩි වී ගඟ එගොඩ එළිකරන ලද උස් භූමියක් පෙන්වීය.

"නිර්මලාට පෙනෙනවා නොවේද අර ඈත පෙනෙන උස් බිම? එතැන කවදාවත් ගංවතුරට යටවන්නේ නෑ. එතැන සිට සැතපුම් ගණනාවක් ගඟ පෙනෙනවා. එහි සිට බලන්නෙකුට පෙනෙන රමණීය දර්ශනය ඉතා චමත්කාරයි. මම ඒ විශාල ඉඩමෙන් අක්කරයක් මිලදී ගත්තා."



"ඒ කුමටද?" නිර්මලා කලබල වූවාය.

"ඒ කුමටද අහන්නේ? මම සැමදම මෙහෙ නැවතිලා ඉන්නේ නෑනේ. නිර්මලාට මෙහේ තනිව බාරදීලා කවදාහරි මම මෙතැනින් ඉවත්ව යන්ඩ එපායැ. ඉදින් මම ලක්ෂණ ගෙයක් හදගෙන එතැනට පදිංචි වෙන්ඩ යනවා."

"තනියම?" නිර්මලාගේ මුහුණ මඳක් අඳුරුවිය.

"නෑ කව්ද තනියම ජීවත්වන්නේ? මම වැඩිකල් නො ගොස් විවාහ වීමට බලාපොරොත්තු වෙනවා."

මුහුණෙහි තුබූ පැහැපත් සවභාවය නැතිව නිර්මලා මඳක් කල්පනාවක මෙන් සිට තවත් ඉවසා ගත නොහී රංජිත්ට කථා කරන්ට තැත් කළාය. එහෙත් ඇගේ මුවින් වචන පිට නොවීය.

"නිර්මලා ඉතින් ඇසුවේ නෑනේ මගේ සහකාරිය කව්ද කියලා" කියමින් ඇගේ පහත්ව වැටී තුබූ මුහුණ දෙසට එබී බැලීය.

තෙත් වූ ඇස් දෙක මහත් සේ අරිමින් නිර්මලා හිස ඔසවා රංජිත් දෙස බලාගෙනම සිටියාය. "ඉතින් කියන්ඩ, රංජිත් කව්ද ඔබේ සහකාරිය?"

රංජිත් මීට පෙර කිසිකලෙකවත් නොපෙන් වූ මෘදු බැල්මකින් නිර්මලාගේ මුහුණ දෙස බලා සිටියේය.

"නිර්මලා අත ළඟ පත්මයක් තිබියදී මල් සොයා මඩෙහි එරෙන්නේ කව්ද? ඉදිරියේ වටිනා මැණිකක් තිබියදී සුනු ගල්

UPLOADED BY ELIFE

අසුලන්නේ කුමටද? මට අන් බලාපොරොත්තුවක් නෑ. මගේ එකම-

ශබ්දයක් ඇසී දෙදෙනම තිගැස්සී වටපිට බැලූහ. සැමී ඒ අසල විය.

"පුංචි මාත්තියා පුංචි මෙනිකේ කතා කරන්ඩ යේකට කමෙක් නේ ලොකු මාත්තියා කිව්වා, කතා කරන්නේ මොනවාද කීල ළඟට අවිල්ලා ආගෙන අවිත් කියන්ඩලු මම ආං ඉඳල කියනවා. ඒක මොකද? පුංචි මාත්තියා. ඒතර ඔදයි. පුංචි මෙනිකේ ඊටත් ඔදයි. ඉතින් ඔද මිනිස්සුලා එක්ක තමයි අපිල යාලූ. මම කීන්නේ ඇමදම පුංචි මාත්තියා තමයි පුංචි මෙනිකෙට ඔදකීල. අපොයි යේකට මොකද ලොකු මාත්තියා තමයි ඉතේ තිනවා රජ්ජුරුවන්ගේ පුතා තමයි. අපෝයි!" මෙසේ කියා සැමී මඳක් වටපිට බැලීය. "ලොකු මහත්තියා තමයි දෙන් අරිම වශයි. ඉතින් මං කීන්නේ මොකද අපිලාත් මනුෂ්‍යුනේද, ලොකු මාත්තියා දෙන් ඉන්නේ උඩ! අරිම උඩ අපිලාට අල්ලන්ඩ බේ. අපිල කීන යෙක නෙමේ ආන්නේ. ලොකු ලොකු ආයෝ කීන යේක තමයි. යේකට මොකද පසුගිය සෙරේ මාත්තියා පෙරදෙනවා පුංචි මාත්තියා නිඳි මරාගෙන වෙඩ කෙලේ නැතිනම්. ඒත් ඔදක් කීනවාද? නේ! කවදවත් ලොකු මාත්තියා සතුටු කරන්ට කවුරුටවත් බේ.-"

රංජිත් සහ නිර්මලා හුන් තැනින් නැගිට ආපසු ගෙදර දෙසට පා තැබූහ. මෙතෙක් වේලා සැමීගේ කථාවට සවන් දුන් නිර්මලා මඳක් අන්දුන් කුන්දුන් වූවාය. රංජිත් ද සිය කාමරයට වී බොහෝ වේලා මේ ගැන කල්පනා කරන්ට වූයේය. "මාමා අප දෙදෙනා ගැන සැක සිතනවා. ඒ නිසා තමා මගෙන් කිසිවක් නො අසා ඔත්තු සැපයීමට වෙහෙස වන්නේ! සැමී මටත් නිර්මලාටත් ආදරෙයි. එම නිසාම තමයි අපට ඔහු මේ ගැන කීවේ! තව කීදෙනෙකුට අප ගැන සොයා බලන්ට කියා



ඇද්ද? එන තත්ත්වය වැඩි ශුභ ඵල නෑ. මම මේ ගෙදරින් අස්නූවූවත් යන්න සිදුවෙනවා නො අනුමානයි. එබැවින් මඳක් සැකසුරුවමින් වැඩකටයුතු, යයි රංජිත් සිතා ගත්තේය.

පසුදිනම අතපත්තු මහතා රංජිත්ට ආමන්ත්‍රණය කොට මෙසේ කීයේය. "රංජිත්! උඹ මෙතෙක් කල් මට කළ උදව් උපකාර ගණනක් නෑ. ඒ ගැන මා නොකීවත් නුඹ දන්නවා ඇති. මෙවර මගේ හිතේ තියනවා ගම් කාර්‍ය්‍ය සභාවේ අසුනක් දිනා ගැනීම පමණක් නොව ගම් කාර්‍ය්‍ය සභාවේ සභාපති පදවියටත් තරඟ කිරීමට. ඊට මම අනිකුත් සභිකයන්ට සුළු සුළු වාසි කර මම ඔවුන්ගේ චන්දය ලබාගන්නවා. එය මට පහසුවෙන්ම කළ හැකි වැඩක්. තවද මගේ අදහස නිතරඟයෙන් පත්වීමටයි. එතකොට නම්බුව වැඩියි. දැනටමත් සභිකයින් දස දෙනාගෙන් සයදෙනෙකු මගේ පැත්තට හරවාගන තිබෙනවා. උන් කථාවට දක්ෂවූවත් අතේ තුට්ටුව නැති එව්වො! සුළු මුදලකට ඔවුන්වත් හරවා ගැනීම බැරි නෑ. ගම්කාර්‍ය්‍ය සභාවේ සභාපති පදිවියත් සමඟම මට අත්වෙනවා ගෞරව සම්මාන රාශියක් ආණ්ඩුවෙන්; ඒ වෙනුවට ගෙදර විශාල උත්සවයක් පැවැත්වීමයි මගේ බලාපොරොත්තුව. ඊට පසුව මට ඇත්තේ තව එක වැඩයි. එනම්:- මගේ දුවණිය නිර්මලාගේ විවාහය සිදු කිරීමයි. රටේ ඉන්න ඉතාම උසස් වැදගත් පවුලක කෙනෙකුට ඈ දීමටයි මගේ සිතේ ඇත්තේ! එහෙම නොවේද හොඳ? දැන් ඒ ළමයාට සල්ලි තිබෙනවා; උගත්කම තිබෙනවා; ලස්සන තිබෙනවා; ඊටත් වඩා හැදිච්චකම තිබෙන්වා; ඉතින් මගේ අදහස් විදියට හොඳ කටයුත්තක් කරන්ට බැරිවෙන්නේ නෑ නොවේද?"

මෙතෙක් වේලා නිහඬව බලාහුන් රංජිත්ට කවුදෝ විසින් උගුර යටින් "ඔව්" යන්න කියනු ඇසුණි. ඒ තමාම නොවේදැයි මඳක් තිගැස්සී සිටි ඔහුට කල්පනා විය.

අද මාසෙ පස්වැනිදා; සභාපති තෝරන්නේ දහවෙනිදා; උත්සවය පවත්වන්නට යන්නේ පසළොස්වැනිදා පමණ එහි

UPLOADED BY ELIFE

කටයුතු සියල්ලක්ම උඹට බාරයි. සල්ලි යනවා නොබලා හොඳින් වැඩේ පමණක් මට කරදෙන්ට ඕනෑ. ගමේ සහ අවට සිටින ප්‍රභූන් පන්සියයක් පමණ ඒවියයි මගේ කල්පනාව. මේ උත්සවය මම පවත්වන්නේ මගේ දුවගේ විවාහ උත්සවය කොතෙක් ඉහළින් ගත හැකිදැයි මැණ ගැනීම පිණිසයි. දැන් මම ඒ කෙල්ලට අසාගන එනවා මහා විශාල තැන්වලින්. මම නොවෙයි ඒ එකකටවත් වචනයක් දුන්නේ." මෙසේ කියා නිමවී සිය හපන්කම් ගැන අධික සන්තෝෂයක් දක්වන්නාසේ උඩ බලා මඳ සිනාවක් පහළ කෙළේය. රංජිත්ට මාමා ළඟ මොහොතකටවත් රැඳී සිටීම පවා නුරුස්නා කරුණක් විය.

"ඉතින් මම යන්ඩද?" ඔහු විචාළේ ය.

"ආ! මට තව එකක් කියන්ඩ තියෙනවා" කියමින් අතපත්තු මහතා මඳක් පැකිලෙන්නට විය. "මේ....... මේ....... ළමයට මම මීට කලිනුත් කියන්ඩ තමයි හිටියේ මේ....... අහල පහළ මිනිස්සු මගේ දූ ගැන නොයෙකුත් ඕපා දූප කියනවා කියා ආරංචියක් ලැබී තිබෙනවා. ඒ සියල්ලම වෙන්නේ මේ ළමයා ගෙදර ඉන්න නිසා විය හැකියි. එබැවින් මේ මාසේ අන්තිමට පුළුවන් නොවේද මේ ළමයාට කොළඹ නවාතැනක් සොයා ගන්ඩ?"

"ඔව් මට අද වුවත් පුළුවනි, කොළඹ මගේ යහලුවෝ සිටිනවා." රංජිත් විගස කීය.

"නෑ, නෑ, එහෙම කලබල වෙන්ට උවමනා නැහැ. හැබැයි. මේ ඉන්න දවස් ටිකේ නිර්මලාගෙන් හැකි පමණ මඟහරින්ට ඕනෑ. ඈ සමඟ කථාවට සූදනම් වන්ට එපා නිකම් කතාවලට ඉඩ තියෙන්නේ මොකටද?

ශීඝ්‍රයෙන්, සීරුවෙන්, ඉතාමත් ප්‍රයෝගාකාර අන්දමින්, අතපත්තු මහතා මෙසේ රංජිත් ඉදිරියේ සිය අදහස් ප්‍රකාශ කෙළේය. දැන් ඉතින් සියල්ල හමාරය. අවට කිසිවෙකු නිර්මලා



සම්බන්ධව හෝ තමා ගැන කිසිම අපහාසාත්මක කථාවක් ඇතිකර නැති බව රංජිත් දන්නේ ය. නිර්මලා ගෙදර හැසිරෙන්නේ කිසිවකුගෙන් ගැරහුම් ලැබිය යුතු අන්දමකට නොවේ. දැන් ඉතින් රංජිත්ට දැනගත යුතුව තිබුණ අවශ්‍යම කරුණ එළිපිටම වුවමනා අයගෙන්ම ප්‍රත්‍යක්ෂ විය. සිය මාමණ්ඩිය කීවා මෙන් නිර්මලා දෙස බැලීම නොවටී. නිර්මලා කෙබඳු තැනැත්තියක් ද කියා සැමටම වඩා රංජිත්ට අවබෝධය. ඈ ඍජුය, නොසැලෙන සුළුය, එමෙන් වෙඬරු පිඩක් මෙන් උණු වන හදවතක් ඇට තිබේ. මෙවැනි තැනැත්තෙකු ගේ හෝ තැනැත්තියකගේ සිත සමඟ සෙල්ලම් කිරීම ඉතා දරුණු ක්‍රියාවකි. නිර්මලාට කෙසේවත් මේ බව අවබෝධ නොකට යුතුය. නිර්මලා තමා ගැන යම් කිසි බලාපොරොත්තුවක් ඇති කරගෙන තිබෙන බැව් රංජිත් දනී. දැන් ඉතින් කළයුතු එකම දෙය නම් ඈට හිත හදා ගැනීමට ඉඩ තබා ඇගෙන් වෙන්ව සිටීමය. මෙසේ කාලයාගේ ඇවෑමෙන් සියල්ල අමතක වනු ඇතැයි රංජිත් සිතට ගත්තේය.

සති අන්තය සිය මැණියන් සමඟ ගතකිරීමට බලාපොරොත්තු වූ හෙතෙම කිසිවෙකුට නොකියාම සෙනසුරාද වැඩ නිමවී හංවැල්ල බලා පිටත් විය. අසරණ නිර්මලාට රංජිත්ගේ මේ අමුතු ක්‍රියාව විඳිය නොහැකි වූ ශෝකයක් බවට පෙරළුනි. රංජිත් හදිසියෙන්ම වාගේ මෙවැනි පියවරක් ගත්තේ කිම් දැයි ඈට සිතිය නොහැකි ප්‍රහේලිකාවකි. මෙසේ තමාගේ පරිතාපය අන් කිසිවෙකුට නොඅඟවා ඈදට වී කල්පනාවෙන් කඳුලු සැලූ අවසථාවන් බොහෝය.

"රංජිත් කිසි විටක වත් මගේ සිත පාරන්නේ නෑ. මා අතින් ඔහුට යම් වරදක් සිදුවී තිබෙනවා! මෙය බේරා ගත හැක්කේ රංජිත් හමුවීමෙන් පසුවයි. කෙසේ නමුත් ඔහු මුණ ගැසිය යුතුය"යි තරයේ අදිටන් කර ගනිමින් ඈ සිත මඳක් සනසා ගත්තාය.

UPLOADED BY ELIFE

ජුවානිස් අතපත්තු මහතා සති අන්තය නික්මෙන්නට පෙර නිතරඟයෙන් කැලණි ගම් කාර්‍ය්‍ය සභාවේ සභාපති ධූරයට පත්වූයේය. ඒ සමඟම සමාදාන විනිශ්චය කාර පදවියද ඔහුට අත්විණ. එදින දවල් වරුවේ අතපත්තු මහතා ගෙදර පැමිණියේ මහ පෙරහැරකිනි. ඔහුගේ මුහුණ වැසීයන තරම් මල් මාලා අවට ගම්වාසීන් විසින් පළඳවා තිබුණි. ඔහු එද ගෙදරට පැමිණියේ මංසන්ධි හයක් පසු කළ යුතු වූ මහා දික්වූ මාර්ගයෙකිනි. ගම් කාර්‍ය්‍ය සභා මන්දිරයේ සිට සියඹලා ගහ වත්තට ඇත්තේ සැතපුමක් දිග පාරක්ය, ඔහු එම පාර අත්හැර දිග පාරකින් ගමන් ගත්තේ අන් කරුණක් නිසා නොව තමාට අත්වූ විජයග්‍රහණය පළාතේ වැඩිදෙනෙකුට පෙන්වීමේ එකම බලාපොරොත්තුවෙන්ය. අතපත්තු මහතා මෙසේ මහජනයාගෙන් ගරු සම්මාන ලබා ගැනුම්වස් යෙදූ කුටෝපායයන් සියල්ලක් ගැනම මනා අවබෝධයක් ඇත්තේ රංජිත්ට පමණය. සභාපති තුමාගේ ගෙලවට පළඳවා තිබූ මල් මාලා සියල්ලටම වාගේ මුදල් ගෙවා ඇත්තේ ඔහුම බව මහජනයා නොදත්හ.

සභාපති පදවිය පිරිනැමීම සම්බන්ධව පැවැත් වූ උත්සවයද කිසිවකු නොසිතූ තරම් අත්‍යාලංකාරයෙන් සිදු විය. එදින සියඹලා ගහ වලව්ව මිහි බට සුරපුරකි! අවට සිටි ගම්වාසීනට සැණකෙළියකි! කල්වේලා ඇතුව ගම්වාසීහු වත්ත වටකර පිරිවරා ගත්හ. උත්සවය පිළිබඳ සෑම බරක්ම රංජිත් කරපිට පැවරී තිබුණි. යම් වැඩක් බාරගත හොත් කිසිම අඩු පාඩුවක් නො කොට හැකිතාක් අංග සම්පූර්ණව ඉටුකිරීම රංජිත් සතු පරම ගුණාංගයකි. මේ සඳහා දෙදිනක්ම රංජිත් සිය කාර්‍ය්‍යාලයෙන් නිවාඩු ලබාගත්තේය. උත්සවයට එන ප්‍රභූන් පිළිගැනීම සඳහා කුඩා වේදිකාවක් සමඟ මඩුවක් සද එය මාලා කර්ම ලතා කර්මාදියෙන් මොනවට සරසා තිබුණි. කිසිම දෙයක් කිරීමට වත් අතපත්තු මහතාට සිහියක් නැත. තමාට අත් වූ පදවියේ තේජස් මහිමය රස විඳිමින් නොසන්සුන් භාවයට පත් හෙතෙම අත්



යුවළ පිටු පසින් අල්වාගෙන ඒ මේ අත සක්මන් කළේය. සවස උත්සවයේ ප්‍රභූන් පිළිගන්නා අවස්ථාව එළඹියේය. වැලනොකැඩී මොටෝ රිය වලව්වට ගලා ආහ. මේ අතර රංජිත් ගේ වැඩ නිමාවට පත් වූ බැවින් තෙමේ සිය කාමරයට වී දෙර අගුල්ලා කල්පනාවක යෙදී සිටියේය. ශබ්ද වාහිනී යන්ත්‍රයක් රංජිත් ගේ කාමරයෙහි ජනේලය අසල සවිකොට තුබූ බැවින් ශුභ ප්‍රාර්ථනා කරන්නවුන්ගේ චතුර කථාවන් අසාගන සිටීමේ අවස්ථාව ඔහුට ලැබිණ.

මුදල් අත ඇත්තාට අනුගාමිකයන් හා යහළුවන් ගෙන් අඩුවක් නැත. මොව්හු මුදල් ඇත්තාගේ ඇති නැති ගුණ ගයමින් මුදල් ඇත්තා කුල්මත් කරති. ගැමි පිරුළෙන් මොවුනට ව්‍යවහාර කරන්නේ, පන්දන්කාරයන් කියාය. මුදල් ඇත්තා යම් දෙයක් කළේ නම් එහි ගුණ දෙස් විවේචනයක් නොමැතිවම අනුචරයෝ එය හිස් මුඳුනෙන් පිළිගනිති. මෙය තමා වත්මන් ලක්දිව ඇති මහා බිය ගෙනදෙන රෝගය! මෙහි රහස නම් මේ අනුගාමික ලිහිණියන් මුදල් කාරයාගෙන් යම් යම් අයුතු ලාබ ප්‍රයෝජන බලාපොරොත්තු වීමය.

"අතපත්තු මහතා නිතරඟයෙන් අප ගම් කාර්‍ය්‍ය සභාවේ සභාපති ධූරයට පත්වීමෙන් එතුමාගේ ජනප්‍රිය භාවය කෙබඳු දැයි දැනගතහැකිය"යි එකෙක් කීය. "අතපත්තු මහතා තරම් ශ්‍රේෂ්ඨ දන පතියෙක් මුළු ලෝකයේම නැති තරම් ය"යි අනෙකෙකුගේ මුවින් පිටවිය." අතපත්තු මහතා වැනි උදර නිහතමානී ගුණාංගයන් ගෙන් සමන්විත පුද්ගලයෝ අප රටෙහි විරලය"යි කීවේ අතපත්තු මහතා ගේ නියම ගතිගුණ හොඳින් දත් කපටියෙකි.

ශබ්ද වාහිනියෙන් පිටවී එන සෑම වදනක්ම රංජිත්ට පෙනුනේ තමා වෙත එල්ලකළ සර ප්‍රහාරයන් මෙනි. මෙය තවත් අසා සිටිනු නොහැකිව හේ නැවත දෙර හැර බරාදය

UPLOADED BY ELIFE

දිගේ ගොස් කිසිවකුහට නොපෙණෙන සේ පළමු පුරුදු පිය ගැට පෙළ අසල තුබූ කොට තාප්පය මත අත්දෙක තබා ඈත බලමින් තමාගේ සිත් තුළ රැගුම් දෙන අදහස් සියල්ල නැවත නැවතත් මෙනෙහි කරන්නට වූයේය.

"පුදුම ලෝකය! කවුරුත් මීට පෙර නො ඇසූ නුදුටු විරූ පුදුම ලෝකය! සත්ගුණතාවය, නිහතමානිත්වය, කරුණාධ්‍යාශය මුදලත් බලයත් පදවියත් සමඟ එක්වූයේ කෙසේද?" රංජිත් තමාටම කියා ගත්තේය.

"ඔබ අදද මේ සත්‍යය අවබෝධ කොට ගත්තේ?" හඬක් ඇසුනි. "මේ තත්ත්වය ඔබ රටේ මුල් බැස ගෙන ඉවරයි. ආපසු යෑමෙක් නෑ. මේ තමා නූතන යුගයේ අර්ථ සිඩියේ රහස"!

රංජිත් වටපිට බලා කිසිවකු නොදක තවත් දේ මෙනෙහි කෙළේය. "හාං, මේ තත්වය කෙසේ නමුත් මැඩ පැවැත්විය යුතුයි.

ගැරහුම් සිනාවක් ඔහුට ඇසිණ. "ඔබ කෙසේද මෙවැනි බියකරු තත්වයක් මැඩ පවත් වන්නේ?"

"ව්‍යාජ අදහස් වලට එරෙහිව ඍජු ගුණය දක්වීමෙන්! වංචා කාරයන්ට විරුද්ධව අවංක ප්‍රතිපත්ති සටනක් කිරීමෙන්"

තව වරක් ඔහු ඉදිරියේ සාවඥ සිනාවක් විය. "දෙරණ කඩාගත යන මහා ගංගාවක් අත් දෙක ඔසවා නැවැත්විය හැකිද? මේ ඔබේ බහුතර ජනතාව අනුගමනය කරන පිළිවෙත. ඊට හරස් කැපීමෙක් නෑ. ගඟ යන අතට ඔබේ සුක්කානම හරවා ඔරුව පදවන්ට. එරෙහිව නැඟී සිටියොත් ඔබට තැනක් නෑ - විනාශය පමණයි - ඔබට අත්විය හැක්කේ - විනාශය පමණයි.



"නෑ, නෑ, කව්ද වැදිබණ දෙඩන්නේ! බහු ජනතාව නැතහොත් මුළු ලොවම ඉදිරියේ වුවද හඬ නගා ඊට විරුඩව සටනක් මා අරඹනවා. බොරුවෙන් අත්වන්නේ බොරුව පමණයි. මුලාවෙන් යන්නේ මුලාවට පමණයි."

"ඔබේ හඬ කුමක්ද? සීමාවක් නොමැති මරු කතරක් මැද ක්ෂුධාවෙන් පෙළෙන්නකුගේ හඬ අසා සිටින්නේ කව්ද? හඃ හඃ හඃ"

"මගේ හඬ නොඅසනවායයි ඔබ කියන්නේ! මගෙන් නිකුත් වනුයේ හඬෙක් නොවේද?" තව තවත් රංජිත් මෙනෙහි කළේය.

"මහමේරුව මදුරු තුඩින් සිදුරු කළ හැකිද? හස්තියා නිය පොත්තෙන් රිදවිය හැකිද? ඔබේ නිවට හඬින් ආකාශයෙහි ගෙරවීම නැවැත්විය හැකිද? ආපසු හැරෙන්න - ආපසු හැරී ජලය යන අතට ඔබත් යන්න."

"නෑ නෑ කිසි කලෙකත් මගේ ආපසු යාමෙක් නම් නැහැ. මා යන්නේ......"

මෘදු කට හඬක් ඇසී රංජිත් පිටු පස බැලීය. නිර්මලා තමා අසල බව දත් හෝ ලැජ්ජාවෙන් පෙළෙන්නට විය.

"නිර්මලා ඔබ මෙතන කුමක් කරන්නේද"

"මා ඔබ සෙයා ආවා, ඉතින් රංජිත් කියන්න මෙතැන මඳ කළුවරේ සිට කුමක්ද කරන්නේ කියා."

"මම-මම මේ ස්වභාදර්ශණයේ අලංකාරය නරඹනවා."

"ඔබ සොභා දර්ශණය නරඹන්නේ අත්දෙක මෙහෙම ඔසවාලද?" කියමින් නිර්මලා අත්දෙක එසව්වාය.

UPLOADED BY ELIFE

"නිර්මලා කියන්න. කොපමණ වේලාවක් මාදෙස බලා සිටියාද? කියලා" ලැජ්ජාවට පත් රංජිත් විමසන්නට විය.

"නෑ, නෑ, කියල අත්දෙක ඔසවන කොටම මා මෙතනට ආවා."

දෙදෙන මඳක් නිසල වූහ. නිර්මලාද තාප්පය අසලට අවුත් රංජිත්ගේ මුහුණ බැලීමට වෑයම් කළාය. තමන් ඉදිරියේ ඇති වූ නිසලතාවය, ඔවුන්ගේ හෘදස්පන්දනයාගේ වේගයෙන් මඳක් යටවිය. අන්තිමේදී රංජිත් පහත් හඬින් නිර්මලාට කථා කළේය.

නිර්මලා! ඔබ මෙතැන සිටින එක හරිනෑ. ආපසු යන්න. අප දෙදෙනා මේ වෙලාවේ තනිව මෙසේ කථා කරමින් සිටිනවා දුටුවොත් ඔබේ පියා වැරදි සොයයි."

නිර්මලා මේ වදන් නොඇසුනාක් මෙන් රංජිත් දෙසම බලා සිටියාය. "රංජිත් අද දින දූනගත් කරුණක් කියන්ඩයි මා ඔබ සොයා ආවේ."

"ඒ කුමක්ද. නිර්මලා?"

"මගේ පියා තරම් ලොකු ධනපතියෙක් මේ රටේම නෑ. මගේ පියා තරම් ශ්‍රේෂ්ඨ ජනප්‍රිය පුද්ගලයෙක් තවත් ලෝකයේ ඉප දී නෑ. මගේ පියා තරම් තේජවත් මහඟු පුද්ගලයෙක් තවත් ඇත්තේම නෑ. මගේ පියා තරම් නිහතමානී සත්ගුණවත් අයෙක් මේ ලෝකේම නෑ." රංජිත් මඳ කළුවරේ නිර්මලා දෙස බැලීය. පසුව මඳක් බියෙන් මෙන් කථා කළේය.

"නිර්මලා ආපසු යන්න. ඔබ මෙතැන සිටීමෙන් අවැඩක් වෙනවා පමණයි. ඔබේ පියා ළඟට යන්න" අන්තිම වචන සවල්පය ඔහු කියා නිර්මලාගෙන් අඩියක් ඈත් වන්නට මෙන් තැත් කළේය.



"ආපසු යන්ඩද ඔබ කියන්නේ?" නිර්මලාගේ චතුර සවරය මඳකළුවරේ වඩාත් පැහැදිලි විය.

"මගේ ආපසු යාමෙක් නෑ රංජිත්! මා ඉදිරියට තැබූ පියවර පස්සට ගන්නේ නෑ. මා යන්නේ ඉදිරියටමයි."

"නිර්මලා! ඔබේ පියා - ඔබේ පියා - ඔබෙන් බලා-පොරොත්තු වන්නේ කුමක්ද?"

"මගේ පියා, මා ඉදිරියේ එලා ඇති මුදු මොලොක් රත් පලස් උඩ මා ගමන් ගන්නේ නෑ. මගේ ගමන ඇත්තේ ඔබේ පියවර අනුවයි. ඒ බව මම තීරණය කරගෙන කාලයක් වෙනවා."

මැඩ පැවැත්විය නොහැකි වූ සන්තාපයෙන් සැලෙන කටහඬකින් යුතුව නිර්මලා දෙසට හැරී රංජිත් මෙසේ කීයේය.

"නිර්මලා! මගේ ගමන් අනුව පියවර තබන්නේ ඔබ කුමක් බලාපොරොත්තු වෙන්ද? වහා මගෙන් ඈත් වී අන් අතක් බලාගන්න. මගේ පාර ගල්පරවලින් කඳු හෙල් නමැති බාධකයන්ගෙන් ගහනයි. මඩ වගුරු වලින් අපවිත්‍රයි. ඔබේ මුදු මොලොක් පියවර එහි තැබීම කිසි විටෙකත් කළ නො හැකියි."

කවුදෝ නිර්මලාට හඬ ගැසූයෙන් ඈ ආපසු නොබලාම ඒ අත දුවන්නට වූවාය. රංජිත් ද සිය කාමරයට වී දොර වසා නිඳගන්නට තැත් කළේය. එහෙත් නිර්මලාගේ සිත්හි ඇති ගාම්භීර අදහස් ඔහුට විශ්වාස කිරීමට බැරි තරම්ය. නිර්මලාටද සිය පියාගේ ව්‍යාජ දිවිපැවැත්ම ගැන ඇත්තේ තත්වාකාර දූනුමකි. ඈ මේ බව ස්වකීය ඥාන ශක්තියෙන්ම සොයා දූනගන ඊට එරෙහිව නැඟී සිටීමට තැත් කරනවාය. මීට කුමක් කරම්ද? මම නොදනිමි. අපගේ ජීවිතය නමැති ඔරුව පදවන දෛවය නැමති තොටියා මෙය විසඳිය යුතුය. මෙය මිනිස් මොලයකට

UPLOADED BY ELIFE

විසඳිය නොහැකි ප්‍රහේලිකාවකි. තෙමේ මෙසේ සිතා ඒ සිත් තැවුලෙන්ම නින්දට එළඹියේය.

ඉහත සඳහන් සිඪිය ඇති වී ගත වූයේ තෙදිනකි. ප්‍රථම වරට නිර්මලාට සිර කුඩුවක සිටින්නාක් මෙන් දැනෙන්නට විය. රංජිත් සමඟ ඇති වූ සතුටු සාමීචි කථාවන් දැන් කෙළවරය. දැන් ඈට විශේෂයෙන්ම දැන ගත යුතුව ඇත්තේ රංජිත් මෙසේ තමාගෙන් වියෝවීමට අදහස් කළේ කුමන කරුණක් නිසාද? යන්නයි. රංජිත් ගැන මෙසේ සිතත්ම ඇගේ හදවත දෙදරා යන තරම් ශෝකයක් ඈ තුළ ඇති විය. හද පත්ලෙන් නැගුණ ශෝක ගින්නෙන් තමා පමණක් නොව මුළු සියඹලා ගහ වලව්වම ක්ෂණයකින් අළු වී යාදෝ යන සැකයක් ඇගේ සිත්හි බලපාන්නට විය.

ඉකුත් වූ රාත්‍රියේ ඇති වූ අධික වර්ෂාව කරණකොටගෙන කැළණි නදිය ජලයෙන් පිරී ඉතිරී දෙපස ඉවුරු යටපත් කරන්නට විය. දවල් කාලයේ වැස්ස අත්හිටිය නමුදු කඳුකරයේ වැස්ස ඇතිවීම නිසා ප්‍රතාපවත් ලෙස ගඟ ගලා බැස්සේය. එදින නිවාඩු දිනයක් බැවින් රංජිත් සිය කාමරයට වී දෙරගලු ලා පොතක් බලමින් සිටියේය. හදිසියෙන්ම ගඟ අද්දර මහත් ඝෝෂාවක් නිකුත් වූයෙන් රංජිත් කවුළුවෙන් හිස මැත්කොට ගඟපහළ දෙසට නෙත් යොමු කෙළේය. විශාල පිරිසක් ගං ඉවුර දෙස පෙනෙන්නට වූහ. මෙය කුමක්දැයි වටහාගනු පිණිස වහා රංජිත් කාමරයෙන් දෙරට බැස ඒ දෙසට පා නැගීය. ඔරුවක නැඟී ගඟෙන් එතෙරවීමට ආ තිදෙනෙක් ගඟ මැද ඔරුව පෙරළීමෙන් මහත් අන්තරාවකට පත්වී ඇති බව ඔහුට අවබෝධ වූයේ එවිටය. ඔරුවේ ආ තිදෙනාගෙන් දෙදෙනෙක් යම්තම් ගොඩට පීනා පණ බේරාගත්හ. පීනන්ට නොහැකි පසළොස් වියේ ළමයෙකු පමණක් ඔරුවේ එල්ලී මරහඬ දෙන්ට විය. ජලවේගය අනුව ඔරුවද දරුවා රැගෙන මරු සොයා යන්නාක් මෙන් පහළ බසින්නට වන. ගං ඉවුර මත රැස්වූ



අධික ජනකාය අතුරෙන් අතපත්තු මහතා විශේෂ තැනක් ගත්තේය. ජල රකුසාට බිලි වන්නට යන පිරිමි ළමයා අනෙකෙකු නොව කැළණි පාසලේ ප්‍රධාන ගුරුතුමාගේ එකම පුතා බව පණ බේරා ගොඩට පීනාගත් දෙදෙනාගේ මුවින් පිටවිය. ඒ ඇසූ අතපත්තු මහතා කලබල විය. පසුගිය කාලයේදී ගුරුතුමා තමාට කොපමණ උදව් උපකාර කළේද යන බව සිතට නැගෙත්ම වහා මොහු බේරා ගත යුතු බව වැටහිණ. " කෙසේ නමුත් මේ දරුවා බේරා ගැනීමට කෙනෙක් ලෑස්ති වෙන්ඩ ඕනෑ, දරුවා බේරාගත් කෙනෙකුට රුපියල් දහක් මුදලින්." අතපත්තු මහතා ගුගුලේය.

"ඇහෙනවාද, අපේ සභාපති තුමාගේ ප්‍රකාශය! රුපියල් දහක් තෑගිලු." කෙනෙක් කෑගසමින් ජනකාය දෙස බලන්ට වූහ.

ගං ඉවුරේ ජීවත්වුන සේතන් පිහිනීමේ දක්ෂයෙකි.

"සේතන් පලයන්කෝ, සභාපති තුමාගේ වචනය ගරු-කරන්ඩවත්, රුපියල් දහක් කියන එක පොඩි දෙයක්ද? ළඟ සිටියෙක් සේතන් ගඟට තල්ලු කරන්ට ලෑස්ති වූහ. සේතන් ඔහුගේ අත ගසා දමා ඉවතට ඇදී ගියේය.

"අද සැඩ පහර වෙනද වගේ නොවෙයි. හරිම සැරයි. අලියකු වුවත් ගසාගන යයි" සේතන් ගඟට නොබැසීමට කරුණු කියන්ට විය.

ඔරුවේ එල්ලී මරුවා සමඟ සටනක යෙදුන බාලයාද සීරුවෙන් පහළට ඇදෙන්නට විය. ඔහුගේ විලාපය හද කම්පනය කරවයි. ගං ඉවුර ජනයාගෙන් පිරී ඉතිරී ගියත් අසරණ දරුවා බේරා ගැනීමට එකද කෙනෙක්වත් ඉදිරිපත් නොවීය. මේ අතර උපදෙස් දෙන්නන්ගෙන් නම් අඩුවක් නැත.

UPLOADED BY ELIFE

"රුපියල් දෙදහක් දෙනවා! නැද්ද කවුරුවත් මේ දරුවා බේරාගන්ඩ? අපේ මිනිසුන්ගේ හැටි ඔහොම තමයි. උවමනා තැනට එකෙක්වත් නෑ. ඒකට මොකද සොරකමක් කරන්ට නම් ගඟ හරහා රෑ තිස්සේ පීනයි." මෙසේ කීවේ මඳක් වේගයට පත් අතපත්තු මහතාය. මේ අසා හුන් කවුදෝ අයෙක් සේතන් අල්ලා දියට තල්ලු කළේය. සේතන්ද දියේ මඳක් දුර පීනා ආපසු ගොඩට විත් අවට සිටින්නන්ට දෝෂාරෝපනය කරන්ට වූයේය. "මම විතරක් යෑ පීනන්ඩ දන්නේ! ඇයි උඹලාට මක්වෙලාද?" සේතන් මෙසේ දොඩමින් අසල හුන් සීබට් දෙස බැලීය.

"සීබට් අයියේ එදත් උඹනේද ඔරුව පෙරලිච්ච වෙලාවෙ මිනිස්සු බේරා ගත්තේ?"

"එද වගේද බන් අද? උඹට පේන්නෙ නැතිද සුළිය සැරකම" කියමින් සීබට් ද මඳක් ඈත්විය.

"අද හරිම අපල දවසක්. අද ගිරහෙක් මාරුවෙනවා කියලා පත්තරේ තියනවා" එතන සිටි වෘධයෙක් ප්‍රකාශ කෙළේය. රංජිත්ද ගඟ අද්දරට පැමිණියේය.

දැන් ඔරුවද ඈතට ගසාගෙන ගොස් ලොකු සුළියක් වට කැරකේ. ඔරුවේ එල්ලී සිටි දරුවාද ප්‍රාණ භයින් කෑගසයි. ගොඩ සිටියවුන්ගෙන් සමහරෙක් ග්‍රහචක්‍රය ගනිති. තව අයෙක් ගුරුතුමාගේ ළමයාට ගිය කලදශාව ගැන ලතැවෙති. මේ අසලට රංජිත් පැමිණි විට සියඹලා ගහ වලව්වේ ඈත්තෝ මවිතවූහ. මොහු මෙතෙක් ගෙදර සිටිබැව් කිසිවෙක් නොදත්හ. නිර්මලාද කට අයාගෙන ඔහු කුමක් කරන්ට යන්නේදැයි මවිතයෙන් බලා සිටියාය. "මේ ළමයා හෙම ගඟට බහින්ඩ එපා පුරුදුකාරයොත් බෑ කියන වෙලාවේ මොනවටද නිකම් කරදරයට වැටෙන්නේ." නිර්මලාගේ මව කියනුවා ඇසුනි.



මේ කිසිවක් අසා සිටීමට වේලාව නොවේ දැන්, ඒ බව රංජිත්ට පෙණින. වරක් ඔහුගේ කඩවසම් සිරුර තවත් දිගුකොට ඈත අනතුරේ වැටී සිටි දරුවා දෙස නෙත් යොමු කළේය. බලා සිටින සෑම මොහොතක්ම මරුවාට ඉඩදීමකැයි, වටහාගත් මොහු කමිසය ගලවා අත බැඳ තුබූ ඔර්ලෝසුවත් සමඟ බිමට වීසිකොට ඇඳ සිටි කලිසම දෙතුන් පටක් ඉහළට නමා හඬ දෙමින් ගලන ගඟට සැනෙකින් පැන්නේය.

ජලප්‍රවාහය ඔහු සිතුවාටත් වඩා සැරවීය. ඔහු ඉදිරියට පීනත්ම දිය සුළි ඔහු කරකවමින් අන් අතකට හරවන්ට වීය. ගං ඉවුරේ රැස්ව සිටි අය ඇස් දල්වා කට අයාගෙන තරුණ වීරයා සැඩ පහර සමඟ කරන සටන දෙස බලාගත්වනම සිටියෝය. වරක් රංජිත් දිය සුළියකින් යට ගසනවා මෙන් ද තව වරක් ඔහු අන් තැනකින් මතුවෙන්නාක් මෙන්ද පෙනෙන්නට වන.

ජල පත්ලෙන් සූරා ඇදගෙන බසින දිය පහර සමඟ විනාඩි පහක් පමණ වේගයෙන් සටන් කළ වීරයා අන්තිමට ඔරුව ළඟට ගොස් අඩක් සිහිසන්ව හුන් අසරණ දරුවා ගෙන කරපිට නංවා ආපසු ගං ඉවුර කරා පිහිනන්ට විය. ගං ඉවුරේ රැස්ව හුන් විශාල ජනකාය මහත් ජයඝෝෂා නංවමින් රංජිත් ගොඩට පීනූ තැනට දුවන්ට වූහ. සියඹලාගහවත්ත මායිමේ ඉතිරි වූයේ අතපත්තු යුවලත් නිර්මලාත් පමණි. ගං ඉවුර අසල කලබලය කොතෙක් උග්‍රවූයේදයත් රැස්වූ සෙනඟ බිම දමා තුබූ රංජිත්ගේ කමිසය උඩින්ද දුවන්ට වූහ. නිර්මලා වහා නැඹුරුව කමිසයත් ඔර්ලෝසුවත් අතට ගත්තාය.

"වීරයා! වීරයා! අපේ රංජිත් මහත්මයා වීරයා" යන හඬ ඈතින් ඇසෙන්නේය. අධික සන්තාපයකින් වෙළී සිටි නිර්මලා නෙත් අයාගෙන ඒ දෙසම බලාගෙන සිටියාය. රංජිත්ට අනතුරක් නොවීම ගැන සතුටට පත් නිර්මලාට දැන් වැට-හෙන්නේ තමා අත්තටු කපා කූඩුවක දැමූ පක්ෂියෙකු මෙන්ය.

UPLOADED BY ELIFE

හිස ඔසවමින් ඇ යම්තම්වත් රංජිත්ගේ මුහුණ දැක ගැනීමට යත්න දැරීය.

මේ උග්‍ර අවස්ථාවේදී තමා අන්ත පරාජයකට පත් වූයේයයි ද අනෙකකු ජයග්‍රහණය ලබාගත්තේ යයිද, යන වේදනාත්මක හැඟීම් රාශියක් අතපත්තු මහතාගේ සිතෙහි වැඩ කරන්නට විය. අත ගසා දමා ඔහු ආපසු යන්ට හැරුණි.

''වරෙල්ලා ගෙදර යන්ඩ,'' අතපත්තු මහතා සිය බිරිඳටත් නිර්මලාටත් සංඥා කෙළේය. අතපත්තු හාමිනේ ආපසු යෑමට හැරුණාය. නිර්මලා පමණක් සිය පියා කීදේ නොඇසුණාක් මෙන් ඇස පිය නොහෙලා ඈත බලාගෙනම සිටියාය. අතපත්තු මහතා ඇ ඉදිරියට අඩියක් ගෙන ''ඔබට ඇසුනේ නැද්ද මා කී දේ'' කියමින් ඇ අත තිබූ කමිසය දෙස බලන්ට විය. කමිසය ඇගේ අතින් ගිලිහින. ඒ මොහොතෙහි ඇට ගඟින් ඈත්වීම ඉතා දුෂ්කර කාරියක් සේ පෙනී ගියාය. එහෙත් පියාගේ අණට කීකරු විය යුතුය. දිග සුසුමක් හෙලා ඇ ආපසු ගෙදර ගොස් සිය කාමරයට වී දොර වසාගෙන ඈත ගඟ දෙස බලාගත්වනම සිටියාය. රංජිත්ගේ ඔරලෝසුව තමා අත බව ඇ දන්නේ කාමරයට ඇතුළු වූවාට පසුවය. හදිසියෙන් තමාට අත්වූ මහඟු දායාදයක් මෙන් ඇ ඔරලෝසුව දයාවන්ත ලීලාවෙන් තුරුළු කොට ගත්තාය. ඔර්ලෝසුවේ ටික් ටික් යන අනුකරණයෙන්ම ඇගේ සිතද කම්පනය වන්නේය. මෙතෙක් ඇ වෙත නොතිබූ හැඟීම් රාශියකින් ඇගේ සිත දවන්නට විය. ''එක ගෙදර වාසය කළත් අප දෙදෙන ගව්ගානක් එකිනෙකාගෙන් ඈත්ය. මට රංජිත් මුණ ගැසෙයිද? කෙසේ මම ඔහු සමඟ කථා කරම්ද? ඔහු හමු වීමට එක කරුණක් ඇත. ඔහුගේ ඔරලෝසුව මා ළඟය.'' මෙසේ සිතත්ම ගඟ දෙසින් තවත් ප්‍රීති ඝෝෂා ඇසුණි. ඒ සමඟම සිය පියාණන් විසින් ගෙනහැර දක්වූ අමනොඥ ක්‍රියා කලාපය ඇට මෙනෙහි විය. 'රුපියල් දාහක් දෙන්නම් දෙදාහක් දෙන්නම්' කියමින් වහසි බස් දෙඩූ ඔහු සිය දිවි



නොතකා රුදුවන් ජල රකුසාගේ කටට පැන මාරාන්තික සටනක යෙදී සිටි අසරණයා මුදාගත් වීරයා දෙස බැලුවේ වත් නෑ නොවේද? රංජිත් මේ ගැන කුමක් සිතයිද? මපියාණන් රංජිත් සමඟ ඇතිකර තිබෙන අමනාපය කුමක්ද? මීට කරුණු වහා සෙවිය යුතුයයි ඇ ඉටාගත්තාය.

උදේ සිට ඝන වැහි වලාකුළු වලින් බරවී තුබූ අහස සවස් කාලයෙහි බලාපොරොත්තු රහිතවම මඳක් ආලෝකමත් විය. බැස යන සූර්යයා සිය රත් පැහැ රශ්මි මාලාවන් එක් රාශිකොට ඈත ක්ෂිතිජය මනස්කාන්ත බවට පෙරළීය. ඈත ගිනිගෙන දිලිසෙන වලා සමූහය දවසේ ආදාහනය දක්වන්නාක් මෙන් බටහිර අහසෙහි පෙනෙන්නට වන. මේ චමත්කාර දර්ශණය නරඹනුවස් රංජිත් සිය කාමරය අසල තුබූ කොට තාප්පය අසලට අවුත් ඈත අහස දෙස නෙත් යොමු කරගෙනම සිටියේය.

මීට පැය කීපයකට පෙර ඔහු විසින් කරන ලද වීර ක්‍රියාව ඔහුටම අමතක වී ඇත. ඔහුගේ සිත ඉතා ඈතය. මෙතෙක් වේලා රංජිත් ගැන මහත් විපරමකින් සිටි නිර්මලාට ඔහු වෙතට යාමට අවස්ථාව ලැබිණ. මොහොතක්වත් ප්‍රමාද නොවී ඔහු වෙත යෑමට ඉටාගත් ඇ වහා ඔරලෝසුව ගෙන ඒම පිණිස සිය කාමරයට පිවිසියාය. ඔර්ලෝසුව අතට ගත් ඇට පළමුවෙන්ම පෙනීගියේ එහි වීදුරුව හරහා ඉරක් වැටී ඇති බවය. මෙය දුටු නිර්මලා තැති ගත්තාය. එය කොයි වේලාවක කෙලෙසක සිදුවූවක්ද? ඇ නොදනී. මේ බව වහාම රංජිත්ට කිය යුතුය. ඇ කුඩා ඔරලෝසුව අතින් ගෙන රංජිත් සිටි තැනට සෙමින් ගමන් ගත්තාය.

''රංජිත්'' ඇගේ කටහඬ ඉතා පහත් විය.

ආගන්තුකයෙකු දෙස බලන්නාක් මෙන් රංජිත් ඇ දෙසට හැරිණ.

UPLOADED BY ELIFE

''රංජිත්! මෙන්න ඔබේ ඔර්ලෝසුව. එහි වීදුරුව හරහා ඉරක් වැටී තිබෙනවා. ඔබට එය සාදවා ගන්ට පුළුවන් නොවේද?'' නිර්මලාගේ කටහඬ ටිකින් ටික පාත් විය. රංජිත් ඔර්ලෝසුව අතට ගෙන පලුද්ද දෙස බලා, වැඩ කරනවාදැයි දැන ගැනීම පිණිස එය කන දෙසට ළං කළේය.

''ඔර්ලෝසුවට කිසිදෙයක් වෙලා නෑ, වීදුරුව මාරු කරන්ඩ වුවමනාත් නෑ. මගේ ජීවිතයේ කඩතොළු මතක් කරදීමට එය තියෙන්ඩ අරිනවා! මෙසේ කියා හේ ඔර්ලෝසුව තම කමිස සාක්කුවෙහි බහා ඈත බලාගෙනම සිටියේ ය.

''රංජිත් ඔබ අද කළේ වීර ක්‍රියාවක්.'' නිර්මලා කථා කිරීමට තැත් කළාය.

රංජිත් නොවේ නිර්මලා දෙස හැරී බැලුවේ.

''රංජිත් මම වරක් බියවූවා ඔබ දියේ ගිලෙයිද කියා.''

රංජිත්ගේ මුවින් දිග සුසුමක් පිටවූවා පමණි.

මෙතෙක් වේලා විශාල අග්නි ජාලාවක පැහැය ගත් බටහිර අහස දැන් ගිනි නිවී දුම් පිටවන්නාක් මෙන් එක එක වලාකුළු කාලවණීයෙන් දිස්විය. නිර්මලා මඳක් නිහඬ වී, රංජිත් කුමක් කල්පනා කරන්නේදැයි විනිශ්චය කරගැනීමට තැත්.කළාය. මේ වේලාවේදී රංජිත්ට කියන්ඩ අපොහොසත් වූ සෑම අදහසක්ම නිර්මලාගේ නෙත් යුගලෙන් පිළිබිඹු විය.

''රංජිත්! එහෙනම් මම යනවා'' නිර්මලා අන්තිමට මෙසේ කීවේ එවිටවත් ඔහු යමක් කියාවිය යන බලාපොරොත්තුවෙන්ය. එයිනුදු කිසිම පලක් නොවීය. අඩියක් පිටුපසට ගෙන නිර්මලා වහා හැරී ආපසු සිය කාමරයට වී තමාට කුමක් සිදුවීදැයි මෙනෙහි කරන්නට වූවාය.



නිර්මලා සහ රංජිත් මෙතෙක් එක සිතින් ජීවත් වුණ කාලය දැන් අවසානය. දැන් දෙදෙන ජීවත් වන්නේ එක නිවසක ජීවත් වන අමුත්තන් දෙදෙනෙකු ලෙසටය. කඩා බිඳ පෙරළා දැමිය නොහැකි වූ අයෝමය මහා ප්‍රාකාරයක් බඳු තත්ත්වයක් දෙදෙනා වෙන්කොට තබා ඇත්තේය. රංජිත්ට මෙය නියමයකි. ඔහු එසේ සිතා සැනසීමට පත්වී ඇත. එහෙත් නිර්මලාට සැනසීමට මඟක් නැත. දිවා රෑ දෙකෙහි ඈ රංජිත් ගැන සිතමින් කල් ගත කළාය. කලකදී සිට සිය පියා රංජිත් අතර යම් කිසි වෙනස් කමක් ඇති බැව් ඈට ප්‍රත්‍යක්ෂය. මේ සියල්ලම අවබෝධකොට ගත හැකි වනුයේ රංජිත් හමුවූවාට පසුවය. අද හෙටම ඔහු හමුවී මේ ගැන කථා කර ගනිමි යයි නිර්මලා අදිටන් කරගත්තාය.

සති අන්තයේදී නිර්මලාගේ මව්පිය දෙදෙන කතරගම බලා පිටත්වූහ. නිර්මලාද මව්පියන් කැටුව වන්දනා ගමන යෑමට ලෑස්තිවූ නමුදු හදිසියේම අතපත්තු මහතාගේ මොටෝරියට යම්කිසි ආබාධයක් සිදුවූයෙන් අන්තිම මොහොතේ නිර්මලා ගෙදර නවතා යාමට මව්පියෝ ඉටා ගත්හ. අතපත්තු මහතාට සහ බිරිඳට කතරගම දානයට බඩු ගෙනයන රියේම යන්නට සිදුවිය. තම දියණිය එම රියේ යාම ගැන ඔව්හු කිසිසේත් කැමති නොවූහ: රංජිත් සෙනසුරාදා කොළඹ සිට හංවැල්ලට ගොස් ආපසු එන්නේ සඳුදා බැවින් නිර්මලා ගෙදර නවතා යාම ගැන කිසිම පැකිලීමක් ඔවුන් තුළ ඇති නොවීය. එහෙත් ඉරිදා උදේ හදිසියේම සියඹලාගහ වලව්වේදී නිර්මලා සහ රංජිත් මුණ ගැසුණි. බලාපොරොත්තු රහිත වූ මෙම හමුවීම ගැන හේ මහත් පැකිලීම් ස්වභාවයකට පත්විය.

''නිර්මලා! මා සිතුවා ඔබ මව්පියන් සමඟ කතරගම වන්දනාවේ ගියා කියලා'' මඳ පහත් ස්වරයකින් රංජිත් කතා කළේය.

UPLOADED BY ELIFE

''ඔව් මම යන්ඩ තමයි ලෑස්තිව සිටියේ, එහෙත් හදිසියෙකින් මා නතර වුණා. ඉතින් රංජිත් කියන්ඩ අද ඉරිදා උදේ මෙහි ආවේ කුමටද කියා?'' කිසිඳු පැකිලීමකින් තොරවූ නිර්මලා ප්‍රශ්න කළාය.

''අද මම මිතුරෙකු සමඟ කාක දිවයින බලා යනවා ඔරුවෙන්, ඔහු ඉන්නේ මා එනතෙක් තමයි,'' කියමින් ළඟ තිබූ හබල්පත්ත විභාග කරන්නට වූයේය.

''එසේනම් අප දෙදෙන හමුවූයේ කිසිඳු බලා-පොරොත්තුවක් නොමැතිවයි.''

''ඔව් නිර්මලා'' රංජිත්ගේ වචන සැලෙන්ට විය. ''ඔබ මෙහි සිටින බව මම සිහිනයකින්වත් දන්නවා නම් මා මෙහි පැමිණෙන්නේ නෑ'' මෙසේ කියා ඔහුගේ දුක්බර මුහුණ සඟවනු වස් බිම බලාගෙනම වැලි කඩදාසියකින් හබල් මිට මදින්නට වූයේය. නිර්මලාගේ වචන එඩිතර සොබාවක් දැක්වීය.

''ඇයි රංජිත් ඔබ මේ මාසයේ අන්තිම ඉඳලා කොළඹ නවතින්ඩ යන්නේ?''

''මා කොළඹ නවතින්ඩ යන බව ඔබට කීවේ කව්ද?''

''තාත්තා.''

''ඔබ මේ මාසයේ අන්තිම සිට කොළඹ නැවතියත්, මේ බව නිර්මලාට කියන්ඩ එපා'' අතපත්තු මාමා කී මේ වචන රංජිත්ගේ සිතට නැඟෙත්ම සිය මාමාගේ කුදිටු අදහස් සක් සුදක්සේ පැහැදිලි විය. එහෙත් ඒ බව නිර්මලාට කිසි විටෙකවත් නොඇඟවීමට තෙමේ ඉටා ගත්තේය. රංජිත්ට දැන් වුවමනා කරන්නේ සිය මාමණ්ඩියගේ අභිප්‍රාය පරිදි නිර්මලාගේ සිතේ තමා ගැන දැඩි ක්‍රෝධයක් ඇති කරවීමටය. ඔහුද මඳක් වේගයෙන් කථා කෙළේය.



''නිර්මලා, මම මේ මස අන්තිමට කොළඹ නැවතීමට යනවා පමණක් නොව ආපසු මෙහි එන්නේත් නෑ.''

''ඇයි?'' නිර්මලාගේ පද්මයක්වන් මුහුණ වේදනාවෙන් මැලවී යන්නට විය.

"ඇයි රංජිත් ඔබ මා බලන්නවත් එන්නේ නැතිද?"

"නෑ, නෑ, නිර්මලා මා අමතක කරන්ඩ."

"අනේ රංජිත් මට ඔබ අමතක කරන්ඩ පුළුවන්ද? අප දෙදෙනාගේ දැඩි ආලය කෙසේ අමතක කොට දැමිය හැකිද? ඇයි රංජිත්....... ඇයි ඔබ මට මෙසේ තරවට්ටු කරන්නේ? මා අතින් ඔබට වරදක් සිදුවුනාද?"

"ස්ත්‍රියක් ආලය කරන්නේ ගිනි මැලයක නැඟී එන ගිනි දැල් ආකාරයෙනි."

"හා" නිර්මලා පුදුමයෙන් කට හැරියාය.

"එම ආලය ආපසු තුනීව යන්නේ බැස යන ගංවතුරක් මෙන්, වරෙක ඇතිවී තව වරෙක නැතිවී යන ආලය ගැන අප කථා කරන්නේ කුමකටද?"

"රංජිත්, ගිනිදැල් මෙන් ඉහළ නඟින හෝ ගංවතුර මෙන් බැසයන ආලයකින් ඔබ රැවටීමට කිසි දිනකවත් තැත් කළේ නෑ. මේ ලෝකයේ කිසිවෙක් ඔබ තරම් හොඳින් මා හඳුනන්නේ නෑ. මා ඔබට ආලය කළේ එකම ස්ථිර ප්‍රතිපත්තියකින් යුක්තවයි. ඒ උදෙසා මගේ මුළු ජීවිතයම ඔබ වෙනුවෙන් පිදීමට මා නිතරම සූදානම්. මට නොසඟවා කියන්න රංජිත්! මේ අවදානම් අවස්ථාවේ ඔබ මා අතහැර දමා යාමට තැත් කරන්නේ ඇයි? මෙය කවද කරගත් තීරණයක්ද? මා අතින් වූ දෝෂයක්ද? නැතහොත් අන් කෙනෙකුගෙන් සිදු වූ දෝෂයක්ද? රංජිත්

UPLOADED BY ELIFE

මගෙන් නම් ඔබට ක්‍රියාවෙන් තබා සිතින් වත් දැනුවත්ව කිසිම වරදක් සිදුවී නැති බැව් දිවිරා කිය හැකියි."

"නිර්මලා! ඔබ අතින් මට කිසිම වරදක් සිදුවී නෑ. නමුත්........ නිර්මලා! මට මීට වඩා කථා කළ නො හැකියි. කරුණාකර මට යන්ඩ ඉඩ හරින්න." මේ වේලාවේදී රංජිත්ගේ මුහුණෙහි ඇති වූ ශෝකාත්මක විලාශය විස්තර කිරීමට වචන නැති තරම් ය.

"රංජිත්! ඔබේ හිතේ සඟවාගෙන ඇති යම් රහසක් ඇති බව මට පෙනෙනවා. එය මට කියන්ඩ. හෙළිකරන්ට අකමැති රහසක් ඔබ ළඟ තිබෙනවා. අනේ මට එය නොසඟවා කියන්ඩ රංජිත්?" ඈ නැවත නැවතත් ආයාචනා කළාය.

"නිර්මලා අප දෙදෙන එක්ව විසීමෙන් ඇතිවන කිසිම යහපතෙක්, සැනසීමෙක් නෑ. විලාශය නැමති ගල්පර අස්සේ අපගේ ජීවිත කැඩී බිඳී යනවාට ඔබ සතුටුද?"

"අප දෙදෙනා එක්ව විසීමෙන් ඇතිවන ව්‍යසනය කුමක්ද? මට නම් ඔබ සමඟ ගත කරන සුළු කාලය එකම මිහිරි ගීතයක්, ඔබගේ දැකීම රසාංජනයක්! ඔබගෙන් ඈත්ව විසීම විඳිය නොහැකි කටුක දුක්දෙන සිහිනයක්" නිර්මලා මෙසේ කියමින්ම සුසුම් ලන්නට වූවාය.

රංජිත් තොල් තද කරගෙන ඉවත බලන්නට විය. තමා අඩක් බරවී සිටි මේසය මත තිබූ ඔරලෝසුව මහා හයියෙන් ටික් ටික් යන අනුකරණයෙන් නාද කරනු ඇසේ. ඈත ගඟ දෙසින් හැමූ සිසිල් සුළඟ විවෘත වූ කවුලු වලින් ගේ තුළට වැද දෙදෙනාට පවන් සලන්නාක් මෙන් විය.

"මට කුමක් වූවත් ඔබට යම්කිසි හානියක් සිදුවෙනවාට මා කිසිසේත් කැමති නෑ," යනු රංජිත් කියත්ම නිර්මලාගේ



දෙනෙත් දුක් කඳුළුවලින් පිරීගියේය. මේ අවස්ථාවේදී දැරිය නොහැකි වූ හැඟීම් රාශියකින් දෙදෙනා වෙළාගත්හ. නිශ්චලත්වයෙන් සිටි ඒ ස්වල්ප මොහොත ඔවුන්ට දැනීගියේ ගිනිමැලයක් මැද දැවෙන්නාක් මෙනි. නිශ්චලතාවයෙන් තවත් පීඩා නොවිඳිය හැකිවූ නිර්මලා මහත් වේදනාවෙන් කතා කළාය.

"රංජිත්! මට එක් ප්‍රශ්නයකට පමණක් නො සඟවා පිළිතුරු දෙන්න." ඔබේ සිත තුළ වරක් මට හිමි වූ ඒ අසහාය ස්ථානය අන් කිසි ස්ත්‍රියක් පැහැර ගත්තාද?"

මෙය ඇසූ පමණින් හෙණ පහරක් ඇසුනකු මෙන් රංජිත් තැති ගත්තේය.

කුරිරු අදහස්වලින් තොර සත්‍යවාදී නෙත් යුවළ මහත් සේ විදහාපියා රංජිත්, නිර්මලා දෙස බැලීය. ඇගේ පැහැපත් ඇස් දෙකෙන් බැහැර වූ කඳුළු බිංදු දෙකක් කම්මුල මත ගලා යනු හේ දිටී. රංජිත් දයාවෙන් ඇගේ මුහුණ අල්ලා කඳුළු බිඳු සෙමෙන් පිස දැමීය. "නිර්මලා! ඔබ මට වරක් ආලය කරනවා නම්, එසේම දහස් වාරයක් මම ඔබට ආලය කරනවා. මගේ ආලය මෙම ගංගාවෙන් මුහුදට ගලා ගිය ජල කඳටත් වැඩියි. මගේ සිතේ රැඳී ඇති ඔබට හිමි ඒ අද්විතීය ස්ථානය පැහැර ගැනීමට සමත් කිසිවකු මේ ලෝකයේම නෑ. මා ඔබෙන් ඉවත් වන්නේ ඔබේ ම මතු දියුණුව සඳහායි. මා කවද නමුත් ඔබෙන් ඉවත් වන්නේ මගේ දිවියෙන් අඩක් ඔබ වෙත රඳවා තමයි. අප දෙපොල තවත් මෙහි ජීවත්වීම හොඳ නෑ. අපට විරුද්ධව මහ මේරුව සේ නැඟී එන බාධකයක් තිබෙනවා.

"ඒ කුමක්ද රංජිත්?"

"ඔබේ පියා."

"මගේ පියා! වෙන්ඩ බෑ. මගේ පියා මට කීවා. ඔබ අප සියලු දෙනාම අමතක කරදමා කොළඹ පදිංචියට යනවා කියා."

UPLOADED BY ELIFE

නිර්මලා මෙසේ කියමින් අත් දෙකින් මුහුණ වසා ඉකිබඳිමින් අඬන්ට වුවාය.

"ඒ කීමෙහි සත්‍යයක් නෑ." රංජිත් සුසුම් ලන්නට වූයේය. "නිර්මලා! ඇයි මෙවැන්නක් අපට සිදුවූයේ?"

"රංජිත්!" කවුදෝ හයියෙන් අමතන හඬෙක් ඇසුණි. හේ වහා නැඟිට ජනේලයෙන් පිටත බැලීය. ඔහුගේ මිත්‍ර දයාරත්න ජනේලයෙන් පිටත සිට කථා කරන්නට විය.

"තමුසේ මදැයි හබල් පත්ත අරන් එන්ඩ කියා ගෙදරට ආවා. දැන් පැයක් ගත වුණා. දැන් පාරු පදින්නේ කොහොමද මේ තද අව්වේ?"

"මට සමාවන්න, පමා වූවාට. මා ඉක්මනට එනවා." මෙසේ කියා පසෙකට දමා තිබූ පත්ත අතට ගෙන පසෙකට වී සිත් වේදනාවෙන් බලාගත් වනම සිටි නිර්මලා ළඟට ගොස් ඈ සනසන්නට වූයේය.

"නිර්මලා! සැනසෙන්න. ස්ථිර ප්‍රේමය සෑම බාධකයක්ම අබිභවා සිටියි. රාත්‍රිය කොපමණ අන්ධකාර වුවත් කිමද එය පහවන්නේ ආලෝකයෙන්නම්, බලාපොරොත්තු නැමති පහන් එළියෙන් අපි අනාගතය බලමු. නිරාපේක්ෂ සිතුවිලිවලින් ඔබේ සිත අවුල් කරගන්න එපා. දැන් සටනට අවස්ථාව නොවෙයි. අපි මඳක් ඉවසිල්ලෙන් කල්ගෙවමු."

මෙසේ කියා රංජිත් ඉතා අමාරුවෙන් ඇගෙන් ඈත්විය.

ඉහත සඳහන් සිද්ධියට පසු ගතවූයේ ස්වල්ප දිනකි. අතපත්තු මහතා සිය දියණියත් බෑණාත් ගැන මඳ විමසිල්ලකින් කාලය ගතකළා පමණක් නොව ඔවුනට එකට හමුවීමට වත් ඉඩ නො දීමට වග බලා ගත්තේය. මේ බැව් මැනවින් වටහා



ගත් රංජිත් හැකි පමණ වේලා සියඹලාගහ වලව්වෙන් බැහැරව සිටීමට ඉටා ගත්තේය. එලඹී ඇති අවස්ථාවේ ගාම්භීරත්වය ගැන වැඩි අවබෝධයක් නැති නිර්මලා රංජිත් හමුවී කථාකිරීමට නො දරූ ප්‍රයත්නයක් නොමැත. එසේ කථා කිරීමට බැරි වූවත් දෙදෙනා එකිනෙකා දෙස හෙලන නෙත් කැලුම් ඔවුන් තුළ පැවති ස්ථිර ආලය මැනවින් පෙන්වා දුනි. රංජිත් තමාට ප්‍රේම කරන බවට කිසිම අඩමානයක් නොමැති බව නිර්මලා දනී. ගිය සතියේ දෙදෙනා අතර ඇති වූ සංවාදයෙන් ඒ බව ස්ථිරවම ඈ දැන ගත්තීය.

නිර්මලාට දෙවනුව වුවමනා කරන්නේ දෙපලගේ ආලය ඉදිරියේ ඇති බාධකයන් කෙසේ මැඩ පවත්වා ගන්නේ ද කියා රංජිත් සමඟ සාකච්ඡා කොට විසඳා ගැනීමය.

රංජිත්ට නම් මෙය ජීවිතයත් මරණයත් අතර ඇති සටනෙකි. කෙසේ මෙය විසඳා ගනිම්දැයි ඔහුට සිතන්ටවත් බැරිය. මිනිසාට විසඳිය නොහැකි ඇතැම් ප්‍රහේලිකාවන් දෛවය නැමති පුද්ගලයා අතින් විසඳනු ලැබේ. එය තමාටත් නිර්මලාටත් වැඩ දයකව නිශ්චය කරනු ලබත්වා. මෙසේ ප්‍රාර්ථනා කර ගනිමින් රංජිත් සැනසුම ලබා ගත්තේය. මෙසේ සිරකරුවන් දෙදෙනෙකු මෙන් එක ගෙදර වාසය කරන මේ දෙදෙනාට එක්තරා පුද්ගලයෙකුගේ අසහාය උදව් නොඅඩුව අත්විණ. ඒ තැනැත්තා අන් කිසිවකු නොව නිර්මලා සහ රංජිත් කුඩා කල සිට රැක බලාගත් සැමී නමැති මෙහෙකරුවාය. උද්ගත වී තිබෙන මෙම අඳුරු අවස්ථාවේදී සැමී එකිනෙකාගේ පණිවුඩ කරදීමට උදව් කරමින් දෙදෙනා අතර නැතිව බැරි තත්වයක් තමන් වෙත පවරා ගත්තේය.

එක් සතිදිනක හවස් වරුවේ හදිසියේම රංජිත් සියඹලාගහ වත්තට පැමිණියේය. ඒ මොහොතෙහි සිය දෙමාපියන් ගෙදර නොසිටියෙන් නිර්මලාට මෙය කිසිවිටකවත් බලාපොරොත්තු නොවූ අනගි අවස්ථාවෙක් විය.

UPLOADED BY ELIFE

රංජිත් ඔරුව පැද ගඟෙන් ගොඩ වී පිටු පසින් සිය කාමරයට එනවා නිර්මලා බලා සිටියාය. කොයි වේලේ ආපසු කාමරයෙන් එළියට එත්දැයි ඈ මඳක් නොසන්සුන් වූවාය. පණිවුඩයක් යැවීමටද සෑම් අසලක නොවීය. ගෙදර සිටි අනෙකකු ඈට විශ්වාස නොමැත. සමහර දිනයන්හි රංජිත් කාමරයට පැමිණි විගසම ආපසු යන්නේය. අද ද එසේම සිදුවෙනවා නො-අනුමානය. "කෙසේ නමුත් රංජිත් ආපසු යන්ඩ පෙර වචනයක්වත් කථා කර ගනිමි." නිර්මලා තරයේ සිතාගෙන පහත බරාඳයේ ඒ මේ අත සක්මන් කරන්නට වූවාය.

දවසෙහි වැඩ නිමා කළ හිරුදෙව් පුත් අවර දිග අහසෙහි රත් පලසක් එලා ඒ මත වාඩි වී තමා දවසේ කළ වැඩ පරීක්ෂා කරන්නාක් මෙන් මඳ වේලාවක් සිට අවරගිරි පර්වතය තුළ සැඟවී ගියේය. මෙතෙක් වේලා අහර සොයමින් දස දෙස පැතිරී සිටි පක්ෂි සමූහයාද සිය කැදලි කරා පියාඹන්නට වූහ. තව කොතෙකුත් බලා සිටිය නොහැකි නිර්මලා රංජිත්ගේ කාමරය අසල පිහිටි පිය ගැට පෙළ අසලට ගමන් ගත්තාය. රංජිත්ද කොට තාප්පය මත වැලමිටි දෙක ගසා කම්මුල් දෙක ඇඟිලි මත රඳවා ඉවත බලා සිටියේය. මෙය දුටු නිර්මලා මඳක් තැති ගත් නමුදු ඒ බව කිසිත් නො අඟවා සීරුවෙන් ඔහු අසළට පා තැබුවාය. "රංජිත්" සෙමෙන් ඇගේ හඬ පිටවිය. රංජිත් ද ආපසු හැරී නිර්මලා දෙස බලා සිත් තුළ උපන් චංචල ස්වභාවය සඟවමින් ඈට පහත් හඬින් කථා කළේය.

"මා හයින් සිටියා ඔබ ගෙදර නැතිවාද කියා."

"ඔබත් දූන් දූන් කාමරයෙන් එළියට ඒවිය කියා මා බලා සිටියා."

"මා ආ බව දන්නේ කෙසේද?"

"ඔබ ගඟ හරහා ඔරුව පදවනවා මගේ කාමරයට පෙනෙනවා."



"ඔබ අද පමණක්ද දුටුවේ? කී දිනක් මම ඔබට නොපෙනී මෙහි අවුත් ආපසු යනවාද?"

"ඇයි ඔබ එසේ කරන්නේ?"

"මගේ ඔරුව කවදත් පැදෙන්නේ ඔබ අසලටයි. ඔබ නුදුටුවත් මා ඔබ අසලය යන හැඟීම ඇතිකර ගැනීමට පමණක් මම මෙවැනි ගංගා සීයක් මුත් තරණය කරනවා" නිර්මලා තවත් ළංවී කෙටි තාප්පයට හේත්තු වූවාය.

"ඇයි ඔබ මීට කලින් එළියට නොආවේ. අද ගෙදර කවුරුත් නෑ. අම්මත් නෑ ගෙදර, තාත්තත් නෑ. අප දෙදෙනා අද තනියම."

"මා ගෙට ගොඩ වෙන කොටම ලුසිහාමි මා දෙස විපරමෙන් බලා සිටියාය."

"කෝ ලුසිහාමි? කියමින් නිර්මලා වට පිට බලන්ට වූවාය.

"ඈ මඳ වේලාවකට පෙර ආපසු ගියා."

"ලුසිහාමි, අපි ගැන සෝදිසියෙන් සිටිනවා?" නිර්මලා පුදුමයෙන් මෙන් ඇසුවාය.

"ඈ ගැන කිසි අමනාපයක් ඇතිකරගන්ට එපා නිර්මලා, ඈ කරන්නේ ඇගේ බත් පත රැක ගැනීම පමණයි."

මඳ වේලාවක් දෙදෙනා එකිනෙකා දෙස නෙත් හෙළමින් නිසලව සිටියහ.

"ඉතින් ඔබ කීවේ නැනේ ඔබේ අම්මලා තාත්තල කොහේ ගියාද කියලා?" රංජිත් අනතුරුව කතා කළේය.

UPLOADED BY ELIFE

"අද කඩුවෙල ඉරුදින දහම් පාසලේ තෑගි බෙදදීම, තාත්තා මුලසුන, අම්මා තෑගි බෙදා දෙනවා. අද එනකොට කොහොම හරි රෑ හත පසුවේවි."

"අද නම් කොහොම හරි තාත්තා මුණ ගැසී තමයි මම ආපසු යන්නේ" කියමින් රංජිත් තව වරක් ඈත බලා ගත්තේය. නිර්මලාද බර කල්පනාවකට වැටිණ. යම් කිසි පණිවුඩයක් කීමට තැත් කරන්නාක් මෙන් මෙතෙක් වේලා පාළු අත්තක් උඩ කෑගැසූ කපුටා වහා අන් අත්තක් බලා ඉගිලී ගියේය. වවුල් සමූහයක් පමණක් ඈත බක් මී ගසක අතුඅතර එල්ලී කෑගසන්ට වූහ. බලාසිටියදී නා නා හැඩහුරුකම් ගැනීමේ සමත් වලාකුළු රැස් ඈත මහා ගින්නකින් ඇති වූ අළු සමූහයක සිරි ඉසිලීය. සැතපුම් ගණනක් ඈත පෙනෙන ගඟ අඳුරු පැහැගත්තාය. තමන් ඉදිරියේ ඇති දර්ශණය, අධික නිසලතාවයේ ප්‍රති-මුහුර්තියක් බඳුවිය.

දුරසිට වැටෙන එළියෙන් පැහැපත් වූ නිර්මලාගේ මුව පියුම රන්මුවා රුවක් මෙන් අලංකාර විය. නිලුපුල් පෙති පරයන නෙත් සඟල අමුතුම චමත්කාර ජනකය. ගොතා පිට දිගට හෙලා තිබූ ඇගේ දිගු සුනිල් වරලස ඒ මේ අත සොලවමින් සිය සිත්තුල හටගත් චංචල භාවය දුරුකිරීමට ඈ තැත් කළාය. දක්ෂ නිර්මාණකයෙක් ඉතා ප්‍රවේසමෙන් පිළියෙළ කොට නෙලනලද මුතුවන් සක් කැබලි පෙළක් මෙන් ශුභ වණීව දිලිසෙන ඇගේ දත් දෙපෙල විටින් විට පාන මඳහසින් පෙනෙත්ම චන්ද්‍රයාද විලියෙන් විටින් විට වලායට සැඟ-වෙන්නට විය.

"රංජිත්! අද දර්ශනය ඉතාමත් අලංකාරයි නොවෙද? ඔබ මීට වඩා පියකරු දර්ශනයක් දූක තිබෙනවාද?"

"ඔව් දූන් වුවත් මට පේන්ට තියෙනවා"



"ඒ කුමක්ද?"

"ඔබේ සුන්දර මුහුණ!"

රංජිත් මෙසේ පවසත්ම චන්ද්‍රකාන්තියෙන් පුබුදු වූ ජලජ පුෂ්පයක් සුළඟින් ඒ මේ අත වැනෙන්නාක් මෙන් නිර්මලා ලැජ්ජාවෙන් මිරිකෙන්නට වූවාය.

මේ මොහොතේ මල්සැරගේ ඊ පහරකින් රංජිත්ගේ හද දූදුරුව ගියෙන් මැඩපැවැත්විය නොහැකි යම් කිසි හැඟීමක් ඇති වී සෑම යෝග්‍යායෝග්‍යතාවයන්ම පසකට තල්ලු කර දමා එකවරම නිර්මලා තමා වෙත ළඟාකර ගන්නා ආශාවෙක් ඇති වූයේය. එහෙත් මහඟු සුශීලතාවයෙන් මුහුකුරා ගිය හේ මතු හදවතට රිංගාගත් ඒ ක්ෂණික චේතනාව වහාම මැඩපවත්වා ගත්තේය.

"නිර්මලා! ඔබට පේනවා නොවේද ඈත ආකාශයේ අඳුරු වලාකුල් එකින් එක නැති වී චන්ද්‍ර ප්‍රභාවට ඉඩදෙන සැටි?"

නිර්මලාද පහත් වී අහසේ මඳක් ඉහළින් තුබූ සඳ නැරැඹීමට තැත් කළාය. රංජිත් නොනවත්වාම කථා කෙළේය. "අප ඉදිරියේ ඇති අඳුරු වලාකුල් ද ටිකින් ටික මොහොතින් මොහොත නැති වී යන්නේත් මේ ආකාරයෙන් තමා."

කිසිවක් කියාගත නොහී විමසීම් සහිතව නිර්මලා ද රංජිත් දෙසම බලා සිටියාය.

රංජිත් මෙතෙක් වේලා තමා ළඟ සඟවා තුබූ ලියුමක් නිර්මලා වෙත දිගු කළේය. මහත් කලබලයෙන් යුතුව ඈ ලියමන දිගහැර එය පිරික්සන්ට වූවාය.

"ඔබට ශිෂ්‍යත්වයක්!"

UPLOADED BY ELIFE

"ඔව්, මෙය නම් කිසි කලෙකවත් මා අපේක්ෂා කළ දෙයක් නොවෙයි. බැංකු සේවය ගැන උපාධියක් ලබා ගැනුම් වස් මට අවුරුදු තුනක් කේම්බ්‍රිජ් විද්‍යාලයේ ඉගෙනීම අත්වෙනවා. නිර්මලා ඇයි ඔබ මා සමඟ ප්‍රීති නොවන්නේ"

නිර්මලාගේ මුහුණ කනස්සලුභාවයෙන් අඳුරු විය. "ඉදින් ඔබ යනවා?" සැනෙකින් ඈ ඇසුවාය.

"මා යන නොයන එක වෙනම දෙයක් නිර්මලා! මෙවැනි භාරධූර ශිෂ්‍යත්වයක් හිමිවීම, ඔබ ලබා ගැනීමේ දැඩි පියවරක් හැටියට තමයි මට හැඟී යන්නේ."

නිර්මලාගේ දෙනෙතින් කඳුළු ධාරාවන් නික්මිනි. "මට පෙනෙන්නේ එක් දෙයක් පමණයි. අප දෙන්නා ඈත් කිරීමට බඳනා ලද තවත් ප්‍රාකාරයක් හැටියටයි මට මෙය පෙනී යන්නේ."

"සැනසෙන්න නිර්මලා, සැනසෙන්න." රංජිත් ඈ අස්වැසීය. "මේ මහා ධරණී තලයටවත් මේ මහා සාගරයටවත් අපව කිසි විටෙකවත් වෙන් කළ නොහැකියි. අනාගතය මෙසේ දීප්තිමත්ව තිබියදී අප පසුතැවිලි වන්නේ කුමටද? මම රටෙන් ඉවත්වන්නේ එක් කාරණයක් නිශ්චය කරගත්තාට පසුව පමණයි. ඔබේ පියා හොඳ සිතකින් සිටිත්නම් මම අද රෑම ඔහු සමඟ කථා කොට සැකෙවින් මගේ අදහස පැහැදිලි කරනවා, මගේ ශිෂ්‍යත්වයේ ආධාරයෙන් ඔබේ පියාගේ දරදඬු පිළිවෙත මඳක් මෙල්ල කිරීමටයි මගේ එකම බලාපොරොත්තුව."

"අනාගතය ගැන සිතන විටත් මා තුළ ඇති වන්නේ බියක්." මෙසේ කියමින් නිර්මලා කෙටි තාප්පය මත අත් දෙක තබා බිම බලාගත්වනම කල්පනාවෙන් සිටියාය.

සීඝ්‍රයෙන් ඇතිවන අඩ අන්ධකාරය දෙදෙනා වෙලා ගත්හ. පෙම්වතුන්ට අවහිර කිරීමට කිසිවෙකු අසල නැත. රංජිත් අත



තුබූ ඔරලෝසුව ටික් ටික් යන අනුකරණයෙන් නාද දෙන්ට විය. හේ දිග සුසුමක් හෙලා ඈත දර්ශනය දෙසම බලා සිටියේය. ඒ අතරම කිසිවකුට මුදලිය නොහැකි වූ ප්‍රේමය නමැති සියුම් බැම්මෙන් දෙදෙන වෙලාගනු ලැබිණ. තමනට එරෙහිව කොතෙක් විරුද්ධකම් ඇති වුවද ඒ සියල්ලක්ම අභිබවා සිටීමට ශක්තියක් ඇති බව රංජිත්ට ඒ මොහොතෙහි වැටහී ගියේය.

පෙම්වතුන්ට වෙලාව ගැන කිසිදු අවබෝධයක් නොමැත. ඔවුන් එකිනෙකා අසල සිටින විට පැයක් ගතවන්නේ විනාඩි පහක සීඝ්‍රතාවයෙනි. දැන් වත්ත චන්ද්‍රාලෝකයෙන් බැබලෙන එකම උද්‍යානයක් විය. ඈත පෙනෙන ගංගාව රාත්‍රි නමැති කාන්තාව ඔතාගන්ට තැත්කරන දිග සළුවක් මෙන් ඒ අත මේ අත සැලෙන්නට වන. මඳ සුළඟෙන් සැලෙන පොල් අතු අග ඔවුනට පෙනී ගියේ සුන්දර ලෝකයකට කවුදෝ අත වනන්නාක් මෙනි.

නිශ්චලත්වයේ රස උරා බොමින් පෙම්යුවළ අවට සියල්ලක් අමතක කළහ. හදිසියේ පිටුපස අඩි ශබ්දයක් ඇසී දෙදෙනාම තිගැස්සී ඒ දෙස බැලූහ. අතපත්තු මහතා ඔවුන් අසල විය. පියා දුටු කෙනෙහි මවිතයෙන් නිර්මලාගේ මුව ඇරිණ. "තාත්තා" ඈ සෙමින් කීවාය. එහෙත් ඔහුගේ බැල්ම තවත් ඉවසා සිටිනු නොහැකි වූ ඈ ආපසු හැරී සිය කාමරයට පිවිසියාය. රංජිත් පමණක් ගල් ගැසී එතනම සිටියේය. තමන් පිළියෙළ කළ සෑම සැලැස්මක්ම එක වරට වතුරට ගසා ගියාක් මෙන් ඔහුට දැන් පෙනී ඇත.

"උඹ දැන් ඉතින් මේ ගෙදරට යන්ඩ එන්ඩ උවමනාවක් නෑ. උඹේ තියෙන එකක් අරගෙන දැන්මම පිටිවී පලයන්." අතපත්තු මහතා ගුගුලේය. මීට උත්තර වශයෙන් රංජිත් යමක් කීමට තැත් කළද පැමිණි වේලාවේ හැටියට නොදෙඩා සිටීම නුවණට හුරුයයි වටහාගෙන තෙමේ නිහඬ විය.

UPLOADED BY ELIFE

පසුදින සියඹලාගහ වත්තට ඉර උදාවූයේ රංජිත් ගඟෙන් එතර වූවාට පසුවය.

පාන්දර පහට පමණ රංජිත් සැමීට කථා කොට මෙසේ කීය. "සැමී මම යනවා. ආපසු එන බලාපොරොත්තුවක් නෑ. යම්කිසි පණිවිඩයක් ඇත්නම් වහා එය රැගෙන මා වෙත ආයුතුයි."

රංජිත් අතුරුදහන්වීමත් සමඟම අසල් වාසීන්ගේ කට කථාවන්ට නව ජීවයක් ලැබිණ. අළුයම් වේලේ යම් කිසි කාරියක් සඳහා ගඟ අද්දරට ගිය රොබෝ සිඤ්ඤෝට පෙනුණේ ගඟ හරහා ඔරුවෙන් යන රංජිත්ය. හේ පමා නොවී මේ බව ලූසිහාමිට කීය. ලූසිහාමි තවත් පල්හෑලි කීපයක් එකතුකොට තවත් කීප දෙනෙකුට කීවාය. මෙසේ සවස් වන්ට පෙර සියඹලාගහ වත්ත වටකර දූප්පත් ජනයා නොයෙක් දූසමාන ආරංචි පතුරුවන්නට වූහ.

මේ කථාවන් කනවැටුණු අතපත්තු මහතා කේන්තියෙන් ඉපිලී ගියේය. ඔහුගේ ගෞරවයට පහර වැදුන බව දත් හෙතෙම වඩාත් රංජිත් කෙරෙහි වෛරය ඇති කරගත.

"ජේනවාද මම මූට දරුවෙකුට වගේ සැලකුවා. ඉහළට යන්ඩ ඉගැන්නුවා, හොඳ රක්ෂාවක් ලබා දුන්නා. එහෙත් කිසි කෙළෙහි ගුණයක් නොදත් ඔහු මා අත වටිනාම වස්තුව පැහැර ගන්ට තැත්කළා. දැන් අහල පහළ එව්වෝ කථා කරන්නේ මේ ගැනමයි." සිය බිරිඳ අමතා මෙසේ කීය.

ලොව මැවූ මහා බ්‍රහ්මයා ස්ත්‍රියට මොලයත් ධනයත් එකට නොදිය යුතුයයි සිතා එක් ස්ත්‍රියකට ඥානයත් තවත් අයෙකුට ධනයත් දීමට තීරණය කළේ යයි කට කථාවෙක් ඇත. අතපත්තු හාමිනේ හොඳින් දන්නා අඳුනන කෙනෙකුට නම් මේ කියමනෙහි සත්‍යතාවය මැනවින් ඔප්පු වන්නේය. අතපත්තු හාමිනේට කිසි දෙයක් තනිව කල්පනා කිරීමේ ශක්තියක් නොමැත. අතපත්තු මහතා කරන කියන සියල්ලක්ම ඈ මැනවැයි මුදුනෙන් පිළිගනී. ඉතාමත් වාසනාවන්තියක් යයිද, ඈ විවාහ කරගත් දින පටන් සිය සැමියාට වස්තුව ලැබෙන්නේ ගඟක් ගලන්නාක් මෙන් යයිද ඇසීමට පවා ඈ තුටු වන්නීය.

අතපත්තු හාමිනේද සිය සැමියාගේ කථාව අනුමත කළාය.

"ඒක නේන්නම්, අපට වෙච්ච දේ! ගෙදර එන්ඩ ඉස්සර වෙලා කියන්ඩයි තුබුණේ මෙහෙම වැඩ නම් කරන්ඩ එපයි කියල, දැන් ඉතින් මොනවා කරන්ඩද? එලවල දාපු එක තමයි හොඳ."

ඉකුත් දින ඇති වූ අවාසනාවන්ත සිද්ධියෙන් පසුව නිර්මලා සිය කාමරයෙන් එළියට නෑවිත් ශෝකයෙන් කල් හැරියාය. කිසිවකුට ඈ සැනසිය නොහැකි විය. රංජිත්ට විඳින්ට සිදුවූ නින්ද අපහාසය ගැන සිතමින් මොහොතින් මොහොත ඈ හෙළූ කඳුළු අප්‍රමාණය.

මෙසේ ටික දිනක් ගත විය. මෙවැනි තත්ත්වයක් දිග්ගැස්සීම ගැන මඳක් බිය වූ අතපත්තු මහතා දිනක් ඇගේ කාමරය තුළට ආවේය. එදින ඔහුගේ මුහුණ ව්‍යාකුල විය. "මොකද ළමයා උඹ කරන්ට යන වැඩේ තේරුම, අපි සියල්ලක්ම කරන්නේ ඔබේම හොඳට නොවේද? ඔය හාදයා මෙහෙම දෙයක් කරනවාය කියා හිතුවානම්."

නිර්මලා නිහඬ වූවාය. "රංජිත් අත කිසිම වරදක් නෑ තාත්තා. ඔහුට කළ අයුක්තිය ඉතාමත් අසාධාරණයි. ඔහු නැති තැන ඔහුට බැණ වදින්ට එපා."

"මම කුමක්ද ඔහුට කළ අසාධාරණය?"



UPLOADED BY ELIFE

"කිසිම විමසීමක් නැතිව තාත්තා ඔහු ගෙදරින් බැහැර කළා." නිර්මලා ඉකි බිඳිමින් හඬන්නට වූවාය.

අතපත්තු මහතා සාවඥ සිනාවක් පිට කෙළේය. "මම නැති වෙලාවේ ගෙදරට රිංගාගෙන ඔබේ සිත දූෂණය කිරීමට තැත් කිරීම හොඳ වැඩක්? හම්!

"ඔහු ආවේ තාත්තා හමුවීමටයි, මා සමඟ රහස් කථා කිරීමට නොවෙයි."

"ඔහුට මා සමඟ ඇති කථාව කුමක්ද? මෙයින් තේරුම් යන්නේ කොතෙක් ඌ නුඹ රවටා ඇතිද කියා."

නිර්මලාගේ දෙනෙතින් උණු කඳුළු කැට වැටෙන්ට වූයේය. "තාත්තා! ඔහු කිසි දිනකවත් මා රැවටුවේ නෑ. මේ අවුරුද්ද තුළ රංජිත් මට කළ උපකාර සියල්ලක්ම මා කිසි විටෙකවත් අමතක කරන්නේ නෑ. මා කුඩා දරුවෙක් නොවේ. කාටවත් මා රැවටිය නොහැකියි."

"හා, උඹත් ඉගෙනගන වැඩි වාගෙ පෙනෙනවා" අතපත්තු මහතා ගුගුලේය. "ඌ මහා අහංකාරයෙක්! මගේ වහලෙ යට ඉඳගෙන මට ආඩම්බර පෙන්වන එක තමයි මට විඳිය නොහැකි කාරණය! මතකද එද ඔහු ගඟට පැන අර දරුවා බේරා ගත්ත හැටි? ඔහුට තිබුණේ පළමු කොට මගෙන් අවසරය ලබා ගන්ට නොවෙද? මා හිටිය බවක්වත් ඌ දන්නේ නෑ."

මෙය කන වැටුණු නිර්මලා අඬන්නටද සිනහවන්නටද නොදත්තෙන් මුව තදින් පියාගෙන කවුළුව අසලට ගොස් ඇත ගඟ දෙස බැලුවාය. එවිට රංජිත් එද කල වීර ක්‍රියාව ඇගේ මනසට දිස් විය. "අනේ තාත්තා රංජිත්ගේ වැරදි ඕවාද"යි ඇගේ මුවින් පිටවිණ.



පියාද ඈ ළඟට අඩියක් ආවේය. මෙසේ කියා නම් නිර්මලාගේ අදහස් යටපත් කළ නොහැකි බව ඔහුට අවබෝධ විය. "දරුව! නුඹ බාලයි. එසේම මෝඩයි. කපටි මිනිසුන් ගැන ඔබට කිසිම තේරුමක් නෑ. ඔය රංජිත් එන්නේ ඔබේ මුදල් සොයා ගෙනයි. මේ තරම් ඔබට ආදරයක් ඇතිනම් ඇයි ඒ බව ඌ මට කලින් නොකීවේ? ඔබ කාත් කවුරුවත් නැති අසරණ තැනැත්තියක් කියා ඔහු සිතුවාද?"

"රංජිත් එද ආවේ ඔබට කථාකරන්ට තමයි. එහෙත් ඊට කලින් ඔබ ඔහු එලවා දැම්මා." නිර්මලා සුසුම් ලෑවාය.

"ඇයි ඔබ ඔහු එතරම් විශ්වාස කරන්නේ?"

"ඔහු අවිශ්වාස කිරීමට කිසිම වේලාවක මට ඉඩක් ඇති වූයේ නෑ," "ඇයි තාත්තා, ඇයි ඔහු කෙරෙහි මෙතරම් ක්‍රෝධයක් ඇතිකරගෙන ඇත්තේ?"

අතපත්තු මහතා මඳක් වේගවත් විය. "මට උවමනා කළේ උඹව එක්තරා පිළිවෙළකට හදගන්ටයි. ඔහු ඇවිත් කළේ කුමක්ද? උඹව ඉඳුරාම වෙනස් තත්ත්වයකට හැඩ ගසා ගත්තා නොවේද? උඹට කව්ද කීවෙ ළඟපාත ගෙවල්වලට ගිහිල්ලා ඔවුන්ගේ දුක සැප සොයා බලන්ඩ? උඹට ගෙදර සැපයේ සිටියානම් නරකද? මේ වාගේ උසස් වැදගත් නම්බුකාර වලව්වල හැදෙන උඹ වාගේ ළමයින් තුළ කොපමණ අහංකාර ගති තිබිය යුතුද. ඕවාගේ දුප්පත් පවුල්වල මිදුලකවත් පස් පෑගීම වටිනවාද?"

අසල දුප්පත් ගෙවල්වල දුකක් පැමිණි විට ඈ රංජිත් සමඟ එහි ගොස් ඔවුන් සැනසීමටත් හැකිතාක් උපකාර කිරීමටත් පුරුදුව සිටියාය. මෙය පියාට නුරුස්නා කරුණක් විය. මේ ගැන පියා රංජිත්ට දෙස් නැඟුවේය.

UPLOADED BY ELIFE

"ඔව්, මා ඔවුන් ළඟට ගිය එක ඇත්තයි, පැමිණි අවසථාවේ හැටියට ඔවුන්ට උදව් කළ එකත් ඇත්තයි. මා කිසි විටකවත් සිතුවේ නෑ එයින් වැඩක් අවැඩක් සිදුවේය කියා."

"උඹට තවමත් මගේ අදහස තේරුම් ගියේ නෑ නොවේද?" මෙසේ කියා ඔහු ජනේලයෙන් ඉවත බලා එක් රෝස පඳුරක් නිර්මලාට පෙන්වීය. "බලාපන් අර මුඳුනේ පිපී තිබෙන රෝසමල! එය අල්ලා බලන්ඩ කිසිවෙකු ළංවෙනවාද? නැත. එහෙත් එහි ලක්ෂණත් සුවඳත් දසඅත පැතිර යනවා. මට උවමනා කරන්නේ ඔබත් අර පෙනෙන රෝසමල මෙන් ලක්ෂණට තබා ගැනීමටයි. අතින් අල්ලා කඩා දමා ඒ අත මේ අත වීසිකර දැමීමට නම් ඕනෑ තරම් මල් අවට පිපී තිබෙනවා."

"තාත්තා! මා පමණක් අර පෙනෙන රෝසමලට සමාන කර මෙහි ඇති වඩා ලක්ෂණ නොවූ මල් අවට සිටින අසරණ නිර්ධනයින් වාගේ යයි පෙන්වීමට තැත් කරනවා නොවේද? තාත්තා! ඔය පෙනෙන සෑම මලකම පෙති එකින් එක ගලවා දමන්න. එවිට ඔබට තත්ත්වාකාරයෙන් පෙනේවි මේ අවට ඇති සෑම මලකටමත් අර පෙනෙන ලක්ෂණ රෝසමලටත් ඇත්තේ එකම අරමුණයි. එනම් ජීවිතය ගෙන යාමේ හුදු සටනයි. ඔය ලක්ෂණට පෙනෙන රෝසමලෙත් අනිකුත් මල්වලත් අධික වෙනසක් නෑ. ඒ තාත්තාට පෙනෙන හැටි තමයි."

මෙය ඇසූ පියාගේ ක්‍රෝධය සිය ගුණයකින් වැඩි විය. "මෙය තමා රංජිත් උඹට ඉගැන්නූ පාඩම් මාලාව.! දූර්ජනයා, අදර්මිෂ්ඨයා" කියමින් හේ දත් සපා කෑවේය.

"රංජිත් ඔය තරම් නරක පුද්ගලයෙකු නම් ඇයි අප දෙදෙනා එක්වීමට සැලැස්සුවේ? ඇයි මොහොතකටවත් මා ඔහු ළඟට ඇරියේ?"

"මගේ වරද! මගේ වරද!" කියමින් අතපත්තු මහතා කාමරයෙන් ඉවතට ගියේය. නිර්මලාද කාමරය තුළ ඇඳ මත

UPLOADED BY ELIFE



දිගා වී සෑහෙන වේලාවක් කඳුළු සලා සිතේ ඇති වූ අධික පීඩනය මඳක් තුනී කරගෙන ආපසු නැගිට කවුළුවෙන් ඈත ගඟ දෙස බලන්ට වූවාය. එයින්ම ඇගේ සිත මඳක් සැහැල්ලු විය.

හුස්ම ඉහළ පහළ නැගෙනවිට රූබර කාන්තාවකගේ පැහැපත් පිරුණු පියයුරු ඉහළ පහළ යන්නාක් මෙන් තද සූර්ය රශ්මිය ගංගා ජලය මත වැටී සෙලවෙන්නට විය. ගඟ හරහා හමා එන මඳ සුළඟ අවට ගසකොළ සොලවමින් තමාගේ සෝගිනි නිවනු වස් එන සිසිල් පවන් බඳු විය. කුඩා ගේ කුරුළු රංචුවක් අසල තණකොළ පලසට වී කෑම අහුලා කමින් පහත් හඬින් කිචි බිචි ගාන්නට වූහ. සිත තුළ වූ වේදනාව මඳක් යටපත් කර ගනිමින් නිර්මලාද මීට සවල්පයකට ප්‍රථම සිය පියාණන් සමඟ ඇති වූ කථාව මෙනෙහි කරන්නට වූවාය.

"ඔහුට උඹව ඕනෑනම් ඇයි, කලින් මට ඒ ගැන නොකීවේ, යන්න දෙවරක්ම තාත්තාගේ මුවින් පිටවිය. තාත්තාගේ කීම සත්‍යයකි. අපගේ අදහස් තාත්තාට නො ඇඟවීම අපගේ වරදකි. එදින රාත්‍රියේ රංජිත් මා සමඟ රහසේ කතාකරන්නට ආවේ නෑ කියා කොතෙක් කීවත් තාත්තා නම් එය විශ්වාස කරන්නේ නෑ. කෙසේ නමුත් රංජිත් හමුවී අප අතින් සිදුවූ වරද මතක් කර දිය යුතුය. මට රංජිත් හමුවිය යුත්තේ රහසින්ය. අහෝ තාත්තා මේ බව දැනගතහොත් මා ගැන කුමක් සිතයිද? එහෙත් තාත්තාට කීකරුවී රංජිත් නොදැක සිටීමටත් බැරිය." මෙසේ තමන් වෙත එළඹී ඇති අවිනිශ්චිත තත්වය සිහියට නැගෙත්ම නිරුත්සාහයෙන් ඈ තද සුසුමක් පිට කළාය. ඒ සමඟම සිය පෙම්වතා නැවත වරක් දැක ගැනීමේ ප්‍රීතිය ආකුලවූ සිය සිත එළිය කිරීමට ඇති වූ විදුලි සැරයක් බඳු විය.

* * * *



කැළණි ගඟ හරහා දමා ඇති වික්ටෝරියා පාලම තරම් හවස් කාලයේ කලබල ඇති ස්ථානයක් තවත් සොයා ගැනීමට බැරි තරම්ය. රක්ෂාවල් නිම වී තම සුරතල් දරු දැරියන් දැකීමේ බලාපොරොත්තුවෙන් ලහි ලහියේ සිය නිවෙස් කරා පිය නඟන ජනයා ද, තම බඩු ටික විකොට අළුත් බඩු රැගෙන ආපසු යන වෙළෙන්දෝ ද, බොහෝ වෙති. ඒ අතරම දෙපැත්තට යා නොහී මුහුණට මුහුණලා තදබද වී ඉතා සෙමින් ගමන් කරන ලොරි බස් කාර් හා කරත්ත ආදිය අවට නරඹන්නවුනට පෙනෙණුයේ සටනකට එළඹී යුද්ධ බල ඇණියක් මෙන්ය. ඒ මේ අතින් ඇසෙන මොටෝරිය හඬ සහ යකඩ පීලි උඩින් දුවන දුම්රිය හඬ ඇරඹූ යුද්ධයකින් නිකුත්වන ශබ්දයක් මෙන් අවට ගිගුම් දෙන්නේය.

මේ කලබල සමූහය මැද්දේ නිදැල්ලේ පහළට ගලා යන කැළණි ගඟ "උතුමෝ කිසිවකට නො සැලෙති." යන්න පෙන්නුම් කොට දෙන්නාක් මෙන් සිය ගමන්හි කිසිදු වෙනසක් නොකරයි.

පාලම හාත්පස කෙබඳු කලබලයක් ඇති වූවත්, ඊට ඔබ්බෙහි ඇති වූ දර්ශනය පිටිසර සිරියෙන් අඩු නොවේ. ගඟ දෙපස යන එන ඔරු පාරු කීපය ද, තනි තනිව එහා මෙහා පදින අඟුල් කීපය ද ගම්බද සුන්දරත්වය තව තවත් කැපී පෙනීමට හොඳ නිදසුනකි.

සියඹලාගහ වත්ත නිම වන්නේ පාලමට යාර සියයක් පමණ ඈතින් පිහිටි වගුරු බිමෙනි. ඉර බැසුණු වේලෙහි එම වත්තට එන අයකු විනා අන් කිසිවෙක් මෙහි නො ගැවසෙයි. මේ විශාල මන්දිරය වාසභූමි කොට ගත් ඉංග්‍රීසි ජාතිකයා, මෙහි වූ උණ පඳුර ලක්ෂණ ලෙස ගල්වලින් වටකර කුඩා පවුරක් තනා පඳුර යට ගලින්ම අසුනක් ද සාද ඇත. ගඟ දෙසින් හමන සිසිල් සුළං මැනවින් රස විඳීමට සිතූ මේ තැනැත්තා දවසේ වැඩ නිම වූ පසු උණ පඳුරයට වූ අසුනෙහි වාඩි වී

UPLOADED BY ELIFE

සිටින පුරුද්දක් තිබුණේය. මෙදින නිර්මලා ද උණ පඳුර යට තනවා තිබූ ඒ අසුන මත වාඩි වී විමසිල්ලෙන් ගඟ දෙස බලා සිටියාය. හාත්පස මඳ කළුවර වැටෙත්ම ඇගේ ගත සැලෙන්නට විය. රංජිත්ට පණිවුඩය ලැබුණා ද? ඔහු ඈ හමුවීමට එයි ද? නැතහොත් සදහටම ඈ අමතක කොට දමයිද? යන සිතුවිලිවලින් ඇගේ සිත පටලැවෙන්නට විය. කළුවර වැටෙන්ට පෙර මා ආපසු ගෙදර යා යුතුය. මෙසේ සිතත්ම ඇගේ සිත මඳක් පැහැපත් විය. ඈත කවුදෝ ඔරුවකින් එනු දුටු නිර්මලා, නිසැකයෙන්ම ඒ රංජිත් බැව් වටහා ගත්තාය. ගතවූයේ විනාඩියකි. "නිර්මලා" කියමින් රංජිත් ඈ ළඟට ආවේය. එහෙත් නිර්මලා දෙස බලත්ම ඔහුගේ මුව අගුල් වැටුණි. නිර්මලා ද මහත් ආයාසයෙන් ඔහු දෙස බලා නැවත හිස පහත් කොටම සිටියාය. උණ පඳුර අසල කැදලි සාද ගෙන සිටි පක්ෂි සමූහයෝ පමණක් ඒ ඒ අතුවල ඒකරාශී වූහ. අසල තුඹු බක්මී ගසට දස දිගින් පියඹා ආ වවුලෝ සිත්සේ ඉදුනු එල රස භුක්ති විඳිමින් මහත් වේගයෙන් අත් තටු ගසන්නට වූහ. නැඟ එන සඳරැසින් පැහැපත් වූ ගඟ ජලය කිරි සයුර මෙන් ඔප දෙන්නට වන.

මෙතෙක් වේලා නිහඬව බලා සිටි රංජිත්ගේ සිත්හි අධික බියක් ඇතිවිය. "කෝ අම්මා තාත්තා! ඇයි ඔබ තනිවම මෙතැන" ඔහු සෙමෙන් ප්‍රශ්න කෙළේය.

"අම්මා තාත්තා නුවර ගියා, එන්නේ හෙට උදේ තමයි" කියත්ම රංජිත් තුළ ඇති වී තිබූ භීතිය පහවිය.

"නිර්මලා! ඉතින් ඇයි ඔබ හදිසියේ එන්ටය කියා මට පණිවුඩයක් ඇරියේ?"

"ඔබ මට නොකියාම ගියේ මක්නිසා දැයි දැන ගැනීමට" නිර්මලාගේ මුවින් පිටවිය.

UPLOADED BY ELIFE



රංජිත් සිනාසෙන්ට මෙන් තැත් කෙළේය. "ඔබ දන්නවා නොවෙද ඊට හේතුව?"

"දැන් ඉතින් අපි කුමක් කරමුද? තාත්තාගේ එකම කල්පනාව මා ගෙදරින් ඉක්මනටම පිට කිරීමයි. උදේ සිට හවස් වන තෙක් තාත්තා මඟුල් කපුවන් සමඟ කාලය ගත කරනවා මිසක් වෙන වැඩක් නෑ. රංජිත් කියන්න, මෙයට අපි කුමක් කරමුද කියා" නිර්මලාගේ මුහුණ බැගෑපත් භාවයෙන් තෙත් විය. මෙය දුටු රංජිත්ගේ හද ගිනි දුටු වෙඬරු මෙන් උණු වී ගියේය. හද පත්ලෙන් ගලා ආ වදනින් හේ නිර්මලා අස් වැසීය. "නිර්මලා මගේ සිව්මැලි පුෂ්පය! මගේ මිනිරුවන! මගේ සොඳුර, මා ඔබට කොපමණ ප්‍රේම කරනවාද කිවහොත් මගේ මේ ශක්තිමත් අත්දෙක යොදා මුළු ජීවිතයම වුවත් පුද ඔබ ලබා ගැනීමට පසුබට නොවෙමි. එහෙත් ඔබ අත් කර ගැනීම උදෙසා ඔබේ පියා සමඟ කෙසේ නම් සටනක යෙදෙම්ද? නිර්මලා මා මෙතෙක් කී අවවාදය නැවතත් දෙනවා, ඔබේ සිත මගෙන් ඉවත් කොට ඔබේ පියා කියන ලෙසට පිළිපදින්න."

"ඔබේ පියාගේ අනුමැතිය නැතිව කිසිවක් කරන්ට එපා. ඔහුට කීකරු වන්න."

"රංජිත් දැවුරුද්දක් පමණ කල් අපි එක පියස්ස යට වාසය කළා, කොයිම අවස්ථාවකදීවත් මා මව්පියන්ට අකීකරු වූවා ඔබ දුටුවෙහිද?"

"නෑ නිර්මලා, ඔබ අත එවැනි වරදක් තිබුණානම් මගේ සිත මේ තරම් පීඩා වන්නේ නෑ. ඔබ මීට පෙර කීකරු වූවාක් මෙන් දැන් මේ තීරණාත්මක අවස්ථාවේදීද වැඩිහිටියන්ගේ ආශිර්වාදය ලබා ගන්න. මා ඔබට කියන්නේ එපමණයි. මා සිත හදගත්තාක් මෙන් ඔබද මව් පියනට අවනතව ඔවුන් කියනදෑට සිත යොමු කරන්න."

"මගේ සිත එක තැනක ස්ථිරව තැන්පත්ව තිබිය දී කෙසේ අනෙකෙකු සමඟ ජීවත් වන්නද? අහෝ ඒක නම් කරන්ඩ බැරි දෙයක්! එය ලොකු වංචාවක්!"

"නිර්මලා මෙවැනි අවස්ථාවක ආත්ම පරිත්‍යාගයෙන් කටයුතු කිරීම ඉතාම අවශ්‍යයි. ඔබ දූන් කල්පනා කරන්නේ දියේ ඉන්නා මැඩියකු ලෙසටයි. ඔබේ අත ගැනීමට මට වඩා බොහෝ සුදුසුකම් ඇති පුද්ගලයන් සිටිනවා. ඔබේ පියා එවැන්නකු ඔබට සොයා දෙනවා ඇති."

"මගේම අවාසනාව! ඔබ මෙසේ කියන්නේ ඒ නිසාමයි." නිර්මලා සුසුම් හෙලන්ට වූවාය.

"මේ බව අසා ගන්න නිර්මලා, වාසනාව හෝ අවාසනාව මිනිසාට උවමනා හැටියට ලැබිය හැක්කක් නොවෙයි. අපගේ ජීවිතයට බලපාන දෛවය නමැති අසදෘශ පුද්ගලයා විසින් අප එකිනෙකාට වෙන් කළ නියමය අනුව අප ජීවිතය හැඩගසා ගත යුතුයි. කුඹලා කළය සාදන්නේ එක්තරා ප්‍රමාණයක ජලය පුරවා ලීමටයි. කෙසේ තැත් කළත් එහි අල්ලන තරමට වඩා ජලය පුරවා ලිය නොහැකියි. අපේ ජීවිතය ද එසේමයි. අප එකිනෙකාගේ ජීවිත හැඩ ගස්වන දෛවය නමැති ඒ අසදෘශ පුද්ගලයා විසින් අපට නියම කරන ලද්දක් අප පිළිගත යුතුමය. ඔබ මීට පෙර කීකරු වූවාක් මෙන් මේ එකම බලගතු අවස්ථාවේද ඔබේ වැඩිහිටියන්ගේ ආශීර්වාදය ලබා ගන්න. අප මේ ගැන කල්පනා කිරීමෙන් තව තවත් මොළය වෙහෙසට පත් කරනවා විනා වෙන ගත යුත්තෙක් නොමැත. එද අප දෙදෙන සහෝදර ප්‍රේමයෙන් ජීවත් වූවාක් මෙන් මතුවට ද එම සහෝදර ප්‍රේමය ඇති කර ගනිමු. මේ අවස්ථාවෙන් මිදීමට කළ යුතු ලෙහෙසිම කාර්ය ඔබ ගෙදරින් පැහැර ගෙන යාමයි. කිසි කලෙකවත් ඒ ලාමක බිය ගුලු ක්‍රියාව මා අතින් කෙරෙන්නේ නෑ. මෙසේ කියා රංජිත් නිර්මලා දෙස මහත් ආයාසයෙන් බලා හිස සැලීය.



"කවදාවත් මා එවැනි නින්දනීය වැඩක් කරන්නේ නෑ. එය ඔබට තේරුණාද, නිර්මලා."

"රංජිත්! අප ඇරඹූ යුධය අපම ජයග්‍රහණය කරා ගෙන යමු. සටනෙක පරමාර්ථය එයමයි. ඔබ දන්නවාද, තාත්තා ඔබ කියන තරම් දරදඬු නෑ, වරද ඇත්තේ අප අතයි. තාත්තා අප සමඟ ක්‍රෝධයෙන් සිටින්නේ අප මේ ගැන කිසිවක් ඔහුට නොකී නිසාය."

"නිර්මලා!"

"ඔව්, තාත්තා කීවා, ඔබේ සිතේ එවැනි අදහසක් මා ගැන ඇත්නම්. ඒ ගැන මට කියන්ඩ තිබුණා නොවේද කියා."

"තාත්තා - එහෙම - කිව්වා."

"තාත්තා, එක් වරක් නොවෙයි. දෙවරක්ම මේ බව සඳහන් කළා. අනේ රංජිත්! මෙහි තේරුම කුමක්ද? අපේ අනාගත සෞභාග්‍යය යම්තම් විදුලි එළියකින් පේනවා නොවේද? නැතිනම් තාත්තා මෙසේ කියාවිද?"

රංජිත් දිගු කල්පනාවක නිමග්න විය.

වේලාව මොහොතින් මොහොත හඬ දෙන්නාක් මෙන් නිර්මලාට දූනෙන්නට වන. තවත් බලා සිටිනු නොහැකිව ඕතොම නිසලතාවය මැඩ පැවැත්වූවාය.

"රංජිත්! ඔබ කුමක් ගැනද දිගු කල්පනාවක යෙදී ඉන්නේ?"

"ඔබේ පියා කීවාය කියන වචන ගැන තමයි - නිර්මලා!"

ඔහුගේ කට හඬ මඳක් දිරිමත් විය. මේ මගේ අන්තිම ප්‍රයත්නයයි. එයින් කුමක් වේද කියා කීම උගහටයි. මා මෙයින් පරාජය වුවහොත් මට එක පොරොන්දුවක් දෙනවාද?"

UPLOADED BY ELIFE

"ඔව්, ඔව්, ඇයි මේ තරම් බියෙන් මෙන්!" කියමින් නිර්මලාද මඳක් සැලෙන්නට වූවාය.

"මේ ප්‍රයත්නයෙන් අප දෙදෙනාගේ හමුවීමත් එයින්ම කෙළවර විය හැකියි. එවිට ඔබ කුමක්ද කරන්නේ?"

"එය වැරදුනොත්, මම තාත්තා කියන දෙයකට කැමති වන්නම්."

"ඔව්, එසේ කිරීමට පොරොන්දු වෙනවාද?"

"ඔව්, ඔබ වෙනුවෙන් මා තාත්තා කියන ඕනෑම දෙයකට කැමති වෙන්නම්." පස් කණ්ඩිය ඉහළ කාගේදෝ අඩි ශබ්දයක් ඇසිණ.

"කවුද ඒ නිර්මලා?" රංජිත් මඳක් තැතිගත් ස්වරයෙන් මෙන් ඇසීය. නිර්මලාද සිය අසුනෙන් නැඟිට කණ්ඩිය දෙසට නෙත් යොමු කළාය. කථාවක ශබ්දයක්ද කන වැටුණි.

"අනේ මන්ද කවුද දෙදෙනෙක් මේ පැත්තට එනවා" යයි කියමින් නිර්මලා රංජිත් දෙසට හැරුණාය.

"මම එහෙනම් යන්නම්. තවත් මෙතෙන සිටින එක හරි නෑ." මෙසේ කියමින් රංජිත් ද අසුනෙන් නැඟිට්ටේය.

"රංජිත්! ඔබ කුමක් කරන්නටද යන්නේ?"

"මා හෙට ආපසු එනවා."

"කුමටද?"

"ඔබේ පියා හමුවීමට."



නිර්මලා මඳත් තැති ගත. "ඔබ තාත්තා හමුවීමට වඩා ඔබගේ අදහස් ලියා තාත්තාට ලිපියක් එවන්න නරකද?"

"නිර්මලා" රංජිත් සිනාසෙන්නට විය. "ලියන්නේත් මමයි. පැමිණ කතා කරන්නේත් මමයි. මේ දෙකෙන් වඩා ප්‍රතිඵල ලැබෙන්නේ කුමන විදියටද කියා මා දන්නවා" කියා පසුද වනතෙක් දෙදෙන වෙන් වූහ.

* * *

රංජිත්, අතපත්තු මහතා හමුවීමට පැමිණියේ ඉතාම අශුභ වේලාවක විය යුතුය. වරක් ගෙදරින් පිටමං කරනු ලැබූවකු ආපසු එම ගෙය තුළට පැමිණෙන්නේ මහත් පැකිලීම් සහිත සිත් වේදනාවකින්ය. එහෙත් රංජිත් තමා වෙත පැවරී ඇති එම භාරධූර කාර්‍ය්‍යයට සරිලන පරිදි සිත දිරි ගන්වා ගනිමින් ආලින්දයේ ඉදිරිපසින් ගෙට ගොඩ වීය. රංජිත් ගෙට ගොඩ වෙනවා අතපත්තු මහතාට පෙණින. එහෙත් වචනයකින් වුවද ඔහුට සංග්‍රහයක් නො කෙරිණ. එක්තරා මිනිසෙකු ඉදිරියේ හිඳුවාගෙන හේ චතුර බසින් කථා කරන්නට වූයේය. අතපත්තු මහතා හොඳ ප්‍රතිපත්ති ගැන නම් කතා කිරීමට සමතෙකි. චිත්තාභ්‍යන්තරයේ පරම්පරානුයාත පුහු ගති කෙසේ බල පැවත්, නම්බුවට හා කීර්ති ප්‍රශංසාදියට වාල් වූ පුද්ගලයෙකු බැවින් අන්‍යයන් ඉදිරියේ වැදි බණ කීම ඔහුට පුරුදුය. උදම් බලාපොරොත්තුවෙන් එන තැනැත්තා වශීවූවකු සේ ඔහුගේ චතුර කටහඬට සවන් දිය යුතුය.

"අප රට සිංහල වර්ගයාගේ ලොකුම වචන දෙක තමයි; නෑ. බෑ. කීම. එබඳු අයට කවදාවත් නෑ, කිසිකලෙකවත් බෑ, ඉතින් මෙහෙම උනාම පුළුවන්ද අපට වැඩකරන්ඩ? මට වේලක් කන්ට මුදල් හෙම නැතිනම් මම නිරාහාරව සිටිනවා. එද මට මෝටෝරියක් තිබුණේ නෑ. ඒ නිසා මම පයින් ගමන් කළා. නමුත් අපේ මිනිස්සු බොහොමයක්ම කරන්නන් වාලේ කරන්ට

UPLOADED BY ELIFE

ගොස් උන් හිටි තැන් පවා නැතිකර ගන්නවා. අනවශ්‍ය දේවලට මුදල් නාස්ති කරන්ට නම් මෙහෙම හපන්නු තවත් නෑ. චාම් දිවි පැවැත්ම යන්න කුමක්ද කියාවත් ඔවුන් දන්නේ නෑ. ඒ නිසා තමයි බොහෝ අය තව තවත් ණය වී අමාරුවේ වැටෙන්නේ."

මෙතෙක් අතපත්තු මහතාගේ අනුශාසනාවට සවන් දී සිටි මිනිසා ඉවතට ගියේය. ඔහු ඇවිත් සිටින්ට ඇත්තේ යම්කිසි මුදලක් බලාපොරොත්තුවෙන් බව රංජිත්ට එකවරම අවබෝධ විය. දැන් තමාගේ වාරය නොවේදැයි සිතමින් හෙතෙම සිය මාමණ්ඩිය ළඟට යාමට නැගිට්ටේය.

"ආයුබෝවන්ඩ කපුමහත්තයා! මා මෙච්චර වේලා නිඳගැනීමටවත් නොගොසින් කපු මහත්මයා එනකල් තමා බලා සිටියේ." අතපත්තු මහතා මෙම කථාව කීවේ තවමත් ගෙට ගොඩනූවූ එක්තරා පුද්ගලයෙකුටය. ඔහුද "ආයුබෝවන්" කියමින් ගෙට ගොඩ වී අතපත්තු මහතා ඉදිරියේ පුටුවක වාඩිගත.

සිය ගමනෙහි නිශ්ඵලතාවය දැන්නම් රංජිත්ට අවබෝධය. එහෙත් ඒ ගැන කිසිත් නොතකා තෙමේ අතපත්තු මහතාට පෙනෙන සේ අඩියක් දෙකක් ඉදිරියට ගොස් අසල මේසය මත තුබූ පුවත් පතක් ගෙන අසුනක වාඩි වී කියවන්නට විය. හෙන පහරක් මෙන් කව්දෝ අවුත් රංජිත්ගේ ඇඟට පැන්නේය. ස්වල්පයක් ඉරීගිය පත්‍රයද පසෙකට දමා රංජිත් තමාට ආදර ගෞරවය දක්වන රාජා නැමති ඒ විශාල බල්ලා සුරතල් කරන්නට විය.

"ඇති, ඇති, ඉතින් පැත්තකට වෙයන්" රංජිත් කියත්ම රාජාද ඉදිරි ගාත්දෙක රංජිත්ගේ කලවා මත තබා බලහත්කාරයෙන්ම මුහුණ ලෙවකන්නට විය. "ඇති, ඇති, රාජා දැන් ඉතින් ඇති."



රාජාට නම් ආදරය පෙන්වීමේ ඇතියක් නැත. ඌට කථාකරන්ට බැරුවා පමණි. චතුර භාවයෙන් දිලිසෙන ඇස් දෙකින් ඌ ප්‍රශ්න අසන බැව් පෙනේ. "ඔබ මට නොකියා කොහේද ගියේ?" යනවග. ඌ නොඅනුමානවම අසනවා ඇත. රංජිත් සවස් වරුවේ ගංතෙරට යනවිට බල්ලා ද රැගෙන ගොස් මඳ වේලාවක් දියේ පිහිනීමට ඉඩහැර පසුව උගේ ඇඟ පිස දමා වැල්ලේ මඳක් දුර දුවවන පුරුද්දක් තුබුණේය. දැන් එය කිරීමට කිසිවෙකු නොමැත. ආදර සැලකීම් ආපසු දෙනුවස් රංජිත් උගේ ඔලුව පිරිමදිමින් ඌට සෙමින් කථා කරන්නට වූයේය. මේ මොහොතෙහිම පසුගිය සතියේ තමා කියවූ පොතක සඳහන් එක් වගන්තියක් සිහිවිය. ඒ පොත ලියා ඇත්තේ බල්ලාගේ උතුම් ගතිගුණ සිහි කිරීමටය. "මිනිසුන් තුළ විද්‍යමාන නිවට ගතිගුණ තත්ත්වාකාරයෙන් දැනගන්ට දැනගන්ට මම මගේ බල්ලාට ප්‍රිය කරමි යන්න එම පොතේ කතෘ ලියන්ට ඇත්තේ, මෙවැනි අවස්ථාවෙක් ඔහු ඉදිරියේ ද ඇති වූ නිසා වියයුතුයි. අනතුරුව රංජිත් බල්ලා ගැන සිතීම මඳකට නවතා කපුමහත්තයා සහ සිය මාමා අතර ඇතිවන කථාවට සවන් දෙන්නට වූයේය. හැබෑටම කපුමහත්තයා කියනවා වගේම, මමත් මේ පවුල ගැන සොයා බැලුවා, මීට වඩා වංශවත් ධනවත් වැදගත් පවුලක් මුළු ලංකාවේම නැහැ කියලා තමයි කවුරුත් කියන්නෙ."

"ආයෙත් මොනවද සභාපති මහත්තයා අහන්නෙ. මම මේවා සියල්ලක්ම සොයලා තමයි අන්තිමට හඳහන ගෙනවිත් දුන්නේ. ඇරත් සභාපති මහත්තයා! මා කරපු වැඩක් ආයෙනම් කීවෙ නෑ කව්රුවත් - මේකේ අහන්ඩ බලන්ඩ දෙයක් නෑ සභාපති මහත්තය, වැඩේ ඉක්මනට නොකළොත් කරන්ඩ ලැබෙන්නේ නෑ."

අසල මේසයක් මත තිබූ කවරයක් අතට ගත් අතපත්තු මහතා එහි තිබූ ලියවිල්ල අතට ගත්තේය. "මේ තමයි තුන්වැනි සැරේ. මා මේ හඳහන බැලූ අයගෙන් තුනෙන් දෙකක්ම කියනවා

UPLOADED BY ELIFE

නේ, හඳහන් දෙක ගැලපෙන්නේ නෑ කියලා. ඒ දෙදෙනාගෙන් එක් අයෙක් තමයි ලංකාවේ ප්‍රසිද්ධ හාමුදුරුනමක්. අද තමයි මේ ලියමන ලැබුණේ. මේකෙත් ලියා එවා තිබෙන්නේ එක හාමුදුරුනමක්. මේ හාමුදුරුවෝ කියනවා පොරොන්දම් විස්සෙන් විස්සම එකඟයි කියලා. හැබැයි කුමකින් කුමක් වෙයිද කියා කාටවත් කියන්ඩ බැරිලු, දෙදෙනාටම සෙනසුරුගෙ මහදශාවත් අතුරු දසාවත් අරගන ජන්ම ඒරාෂ්ඨකය යෙදී තිබෙන නිසා."

"සභාපති මහත්තයා" කපුමහතා හොඳට උගුර ශුද්ධ කළේය.

"ඔය හොඳ නරක කියන එක වැඩිය ගණනකට ගන්ඩ එපා. හඳහන් කැපෙන්නේ නැත කියන්නේ මොකද? ඔහොම ජෝඩු සොයා ගැනීම දුර්ලභයි කියන එක තමයි. එක එක හඳහන් කාරයාගේ කියමන් එක එක විදියයි. හඳහන් හරි-නොගියාට මොකද? පවුල් හරියනවා නම්! මෙහෙම සිරියා කඳකුයි කැපෙන හඳහනකුයි කොහෙන් සොයන්ඩද? එහෙනම් දිව්‍ය ලෝකේ දේවසමාගමෙන් වරම් ගන්ඩ ඕනෑ. අනේ සභාපති මහත්තයා! ඔය බමුණු මත ඉවතට දලා මෙන්න මේ පරස්ථාව කරන්ඩ සූදනම් වෙන්ඩ. මෙහෙම කැපෙන මනමාල මහතෙක් නම් පුංචි මැණිකෙට මේ කපේදි නම් සොයන්ට බෑ." මෙසේ කියා කපටි වදන් වලින් අතපත්තු මහතා පෙළඹවීමට ඒ කෛරාටික මඟුල් කපුවා උත්සාහ කළේය.

"ඔව්, හඳහන් කාරයන් කියන දේවල් අපට වුවමනා නෑ. අපට දැන් තියෙන්නේ මේ කටයුත්ත කල් නොයවා ඉක්මන් කිරීමටයි." මෙසේ කියා අතපත්තු මහතා සිය ප්‍රීතිය පළකරණුවස් සාක්කුවෙන් යම් කිසිවක් ගෙන කපුවා අත තැබීය.

"තොපි මියෙත්වා, රැකෙත්වා, මට ඕනෑ මේව තමයි." යන එකම චේතනාවෙන් යුත් කපුවා, එය බලත්ම මුහුණ පියුමක් මෙන් පුබුදු විය. වහාම ඔහු එය සිය කළු කබායේ සාක්කුවට බහාලීය.



ඔහු කුඩය අතට ගෙන යන්ට පෙර ප්‍රීතියෙන් ඉපිලෙමින් මෙසේ ද කීය; "මනමාලයාගේ තාත්තා කියන්නේත් මේ ටික තමයි. වැඩේ කල් දමන්ට එපා කියනවා. පවුල් දෙක කැමති නම් කල් අරින්ඩ කාරණයක් නැතිලු."

රංජිත් හුන් තැනින් නැගිට අතපත්තු මහතා ඉදිරියට අඩියක් දෙකක් තැබුවේය. අතපත්තු මහතා සාවඥ බැල්මකින් රංජිත් දෙස බලා මෙසේ කීය:

"උඹ දමල ගිය ඇඳුම් අරන් යන්ටද මෙහි ආවෙ? ඒවා මම උඹේ අම්මට භාර දුන්නා."

"මා මෙහි ආවේ ඇඳුම් ගෙනයාමට නොවෙයි. මාමා හමුවීමට." රංජිත් එඩිතරව කියා සිටියේය.

මුව මඳක් අයාගෙනම අතපත්තු මහතා රංජිත් දෙස බලා සිටියේය. "මා හමුවීමට මොකක් ද මගෙන් උඹට ඇති වුවමනාව?"

සටනට එළඹෙන සිංහරාජයෙකුගේ එඩිතර වික්‍රමාන්විත භාවයක් පෙන්වමින් රංජිත් තව අඩියක් දෙකක් ඉදිරියට ගොස් අතපත්තු මහතා අසල තුබු මේසය මත සිය යුගත් තබා මඳක් නැඹුරුවී, නිර්භීත ස්වරයෙන් මෙසේ කීයේය:

"නිර්මලාගේ අනාගත ජීවිතය ගැන සම්පූර්ණ වගකිව යුත්තා ඔබයි. ඇගේ අනාගතය කෙලෙසක විසඳේදැයි නිශ්චය කරගත හැක්කේ ඔබ ගන්නා නිගමනය අනුවයි. මේ ගැන ඔබ ඉතා සුපරීක්ෂාකාරීව ක්‍රියා නොකළහොත් පරතෙරක් නොපෙණෙන පශ්චාත්තාපයකට ඔබට මූණපාන්ට වෙනවා පමණක් නොව, ඔබගේ ජීවිතයද කරදකාරීව කෙළවර විය හැකියි. ඔබට වෙන දරුවෙකුත් නෑ. ඔබට ඇති එකම වස්තුවත් ඔපමණයි. මේවා හොඳ හැටි කල්පනාකර බලා කටයුතු නොකළොත් සමහරවිට

UPLOADED BY ELIFE

පරණ පව් පවා මතුවිය හැකියි. තවද මාමා දන්නවා නොවේද කුඩා කාලයේ සිටම මා නිර්මලාට කොපමණ ලැදිව සිටියාද යන්න."

රංජිත් තවත් කිසිවක් කථා කරගත නොහැකි තත්ත්වයකට පත්විය. අතපත්තු මහතා රෞද්‍ර ව්‍යාඝ්‍රයෙකුගේ විලාශයෙන් ඔහුගේ මුහුණට කඩාපැන්නේය.

"කට් වහපන්; ඔය ඇති! ඒ කාලේ යාළුකමත් මම දන්නවා. මේ කාලේ යාළුකමත් දන්නවා. ඒ ගැන නුඹ මට කිසිදෙයක් කියන්ඩ වුවමනාවක් නෑ. ඔය යට ගිය දේවල් ආපසු මතක් කරලා මාව කෝප කරන්ඩ විතරක් එපා. ඉතින් පලයන් යන්ඩ." මෙසේ කියා මඳක් ඇඟපත සොලවා ඉවත බලාගත්තේය.

රංජිත් නොවේ හුන්තැනින් සෙලවුනේ! අන් කිසිම අවස්ථාවකදීවත් නොමැති වූ මානසික ශක්තියක් දැන් ඔහුට අත් වී ඇත. ඔහුගේ එඩිතර භාවය වශීකරන සුළුය.

"මා අතින් යම්කිසි වරදක් සිදුවූවා නම් ඊට ක්ෂමාව ඉල්වන්ටයි මම ආවෙ."

"උඹ ආ පාරෙන්ම මෙතනින් පලයන් යන්ඩ, උඹටත් මටත් කිසි කථාවක් නෑ." අතපත්තු මහතා බෙරිහන් දුනි.

රංජිත්ගේ උදර මහත්මා ගති ඉදිරියේ අතපත්තු මහතාගේ අහංකාර රළු ස්වභාවය තදින් කැපී පෙනෙන්නට විය. පරාජය තමා ඉදිරියේ පෙනෙන්නට තිබියදීම රංජිත් තවත් කථා කළේය.

"තරුණයෙක් තරුණියකට ආලය කිරීම ලොව සිදුවන අරුම පුදුම දෙයක් කියා ඔබ සිතුවාද?" හෙතෙම සිය මාමාගේ මුහුණ බලාගෙනම ප්‍රශ්න කළේය.



අතපත්තු මහතා සිය අසුනෙන් නැගිට රංජිත් ඉදිරියට යාමට සැරසුණේය. "උඹ මගේ දුවට ආලය කළේ නෑ. උඹ මගේ දුවට අයිති දේපලවලට ඇස් ගසාගන සිටියා. ඒ බව මම දැනගත්තේ මේ ළඟදී තමයි."

රංජිත් සාවඥ සිනාවක් පළකළේය. සිය මාමණ්ඩිය සිතන්නේ අවට සියල්ලක්ම තමා අනුගමනය කරතියි කියාය. තමාගේ නිදෙස් භාවය පළ කිරීමට දැන් වේලාව නොවේ. "නිර්මලාගේ අතින් අයිති නොවූවත් මාමාගේ දේපලින් අඩක් මට අයිති නොවේද?" හෙතෙම එඩිතරව කියා සිටියේය. අතපත්තු මහතාගේ ඇස් ගිනි පුපුරු දෙකක් මෙන් ක්‍රෝධයෙන් දිලිසෙන්නට විය.

"මොනවා? කියාපන් තව සැරයක්," හේ පහර දෙන්නට ලෑස්ති විය. රංජිත් හුන් තැනින් නොසෙල්වින. "මම කියන්නේ ඔබේ පිය උරුමයෙන් ආ දේපලවලටයි. මෑතකදී දුප්පතාට සමාජ-වාදයෙන් කටයුතු කිරීමට ගොස් හම්බ කරගත් දේපලට නොවෙයි."

ඒ ඇනුම් පදය වහා තේරුම් කොටගත් අතපත්තු මහතා ඉදිරියට පැන රංජිත්ගේ කම්මුලට තදින් පහරක් ගැසීය. රංජිත්ද මහමෙර මෙන් නොසැලී එතැනම සිටියේය. අතපත්තු මහතාගේ සර්වාඞ්ගයම සැලෙන්නට වන. මෙසේ වෙව්ලමින් ඔහු රංජිත්ට සාප කරන්නට වූයේය. "කුඩා කල පටන් ඉන්ඩ තැන දුන්නා. ඉගැන්නුවා, රක්ෂාවල් ලබා දුන්නා, තවත් කරන්ඩ පුළුවන් දේවල් සියල්ලක්ම නොඅඩුව කළා. එහෙත් මේ දුර්ජනයා කළේ කුමක්ද? මගේ එකම දරුවා ගෙදරින් පැහැරගන්ට තැත් කළා. පලයන්, පලයන්." හේ උන්මත්තකයකුගේ විලස් පාන්ට විය.

"මට උගන්වන්ඩ මුදල් ගියා කියා, මගේ අසරණ මව රවටා ඇගේ සියලු ඉඩමක්ම ඔබ සන්තක කරගන තිබෙනවා. එය මට රහසක් නොවෙයි." තරුණයා කීවේය.

UPLOADED BY ELIFE

අතපත්තු මහතා අසාධ්‍ය පිස්සෙකු මෙන් කෑගසා ඔහු ඉදිරියට පැන තවත් පහරක් ගැසීය. එහෙත් රංජිත් නොසැලිණ. ගේ අවට සිටි වැඩකරුවෝද වටින් පිටින් රැස්ව බලා සිටියහ. මෙතෙක් වේලා සිය කාමරය තුළ සියල්ල අසා සිට නිර්මලා හදිසියෙන් ඉදිරියට පැන ගොදුරට අසුවූ මුව පොව්වෙකු මෙන් හඬන්ට වූවාය.

"රංජිත් අත වරදක් නෑ. ඔහුට මෙසේ දෙස් නඟන්ට එපා. වරද ඇත්තේ මා අතයි."

"උඹ පලයන් ඇතුළට, උඹට මෙතන කථාවක් නෑ." කෑගසත්ම නිර්මලා ආපසු සිය කාමරයට ගියාය.

හදිසියේම මැඬ පැවැත්විය නොහෙන උන්මාද ලක්ෂණයකින් අතපත්තු මහතා පෙළෙන්නට විය. "උඹ මාගේ දුව ගෙනයන්ට ආවා, මට බෑණා කෙනෙක් ඉදිරිපත් උනා. හඃ හඃ හ මේ මගේ බෑණා, ඔන්න බලා ගනිල්ලා! උඹ හිතුවාද මම මගේ කෙල්ල කැලි කපලා මේ ගඟේ පාකරලා හැරියත් ඔබ වැනි නිවටයෙකුට ඒකිව දෙනවා කියලා. මීට පස්සෙ මගේ දරුවා හොයාගෙන මේ ගඟෙන් මෙගොඩට එන්ට එපා. මම කියන දේ උඹට තේරුණාද? කාලකණ්ණියා" මෙසේ කියා තමා කීදේට තමාම ප්‍රීතිවන්නාක් මෙන් අතපත්තු මහතා තව වරක් මහ හඬින් සිනාසෙන්නට වූයේය.

අඳුනක් ඉදිරියේ මෙල්ල වූ නාගරාජයෙකු මෙන් රංජිත් සිය මාමා දෙස බැගෑපත් බැල්මක් හෙලා පස්සට අඩියක් ගත්තේය. "නවතින්ඩ මාමා! මම යනවා. ඔව්, මම දැන්මම යනවා කැළණි ගඟේ කපා දැමිය යුතු අයකු නොවේ නිර්මලා! ඈ වටිනා ස්ත්‍රී රත්නයක්" නැවත යමක් කීමට අමතක වූවකු සේ ඔහු තව වරක් අතපත්තු මහතා ඉදිරියට අඩියක් තැබුවේය.



"නිර්මලා කෙරෙහි මම කිසිකලෙකවත් අයුතු බලපෑමක් කළේ නැහැ. ඒ බව මට වඩා හොඳින් ඈ දන්නවා ඇති. ඔබේ අහංකාර පුහුමානයට නිර්මලාට වග කීමට සිදු නොවේවා! ඔබේ පව් නිර්මලාට ගෙවන්ට සිදු නොවේවා! මේ මාගේ එකම ප්‍රාර්ථනාවයි."

මෙසේ කියා රංජිත් ලහිලහියේ ආපසු පා නැඟීය.

එද හදිසියේම සියඹලාගහ වලව්වේ ඇති වූ නිශ්චලතාවය දැරිය නොහැකි තරම් දරුණු විය. අතපත්තු මහතා සිය කාමරයට වැද දොර වසා ගත්තේය. හාමිනේ සිය කාමරයට වැද කම්මුලේ අත තබාගෙන සුසුම් ලන්නට වූවාය. නිර්මලාද සිය කාමරයට වී කවුළු දොර හැර ඈත බලාගනම සිටියාය. ගෙදර වැඩකරුවෝද අවස්ථාවට ගැළපෙන පරිදි මහත්සේ තුෂ්ණීම්භූතව සිය කාරියන්හි යෙදුණාහ. මේ ආකාරයෙන් දවස නිම වී රාත්‍රී කාලයද ළඟා වූයේය. ඈත ගඟ පෙදෙසෙහි පැවති නිසලතාවයත් සමඟම නිර්මලාට මතක් වූයේ රංජිත් ඉදිරියේ කළ පොරොන්දුවය. වහා ඈ කාමරයෙහි දොර හැර මහත් කනස්සළු භාවයෙන් යහන මත වැතිර සිටි සිය පියාණන් වෙත ගියාය. "තාත්තා!" ඇගේ කට හඬ පහත් විය. පියාද සිය දියණිය දෙස මහත් චංචල සිතින් බැලීය. "තාත්තා! අද දවල් සිදුවූ දෙය මගේ වරදින් සිදුවූවක්. මා රංජිත් සිතින් ඉවත් කළා. තාත්ත මා වෙනුවෙන් කරන ඕනෑම දෙයකට මා සතුටු වෙනවා. තාත්තා මට සමාවන්න."

නිර්මලාගේ බැගෑපත් ලීලාව දුටු අතපත්තු මහතාගේ සර්වාඞ්ගය චලනය වන්ට විය. "මගේ දුව!" හේ ඉකි බිඳිමින් අඬන්ට වූයේය.

මේ අවාසනාවන්ත සිද්ධියට පසුව නිර්මලා ඉක්මනින් විවාහ කරදීමේ අවශ්‍යතාවය අතපත්තු මහතාට මනාසේ පැහැදිලි විය.

* * *

UPLOADED BY ELIFE

සිසිල් වින්ස්ටන් මද්දුම බණ්ඩාර කොබ්බෑකඩුව, මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙහි සීනියර් විභාගයෙන් ගෞරව සහිතව සාමාර්ථය ලැබ පසුව නීතිය හැදෑරීම සඳහා එංගලන්තයෙහි, විශිෂ්ඨ නීති විද්‍යාලයකට ඇතුළු විය. වයස විසි දෙකක් ඉක්ම යෑමට කලින් හේ බැරිස්ටර් ගරුනාමයද අත්කොට ගත්තේය. පසුව කිසිදු කරුණක් නොමැතිව ඔහු එංගලන්තයෙහි රැඳී සිටීම නිසා ඔහුගේ නෑදෑ හිත මිතුරෝ මහත් සැක සහිත කනස්සලු භාවයකට පත්වූහ.

කොබ්බෑකඩුව මහතා මනා කඩවසම් දේහයක් ඇති තරුණයෙකි. පස්වසක් එංගලන්තයේ වාසභූමිය කොට ගත් හේ හැකි පමණ සංකර සිරිත් විරිත් අනුගමනය කරන්නට වූයේය. පෙරලා ලංකාවට ආ පසු ද හේ අවිවාහකයෙකු ලෙසට ප්‍රසිද්ධියක් දැරීය.

"පොහොසත් අයගෙ ඇති කුලමල නැතිවේවි.

දුප්පත් අයගෙ නැති කුලමල ඇතිවේවී."

පුරාණ ගැමියෙකුගේ කව් දෙපදයකි.

තමාට සතුවී තිබෙන වතුපිටි ඈ ධනසම්භාරය අනුව රැකියාවක් නුවුවමනා වුවද උගත් කමින් ප්‍රයෝජනය ගැනීමට සිතූ බැරිස්ටර් මහතා කඩුගන්නාවේ පදිංචිය ගෙන නීති විධායකයෙකු ලෙස නුවර අධිකරණයෙහි වැඩ කෙළේය.

බැරිස්ටර් කොබ්බෑකඩුවගේ පියා රජ පෙළපතකින් පැවැත එන්නෙකුයයි කථාවක් ඇත. ඔහුගේ පෙළපත එතරම් පැරණිය ඉංග්‍රීසි ජාතිකයා කඩුගන්නාවෙන් ඔබ්බට ගියේද එක කොබ්බෑකඩුව කෙනෙකුගේ සහාය ඇතුවයයි තවත් කථාවකි. වර්ෂ 1815 දී ඉංග්‍රීසින් අතට ලක්දිව අත්වෙද්දී, කොබ්බෑකඩුව



මහතා එක් ජනප්‍රධානියෙක් ලෙසට කඩුගන්නාවේ කඳු පාමුල වාසය කළ බවද නොරහසකි.

නම, ගම, පෙළපත හා වංශ පමණක් අනුව මිනිසෙකුගේ සුදුසුකම සොයන අතපත්තු මහතාට සිය දියණිය විවාහ කර දීමට මෙම බැරිස්ටර් මහතාට වඩා යෝග්‍යතම පුද්ගලයෙකු ලක්දිව තවත් නැතැයි පෙනී ගියේය. තමා දත් සමාජයේ ලබා ඇති අද්විතිය ස්ථානය අනුව විශාල නමක් ඇති උසස් පරම්පරාවකින් පැවත එන ඉහළම අඩියේ වැජඹෙන කෙනෙකු විනා අන් කවර පුද්ගලයකුවත් නොගැළපේය යන්න අතපත්තු මහතාගේ පරම විශ්වාසය විය.

* * *

පසුගිය කාලපරිච්ඡේදය සඳහටම අමතක කිරීමට ඉටාගත් රංජිත් තමාට අත්වූ ශිෂ්‍යත්වය පිළිබඳ වැඩ කටයුතු කිරීමෙහි නිරතවිය. දෙමසකින් ඔහු ලන්ඩන් නුවර විශ්ව විද්‍යාලයට ඇතුළුවිය යුතුය. නැතහොත් ශිෂ්‍යත්වය අවලංගු වන්නේය. තමා මෙතෙක් කල් මහා බැංකුවේ කරනු ලැබූ වැඩ සියල්ල භාර ගැනීමට ලන්ඩන් විශ්ව විද්‍යාලයෙහි ගණකාධිකාරයෙකු හැටියට පුහුණුව ලැබූ ඔස්ටින් දළුවත්ත නැමැත්තෙකු පත්වින. එක්ව වැඩකළ මේ දෙදෙන නොබෝ දිනකින් අති මිත්‍රයෝ වූහ.

දිනක් බැංකුව මඟින් එංගලන්තයට හරිනු ලැබූ මුදලක් සම්බන්ධව ලිපිකරුවන් අතර කලබලයක් ඇතිවිය. එක් ලිපිකරුවෙක් මේ බව දළුවත්ත මහතාට කියා සිටියේය. දළුවත්ත මහතා විසින් එය සෝදිසි කිරීම රංජිත්ට පවරනු ලැබීය. මුදල් කුවිතාන්සිය අතට ගත් හෙතෙම වහා ගණන් පොත් පිටු ආපසු පෙරළා එහි නිධානය සොයා ගත්තේය. මෙය මසකට වරක්

UPLOADED BY ELIFE

කෝර්න්වෝල්හි පදිංචි අගතා සිම්සන් නමැත්තෙකුට අරින රුපියල් දාහක් යයි රංජිත් පෙන්වීය. නම ඇසූ විගස යම් කිසි පැකිලීමක් දළුවත්ත මහතා තුළ ඇතිවිය. ඒ බව රංජිත්ට මැනවින් වැටහිණ.

"ඔස්ටින් ඔබ අගතා සිම්සන් නම් ඇසූ විගස ඔබගේ මුහුණෙහි වෙනසක් ඇතිඋනා. ඒ මන්ද?"

"නෑ මම ඈ අඳුනනවා, එපමණයි." කියා ඔස්ටින් බිම බලා ගත්තේය.

"කෙනෙකු දන්නා අඳුනන පළියට මෙසේ වෙනස්වීම් ඇතිවන්නේ නෑ. ඔබ මෑ සමඟ අයතා සබඳකමක්වත් ඇති කරගෙන තිබුණාද?"

"රංජිත්, මම අවුරුද්දක් ලන්ඩන් විශ්ව විද්‍යාලයෙහි උගෙන උපාධියක් ලබාගත්තා. එහෙත් මගේ රට, මගේ ජාතිය, මගේ සිරිත් විරිත් අතහැර දැමීමට සිදුවන කිසිවක් මා අතින් කෙරුණේ නෑ."

"මට සමාවන්න." රංජිත් ඉල්ලා සිටියේය.

"ඔබ කියන තාලයේ අය මේ රටේ නැතුවා නොවෙයි. පිටරට නොහොබිනා අන්දමට හැසිරිලා නැවත තමන්ගේ මව් බිම කරා අවුත් ඊටත් වඩා දරුණු වැඩ කිරීමට යන අය බොහොමයි. ඒක තමා මට ඉවසන්ඩ බැරි රංජිත්," මෙසේ කියමින් ඔස්ටින් මුදල් සහතික පත ආපසු ගෙන එය මාස්පත අරින තැනැත්තාගේ නම සෝදිසි කෙළේය.

"මේ නම කුමක්ද?" ඔහු රංජිත්ගෙන් ඇසීය.

"පලිපාන" රංජිත් උත්තර දුනි.



"ඔහු පලිපාන නොවෙයි මිතුර, ඔය බැංකුවට දී තිබෙන හොර නමක්. ඔහුගේ නියම නම සිසිල් කොබ්බෑකඩුව."

මෙය අසත්ම රංජිත්ගේ සිරුර මඳක් චලනය විය. එදා තමා සියඹලාගහ වලව්වේ හිඳ සුනබ පෝතකයා සුරතල් කරන වේලාවේදී කොබ්බෑකඩුව යන නම නිතර ඇසීමට ලැබුණු හෙයිනි.

"ඔස්ටින්, මට මොහු ගැන දන්නා දෙයක් ඇත්නම් නොවලහා කියන්න. මොහු අවිවාහකයෙක්ද? කොහේද පදිංචිය? මොහු සම්බන්ධව ඇති නොමනා ක්‍රියා කවරේද?" රංජිත් නැවත නැවතත් අයැදීය.

ඔස්ටින් රංජිත් දෙස බැලුවේ මඳක් සැක සහිතවය.

"කියන්න ඔස්ටින් කියන්න! මට මේ ගැන දැන ගැනීම ඉතා අවශ්‍යයි."

"රංජිත් මිතුරෙකු පාවාදීම දරුණු වැඩක්, නමුත්, ඊට වඩා දරුණු ක්‍රියාවක් ඒ මිතුරාගෙන් කෙරෙන්ට යනවානම්, ඔහු ගැන දන්නා සත්‍යමය තොරතුරු හෙළිකිරීම රටට කරන උසස් සේවයක් නිසා මොහුගේ නියම තතු නොසඟවා කියමි. සිසිල් කොබ්බෑකඩුව අගතා සිම්සන් නමැත්තියක සමඟ සබඳකමක් ඇති කරගෙන සිටියා. ඔහු සති අන්තය ගත කළේම ඇගේ නිවසේ තමයි. මෙසේ අවුරුද්දකට පමණ පසු ඈට පුතෙකු ලැබුණා. තවත් වසක් ඉක්මෙනවාත් සමඟම ඈට තව දරුවෙකු ලැබුණා. දිනක් හදිසියේම සිසිල් මා සමඟ කීවා ඔහු ඈ සමඟ විවාහ වූවා කියා. පළමුව මා එය විශ්වාස කළේ නෑ. එහෙත් පසුව මා දැනගත්තා එය සත්‍යයක් බව. මා ලංකාවට එන්ට හමසකට පෙර සිසිල් නැව් නැංගා. දිනක් ඔහුගේ භාර්‍යාව මට හමු වුණා. එහිදී ඈ කියා හිටියා, තම ස්වාමියාගෙන් සැහෙන මුදලක් ලැබෙන බවත්, වසකින් පමණ ඈ ලංකාවට ගෙන්නා

UPLOADED BY ELIFE

ගන්නා බවත්. ළඟදී සිසිල් මා හමුවීමට ආවා. මා එංගලන්තයේදී විවාහ වූ බවත් කිසිවෙකුට සඳහන් කරන්ට එපා කීවා. ඔහු කොළඹට නුදුරු එක් තරුණියක් සමඟ විවාහ ගිවිස ගන්ට යනවා කීවා. "ඔබ කරන්නේ ලොකුම වරදක් යයි මම ඔහුට කියා සිටියා." "ඔස්ටින් ශබ්ද නැතුව හිටපන්, නිධානයක් පහළ වන ලකුණු තිබියදී එය අත නො ගසා ආපසු දුවන්නේ කවරෙක්ද?" කියා ඔහු මගෙන් ඇසුවා. "ඔව්" රංජිත් ඔහු කැළණියේ පාලම අසල විශාල ධනවතෙකුගේ එකම දියණිය සමග විවාහ ගිවිස ගන්ට යනවාලු, කීපදිනකින්. . . . . . . රංජිත් - රංජිත්"- හදිසියෙන් මූර්ඡාවූවකුසේ හීන් හඬක් නිකුත් කොට රංජිත් මේසය මත හිස තබාගෙන කෙඳිරි ගාන්නට වූයේය.

"රංජිත් ඔබට මොකද? ඉර හඳ පවතිනා තුරු මා කීවේ සත්‍යයක්." මෙසේ කියා අසල තුබූ වතුර වීදුරුවක් වහා ගෙනවුත් රංජිත් අතට දින.

"ඔස්ටින්! කරුණාකර සවල්ප වේලාවකට මගේ කාමරයෙන් ඉවත්ව මට තනිව ටිකක් ඉන්ට ඉඩ හරින්න"යි රංජිත් ඉල්වීය.

මිතුරාගේ අණට කීකරු වූ ඔස්ටින් පිටුපස බලමින්ම කාමරයෙන් පිටවිය.

"අහෝ, නිර්මලා! අසරණ නිර්මලා! කිසිවෙකුට පීඩාවක් කරන්නේ කුමක්ද වත් නොදත් මගේ අහිංසක නිර්මලා! ඔබට සිදුවන්ට යන්නේ කුමක්ද? අහංකාරයත් වස්තු උන්මාදයත් විසින් නොමඟ ගෙන ගිය ඔබේ පියා ඔබ බිලිදෙන්ට සැරසෙනවා නොවේද? මට මෙය බේරුම් කර දෙන්ට බැරිද? අහෝ දෙවියනි අසරණ නිර්මලා මට මේ උවදුරින් බේරා ගැනීමට අනුග්‍රහය වෙත්වා! මගේ මේ අත් පා ශක්තිමත්ව තිබියදී මගේ සිතේ අධිෂ්ඨානය පෙරටු කොට තිබියදී මම කොයි ලෙසකින්වත්



ඇට උපද්‍රවයක් වීමට ඉඩ නොතබමි. ඔව්, අදම කළයුතු දෑ කළ යුතුය. දවසක් වත් මෙසේ පසුවීමට ඉඩ හැරියොත් ඈ මේ භයානක මාර මුඛයට තව තවත් ළං වන්නේය." රංජිත් සෙමෙන් වැළපුණි.

එදින රාත්‍රියේ සැමීගේ ආධාරයෙන් රංජිත් සහ නිර්මලා සුපුරුදු උණ පඳුරු යටදී හමුවූහ.

"නිර්මලා!" රංජිත් වැළපුණේ නැතුවා පමණය. "ඔබ අනතුරේ. මේ රටේ කිසිම තරුණියෙක් පත් නුවූ විපතකට ඔබ මුහුණ පා සිටිනවා. මා ආවේ සිදුවන්ට යන එම විපතින් බේරා ගැනුම වස් ඔබ රැගෙන යන්ඩයි."

"රංජිත්" නිර්මලා පහත් හඬින් කථා කළාය. "ආලය නොකරන්නෙකු සමඟ විවාහවීම කොපමණ අසාධාරණයක්ද? එහෙත් දූන් මා ඔබ සමඟ යන්නේ කෙසේද?"

නිර්මලාට පැමිණෙන්ට යන අනතුර කුමක්දැයි නොකීමට රංජිත් කල් ඇතිවම තීරණය කොට තිබුණේය.

"නිර්මලා! ඔබ මට පෙරසේම ආලය කරනවාද?"

මෙය කන වැටුණු ඈ සෙමෙන් හඬන්ට වූවාය. "රංජිත්! ඇයි, ඔබ මා අවිශ්වාස කරන්නේ? ලොව සුදුසුකම ඇති පුද්ගලයින් සියල්ලම එක් පසෙකට දමා ඔබ තනිව පැත්තක සිටිත්නම්, මා තෝරා ගන්නේ ඔබ බව දන්නේ නැද්ද?"

"එසේනම් නිර්මලා ඔබ මා කියන දෙයට කීකරු විය යුතුයි."

"මා ඔබ කියන ඕනෑම දෙයකට කීකරු වන්නම්."

"ඔබ, මුදු මාරු කරන්නේ කවදාද?"

UPLOADED BY ELIFE

"අනිද්දා, සෙනසුරාදා."

"ඔබ මුදු මාරු කරන දිනට පෙරදින රාත්‍රියේ මෙතනට පැමිණෙන්ට, මා අවුත් ඔබව රැගෙන යන්නම්. ඔබව එක්තරා ස්ථානයක නවත්වා ඔබ පිටමං කළේ කුමකටදැයි කරුණු කියා පෑමට මම මුදු මාරු කරන සුභ මොහොතට මෙහි පැමිණෙනවා. ඔබ මෙහි සිටිනා තාක් මට කිසිවක් කිරීමට ඉඩක් නැහැ. නිර්මලා මා ඔබට කියන දේ තේරුණාද? මෙය ඔබගේ මරණයත් ජීවිතයත් අතර ඇති සටනක්." රංජිත් කන්නලව් කෙළේය.

ඔහුගේ බැගෑපත් ඉල්ලීම කෙතරම් උත්සුකවීද කිවහොත් එය ප්‍රතික්ෂේප කිරීමට නිර්මලාට කිසිසේත් නොහැකි විය.

"ඔව්, රංජිත් මේ විවාහයෙන් අත් මිදීමට ඔබ කියන ඕනෑම දෙයක් මා කරන්නම්. මා සොයා එන අමුත්තා බොරුවෙන් සංග්‍රහ කරන්නේ කෙසේද?"

නිර්මලා සිතන්නේම ඈ අතින් සිදුවන වරද ගැනමය. ඈට පැමිණෙන උවදුර ගැන නම් කිසිදු කල්පනාවෙක් ඈ තුළ නොවීය. එය කවදත් නිර්මලාගේ චරිත ලක්ෂණයකි.

"නිර්මලා!" රංජිත්ගේ බැල්ම කරුණාවෙන් පිරුණු එකක් විය. "මේ මොහොතෙහි ඔබ මා කෙරෙහි ඇති කරගත් විශ්වාසය අල්ප මාත්‍රයකුදු බිඳී යෑමට ඉඩ තබන්නේ නෑ. මා පොහොසතෙකු නොවෙයි. ඔබ ගෙල පැළඳ වීමට අගනා රන් මාල මා අත නැති වුවද මගේ මේ ශක්තිමත් අත් යුවළින් ඔබ ගෙල පළඳවන්නම්. ඔබ රැගෙන යෑමට ඔබිනා මාළිගාවල් මා සතු නුවූවද මගේ ජීවිතය නොබලාම ඔබට රැකවරණය දෙන්නම්. මා සිටින තෙක් ඔබ කිසි කලෙකවත් අසහාය තාවයෙන් පෙළෙන්ට ඉඩ නොතබමි. නිත්‍ය ප්‍රේමය නමැති ප්‍රදීපයෙන් අප දෙදෙනාගේ ඉදිරි ගමනට බාධා කරන අන්ධකාරයත් දුරුවනු ඇත."



සිය පෙම්වතා හමුවීමෙන් ලැබූ ප්‍රීතියෙන් උදම් වී ඔහුගේ සුරක්ෂිත භාවයෙන් රැකවරණය ලබමින් නිර්මලා නිසලව ඔහු දෙසම බලා සිටියාය. ගඟ හරහා හමන සුළු මාරුතය දෙදෙනාගේ ගත පිරිමදින්ට වූයේය. කූඩුව සොයා ගස වෙත ආ අන්තිම පක්ෂියාද අත්තටු සලා සිය පැටවුන් තුරුළු කොට ගෙන නිඳන්ට වන. ගඟෙහිද අන්කිසි දිනකවත් ඇති නොවූ තද විවේකී භාවයෙක් පෙනෙන්නට වන.

"ඉතින් නිර්මලා! මා යන්නම්" රංජිත් නිර්මලාගේ කනට කොඳුරා කතා කළේය. "හෙට රෑ දහයට මෙතනට ඇවිත් සිටින්නම්. සැමී ඔබට මෙතනට ඒමට ආරක්ෂාව දෙනවා ඇති. කිසිවකට බිය වන්න එපා. මා ඔබ ළඟයි."

බිළිඳකු සිය අත්ලෙහි තුබූ පැණි රස දෙයක් ඉවත් කරන්නාක් මෙන් රංජිත් සිය අත්ලෙහි රඳවා තුබූ සිව්මැලි අත් යුවල සෙමෙන් අතහැරියේය. පසුව ඈ දෙස නොබලාම සීරුවේ ගොස් ඔරුව දියත් කර ගඟ හරහා පදවන්ට විය. ඔරුව නොපෙනී යන තෙක්ම නිර්මලා ඒ දෙස බලා සිට ආපසු හැරී ගේ දෙසට පා නැඟුවාය.

සෙනසුරාදා පෙරවරු 10 ත් විනාඩි 30 ට සියඹලාගහ වලව්වේ නව යුවලගේ මුදු මාරු කිරීමේ උත්සවය යෙදී තිබුණි. අතපත්තු මහතාද සිකුරාදා උදේ සිට රෑ වනතෙක් ගෘහය සහ අවට වත්ත සැරසීමෙහි නිරත විය. කිසියම් දිනකවත් නොසිටිය අලි ඇතුන් ගණනාවක්ම කල් ඇතුවම වලව් වත්තට ගෙනෙනු ලැබූහ. මෙසේ අලි ඇතුන් ගස්වල බැඳ තබන ලද්දේ සිය වලව්වට සැපත් වන ප්‍රභූ ජනයාට සිය වත්කම පෙන්වීමටය. සෑම ගසක්ම නා නා වණී විදුලි බුබුළු වලින් සරසා තිබුණි. සිකුරාදා රාත්‍රියෙහි මුළු වත්තම මිහිපිට සුර පුරයක සිරි ඉසිලීය.

මුළු සිකුරාදා දවසම මෙසේ කලබලකාරී තත්වයක තුබූ සියඹලාගහ වලව්ව රාත්‍රී නවය පමණ වන විට අධික

UPLOADED BY ELIFE

නිශ්චලතාවයක් පැතිර ගියේය. ගෙදර වැඩ කරුවෝද පාන්දර අවදි වන්නට බලාපොරොත්තුවෙන් ඒ ඒ තැන්වල නිඳාගත්හ. අතපත්තු මහතා පමණක් වලව්වෙහි ඉදිරිපස සැප පුටුවක හිඳ කව්දෝ සමඟ කථා කරමින් සිටියේය.

රාත්‍රි අටට පමණ සිය කාමරයට වූ නිර්මලා එහා මෙහා ඇවිදිමින් තමා කරන්නට යන සාහසික ක්‍රියාව මෙනෙහි කරන්ට වූවාය. කාලය එලඹෙත්ම එල්ලුම් ගසකට කැපවූවකු සේ ඇගේ ගත සැලෙන්නට විය. ගේ පිටුපස දමා තිබූ විදුලි පහන් එකින් එක නිවී ගියේය. අසල ඔරලෝසුවේ නවය වැදෙන්ට වන. ඒ අතරම අධික බියක් සහ කම්පනයක් නිර්මලාගේ සිත් තුළ බලපාන්නට විය. "අහෝ, අද රෑ මම කරන්ට යන්නේ ආත්මාර්ථකාමී වැඩක් නොවේද? මේ බව දැනගත් විට මගේ පියා මා ගැන කෙතරම් කළකිරෙනු ඇත්ද? අද මුළු දවසේම එහා මෙහා ඇවිදිමින් මුදල් වියදම් කොට ගේ දොර අලංකාර කෙළේ මා කෙරෙහි ඇති ලැදිකමෙන් නොවේද? එසේ කළ තාත්තා මගෙන් බලාපොරොත්තු වන්නේ මේ දෙයද? මෙවැනි ප්‍රශ්න මාලාවක් ඇගේ සිතට නැඟෙත්ම, "නෑ, නෑ," මා කිසි කලෙකවත් මෙවැන්නක් නොකරමි"යි ඉටා ගත්තාය.

ඒ අතරම ගඟ අද්දර මහත් බලාපොරොත්තුවෙන් බලා සිටින රංජිත් ඇගේ මනසට ලක්විය. එකෙණෙහි ඇගේ සිත ධෛර්යයෙන් මුසපත් වුණි. ඊයේ රාත්‍රියේ මා රංජිත් ඉදිරියේ කළ පොරොන්දුව කිසි විටෙකවත් කඩ නොකරමි. මා තවත් මෙහි රැඳී සිටීමෙන් මගේ සිත තැවුලට පත් වෙනවා විතරයි. මෙසේ යදම් දහසෙකින් බැඳ තිබුණත් මේ ගමන නැවැත්වීම කිසිවකුට කළ නොහැකිය, යනවග ඇගේ සිතට නැඟිණ.

දොර ළඟ යම් කිසිවෙකුගේ ශබ්දයක් ඇසී වහා නිර්මලා දොරහැර පිටත බැලුවාය. සැමී ඒ අසල විය. "පුංචි මාත්තිය ගඟ ළඟට ඇවිත් ඉන්නවා, මට කීවා ඊන්සැරේ ආමු එක්ක



යන්න" සැමී පහත් හඬින් සැල කළේය. ඒ අතරම තමන්ගේ සිත තවත් බලගතු වේගයකින් දමනය වන්නට විය. "මගේ කීකරු දුව! මගේ එකම අනාගත බලාපොරොත්තුව." මීට දින කීපයකට කලින් කඩුගන්නාවට ගොස් කොබ්බෑකඩුව වලව්වේ ශ්‍රී විභූතිය සිතට ගෙන පෙරළා ආ සිය පියාණන්ගේ මුවින් පිටවූ වචන දැන් නිර්මලාගේ සිතට නැඟේ. "අනේ දැන් මම කුමක් කරන්ටද යන්නේ? ආ මගේ පියාට මා එදා පොරොන්දු වූවා නොවේද තාත්තා මට සමාවන්න, තාත්තා කියන ඕනෑම දෙයකට මම එකඟ වන්නම් කියා. මෙය එම වචනවලට පිටුපා ආපසු යාමෙක් නොවේද? මගේ මව්පියන්ගේ සිත් කඩා ඔවුන් දුක් සයුරේ ගිල්වා මා සොයා යන සැපත කුමක්ද? නෑ, නෑ, පා ඔසවා මේ ගමන මම නම් යන්නේ නෑ."

මෙසේ සිතත්ම සැමීගේ කටහඬ තව වරක් ඇසුණි. නිර්මලා දොර හැර පිටත එබී බැලුවාය. මඳ කළුවරේ වැඩකරුවා බලා සිටියේය. නිර්මලා තව වරක් දොර අඩවල් කොට ලියන මේසය ළඟට ගොස් කඩදාසියක් රැගෙන රංජිත්ට ලියමනක් ලියන්ට සැරසුණාය. ඒ සමඟම හුදකලාව තමා පැමිණෙන තෙක් ගඟ අද්දර මහත් ආයාසයෙන් බලා සිටින සිය පෙම්වතා සිහියට එළඹ නිරායාසයේ කඳුළු බිංදු ඇගේ කම්මුල් දිගේ ගලා විත් කඩදාසිය තෙමෙන්නට විය. ඇස් අන්ධ කළ කඳුළු ධාරාවන් මධ්‍යයේ ඈ ලියුම ලියා වහා එය දෙකට තුනට නමා කාමරයෙන් එළියට ආවාය.

"සැමී."

එතෙක් පැවති නිශ්චලතාවය තුළ මහා ශබ්දයක් පතුරුවමින් සාලයේ තුබූ ලොකු ඔරලෝසුව එකොළහ වදින්නට විය. දැන් ගෙදර අවදිව ඇත්තේ නිර්මලා සහ සැමී පමණි. ශබ්දයක් නොකොටම සිය සිත් තුළ විචිත්‍ර හැඟීම ඇතිකරන පහළ බරාඳයේ පියගැට පෙළට ඈ පා නැඟුවාය. සැතපුම් ගණනක්

UPLOADED BY ELIFE

පෙනෙන ඒ නදී තීරය ඈට සුමිහිරි ගීතයකින් අඬගසන්නාක් මෙන් සියුම් සුළඟක් තමා වෙතට හමන්ට වූයේය. සැම ස්පීර පිළිවෙතක්ම සමූල ඝාතයෙන් බිඳ දමා එක්වරම ගඟ අද්දර බලා සිටින සිය පෙම්වතාගේ ආරක්ෂාව සොයා යෑමට දැඩි චේතනාවක් ඇති වුවද, ඊට කිසිසේත් ඉඩ නොදී සිය අත තුබූ ලියුම් කැබෙල්ල වහා සැමී අත තබා ආපසු කාමරයට හැරුණාය.

"මොකද මේක ලියුම පුංචි මාත්තයා බලයින්නවා. දෙන් මේ ළඟට තමා අවිත් ගියා," සැමී කලබල විය.

"සැමී ගිහින් මේ ලියමන පුංචි මහත්තයාට දෙන්න. මම අද එන්නේ නෑ. කියන්ඩ." නිර්මලා පහත් හඬින් කීවාය.

"පුංචි මාත්තියා ඇවිල්ල පැය දෙකයි තමා. දෙන් කව්රුත් නේ අපිට ඉක්මනට තමා ගිය ඇකි." සැමී කීය.

"සැමී! පුංචි මහත්මයා අතට මේ ලියමන දෙන්න." මෙසේ කියා සැමී කියන කිසිවකට සවන් නොදී වහා සිය යහන් ගැබට වැද දොර වසා යහන මත දිගාවී ඉකි බිඳිමින් හඬන්නට වූවාය.

ගඟ අද්දරට තනිව සෙමින් සෙමින් පා නඟන සැමී දුටු රංජිත් විස්මයාකුල වී ඔහු ඉදිරියට පා නැඟීය.

"කෝ හාමු" හේ මහත් කලබලයෙන් විමසීය.

"හාමු දන්නේ නෙද්ද? ගානි ඕම තමයි; යෙනවා කීනවා යෙන්ඩ බා කීනවා. යෙක වචනය කිසිම දවසක නේ."

"නුඹ, මා කීදේ නොවෙයි නේද කෙළේ." රංජිත් වේගයෙන් ප්‍රශ්න කෙළේය.



"මම මොකද, කෂාද බෙන්දෙ නෙත්තේ, ගානු ඕදනේ. එක වචනෙ නේ. ආ වෙල්ලෙ ඉඳලා. මම එක ගානී තමයි ගෙනවා සිංහල නෙමෙයි කීලා ආපහු ගියා. ඉතින් මොකද කරන්නේ"................

වේගයෙන් රංජිත් සැමීගේ සිරුර සොලවන්නට විය.

"බොරුකාරයා, උඹ මොකක්ද කළේ? හාමු මොකද කීවේ කියාපන් ඉක්මනට කියාපන්."

කුහුඹුවෙකු දෂ්ඨ කළ තරම් වත් දැනුමක් නොමැතිව සැමී දොඩවන්නට විය. හදිසියේ ඔහුගේ ඉනේ තිබී ලියුම් කැබෙල්ලක් බිම වැටුණි.

"මේ කුමක්ද?" අසමින් රංජිත් නැඹුරු වී ලියුම අතට ගෙන එය තමාට බව දැන වහා විදුලි පන්දම අල්වා කියවන්නට විය. ලියුම කියවූ පසු ඔහුගේ සර්වාංගය ඩහදියෙන් තෙත්විය. මුව තදකර වසා ගනිමින් තමාගේ සිතේ ඇතිවූ නිරාපෙක්ෂ හැඟීම් මාලාව එකින් එක මැඩ පැවැත්වීමට ඔහු තැත් කළේය.

"සියල්ල අවසානයි. සියල්ල අවසානයි, දැන් මට ඇත්තේ ගඟෙන් එතර පමණයි." ඔහු සුසුම් ලන්ට වූයේය. "නිර්මලා මා මේ දැඩි පියවර ගත්තේ ඔබේම ආරක්ෂාව සඳහා, මා ගැන බිඳක් සිතුවේ නැහැ."

තව වරක් ඔහු ලියුම කියවන්නට වූයේය. හඳ එළියෙන් ඔහුට එය වඩාත් පැහැදිලිව කියවිය හැකිය.

"තාත්තාට මා එදා දුන් පොරොන්දුව කැඩිය නොහැකිය. මගේ සැපත උදෙසා මම කිසිවිටෙකවත් අනුන්ට හානියක් නොකරමි. රංජිත් ඔබ එදා දුන් උපදෙස් පරිදි මව්පියන්ගේ අණට කීකරුව නිර්භීත ලෙස දෛවයට මුහුණ දෙමි. රංජිත් මා

UPLOADED BY ELIFE

අමතක කර දමන්න. ඔබේ අනාගතය සෑම අතකින්ම දියුණු වේවායි මම ආශිර්වාද කරමි."

ලියුමේ සඳහන් කොට තිබූ කරුණු වලින් කීපයකි මේ.

රාත්‍රි දහයට පමණ පෙරදිගඹරින් උදාවූ අඩ සඳ මුඳුන් පතට නැඟ මෙතෙක් අවට රජකළ ඝනාන්ධකාරය අතුරු දහන් කළේය. රංජිත් සෙමින් සෙමින් ගඟ අද්දර පිහිටි වැලිතලාවට පා නැඟීය. කුමක් සිදුවූවාද යනු දත් නම් ඔහුට හිතන්ටවත් බැරිය. කකුල් දෙක තදින් එරීයන වැලිතීරය, ඈත මුහුදේ සිට හමාඑන සිසිල් සුළඟ, වලාකුල් අතරින් එබී බලමින් ගඟ දෙපස එකම සුර ලොවකට පත් කරන චන්ද්‍ර රශ්මිය, යන මේ සියල්ලක්ම එක හඬින් තමාට සමච්චල් කරන්නාක් මෙන් සිය මනසට දැනෙන්නට විය. පෙණ පිඬු සහිත ගඟෙහි වතුරෙන් දෙපා තෙමත්ම රංජිත් මඳක් නැති ගත්තේය. අත තිබූ ලියමන දෙස ඉබේටම ඔහුගේ නෙත් යොමු විය. නිරායාසයෙන්ම හේ ලියුම කැබලිවලට ඉරා ගංගා ජලය මත දමා එම කැබලි එකිනෙක පහතට පාවෙමින් යන සැටි බලා මඳක් සැනසෙන්නට වෑයම් කෙළේය. "දුටුවාද මගේ බලාපොරොත්තු සියල්ලම වතුරට ගසා යන සැටි" මෙසේ කියා ඔහු සිනාසෙන්නට මෙන් තැත් කෙළේය. සිය කටහඬ අන්‍යයෙකුගේ මෙන් රංජිත්ගේ සිතට දැනිනි. තවත් එතැන මෙහොතක් නොරැඳි හෙතෙම වහා ඔරුවට නැඟ ඉක්මනට ගඟ හරහා පදවන්නට වූයේය.

පසු දින පාන්දර සිට අතපත්තු වලව්ව මහත් උත්සවශ්‍රීයෙන් බබලන්නට විය. විවාහය ගිවිස ගැනීමට ආ මනාලයා ඇතුළු සියයක් පමණ ප්‍රභූ පිරිසක් අතපත්තු මහතාත් එම මැතිණියත් අතින් මහත් හරසරින් පිළිගනු ලැබූහ. සෙනසුරාදා පෙරවරු දහයකුත් මිනිත්තු තිහට යෙදුන ශුභ නැකතින් සිසිල් කොබ්බෑකඩුව මනාල මහතා සිංහල රජ පෙළපතකින් පැවත එන ලක්ෂයක් අගනා රන් මාලය නිර්මලාගේ ගෙලට දමා



විවාහ ගිවිසුම් කොට ගත්තේය. මඟුල කල් ඇරීමට දෙපාර්ශවයම අකමැති වූහ. එබැවින් යම්තම් මසක් ඉකුත්ව ගියපසු මංගල උත්සව දිනයත් නියම විය. නිර්මලා අතපත්තු සහ සිසිල් කොබ්බෑකඩුව අතර සිදුවූ සරණ මංගල්‍ය උත්සවය කැළණිය සහ අවට ගම්වල එකම සැණකෙළි උත්සවයක් විය. සෑම හන්දියකම තොරණින්ද මඟ දෙපස ධජ පතාකාදියෙන්ද සරසා තිබුණි. නානාලංකාර වස්ත්‍රාභරණයන් පැළඳ දෙවඟනන් පරයන රබන් ගසන ස්ත්‍රීන්ගෙන්ද, මනාල යුවලගේ ගුණ-යන්ගෙන් ප්‍රබන්ධ ආශීර්වාදාත්මක ගී කියමින් නටන තරුණ-යන්ගෙන්ද, රා බී මත්ව විලි බිය සුන්කරගෙන කෑ කෝ ගසන සුරා සොඬුන් ගෙන්ද, අඩුවෙක් නොවීය.

ධනබලය, පිරිවර බලය, කුලබලය, නිලබලය, ඈ සියලුම ලෞකික බලයන් පෙන්වීමට පසුබට නොවූ අතපත්තු මහතා මේ එකම මඞ්ගල උළෙලේදී ලෝභය මුල් සිඳ සිය ධනය වියදම් කෙළේය. මසක් කල්යත්ම පෙර අපර දිග සංකර චාරිත්‍ර වාරිත්‍රයන්ගෙන් යුත් මහත් උත්සවයකින් සිය දියණියවන නිර්මලා, කොබ්බෑකඩුව මහතාට භාර දුන්නේය.

කල්වේලා නොඉක්මවා අවට ගම්වලින් පැමිණි විශාල ජනකාය සියඹලාගහ වලව්ව වටකරගන තදබදයේ මඞ්ගල උත්සවශ්‍රීය නරඹන්නට වූහ. 'මනමාල මහතා, රජ පෙළපතකින් පැවත එන අතපත්තු මහතාගේ ධනස්කන්ධය මෙන් දහස් ගුණයක් නින්දගම් හා වෙනත් වස්තුව ඇති එංගලන්තය පාස් කරපු අබ්බාකත් කෙනෙක්' යයි එකෙක් කීහ.

මනමාලිය වැඩි සිනාවක් හෝ ප්‍රීතියක් නොපෙන්වන්නේ මේ මඟුල ඇගේ අකමැත්තෙන් සිදුවන බැවින් යයි තව එකෙකුගේ මුවින් පිටවිය. "අතපත්තු මහතාගේ දියණිය නිර්මලා හාමු ආශාවෙන් සිටියේ රංජිත් මහත්මයාට යයිද ඒකට අකමැත්තෙන් දවසක් අතපත්තු මහතා ඒ ඉලන්දාරියා ගෙදරින්

UPLOADED BY ELIFE

එලවා ගත්තේයයිද, අද දවසේ මඟුල් ගෙදර අහලටවත් නොආවේ ඒනිසා යයි" ද ලූසිහාමි හීන් සීරුවේ ළඟ සිටියෙකුට පැවසුවාය.

"මොකද බන් මෙහෙම රාජ කුමාරවරු ඉස්සරහට එනවානම්; පුංචි මහත්තයලා වාගේ අයට මොනවට දෙනවාද?"යි අසලහුන් රොබෝ සිංඤෝගේ මුවෙන් පිටවිය.

"අතපත්තු මහතා ලෝකෙ කාල වතුර බීල ඉන්න එකත් හැබැයි. මේ මඟුල ලෑස්ති කරගත්තේ දුව හොඳ මිනිහෙකුට දෙනවාට වඩා තමන්ගේ බලපුළුවන්කාරකම ලෝකෙට පෙන්වන්ඩයි. මෙදා ගමනෙනම් මට පේන හැටියට මිනිහාගේ බෙල්ල ළඟින්ම තදවෙලා තමයි වාසනාව අනිත් පැත්ත බලන්නෙ. කවදාවත් අපේ පුංචි හාමු ඔය හතර විලම්බීත මිනිසුන් එක්ක දීග කන එකක් නෑ. අවුරුද්දකින් මෙහා ආපසු ගෙදර එනවාට මෙන්න කැට." මෙසේ කීයේ බොහෝ කලක් සියඹලාගහ වත්ත අසල පදිංචිව සිටි අතපත්තු මහතා ඇතුළු අනිකුත් අය ගැන හොඳ හැටි දන්නා මනා අවබෝධයක් ඇති එක්තරා සැට වස් පිරි පුරුෂයෙකි.

රංජිත්ටත් ඔහුගේ මෑණියන්දෑටවත් මඟුල් ගෙදර කොතැනකවත් ඉඩක් නොතිබිණ. මඞ්ගල්‍යය සිදුවී තෙදිනකට පසු රංජිත් විශේෂ දියුණුවක් ලබාගනු වස් එංගලන්තයට බලා පිටත් විය. මඟුලේ අලඞ්කාරය ඔහුට දැනගන්ට ලැබුණේ පත්‍ර මාර්ගයෙන් පමණි. එහි ලියා තිබූ විස්තර සියල්ලක්ම එකිනෙක කියවා බැලූ රංජිත් අතීතය දෙස නොබැලීමට තදින් ඉටාගත්තේය.

අහෝ! අද රටේ පස් පව් නොකරන තැනැත්තෙක් සොයා ගැන්ම නිකිණි සෙවීමටත් වඩා අමාරුය. ක්‍රෝධ මද මනාදියෙන් තොර පුද්ගලයෝ ලොව කොතැනද නැත්තේ! අක්‍රමිකතාවන් සිදුනොවන්නේ කා අතින්ද? මිනිසා හොඳය, නරකය කියා හුවා දක්වන මිණුම් දණ්ඩ කාලයාත් සමඟම වෙනස් වී යයි.

UPLOADED BY ELIFE



දූෂ්‍ය ක්‍රියාවන් කරන සමහරුන්ගේ එම ක්‍රියා කලාපය කොතෙක් සඟවා තැබීමට තැත් කළද කාලයාගේ ඇවෑමෙන් එළිය දකී. "ලොව රහසක් නම් නැත" මෙය ශ්‍රී මුඛ පාඨයයි. එහෙත් තමන් අතින් කෙරෙන ඒ නොහොබිනා ක්‍රියාවන් සමඟම සමහරු පස්සට වන්නෝය. නමුත් බුදු දහම බොරු කිරීමට නම් සමතෙක් තවම මෙලොව ඉපදී නැත. නිර්මලාගේ ස්වාමි පුරුෂයා අතින් සිදුවී තිබෙන පාපතර නීච දූෂ්‍ය ක්‍රියාවන් යම් දිනක එළිය දුටුවේද, එදින සිට අසරණ නිර්මලාගේ අනාගතය කෙසේද? අහෝ දෙවියනි! ඒ පාපතරයා අතින් සිදුවී තිබෙන එම වසල ක්‍රියා කලාපය කිසි කලක එළිය නොදකීවා" නිර්මලා වෙනුවෙන් මට කළ හැකි එකම ප්‍රාර්ථනාව මෙයයි. මෙසේ සිත හදාගෙන රංජිත් එංගලන්තය බලා නැව් නැංගේය.

# ගඟ අද්දර

## දෙවන කොටස

කොළඹ නගරයට සැතපුම් හයක් පමණ දුරින් අවිස්සාවේල්ල පරණ පාරේ වෙල්ලම්පිටිය නැමැති කුඩා ග්‍රාමයක් ඇත. කැළණි ගඟ මේ අසලින් ගලායන බැවින් දෝ මේ ගම්මානය සිසිල් ගුණයෙන් හා සුන්දරත්වයෙන් අවට පිහිටි අනිකුත් ගම් පරයා පිහිටියාය. ගඟ අද්දර පිහිටි අක්කර හතරක් පමණ විශාල රමණීය භූමි භාගයක නවීන මෝස්තරයට සැදුම් ලත් එක්තරා තෙමහල් ගොඩනැගිල්ලකි. මේ විශාල මන්දිරය අනිකක් නොව සකලාඞ්ගයන්ගෙන් සමන්විත වූ නවීනතම මානසික ආරෝග්‍යශාලාවක්ය. මානසික වෛද්‍ය විශේෂඥයෙකුවූ ඉංග්‍රීසි ජාතික ලැම්බෙරි මහතා මෙහි ප්‍රධානව කටයුතු කෙළේය. මෙම මානසිකාගාරය රජය මඟින් පවත්වාගෙන යනු ලබන අනිකුත් මානසිකාරෝග්‍යශාලාවන්ට වඩා බෙහෙවින් වෙනස්වූයේ මෙහි තුළ වසන රෝගීන්ට සාමාන්‍ය සැපවත් ගෙදරක අත්වන සත්කාර නොඅඩුව ලැබෙන හෙයිනි. ලැම්බරි මහතාගේ මානසිකාගාරය කිසිකලෙකවත් නොමිලයේ ප්‍රතිකාර කරන තැනක් නොවීය. ඒ නිසාම රෝගීනට සෑම අතින්ම අත්වූයේ විශේෂ ප්‍රතිකාර හා සැලකිලි ය, මේ විශිෂ්ඨ මානසිකාගාරයේ ප්‍රතිකාර ලබාගැනීමේ වාසනාව අත්වන්නේ ධනවත් පවුල්වල මානසික විකලත්වයෙන් පෙළෙන අයට පමණය. බෙරි මහතා මෙම මානසිකාගාරයෙහි වැඩ බාරගෙන කීප දවසක් නිකුත් වෙත්ම මෙහි කීර්තිය දශදිග පැතිරිණ. මානසික දුර්වලත්වයෙන් පෙළෙන්නෙකු ඉතා තේරුම්

UPLOADED BY ELIFE



ඇතිව මහත් සැලකිල්ලකින් රැක බලා ගතයුතුය" යන්න බෙරි මහතාගේ අදහසය. මේ ස්ථානයට ගෙනයන ලෙඩුන් අන් තැනකට ගෙනයන ලෙඩුන්ට වඩා ඉක්මනින් සම්පූර්ණ සුවය ලබාගනු ඇතැයි කාගේත් විශ්වාසයයි. එසේම මසකින් හෝ දෙකකින් සුවය ලබා යන්නෝ ද මාස කීපයකින් සුවය ලබා යන්නෝද බොහෝ වුවත් සදහටම උන්මාදයෙන් ගතකිරීමට සිදුවන අවාසනාවන්තයෝද නැත්තේ නොවෙති.

නවාංගයන්ගෙන් පරිපූර්ණවූ මෙම මානසිකාගාරයෙහි එක් පැත්තක් පිරිමි ලෙඩුන්ටද, අනෙක් පැත්ත ස්ත්‍රීන්ටද වෙන්කොට තිබුණි. බොහෝ කාලයක් මෙහි විසීමට කැපවී සිටින රෝගීන් උඩුමහල්වල තනා තිබෙන කාමරවල සුරක්ෂිතව බලාගනු ලැබීය. එසේ කිරීමට හේතුව ඔවුන්ගේ මානසික තත්ත්වය අවට සිටින්නන්ට නොපෙන්වීමට සැලැස්වීමේ එකම මාර්ගය බැවිනි.

මානසික රෝගයකින් පෙළෙන්නෙකුට විශේෂයෙන්ම අත්විය යුත්ත නම් හොඳ විවේකය බැව් මැනවින් දත් බෙරි මහතා ඒ වෙනුවෙන් සියලු දෙයක්ම ඉටු කිරීමට පසුබට නොවීය. මෙවැනි රමණීය භූමිභාගයක් සොයා ගත්තේද, මානසික රෝගියාට එවැනි පරිසරයක් ඉතාමත් අවශ්‍ය බැවින්ය.

මෙහි උඩුමහල් තලයෙහි සිට බලන්නෙකුට අවට දර්ශනය වන සුන්දරත්වය ඔහුගේ සිත්සතන් ඇදගනී. මේ ඉඩම අසලින් වංගු සහිතව ගලායන කල්‍යාණි නදිය සැතපුම් ගණනාවක්ම කවාකාර බැව් පෙන්වීමට සවාභාව ධර්මයා අමතක නොකෙළේය. වත්ත පුරා තැනින් තැන පිළිවෙළකට පාත්ති සාදා වවා තිබුණ නානා වර්ගවල සුපුෂ්පිත මල්පැළෑටි හා ඵල පල්ලවයන්ගෙන් පිරි අඹ දඹ නා පනා ආදී පලතුරු වෘක්ෂයන්ද දුටුවන්ගේ නෙත් යුගලයන්ට රසවත් අහරක් විය. මානසිකාගාරයට එන අසරණයනට සුන්දර පරිසරයත් විවේකීභාවයත් බෙහෙත් වලට වඩා උපකාර වනු ඇතැයි වෛද්‍යවරුන්ගේ මතයයි.

මෙම ආරෝග්‍යශාලාවෙහි වැඩකළ ඇත්තෝ හෙදියන් වශයෙන් අවුරුදු ගණනාවක්ම පුරුද්ද ලබා ඇත්තෝ වූහ. මානසිකාගාරයෙහි ප්‍රතිකාර ලබන අයගෙන් සෑම දෙනෙකු වාගේම සිහිවිකල වූවන් බැවින් ඔවුන් කෙබඳු සංග්‍රහයන් ලබනවාද යන්න මැනගැනීම උගහටය. එම නිසාම පුරුදු කාරුණික හෙදියන් පත්කොට ඔවුනට විශේෂ වේතනයක්ද දී ඔවුන්ගෙන් යුක්ති ධර්මය බලාපොරොත්තුවීම බෙරි මහතාගේ එකම අදහසය.

ඉහත සඳහන් මානසිකාගාරයෙහි ස්ත්‍රීන් සඳහා වෙන් කළ පැත්තෙහි උඩු මහලේ වෙසෙන එක්තරා තරුණ කාන්තාවකි. මෙම කාන්තාවගේ මුහුණ සකලංක පූර්ණ චන්ද්‍රයාටද, දිලිසෙන නෙත් යුවල ඉඳුනිල්මිණි දෙකකටද, බබලන දෙකම්මුල දවසින් පරවී විවර්ණ වන ලා රත් පැහැති රෝසමල් පෙතිවලට ද දෙතොල සුළඟට පවා කඩා හැලෙන නාදළුවලටද උපමා කළහොත් එය ඇගේ ශරීරාවර්ණයට කරන අපහාසයකි. ඈ ළඟට එන ඕනෑම අයෙකුට ඈ වෙත අයත් එකම දායාදය වන මෘදු සිනාව නො අඩුව ලැබෙන්නේය. මෙම ලලනාව හුදකලාව සිටින විට මහත් කල්පනාවෙන් මෙන් එක් අතකම බලාගෙන සිටින්නීය. ඇගේ කාමරයෙහි පිහිටා ඇති එකම කවුළුවෙන් කැළණි ගඟෙහි එක් තොටු පොළක් පෙනේ. විවේකීව සිටින සෑම අවස්ථාවකම ඈ කවුළුවෙන් පිටත බලාසිටින්නේ මහත් විමසිල්ලෙන්ය. සමහර විට ඇගේ මුහුණ අලුත පිපුන රෝසමලක සිරිය උසුලයි. තවත් අවස්ථාවක දී පරවී ගිය මලක් මෙන් වෙයි. නෙත් යුවලින් කඳුළු බිංදුද ඒ සමඟම හැලේ. මානසික දුර්වලත්වයෙන් පෙලෙන අනිකුත් රෝගීන්ගේ කිසිම ලක්ෂණයක්වත් ඇය තුළ නොපෙනේ. මානසිකාගාරයෙහි හෙදියන් අතර ඈ 'රෝස මොට්ටුව' නමින් හඳුන්වා ගනු ලැබීය.

සාමාන්‍යයෙන් බලන්නෙකුට දහසය ඉක්මී ගිය යෞවන කාන්තාවක් මෙන්ය ඈ පෙනෙන්නේ! ඇගේ අපරිමිත කරුණා



ගුණයෙන් සහ ප්‍රියංකර භාවයෙන් ඈ ළඟට එන සියල්ලන්ගේම සිත් දිනාගත්තීය. එහෙත් අහෝ! වාසනාවක මහත! ඈ ජීවත් වන්නේ ඉතාම කර්ණකටුක අවස්ථාවකය. ඈට පසුගිය කාලපරිච්ඡේදය සියල්ලක්ම අමතකය. ඈ මඳක්වත් කථා නොකරයි. බේරුම්කොට ගත නොහැකිවූ ප්‍රශ්නයක් විසඳන්ට තැත් කරන්නාක් මෙන් සමහර අවස්ථාවන්හි ඇගේ ඇස්බැම හකුළුවා ඈත බලා ඉන්නීය. "සිතටත් ගතටත් නොදැරිය හැකිවූ හදිසි කම්පනයකින් පසුවෙයි." ඈ පරීක්ෂා කළ වෛද්‍ය විශේෂඥයන්ගේ මතය මෙය විය. ඈ කතා නොකරතත් කටහඬට කිසි හානියක් සිදුවී නැතැයිද, කම්පනය සමනය වන විටම ඈ කථා කරනු ඇතැයි ද ඇගේ උගුර නාසය පරීක්ෂා කළ වෛද්‍යවරු ප්‍රකාශ කළහ. "ඇගේ සිත තුළ ඇතිවූ කම්පනයට හේතු සොයා ගන්නාතුරු කිසිම ප්‍රතිකාරයක් කළ නොහැකිය"යි බෙරි මහතාගේ ප්‍රකාශය විය. ඈ ආරෝග්‍ය ශාලාවට පැමිණ දනට වර්ෂයක් ඉකුත්වී ඇත. ඈ මෙම ස්ථානයට පැමිණීමට පෙර හමසක් පමණ එක්තරා ක්ෂය රෝග මර්දන විශේෂඥයෙකුගේ ප්‍රතිකාර ලබා ගත්තාය. හමසකට පසු ක්ෂය රෝගයෙන් පෙළෙන්නියක නොවේයයි දොස්තරවරුන් කියා සිටියෙන් පසුව ඈ මෙතනට ගෙනෙනු ලැබීය.

ඉහත සඳහන් තරුණ කාන්තාව අන් කිසිවකු නොව මීට දෙවසකට පෙර මහත් උත්සවශ්‍රීයෙන් විවාහයට පත් වූ නිර්මලා අතපත්තුය. විවාහයේ නැවුම් සුවඳ ඉක්මයන්ටත් පෙර ඇගේ ජීවිත යාත්‍රාව දුක් සයුරේ අනේක විද ගල්පරවල ගැටී කැඩී බිඳී ගියේය. ඈට පැමිණි ආබාධයන් මධ්‍යයේ ඈ ජීවත්වීම පුදුම එලවන කරුණක් විය. මේ ගැන නොයෙක් දෙනා නොයෙකුත් කතා දොඩන්නට වූහ. ඔවුන්ගේ කථාවල යම් කිසි සත්‍යයක් තිබුණත් අසත්‍ය කරුණු රාශියකින් එය ආකූල විය. ඇත්ත කියවෙන්න කාගේ මුවින්ද? කිසිවෙක් නොදත්හ. ඒ අතරම අතපත්තු මහතා යථා තත්වය ලොවට සැඟවීමට යත්න දැරීමෙන්

UPLOADED BY ELIFE

මිනිසුන්ගේ සිත් තව තවත් ව්‍යාකූල තත්වයකට වැටිණ. කවුරු කුමක් කියන්ට තැත් කළත් සිදුවූ දෙය මෙසේය:

ඉහත සඳහන් පරිදි දිවයින පුරා මහත් ආන්දෝලනයක් ඇතිකරමින් සිසිල් කොබ්බෑකඩුව මහතා සිය ප්‍රියම්බිකාව වාසය පිණිස කඩුගන්නාවේ මහ වලව්වට ගෙන ගියේය. සියලුම අවහිරතාවයන් මධ්‍යයේ නිර්මලා තරයේම ඉටා ගත්තේ පසුගිය කාලපරිච්ඡේදය සහමුලින්ම අමතක කොට දමා නිර්භීත ලෙස නව දිවිපෙවෙතට මුහුණ දීමටය. අලුත් ජීවිතය ගැන කිසිම බාධාවක් ඇතිවේය යන සැකයක් ඈ තුළ නොවීය. එහෙත් කිසිවක් ඈ සිතූ ලෙසට ඉටු නොවූහ. කොබ්බෑකඩුව රටේ මහතා, මහත් ධන කුවේරෙකුයයි රට පුරා ප්‍රසිද්ධවූ නමුත් නියම සත්‍යය නම් ඔහුගේ වත්කමට වඩා ඔහු ණය බරින් වැඩි වීමය. පවුලේ උදවිය මිස අන් කිසිවකු මේ ගැන නොදැන සිටියා විය යුතුය. සිය පුත් එංගලන්තයේ ගතකළ සත් හවුරුදු කාලය තුළ පියාට වසකට රුපියල් විසිදහසක් පමණ වියදම් කිරීමට සිදුවිය. සිය පුතු ගෙදරට ගෙන්වා ගත්තේ මුදල් ඇරීම නතර කළායින් පසුය. තරුණ කොබ්බෑකඩුව මහතාද ආපසු ලංකාවට පැමිණියේ හුදෙක් කලකිරුණු සවභාවයකින් යුතුවය. තම ඉඩම්වලට එකම හිමිකරු සිය පුතා බවත් විශාල දායාදායක් සමඟ කසාදයක් ලෑස්ති කළහොත් තමා පත්වී සිටින ණය බරින් මිදීමට හැකිවේය යනුත් ප්‍රථමයෙන්ම පියා වටහා ගත්තේය. මෙවැනි කුදිටු අදහසක් මුදුන් පත් කර ගැනීමට නම් මහත් ධනස්කන්ධයකින් පිරී ඉතිරී ගිය එක්තරා අවාසනාවන්තියකු කොතැනක හෝ ඇතිවිය යුතුය. අහිංසක නිර්මලා මොහුගේ කුට උපක්‍රමයනට ඇගේ පියා විසින් වහලියක් කරනු ලැබීය.

තරුණ කොබ්බෑකඩුව මහතා සිය පියාගේ වචනය ඉවත ලෑමට අපොහොසත් නිසාත් තමා සතුවීමට තිබෙන පියාගේ ධනය ණයෙන් නිදහස් කර ගැනීමට අතපත්තු මහතාගේ ධනයෙන් හැකිවේය යන කපටි චේතනාව ඇතිවූ නිසාත්



නිර්මලා විවාහ කරගැනීමට කැමැති වූවා විනා ඈට නියම ආලයකින් කරගත් විවාහයක් නොවේ.

අකමැත්තෙන් වුවද නව දිවිපෙවෙතට පාතැබූ නිර්මලාට මුහුණ දෙන්ට සිදුවූයේ බලාපොරොත්තු රහිත දුක් දොම්නස් වලින් පිරි අමුතුම ජීවිතයකටය. යහපත් පරිසරයක් ඈ බලාපොරොත්තු වුවද, මෙවැනි සිද්ධීන් ඇතිවේය කියා ඕ සිහිනෙකිනුදු නොසිතුවාය. නිර්මලා විවාහ වී දෙසතියකට පසු කොබ්බෑකඩුව වලව්වේ පිය පුත් දෙදෙනා අතර විශාල අරගලයක් ඇතිවිය. පළමුව නිර්මලා මේ සිද්ධීන්ගෙන් ඈත්කොට තැබීමට වලව්වේ උදවිය තැත්කල නමුදු මේ ආරාවුල තමාගේ දෑවැද්ද මුදල් සම්බන්ධයෙන් ඇති වූවක් බව වටහා ගැනීමට ඈට වැඩි වේලා නොගියේය. තමා මේ තරම් ණයවූයේ එංගලන්තයට නොකඩවා මුදල් ඇරීමට සිදුවූ නිසායයි පියා කියා සිටියේය. නිර්මලාගේ අත්සන නොමැතිව මුදල් වැය නොකළ හැකි බව පුතාගේ අදහස විය. අන්තිමේදී මෙය බේරුම් කර දීමට අතපත්තු මහතාට කඩුගන්නාවට ඒමට සිදුවිය.

අතපත්තු වලව්වේත් කොබ්බෑකඩුව වලව්වේත් පරතරය අහසත් පොළොවත් මෙන් ඈත් විය. සිය වැඩ කරුවන්ට තිරිසනුන්ට මෙන් සලකන අවස්ථාවෙක් කිසි කලෙකවත් නිර්මලාගේ නිවසේ නම් අසන්නට වත් නොලැබිණ. වැඩකරුවෙකුට අකරුණාවන්ත කමෙක් දක්වනවා කියන්නේ කුමක්ද කියාවත් නිර්මලා නොදන්නීය. ගේ දොර වතු පිටිවල වැඩ කරන අසරණ මෙහෙකරුවන්ට අතින් පයින් ගැසීම, අශිෂ්ඨ ලෙස බැණ වැදීම යන මේවා අතපත්තු මහතාගෙන් නම් සිදුවූ වරදවල් නොවේ. තම සවාමියා යටතේ සේවය කරන්නෙකු ඈත යුගයේ වහලෙකු මෙන් සලකනවා නිර්මලාගේ ඇසට ලක්වූ ප්‍රථම අවස්ථාව මෙය විය. රංජිත් වැනි උදාර ගුණයන්ගෙන් සමත් වූවකු අසල හැදීවැඩී ලෝකයේ හොඳ නරක කුමක්දැයි යථාවබෝධයෙන් දැක ඔහු විසින් පුරුදු පුහුණු කරනු ලැබූ වාම්

UPLOADED BY ELIFE

දිවිපෙවතට ගරුකළ නිර්මලාට මේ අශිෂ්ඨ නව පරිසරය මහත් සේ සිත් වේදනාවෙක් විය. අලුත් යුගයකට පා තබන විට දී ඇතිවන නොයෙකුත් ආබාධයන් කාලයාගේ ඇවෑමෙන් විසඳෙනු ඇතැයි සිතමින් නිර්මලා සිත සනසා ගැනීමට තැත් කළාය. එහෙත් ඕහට රංජිත්ගේ මුවින් පිටවූ වචනවල අගය තේරුම් යන්නේ දැන්ය. "නිර්මලා ගඟක් එක් අතකට ගලායත් නම් තමන්ගේ ඔරුවද ඒ අතට හරවා ගත යුතුයි. වේගයෙන් හමන සුළඟ නැවැත්වීමට දෑත ඔසවා කොතෙක් තැත් කළත් එයින් ඇතිවන ඵලය නම් ඔබේ දෑත පීඩාවට පත් වෙනවා පමණය" රංජිත් එදා මට මෙසේ අවවාද දුන්නේ කොතෙක් දුර කල්පනා කොට ද? දැන් ඉතින් ආපසු බැලීමක් මට නෑ. ගඟ යන අතට මමත් මගේ ජීවිතය නමැති ඔරුව හරවා ගත යුතුයි. කැළණියේදී කළ දේ කඩුගන්නාවේ දී අත් හැරිය යුතුයි. ඈ තරයේ ඉටා ගත්තාය.

අලුත් විවාහයේ රශ්මිය නිවීයන්නටත් පෙර කොබ්බෑකඩුව මහතා වලව්වේදී අමුතු විලාශයකින් හැසිරෙන්නට විය. තමා යම්කිසි කරදරයකින් පසුවන බව බසින් නොකීවත් නිර්මලාට දැන්නම් අවබෝධ වී ඉවරය. තම ස්වාමියා කිනම් වේදනාවකින් පෙළෙන්නෙහි දැයි දැන ගැනීමට නිර්මලා දැරූ ප්‍රයත්න නිශ්ප්‍රභාවිය. ඔහුට යම්කිසි කරදර අවස්ථාවක් ඇතැයිද ලබන වස මුල් භාගයේදී එංගලන්තයට යෑමට උවමනාවක් වී ඇතැයිද කියමින් කොබ්බෑකඩුව මහතා නිර්මලා අස්වැසීය. මෙසේ තෙමසක් ඉකුත් වීමට පෙර ඈ මහත් කලකිරුණු ස්වභාවයකින් කාලය ගත කළාය.

අමුතු පරිසරයට යටත් වූ නිර්මලා සිව් මස් ඇවෑමෙන් රෝගාතුර වූවාය. ඒ සමඟම ඈ ගෙදර ඒමට රුචියක් දැක්වූයෙන් අතපත්තු මහතා ඈ ගෙදර රැගෙන ආයේය. ගෙදර සිටි කීප දින තුළ අසල්වාසීහු නොයෙකුත් ඕපා දූප පතුරු වන්නට වූහ. මේ කාලය වනවිට අතපත්තු මහතා සිය දියණිය ගැන යම් කිසි



බියක් ඇති කරගන තිබුණි. එහෙත් ඒ බව කිසිවෙකුට නොඇඟවීය. "දරුවා ගෙදර තියාගත්තාමත් කරදරයි. දීග දුන්නත් කරදරයි," මෙසේ කියා හේ අසල්වාසීන් ඉදිරියේ යම් කිසි දෙයක් සඟවන්නට මෙන් තැත් කෙළේය.

නිර්මලා ගෙදර විත් මසක් ඉකුත් වන්නට පෙර නොයෙකුත් දූශමාන ආරංචි ගම පුරා පැතිර ගියේය. ආරංචි මඟ හැරීමේ එකම උපක්‍රමය නිර්මලා ආපසු කඩුගන්නාවට ඇරීම යයි වටහා ගත් අතපත්තු මහතා යම්තම් සනීපවූ විට සිය දියණිය ආපසු රැගෙන ගොස් ඇගේ ස්වාමියාට භාර දුන්නේය.

මෙසේ අවුරුද්දක් නික්මෙන්ට පෙර සිය දියණියගේ යහපත ද ලෝක අපවාදයෙන් මුවාවීම ද යන දෙකින් කොයි දේ කළොත් වඩාත් හොඳ දැයි කල්පනා කරමින් අතපත්තු මහතා මහත් සේ සිත් තැවුල් බවට පැමිණියේය.

රෝගාතුර වූ නිර්මලාද ඇගේ ඉරණම කුමක් දැයි නොදත්තී වහා ප්‍රකෘති සුවය ලබා ආපසු සිය ස්වාමියා ළඟට පිවිසියේ ජීවිතයේ පරමාර්ථය ලබා ගැනීමේ පරම චේතනාවෙන්ය.

කුඩා කල සිටම රංජිත් කෙරෙහි ඈ තුළ තුබූ ස්ථිර ආලය අළුයට සැඟවී තිබෙන ගිනි පුපුරක් වැන්න. රංජිත් ගැන වරක් ඇගේ සිත ඇදී ගියේද, ඒ නයින් ඇගේ සවාමියාට අවැඩක් සිදුවේ යන සිතින් වහා සිත අන් අතකට යොමු කරගත්තීය.

එකල කඩුගන්නාව පෙදෙස මැලේරියා උණ වසංගත රෝගය පැතිර ගියේය. මද දුර්වලත්වයකින් සිටි නිර්මලාද මෙම උණ රෝගයට ගොදුරු වූවාය. උණ රෝගයට ප්‍රතිකාර ලබාගනු වස් ඈ මඳ කලකට ආපසු සිය මව්පියන් ළඟට පැමිණියාය. මේ කාලයේදී ඈට සිව් මස් දරු ගැබක්ද විය. මැලේරියා උණයෙන් සුවය ලබා නිර්මලා ආපසු කඩුගන්නාව බලා ගියේ ශරීරය ඉතාමත් දුර්වල අවස්ථාවක තිබිය දීය. මේ කාලයේදී ඈ

UPLOADED BY ELIFE

විභාග කළ දක්ෂ වෛද්‍යවරයෝ ඈට දියයුතු එකම ප්‍රතිකාරය නම් හැකි පමණ කාය, චිත්ත විවේකය බව දන්වා සිටියහ. මෙකල තරුණ කොබ්බෑකඩුව මහතා මහනුවර උසාවියේ අධිනීතිඥයෙකු ලෙස ක්‍රියා කළේය. එබැවින් නඩු දිනයන්හි ඈ තනිව ගත කිරීමට පුරුදු වූවාය. රෝගාතුරව සිටි අවස්ථාවන්හි වලව්වේ සියල්ලන්ගෙන්ම ලැබුණු උපකාර විස්තර කළ නොහැක. මෙහෙකරුවෝද ඈට විශේෂ සැලකිලි දක්වූවෝය.

මෙසේ ගත වූයේ සවල්ප කලකි. දිනක් එක් උදය කාලයක නිර්මලා සිය වලව්ව අසල පිහිටි විශාල ගලක් අසල තුබූ අසුනක වාඩිවී ළඟ සිටි වැඩ කරුවන් දෙදෙනකු සමඟ කතා කරමින් සිටියාය. එදින කොබ්බෑකඩුවේ මහතාගේ පියාද ගෙදර නොවීය. නීතිඥ කොබ්බෑකඩුවේ මහතාට මහනුවර උසාවියේ නඩුවක් වෙනුවෙන් පෙනී සිටීමට සිදුවිය. කොබ්බෑකඩුව වලව්වේ මෙහෙකරුවන්ට ද මෙවැනි දිනයක් ලැබෙන්නේ කලාතුරකින්ය. "ලොව උපන් සියලු සතුනට ම මේ මහ ධරණීතලයේ සුරක්ෂිත ස්ථානයක් තිබිය යුතුය," යන බව වචනයට පමණක් සීමා නො කොට ක්‍රියාවෙහි යොදවන්නියක් වූ නිර්මලා එදින ඈ ළඟ සිටි මෙහෙකරුවන් දෙදෙන සමඟ ඉතා ප්‍රීතියෙන් කථා කරන්නට වූවාය.

"මම නම් හිතුවේ නෑ පුංචි හාමු මේ ලෝකයේ එළිය ආයිත් දකීවි කියල. වෙච්ච අමාරුවේ හැටියට," වැඩි මහල් බිසෝ මැණිකා කීවාය.

"මට එතරම් අමාරු උනාද? මට නම් කිසි දෙයක් මතක නෑ." නිර්මලාගේ උත්තරය විය.

ඈ කථා කරන විට ද මඳක් හති අරින්නීය.



"පුංචි හාමු! වැඩිය කථා කරන්ට එපා. කථා කරන කොට හති එනවා නොවේද?" කියමින් නිර්මලාගේ පා අසල වාඩි වී සිටි කුඩා ටිකිරි කියා සිටියාය.

"දැන් පුංචි හාමු බැඳලා අවුරුද්දක් වෙන්ඩ එනවා නේද?" බිසෝ මැණිකා මතක් කළාය.

"කොච්චර ඉක්මනට දවස් යනවාද? මට නම් මතක ඊයේ වාගේ තමයි!" කුඩා කෙල්ලගේ මුවින් නිකුත් විය.

"දැන් ලොකු වලව්වේ හාමුදුරුවොත් මැරිලා අවුරුදු දෙකක් වෙනවා, පුංචි හාමුදුරුවෝ මිනියට ඇවිල්ලා දවස් දෙකයි හිටියේ, ආපසු ගියා. ඔව්, ආපසු රට ගියා. ඉතින් එන්නේ නෑ කිව්වා. එහෙම ඉන්නවා කීවා."

නිර්මලා කුඩා කෙල්ල දෙස බලත්ම ඈ වැඩි මහල් මෙහෙකාරියගේ නෙත් යුවළට බියෙන්දෝ හදිසියෙන් කට පියා බිම බලා ගත්තාය. යම්කිසි බියකින් වෙලා ගනු ලැබූ නිර්මලාගේ සුදුමැලි මුහුණ තවත් මැලවී ගියේය. වැඩි මහල් ස්ත්‍රිය සිය හාම්පුතා අස්වසන්නට වූවාය. "ඔය පිස්සු! ටිකිරි කියන ඒවා විශ්වාස කරන්නට එපා, ගියේ ආපසු නො එන්ට නොවෙයි. එන්නේ නැත කීවා නම් කොහොමද දූන් ඇවිදිල්ලා ඉන්නේ?"

නිර්මලාද මේ කථාව අමතක කිරීමට මෙන් තැත් කළාය. එහෙත් ඒ හේතුවෙන්ම ඇගේ දුර්වල වූ සිත මඳක් සැලෙන්නට විය. "මේ පැත්තේ කී දෙනෙක් මළාද? මැලේරියා උණ හැදිලා" වැඩි මහල් ස්ත්‍රිය තමාට ම කියා ගත්තාය.

"ඔය ඇත්තද, මම දන්නේවත් නෑ" නිර්මලා සෙමින් පිළිතුරු දුන්නීය.

UPLOADED BY ELIFE

හදිසියේම පොඩි කෙල්ල නැඟිට පාර දෙස බලා මඳක් වේගයෙන් හඬ නගන්ට වූවාය. "අන්න එනවා කව්ද ගෙදරට, පිටිපස්සේ දොරෙන්."

නිර්මලාද නැගිටින්ට තැත් කරමින් ඈත ගල් පඩි පෙළ නඟින්නේ කවුදැයි මහත් විමසිල්ලෙන් බලන්ට වූවාය. ඈ ඉංග්‍රීසි කාන්තාවකි. මඳක් ඈත මහ පාරේ මොටෝ රියක්ද නවත්වා තුබුණි. තමා ඉදිරියට එඩිතරව පා නඟන ස්ත්‍රිය දුටු නිර්මලා ආපසු ගෙදරට යන්ටද, නැතහොත් එතැනම සිටින්ටද විමසා ගත නොහැක්කේ හුන් තැනම ගල් ගැසී සිටියාය.

ඉංග්‍රීසි කාන්තාවන් කුඩා දරු දෙදෙනෙකු අතින් අල්ලා ගෙන එඩිතර සවරයකින් පඩිපෙළ ආරෝහනය කරන්ට වූවාය. මෙතෙක් වේලා ඉතා පරීක්ෂාකාරීව පහත බලා සිටි මෙහෙකාරියන් දෙදෙන සිය හාම්පුතා තනිව සිටිය දී ඉවතට ඇදී ගියහ. නිර්මලා තනි වූවාය. සුදු කාන්තාවද ස්ථිර පියවරින් පියගැට පෙළ නගිත්ම යම්කිසි අනතුරක් තමාට සිදුවනු ඇතැයි යන පූර්වාබෝධයක් ඈ තුළ බලපාන්නට විය. ගතවූයේ මොහොතකි. සුදු කාන්තාව නිර්මලා ඉදිරියේ සිටගත්තීය.

"සිසිල් වින්ස්ටන් කොබ්බේකඩුව ගේ නිවස මෙයද"යි ඇගේ චතුර ප්‍රශ්නය විය.

"ඔව්" නිර්මලා සෙමෙන් කථා කළාය.

"ඒ මගේ සවාමියා, ඔහු දැන් ගෙදර නෑ." කියන්ටත් පෙර සුදු කාන්තාව අසල තුබූ අසුනක වාඩිවී අත තුබූ යම්කිසි පතක් රැගෙන පවන් සලන්ට වූවාය.

"පඩිපෙළ නැඟීමෙන් මට ස්වල්පයක් මහන්සියි"

"ඔබ වැරදි පාරෙන් ආවේ," නිර්මලාගේ මුවින් පිටවිය. "මොටෝරිය ගේ දොරකඩටම ගෙනෙන හැකියි."



සුදු කාන්තාවද මෙය නෑසුනාක් මෙන් සිය දරු දෙදෙනා දෙස වරක් දෙකක් බලා විනිවිද යන පරිද්දෙන් නිර්මලා දෙසට නෙත් යොමු කළාය.

"ඔබ කොබ්බේකඩුව මහතාගේ භායර්‍යාව, ආ" මෙසේ කියමින් ඇගේ අත් බෑගයේ තිබූ ලියවිල්ලක් නිර්මලා දෙසට දිගු කළාය.

"නීතිය අනුව කොබ්බේකඩුව මහතාගේ භායර්‍යාව ඔබ නොවෙයි, මමයි. මේ තමා අපගේ මංගල සහතිකය. මේ තමා කොබ්බේකඩුව මහතාගේ දරු දෙදෙන. අප විවාහ වී සිව් වසක් වෙනවා."

හදිසියෙන් යමකු සිහිසන් නැති කිරීමට පහර දුන්නාක් වැනි අධික කම්පනයක් නිර්මලාගේ සිත් සතන්හි දැනෙන්නට විය. කට කෙළ සිඳින. සිහිසන් නැතිවීමට යමකු පහර දුන්නාක් මෙන් අධික වේදනාවක් නිර්මලාගේ ගත සිතෙහි ඇතිවිය. උගුර වියළින. දියෙන් ගොඩගත් මාලුවකු සේ ඇගේ සිරුර ගැහෙන්නට විය. ඈ වරක් නැගිටින්ට තැත් කළාය. "බිසෝ! ටිකිරි!" වැඩ කරුවන්ට ආමන්ත්‍රණය කළාය, කිසිවෙකු ඈ ළඟ නැත. සුදු කාන්තාව පමණක් විශාල ප්‍රතිමාවක් මෙන් ඈ ඉදිරියේ දැන් පෙනෙයි. මොහොතකින් නිර්මලා මුසපත්ව බිම ඇද වැටුණාය. සිහිසන් නොමැතිවීමත් සමඟම පසුගිය කාලය පෙන්වන සිහිය නමැති කවුළුව වැසී ගියේය. ඇගේ කට හඬ ඈට අමතක විය. සිදුවූයේ කුමක්දැයි ඈම නොදනී. මත්තට කුමක් සිදුවේද? එය ඈට ප්‍රශ්නයක් නොවේ. ඒ තරම් කල්පනා කිරීමට ඈට ශක්තියක් නොමැත. මෙසේ අන් කිසිම කාන්තාවක් ගත නොකළ අයුරු අරුම පුදුම ජීවිතයක් ඈට හිමිවිය!!

තෙමසක් පුරා ඈ කොළඹ පුද්ගලික ආරෝග්‍යශාලාවක ප්‍රතිකාර ගනු ලැබීය. ඇගේ ජීවිතයේ ඇතිවූ කම්පනයත් සමඟම කුස ඔත් දරුවාද අඩු මසින් බිහිව අන්තරා විය. නිර්මලා මේ කිසිවක් නොදත්තීය. පුද්ගලික ආරෝග්‍ය ශාලාවක ගතකළ

UPLOADED BY ELIFE

හයමාසය තුළම ඈ මරණීය දොරටුව අසලට කීපවරක් පා තබා ආපසු පියවර ගත්තාය. කුමක් වූවාද යනු ඈට අවබෝධයක් නැත. එමෙන්ම ඈට කිසි දෙයක් කථාකළ නොහැක. ඈ මව්පියන් පවා නොහඳුනයි. ඇගේ සවාමියා දෙස බලන්නේ මින් ඉහත කිසිකලෙකත් ඇස නොගැසුණු අයෙකු දෙස බලන්නාක් මෙනි. දිවා රෑ දෙක්හි සිය සයනයට වී අධික ලෙස කල්පනා කරන්නාක් මෙන් ඈ දුර බලා ගෙනම සිටින්නීය. මෙතෙක් ප්‍රතිකාර කළ වෛද්‍යවරු දෙදෙන සවල්ප කලක් මානසිකාගාරයක ප්‍රතිකාර ලබා ගතයුතු බව, ස්ථිර ලෙස දන්වා සිටියහ.

නිර්මලා ඉහත සඳහන් මානසිකාගාරයට පැමිණියේ මීට පසුවය. මානසිකාගාරයේ නිර්මලා ගතකළ කාලය ඉතා ගැටලු සහිතය, රෝහලේ සිටි සියල්ලන්ගේම අනුකම්පාවට ඈ භාජනවූවාය. ඈට ප්‍රතිකාර කළ දොස්තරවරු ඈ ගැන මහත් පරීක්ෂාවකින් සිටියහ. සාමාන්‍යයෙන් සිහි විකල්වූවෙකු අතින් කෙරෙන කිසිම අමුතු ක්‍රියාවක් ඈ අතින්නම් නොකැරිණ. ඈ දෙස බලන්නෙකුට කිසිම ආබාධයකින් පෙළෙන්නියක යයි කිව නොහැක. ඈ නැවතී සිටි කාමරය ගොඩනැඟිල්ලේ උඩම තට්ටුවෙහි විය. එහි ගඟ පෙනෙන සේ සාදා තුබූ ජනේලය අසල ඈ නිතර ලැගුම් ගත්තාය. යම් යම් අවසථාවන්හි අත් දෙකින් මුහුණ වසා සිටීමට ඈ තැත් කරයි. "නුඹ කුමක් කරන්නෙහිද"යි හෙදියක් ඇසූ විගස වහා අත් යුවළ ඉවත දමා ඈ දෙස බලා සිනාසීමට තැත් කරයි. ඇගේ නිශ්ශබ්දතාවය බෙරි මහතාට මෙන්ම රෝහලේ අනිකුත් අයටද ප්‍රහේලිකාවක් විය. ඈ කථා නොකර සිටින්නේ චිත්තාභ්‍යන්තරයෙහි පවතින මුරණ්ඩු ගතියකින් යයි පළමුව බෙරි මහතා කල්පනා කෙළේය. දැන්නම් වෛද්‍යවරයා ඒ අදහස සිතින් ඉවත්කර දමා ඇත. ඈ තුළ කිසිම දරදඬුකමෙක් නැතැයිද, ඒ අනුව නම් ඇගේ සතර ඉරියව් මෙසේ යහපත් නොවන්නේ යයිද වෛද්‍යවරයා තේරුම් ගත්තේ මසක් ගතවූවාට පසුවය.



නිර්මලා මානසිකාගාරයට භාරගත් දිනම ඈ බැලීමට කිසිවෙකු නොපැමිණිය යුතුයැයි බෙරි මහතා මවුපියනට දන්වා සිටියේය. ඒ නිසා ඇගේ මව්පියෝ ඈ බැලීමට නොආහ. නිර්මලාගේ සියලු තතු දැනගනු බලාපොරොත්තුවෙන් කීපවාරයක්ම බෙරි මහතා ඇගේ මව්පියන්ට පණිවුඩ යවා ඔවුන් සමග දීඝී සාකච්ඡාවන්හි යෙදින. එහෙත් නිර්මලාට සිදුවූ දෙය ඇති තතු ඔවුන්ගෙන් කිසි විටෙකත් දැනගත නොහැකි විය.

මෙසේ අවුරුද්දක් ගෙවී ගියේය. මේ කාලයේදී මානසිකාගාරයෙහි වැඩ භාර ගැනීම සඳහා ඇමෙරිකාවේ එක් මානසිකාගාරයක විශේෂ පුහුණුව ලැබූ මානසික විශේෂඥයෙකු වූ සරත් පතිරණ නමැති තරුණ වෛද්‍යවරයෙක් මෙහි පැමිණියේය.

පළමුව රෝහලේ ඇති තතු පෙන්වාදී අනතුරුව බෙරි මහතා නිර්මලාගේ තත්වය ගැන පතිරණ මහතාට ප්‍රාථමික අවබෝධයක් ලබා දුන්නේය.

"නිර්මලා කොබ්බෑකඩුව මානසිකාගාරයට අවුත් දැනට වසක් ගෙවී තිබෙනවා. ඈ මෙහි පැමිණි අවසථාවේ ඇගේ ශරීර තත්වය තිබුණේ ඉතාමත් දුර්වල අවසථාවකයි, කායික ප්‍රබෝධයත් සමගම මානසික දුර්වලකම් මඟ හැරේය යන අදහසින් මම ඈට විශේෂ ප්‍රතිකාර ලබා දුන්නා. දැනට ඈ ශාරීරික අතින් නම් ප්‍රකෘති තත්වය ලබා ඇති බව මට සහතික කළ හැකියි. ඒ සමගම ඇගේ මානසික දුර්වලත්වය වඩාත් කැපී පෙනේ. ඈට සිදුවූයේ කුමක් ද කියා දැනගැනීමට ඇති බාධකයන් ගණනාවකි. පළමුවෙන්ම මට පෙනී ගිය විශේෂ කරුණක් නම් ඇගේ දෙමාපියන් ඇගේ ඇති තතු සඟවා ඇතැයි යන හැඟීමයි. මේ අහිංසක දැරියගේ මව්පියන් කියන අයුරින් නම් ඇගේ විවාහ ජීවිතය ඉතාමත් සැපවත් යයි පිළිගැනීමට

UPLOADED BY ELIFE

කරුණු කියා තිබෙනවා. අඩු මාස දරු ප්‍රසූතියකින් ඇති වූ රුධිර ධාවනය කරණ කොට ගෙන ඇගේ මානසික විකලත්වය ඇතිවීයයි ඔවුන් මට කීමට තැත් කරන එකම කරුණයි. එක් වෛද්‍යවරයෙකුගේ සහතිකයක් අනුව මට එය විශ්වාස කළ හැකි නමුත් රෝගියාගේ මේ තත්වයට තවත් කාරණා එකතු වී ඇතැයි මගේ පරම විශ්වාසයයි"

"අද වන තුරුත් මා ඈ සෝදිසි කිරීමෙහි නියැලුනා. තව මසකින් ඇගේ පියා ඈ ගෙන යන බව දන්වා සිටිය මුත් තව මසක් කල් ඉල්ලා ගත්තා. ඇත්තෙන්ම මා එසේ කළේ ඈ නොමැතිවාට මේ රෝහලට පාඩුවක් සිදු වෙනවාට නොවෙයි. කරුණු දෙකක් නිසා ඈ රැගෙන යනවාට මම කැමැති වූයේ නෑ, ඉන් පළමුවැන්න නම් වසක් මෙහි සිටලත් ඈට-සුවය ලබා දීමට නොහැකිවීම ගැන මා තුළ ඇති බලවත් කනගාටුවයි. දෙවැන්න නම් මෙවැනි අහිංසක දූරියක් ආපසු ගෙදර ගොස්, කුමන විදියේ ප්‍රතිකාර ලබා ගනීවිද කියා මා තුළ ඇති බියයි. ඈට සිදුවී ඇති අවාසනාවන්ත ඉරණම කුමක් වුවත් ඈ කාලය ගතකරන්නේ මහත් සේ ප්‍රීතියෙන් බව ඈ දෙස බලන ඕනෑම කෙනෙකුට එකවරම පෙනී යනවා. නමුත් ඇගේ සිහිබුද්ධිය අඩුවී ඇත්තේ කිනම් ආකාරයකින්ද යනු සොයා ගැනීම මහත් ගැටලුවක්ව තිබෙනවා. දිනක් මා ඈ ළඟින් යනවිට මා ළඟ කුඩා බලු පැටවෙකු සිටියා. ඈ වහා බලු පැටවා අතට ගෙන ඌ සුරතල් කරන්ට පටන් ගත්තා. මම බලු පැටවා ඈ අතට දී කියා, සිටියා මා ලෙඩුන් බලා ආපසු යනවිට ඌ මට දිය යුතුය කියා, පැය බාගයකට පසු මා ඇගේ කාමරය අසලින් ගියා. බලුපැටවා මට අමතක වුණා. ඈ වහා කාමරයෙන් එළියට විත් ඌ මගේ අතේ තබා ආපසු ගියා. ලෙඩුන් සිටින අනිකුත් කාමරවල දොර වසා තිබුණ නමුත් මගේ අණ පරිදි ඇගේ කාමරයේ පමණක් දොර ඇර දමා තිබෙනවා. ඈ එතරම් මට විශ්වාසයි. හුදකලාව ගතකරන අවසථාවලදී මා ඇයට කඩදාසි සහ පාට පෙට්ටියක් ලැබෙන්ට සැලැස්සුවා. ඈ චිත්‍ර දෙකක්



පමණයි ඇඳ තිබෙන්නේ. එකක් ගඟ අද්දරක පෙණපිඬු දක්වන චිත්‍රයක්! අනෙක ගඟ අද්දරක කැඩී බිඳී ගිය ඔරුවක්! ඊට පසුව කිසිවක් ඇඳීමට කැමැත්තක් දක්වූයේ නෑ. කිසිවකු ඈට බල කළේ ද නෑ."

තීක්ෂණ බුද්ධියෙන් යුතුවූ සරත් පතිරණ දොස්තර මහතා. බෙරි මහතා කී සෑම වචනයක්ම අසා සිට අනතුරුව මෙසේ කීය. "මම පස් අවුරුද්දක් පමණ මානසික රෝගීන් සම්බන්ධව විශේෂ පුහුණුවක් ලබා ඇත්තෙමි. ඒ අතර අමෙරිකාව, එංගලන්තය ආදි රටවල මානසිකාගාරයන්හි වැඩ කරන පිළිවෙළ ගැන මනා අවබෝධයක් ලබා ඇත්තෙක්මි. එහෙත් ඔබ කියන අයුරු මෙවැනි ලෙඩෙකු මා දක පුරුදු නැහැ. සමහර මානසික රෝගීන් සිතේ යම්කිසි කළකිරීමක් ඇතිව නිහඬව නිරාහාරව මරණය කරා යුහුසුළුව පා නඟයි. මෑ ඊට වඩා අතිශයින් වෙනස් තත්වයක් ගෙන ඇත. ඔබ කියන මේ රෝගියා එක්තරා තියුණු පරීක්ෂණයකට භාජන නොකොට මට කිසිවක් කිව නොහැකිය. මේ අනුව මට තෙමසක් කල්දුන මැනවැ"යි ආයාචනා කෙළේය.

පසුදින පෙරවරු නවයට පමණ පතිරණ මහතා, බෙරි මහතා කැටුව උඩුමහල් තලයේ සිටි නිර්මලා බැලීමට ආයේය. නිර්මලා දුටු විගස තරුණ පතිරණ මහතාගේ සිතේ ඇතිවූ වේගය විස්තර කළ නොහැක. කිසි විටෙකත් හේ මෙවැනි අයෙකු නම් බලාපොරොත්තු නොවීය. බෙරි මහතා ඈ ගැන කථා කරන අවසථාවේ තමා සිතේ ඇඳගත් සටහන දූනට වඩා ඉතා වෙනස්ය. පතිරණ මහතා මවිතයෙන් කට අයාගෙන ඈ දෙසම බලා සිටියේය. උමතු අයකුගේ කිසිදු ලක්ෂණයක් ඈ තුළ නොවීය. ඈද උමතුවෙන් පෙළෙන්නේ, නැතහොත් අවට සිටින්නන්ද? යනබව ඔහුගේ සිත්හි ප්‍රථම වරට බලපැවැත්වූ ප්‍රශ්නයකි. බෙරි මහතා දුටු වහාම නිර්මලා ඔහු දෙස බලා සිනා මුහුණින් යුතුව නැවත බිම බලා ගත්තාය. නිර්මලාගෙන් හිස

UPLOADED BY ELIFE

වැනීම පවා උත්තරයක් නොලැබුණද, ඇට හොඳ හිතවතෙකුට මෙන් කථා කිරීම බෙරි මහතාගේ සිරිතය. මෙතෙක් වේලා පතිරණ මහතා ඈ දෙසම බලා සිටියද වරක් වත් ඈ ඔහු දෙසට සිය දෙනෙත් යොමු නොකළාය. මෙයින් පතිරණ මහතාට අත්වූයේ තවත් පරාජයකි. බෙරි මහතා රෝගියාගේ සටහන් පත බලා ඒ ගැන යමක් පතිරණ මහතාට පෙන්වා දින. පසුව හේ නිර්මලාට කථා කෙළේය.

"නිර්මලා! මම අද පටන් තුන් මාසයක් නිවාඩු යනවා. ඔබව උදේ හවස බැලීමට පතිරණ මහතාට බාර දෙනවා. ඔබට තේරුණාද? මෙසේ කියත්ම නිර්මලාගේ මුහුණ මහත් ප්‍රතාපයකින් වෙළී ගියේය. ඈ පළමුවරට පතිරණ මහතා දෙස බලා නැවතත් බෙරි මහතා දෙසම ඇස් අයාගෙන සිටියාය. බෙරි මහතා අසල බිත්තියේ එල්වා තිබූ දින චක්‍රය ගෙන තෙමසක පත් ඈට පෙන්වීය. "නිර්මලා! මා නිවාඩු යන්නේ මෙතෙක් කල් පමණයි. මා අසල සිටින පතිරණ මහතා ඔබව හොඳින් බලා ගනීවි." නිර්මලා ශෝකයෙන් ඈත බලන්නට වූවාය. බෙරි මහතා තරුණ පතිරණ මහතා සමඟ කාමරයෙන් ඉවත් විය. "ඔබ දුටුවාද ඇගේ මුහුණෙහි ඇති වූ වෙනස, මා නිවාඩු යනවා කීවාම?" හේ පතිරණ මහතාගෙන් ප්‍රශ්න කෙළේය.

"ඔව්. මා එය දුටුවා!" පතිරණ මහතා කීය.

"එයින් තේරුම් යන්නේ ඇගේ සිහි බුද්ධිය හරියාකාර ක්‍රියා කරන බවයි." බෙරි මහතා උත්තර දින.

"නෑ, මෙවැනි සිහිවිකලවුන්ගේ දුබලවූ සිත්වල එක්තරා ප්‍රබල හැඟීම් ඇතිවෙනවා. දැන් ක්‍රියා කරනු ලැබුවේ ඒ හැඟීම් මාත්‍රය මිස ඇගේ සිහි බුද්ධිය නොවේ." යයි පතිරණ මහතා ස්ථිරව කියා සිටියේය.



"නුඹ ඇට කුමන ප්‍රතිකාරයක් කිරීමට ද බලාපොරොත්තු වෙන්නේ? බෙරි මහතා නැවතත් ප්‍රශ්න කෙළේය.

"මා පළමු කොට ම ඈ කථාකර වීමට තැත් කරනවා"

"කෙසේද ඔබ ඈ කථාකර වීමට තැත් කරන්නේ?"

"ඇගේ මොලයේ මාංශ පේශිවලට සුළු කම්පනයක් ඇති කිරීමෙන්."

"ඈ එවිට කථා කරයි ද?"

"ඇයි නැත්තේ! ඇගේ කට හඬට කිසිම ආබාධයක් සිදුවී නැහැ. ඈට කථා කළ හැකි බව ඈ පරීක්ෂා කළ වෛද්‍යවරුන් සහතික කොට කියා තිබෙනවා."

"වසක් තුළ මා සුව කිරීමෙහි නිරතවූ නමුත් මගේ උත්සාහයන් සියල්ලක්ම අසාර්ථක බැව් දැන් මට වැටහී තිබෙනවා, මා ඔබට ඈ සුව කරන්නටය කියා යම්කිසි අණක් පනවන්නේ නැහැ. එහෙත් ඇගේ තත්වය මීට වඩා බරපතල නොවේවායි මා කරන එකම ප්‍රාර්ථනාවයි." මෙසේ කියා බෙරි මහතා සමුගෙන ඉවතට ගියේය.

පසුදා උදේ නවයට පමණ පතිරණ දොස්තර මහතා පුරුදු හෙදියක සමඟ නිර්මලාගේ කාමරයට පැමිණියේය. නුපුරුදු අයකු හඳුනා ගැනීමට තැත් කරන්නාක් මෙන් නිර්මලා ඇසිපිය නොහෙලා මඳ වේලාවක් වෛද්‍යවරයා දෙස බලා ගෙනම සිටියාය.

"නිර්මලා!" දොස්තර ඈ ඇමතුවේය. ඔබට මාව මතක නැද්ද? මම ඊයේ උදේ බෙරි මහතා සමඟ ඔබ බැලීමට ආවේ," නිර්මලාද ඇගේ කාන්තිමත් නෙත් යුවළ පුළුල් කොට සිනා

UPLOADED BY ELIFE

මුසු මුහුණින් දොස්තර දෙසම බලා සිටියාය. "නිර්මලා! බලන්න, ඔබට කථා කරන්න බැරි කමෙක් නැහැ. අන් කිසිවෙකුට ඔබ වෙනුවෙන් කථා කරන්න කිසි විටෙකත් බැහැ. ඔබ දැන් මෙතැනට අවුත් බොහෝ කාලයක් ගත වුණා. ඔබට හැමදාම මෙතැන සිටින්ට බැහැ. යම් දවසක සුවවී ගෙදර යන්ට ඕනෑ. ඔබට තේරුණාද? ඔබ ගෙදර යන්ට ඕනෑ. ඉක්මනින්ම."

දොස්තර මේ වචන කියත් ම ඒ සියල්ලක්ම තේරුම් ගියාක් මෙන් නිර්මලා දොස්තර දෙස බලා සිටියාය. "ගෙදර යන්න." කන වැටෙත්ම ඈ තුළ අමුතු විපර්යාසයක් ඇතිවිය. ඈ මහත් බියකින් තැවෙන්නාක් මෙන් දොස්තරට පෙනී ගියේය.

පතිරණ මහතා නැවත වරක් කථා කොට, "නිර්මලා! අසනීපයෙන් පෙළෙන්නෙකුගේ කිසිදු ලක්ෂණයක් ඔබ ළඟ නැත. ඔබ යම් කිසි බියකින් ලතැවෙනවා. මා ඔබේ යහළුවෙකුයි සිතා ඔබේ සිත පෙළෙන ඒ බිය කුමක් දැයි මට කියන්න"යි අයැදීය.

ඇගේ මුහුණ නැවතත් බියෙන් මෙන් අඳුරු විය. ඈත ඇති දෙයක් බලන්ට තැත් කරන්නාක් මෙන් ඇගේ ඇස් බැම හැකිලෙන්නට වන.

"නිර්මලා! මා ඔබ ගැන දන්නේ එක කරුණක් පමණයි. එනම් ඔබ වැනි අසරණ කාන්තාවක් තවත් මේ ලෝකේ නැති බවයි." මෙසේ කියා පතිරණ මහතා අසල හුන් හෙදියකට යම් කිසි සංඥාවක් කෙළේය. හෙදියද, රෝගියා ඇඳෙහි හිඳුවා පුළුන් කැබෙල්ලක බෙහෙත් සවල්පයක් ගෙන අත පිසදමා දොස්තර දෙසට දිගු කෙළේය. දොස්තරද බටයක් ගෙන එක්තරා බෙහෙතක් ඇගේ නහර ගත කරන්ට වූයේය. මොහොතකින් නිර්මලා ඇස් පියා ගෙන සිහිසන් නොමැතිව වැද හොත්තේය. දොස්තරද බෙහෙත් විදීම අත්හිටවා ඈට කථා කෙළේය. ඔහුගේ කථා කිරීම මඳක් වේගවත් විය.



"නිර්මලා! කථා කරන්න., ඔබ කොහේද? ඔබ දැන් කොහේද?" දොස්තරගේ වචන තව තවත් එඩිතර විය.

"ගඟ අද්දර, ගඟ අද්දර," නිර්මලා කථා කරන්ට වූවාය.

"ගඟ අද්දර?" දොස්තර එම වචනයම ප්‍රතිරාවය කෙළේය. "කා සමඟද?"

"රංජිත්, රංජිත්," දොස්තර ප්‍රශ්න කෙළේය."කෝ රංජිත්?"

"තාත්තා ගෙදරින් එලවා ගත්තා." මෙසේ කියා ඈ වේදනාවෙන් මෙන් කෙඳිරි ගාන්නට වූවාය.

"ඉතින් රංජිත් කුමක්ද කළේ?"

"ඔහු එදා රෑ ආවා මා රැගෙන යාමට."

"ඉතින් ?"

"මම ගියේ නෑ, මම ගියේ නෑ. මම ........ ගියේ......... නෑ." නිර්මලාගේ කට හඬ පහත් විය. දැන් ඇගේ හුස්ම ගැනීමද මඳක් දුර්වලය. දොස්තර මහතා වහා බෙහෙත් විදීම නවත්වා, ඇගේ මුහුණට අම්ලකර වායුව අල්වන්ට සලස්වා ඉතා ඕනෑකමින් ඈ දෙස බලා සිටියේය.

සවල්ප වේලාවකින් ඈ නිඳිමෙන් වැද හොත්තීය. දොස්තර ද පසෙක හිඳ මහත් කල්පනාවකින් යුතුව ඈ පරීක්ෂා කරන්ට වූයේය. සෑහෙන වේලාවක් මේ අන්දමින් බලා සිටි පතිරණ මහතා ඇගෙන් ඉවත්ව යන්නට පෙර අසල හුන් හෙදියකට මෙසේ අවවාද දුන්නේය.

"පැය තුනක් ඇතුළත ඈ මෙම නින්දෙන් අවදිවිය යුතුය. සෑම පැය කාලකට වරක් බැගින් ඇගේ නාඩි පරීක්ෂා කොට

UPLOADED BY ELIFE

එය සටහන් කර තබන්න. මේ කාලය තුළ ඈ ඉතා පරීක්ෂාවෙන් රැක බලා ගත යුතුය. ඇස් හරින මොහොතෙහි ඇය නොයෙක් දේවල් දොඩවනවා ඇත. සියල්ලක්ම පොතේ සටහන් කළ යුතුය. ඈ සිහිබුද්ධියෙන් කථා කරත් නම් පළමු කොටම වතුර සවල්පයක් ඉල්ලනවා ඇත. එසේ කථා නොකළොත් අවදිවූ විගස දොඩම් ඉස්ම සවල්පයක් දීමට පිළියෙළ කර තබාගන්න. අනිත් ලෙඩුන් පරීක්ෂාකර ආපසු එන ගමන් මම නැවතත් ඈ පරීක්ෂා කරන්නම්."

පස්වරු දෙක වැදෙත්ම පතිරණ මහතා නිර්මලාගේ කාමරයට පිවිසියේය. හෙදියන්ගේ සටහන් පොත බලා එහි ගත යුතු කිසිවක් නොලියා ඇති බව දුන දොස්තර හෙදියට කථා කෙළේය. "ඔබ දන්නවාද, ඇගේ හෘදය වැඩ කිරීම අත්හිටියා."

"ඔව්, මට තේරුම් ගියා, ඔබ මහත් කලබලවූ බව" දොස්තර ආපසු යන්ට පෙර තව වරක් නිර්මලා අසල වාඩි වී නාඩි පරීක්ෂා කරන්ට වූයේය.

නොතේරෙන යම් කිසි දෙයක් නිර්මලා දොඩවන්ට වූවාය. දොස්තර ආපසු හැරී හෙදියට කථා කෙළේය. "ඇගේ මොලය ඉතා අධික ලෙස කම්පනය වී තිබේ. සතියක් පමණ කල් ඈට විවේකය දිය යුතුයි" මෙසේ කියත්ම නිර්මලා ඇස් හැර වටපිට බලන්ට වූවාය. "නිර්මලා," දොස්තර සෙමින් කථා කෙළේය. "ඔබට දැන් කොහොමද?"

ඇගේ නෙත් වඩාත්ම ගෝලාකාර විය. මහත් පිපාසයකින් පෙළෙන්නකු සේ ඈ තොල් ලෙවකන්ට වූවාය. අසල සිටි හෙදිය වහා දොඩම් යුෂ වීදුරුව ඇගේ මුව ළඟට ළං කළාය. අධික පිපාසය සංසිඳවා ගන්නෙකු සේ දොඩම් යුෂ අන්තිම බිංදුව පවා බී නැවතත් ඈ නිද්‍රොපගත වූවාය.



පතිරණ මහතා හිස සැලීය.

"ඈට කිසිදු කල්පනාවක් නැහැ. කුමක් වූවාද කියා" මෙසේ කියා ඔහු කාමරයෙන් ඉවතට ගියේය.

සතියකට පසු පතිරණ මහතා විදුලි කම්පන යන්ත්‍රය රැගෙන නිර්මලාගේ කාමරයට ගියේය. යන්ත්‍රය දුටු විගස නිර්මලා මහත් වේදනාවෙන් මෙන් හඬන්ට වූවාය. මඳ වේලාවක් නිසලව බලාහුන් දොස්තර තමා අත තුබූ විදුලි යන්ත්‍රය ඉවතට දැම්මේය.

"ඔබ මීට බියයි නොවේද? එසේනම් මම මෙය ඔබට පාවිච්චි කරන්නේ නැහැ." මෙසේ කියා හේ, අසල හුන් හෙදියට එය කාමරයෙන් ඉවත් කිරීමට අණ කෙළේය. නිර්මලාද ඇඬීම නවත්වා මහත් ආයාසයෙන් දොස්තර දෙස බලන්නට වූවාය. ඇස් ඉවත් නොකොටම දොස්තරද ඈ දෙසම බලාගන සිටියේය. මේ අතරම මැණිය නොහැකිවූ ආත්ම ශක්තියකින් තෙමේ වෙලාගන්නට විය. නිර්මලා සනීප කළ හැක්කේ තමාට පමණක් යයිද, ඈ සනීප කළ යුත්තේ මෙවැනි කම්පනයක් ආධාර කොට ගෙන නොවේයයිද, ඇගේ තත්වය තේරුම් කොට ගෙන යන බවද, ඔහුට වැටහී ගිය තවත් සත්‍යයකි.

ඔහු නැවත වරක් කථා කෙළේය. මේ වර කථා කෙළේ මහත් බැගෑපත් ලෙසිනි. "නිර්මලා ඔබේ මොලය වෙහෙස කරන කිසිම ආයුධයක් මීට පසු මම යොදන්නේ නෑ. අපව විශ්වාස කරගන මා සමඟ කථා කරන්න. ඔබේ කටහඬ ඔබට අකීකරුයි." මෙසේ කියමින් තමා වාඩිවී සිටි පුටුව ඈ ළඟට කෙළේය.

වරක් ඈ කථා කරන්ට මෙන් තොල් හකුලා ආපසු නිහඬ වූවාය.

UPLOADED BY ELIFE

"නිර්මලා ඔබ මා හඳුනන්නේ නැතිද?" දොස්තර ඇසීය. මම තමා රංජිත්-රංජිත් ඔබේ පෙම්වතා"-

හදිසි පහර ලද්දියක මෙන් නිර්මලා ගත සොලවන්නට විය. ඒ අතරම මහත් දයාන්විත බැල්මකින් ඇගේ මුහුණ තෙත්වී ගියේය. එහෙත් ඈ නිහඬය. කතා කරන්නේ ඇගේ නෙත් යුවළ පමණි.

පතිරණ මහතා තව තවත් ඇට කථාකොට තමා රංජිත් යයි තරයේ කියා සිටියේය. ඔහු මෙසේ කීවේ ඒ අනු-ග්‍රහයෙන්වත් ඇගේ තත්වය සැකෙවින් වටහාගත හැකිය යන අදහසිනි. නිර්මලා රැවටීමට නම් නොවේ. එහෙත් ඔහු අතින් සිදුවූයේ වරදෙක්දැයි නිශ්චය නැත.

"නිර්මලා! මා ඔබ සොයා ආවා මේ ගඟින් එගොඩ වෙලා. මා ආවා-ඔව්, - ඔබව - සොයා"-

මෙසේ කියත්ම නිර්මලා පතිරණ මහතාගේ පතුල සිට හිස දක්වාද, ආපසු හිස සිට දෙපතුල දක්වාම ඉතා පරීක්ෂාකාරීව බලන්නට වූවාය. ඉක්බිති මහත් අවිනිශ්චිතතාවයක් දක්වන්නාක් මෙන් ඈ බිම බලාගත්වනම සිටියාය.

නිර්මලා මෙසේ කථාකරවීමට නොහැකිවූ නමුදු ඒ මඟින් ඇගේ සිත් තුළ යම්කිසි විපර්‍යාසයක් ඇති කිරීමට දොස්තරට හැකි විය. ඒ බැව් අවබෝධ කොටගත් හේ, තව තවත් නිර්මලාගේ සිත ක්‍රියාකරවීමෙහි නිරත වූයේය.

"නිර්මලා! මා දෙස බලන්න ඔබට මෙපමණ ඉක්මනට මාව අමතක වූයේ කෙසේද? මමත් ඔබත් ප්‍රීතියෙන් ගං ඉවුරේ සෙල්ලම් කරමින් සිටි අවස්ථාව ඔබට මතක නැද්ද? මට නම් ඒ වග හොඳටම මතකයි."



සිව් මස් දරුවෙකු සිය මෑණියන් දුටු විගස ඈ අඳුනා ගැනීමට සෑම ප්‍රයත්නයක් දරාද? එසේම දොස්තර දෙස බලමින් පසුගිය කාලය මෙනෙහි කිරීමට ඈ ගත් වෙහෙස අනන්තය.

"නිර්මලා! මා දිනක් කීවා කිසි විටෙකවත් ඔබ අමතක කරන්නෙ නෑ කියා, මා දැන් පැමිණියේ ඒ පොරොන්දුව ඉටු කිරීමටයි."

"එකමත් එක රටක" කථාවක් කියනවිට යම් සේ කුඩා දරුවකු ඇස් අයා ඒ කථාව අසා සිටීද? එමෙන්ම නිර්මලා පතිරණ මහතාට සවන් දෙන්ට වූවාය.

පැයක් පමණ වේලා ඈ සමඟ ගතකළ පතිරණ මහතා අන්තිමේදී ඇගෙන් ඉවත්වීමට ලෑස්ති විය. ඊට පෙර ඇට මෙසේ කීවේය. "නිර්මලා මා කියන සෑම වචනයක්ම ඔබට තේරුම් ඇති, අර පෙනෙනවා නොවේද මුළු ගඟ පෙදෙසම රත් පැහැ කරමින් ඉර බැස යන සැටි! මම හෙටත් ඉර බැස යන්ට පෙර ඔබ ළඟට එනවා." මෙසේ කියා ඈ දෙස යටහත් බැගෑපත් බැල්මක් හෙලා දොස්තර මහතා යන්ට ගියේය.

ඊට පසු සෑම දිනකම හිරුබැස යන්ට පෙර පතිරණ මහතා නිර්මලා බැලීමට පැමිණියේය. එසේ පැමිණ රෑ බෝ වෙනතුරු ඈ සමඟ කාලය ගත කෙළේය. දැන් ඔහු පැමිණෙන්නේ වෛද්‍යවරයෙකු ලෙඩෙකු බැලීමට එන අදහසින් නම් නොවේ. ඔහුගේ සිතුම් පැතුම් ඊට වඩා ඉතා ගැඹුරුය. ඔහුට නිර්මලා දකින්නේ නැතුව සිටීමට බැරි තත්වයක් දැන් එළඹ ඇත. නිර්මලා කථා නොකලද දෙදෙනා එකතුව ඉතා ප්‍රීතියෙන් ගතකරන බව ඇගේ පැහැපත් මුහුණින් පැහැදිලිව පෙනුණි.

මේ ආකාරයෙන් දෙමසක් ගෙවී ගියේය. දැන් දැන් සරත් (පතිරණ) ඉදිරියේ ඇත්තේ විසඳිය නොහැකි ප්‍රශ්නයකි. දෙමසක්

UPLOADED BY ELIFE

තුළදී ඈ සනීප කිරීමට හැකි බව වරක් හෙතෙම ප්‍රධාන වෛද්‍යවරයා ඉදිරියේ කියා සිටියේය. තවත් ඔහු ඉදිරියේ ඇත්තේ මසක් පමණි. ඔහු කළ පරීක්ෂාවන්ගෙන් නිර්මලා ගැන දැන ගත් දේ බොහෝය. ඇගේ අසනීපය නිශ්චය කොට සුව කිරීමට නම් ඈ ගැන තවත් කරුණු රාශියක් දැනගත යුතුය. කරුණු දැනගත්තේ වුවද මේ අවාසනාවන්ත තත්වයෙන් මුදාගත හැකි යයි කාට නිශ්චය කළ හැකිද? යුරෝපා අමෙරිකාදී රටවලින් උගත් එකම ප්‍රතිකාරයක්වත් මැගේ රෝගයට නොගැළපේ. උදේ සවස නිර්මලා දැකීමෙන් ඔහු තුළ ඇතිවී තිබෙනුයේ නොදැමිය හැකි සිත් තැවුලකි. නිර්මලාගේ සුවිනීත මෘදුගුණයන් ඉදිරියේ ප්‍රේමය නැමති අග්නිජාලාව ඔහු හද තුළ ඇවිලී යන්නේය. මෙය තමා අතින් සිදුවූ වරදකැයි තමාට වරින් වර කල්පනා වේ. එහෙත් නිර්මලා දුටු විගස එහි හරි වැරදි සියල්ලක්ම ඔහු තුළින් ඉවත් වේ.

"මා අසල ඈ සිටින්නේ මහත් ප්‍රීතියෙන්! මගේ කරුණාව නැමති ගීතයෙන් ඇගේ ශෝගින්න නිවී යනවා, මේ අභිරහස් බාධාවෙන් ඈ එතර කිරීම මගේ එකම අභිප්‍රායයි." මෙසේ සිතමින් තව තවත් ඔහු ඈ සම්බන්ධව කරුණු සෙවීමෙහි නිරත වූයේය.

හිරු බැස යන වේලෙහි නිර්මලාගේ එකම අභිප්‍රාය වූයේ ඈ අලුතෙන් සොයාගත් "රංජිත්" හමුවීමය. දිනක් පතිරණ මහතා ඇගේ කාමරය අසලට ඒම ප්‍රමාද විය. නිර්මලාද ඈත රක්ත වර්ණ අහස දෙස බලමින් මහත් චංචල ස්වභාවයක් දැක්වීය. ඇගේ අශාන්ත භාවය දුටු හෙදිය ඈ දෙස මහත් කල්පනා සහිතව බලා සිටියාය. ගඟ හරහා විශාල ගිනි දැල් පතුරුවන්නාක් මෙන් පෙන්වා හිරුදෙව්පුත් සයුර තුළ ගිළිනි. නිර්මලා මහත් වේදනාවෙන් කවුළුව මත හිස තබා සුසුම් හෙලන්ට වූවාය. ඇගේ දෙනෙත් ගෝලාකාර ලෙස ඇරෙන්නට විය. හෙදියද ඈ ළඟට විත් පහත් හඬින් ඇට කථා කළාය.



"නිර්මලා! ඔබට හදිසි අසනීපයක් වත් සෑදීගෙන එනවාද? කියන්න. ඇයි ඔබ මෙපමණ නොසන්සුන්?"

"රංජිත්, රංජිත්, කෝ රංජිත්," ඇගේ මුවින් ඉබේම පිටවිය.

ඈ විසින් අරඹන ලද මහා යුධය මෙතෙකින් අවසානය. විදුලියක වේගයෙන් කථා කිරීමේ ශක්තිය ඇට ඇති විය. හෙදියද ඇගේ අත් දෙක අල්වා මහත් පුදුමයෙන් හා සතුටින් ඈ දෙස බලාගෙනම සිටියාය. ජයග්‍රාහකයෙකුගේ තේජස් විලාශය හෙදියගේ මුහුණෙහි පිළිබිඹු කළේය.

"රංජිත් යන නම ඇගේ මුවින් නික්මෙත්ම කාමරයෙහි දොර විවෘත විය. පතිරණ දොස්තර මහතා ඈ ඉදිරියේ සිට ගත්තේය. හෙදියද දෙදෙනට වහා ඉඩදී කාමරයෙන් ඇත් වූවාය. නිර්මලා සහ දොස්තර වශී වූවාක් මෙන් මඳ වේලාවක් නිහඬව එකිනෙකා දෙස බලා ගත් වනම සිටියහ. අන්තිමේදී දොස්තර මහතා කථා කෙළේය. "නිර්මලා! ඔබ සොයන රංජිත් මා තමයි. ඔබ අද අත් කොට ගත්තේ ලොකුම ජයග්‍රහණයක්! අද සිට ඔබ මා ඉදිරියේ නිහඬව සිටින්ට උවමනා නැහැ. මම ඔබ සොයා ආවේ ඔබව බේරා ගැනීමටයි. ඉතින් බිය සැක දුරලා මා සමඟ කථා කරන්න."

"මා හිතුවා ඔබ මුහුදින් එතෙර ගියා කියලා," ඇගේ කටහඬ පහත් විය.

කොයි ආකාරෙකින් වත් නිර්මලාගේ හිත ආකුල කිරීම යුතු නැත. එබැවින් දොස්තර මහතා ඇට නිසි පිළිතුරු දුන්නේය.

"ඔව්. මම මුහුදින් එතර ගියා, එහෙත් ඔබ අසනීප බව දැන ගත් විගස මම සොයා ආවා."

"දැන් මට සනීපයි, ඔබ ඉදිරියේ මට කිසිම අසනීපයක් නෑ." නිර්මලාගේ මුහුණ අලුත දැල්වූ ප්‍රදීපයක් මෙන් එළිය වැටුණි.

UPLOADED BY ELIFE

"ඔව්. නිර්මලා ඔබට දැන් බොහෝ දුරට සනීපයි. තව ස්වල්ප දිනකින් ඔබට ගෙදර යන්ට පුළුවන් වෙයි."

"ගෙදර" ඇගේ මුහුණ නැවත වරක් අඳුරු විය. "ගෙදර!" පතිරණ මහතාටද වූයේ වරදකි. ක්ෂණයකින් ඔහු කථාව අන් අතකට හැරවීය.

"නිර්මලා! ඔබේ කෙස්වැටිය අද වෙනදාටත් වඩා දිගයි. ඔබ අද සවස නෑවාද?"

"මම කොණ්ඩය සේදුවා. ඈ උත්තර දුනි.

මානසික රෝහලක ප්‍රතිකාර ගැනීම සඳහා ඇතුළු වූ අයගේ හිස කෙස් බූ ගෑම සිරිතක් වුවද බෙරි මහතාගේ අණ පරිදි නිර්මලාගේ හිසේ කෙස් වැටිය එසේම තිබෙන්ට හරින ලදී.

මෙවක් පටන් පතිරණ මහතා වේලාව ලැබුණු සෑම අවස්ථාවකදීම නිර්මලා බැලීමට ආයේය. කථා කළ හැකි වුවද ඇට අතීතය අමතකය. තමා කොහේද සිටින්නේ යන වගක් ඇට නො තේරේ. පසුගිය කාලයෙහි සිඩීන් ඇගේ සිතට නැඟෙන්නේ මහත් පැටලුම් සහිතවය. මෙවැනි අවස්ථාවන්හි දොස්තර ඉතා බුඩිමත් අයුරින් ක්‍රියා කිරීමට ඉටා ගත්තේය. නිර්මලා සම්පූර්ණ සුවය ලබන තුරු පතිරණ මහතා "රංජිත්" යන නම ආරූඪ කොට ගත යුතුය. එමෙන්ම ඈ කියන සෑම දෙයක්ම තමාට හොඳට පලපුරුදු ඇති බව පෙන්විය යුතුය.

පතිරණ මහතා මානසික වෛද්‍ය විශේෂඥයකු වූ බැවින් මෙවැනි ගැටලු අවසථාවකට මුහුණදීම භාරධූර කාර්‍යයක් නොවීය. දිනක් දොස්තර හදිසියේම ඇගේ කාමරයට පැමිණියේය. නිර්මලා මඳක් තිගැස්සී, "ඔබ දැන් කෙසේ පැමිණියේදැ" යි විචාළාය.



"ඇයි ඔබ එසේ අසන්නේ? මා ආවේ වෙනදා එන විදියටමයි." දොස්තර උත්තර දින.

"මම දුටුවේ නෑ ඔබේ ඔරුව මෙගොඩ එනවා."

ඊට දොස්තර මහතා දුන් පිළිතුර ඉතා සූක්ෂම විය.

"මම අද ආවේ එහා තොටුපළින්. ඔබට එය පෙනෙන්නේ නෑ." නිර්මලා සෑහීමකට පත් වූවාය. ඇගේ මුව සිනාවෙන් පිරුණි.

නිර්මලා කවුළුව ළඟ සිටීමේ රහස ඔහුට සැනෙකින් අවබෝධ විය.

හදිසියේම නිර්මලා දොස්තර අත තුබූ ඔරලෝසුව දෙස මහත් විමසිල්ලෙන් බලා සිටියාය.

"ඔබ කවදාද අලුත් වීදුරුවක් දැම්මේ?"

"මේ මාගේ පරණ වීදුරුව තමයි." දොස්තර උත්තර දුනි.

"ඒ වීදුරුව එදා මගේ අතින් කැඩී ඉරක් ගියා ඔබට මතකද?"

දොස්තර අන්දුන් කුන්දුන් විය. ඒ බව කිසිත් නො අඟවා හේ මෙසේ කීය. "මම අලුත් වීදුරුවක් දමා ගත්තා ඒ වෙනුවට."

"කවදාද?" ඇගේ මුහුණ මවිතයෙන් පිරී ගියේය.

"ඊට පසුවදාම"

"එහෙනම් ඇයි එදා කීවේ බිඳී ගිය බලාපොරොත්තු සිහිවීමට ඔරලෝසුව එසේම තියාගන්නවා කියා."

UPLOADED BY ELIFE

"නෑ නිර්මලා ඒ ඔරලෝසුව ගෙදර, ඔබව සිහිවීමට ප්‍රවේශමේ අරන් තියලා, මේ වෙනින් ඔරලෝසුවක්."

මෘදු වූ සියුමැලි සිනාවකින් ඇගේ මුහුණ තෙත් වී ගියේය. පසුව ඇගේ හිස දොස්තරගේ ලය මත රඳවා සෙමින් මෙසේ කියන්ට වූවාය.

"මට ඒ ඔරලෝසුව දකින්න හරිම ආසයි"

දොස්තර ද කුඩා දරුවකු නලවන්නා සේ නිර්මලාගේ හිස පිරිමදිමින් මෙසේ කීවේය. "අපේ බලාපොරොත්තු සියල්ලක්ම මෙසේ සඵල වෙද්දී සුන් වූ බලාපොරොත්තු, සිහිකරන ඒ කැඩීගිය ඔරලෝසුව බලන්නේ කුමට ද?"

මෙය ඇසූ නිර්මලා මඳක් සෑහීමට පත්ව හිස ඔසවා දයාබර බැල්මකින් දොස්තර වශී කළාය. දොස්තර ද අත් යුගළයෙන් ඈ තරයේ අල්වා දිගු සුසුමක් හෙළීය.

"ඔබෙන් ඉවත්ව ගිය අතීත කාලය නැවත ලබා ගන්නා තෙක් මා කුමක් කීවත් ඔබට කිසිදු තේරුමක් නෑ. නිර්මලා! කවදාද ඔබේ ප්‍රකෘති තත්ත්වය නැවතත් ඇති වන්නේ?" මෙසේ කියා සිතේ ඇති වූ අශාන්ත භාවය මැඩිය නොහැකිව හේ වහා කාමරයෙන් පිට වී ගියේය.

ඊට දෙදිනකට පසු නිර්මලා ද අසනීප ගතියකින් පෙළෙන්නට වූවාය. මෙය ඇගේ තත්ත්වය ආපසු යෑමෙක් දැයි පතිරණ මහතා වරක් බියවිය. වහා මීට හේතු සෙවීමෙහි හේ නිරත වූයේය. මේ ගැන හෙදිය ගෙන් ප්‍රශ්න කරන ලදුව එක් ඉංග්‍රීසි කාන්තාවක් ඇගේ කුඩා දරුවා සමඟ මල්වත්තේ ඇවිදිනවා දැක ඒ ගැන යම්කිසි බියක් ඇති කර ගත් බව ඈ නොවලහා කීවාය. ඒ ඉංග්‍රීසි කාන්තාව අන් කිසිවකු නොව මසකට පෙර එංගලන්තයේ සිට නිවාඩුවක් ගත කිරීමට



ලංකාවට පිවිසි බෙරි මහතා ගේ වැඩි මහල් දියණිය ය. කුඩා දරුවා ඇගේ පුත්‍රයා විය.

මේ කථාව ඇසූ පතිරණ මහතා මේ ගැන යම්කිසි පරීක්ෂණයක් ඇති කිරීමට සිතා පසු දින උදෑසන නිර්මලා ගේ කාමරයට පැමිණියේය. පතිරණ මහතා කාමරයට පිවිසෙත්ම කවුළුවෙන් බෙරි මහතා ගේ දියණිය ඔහුට පෙනිණ. ඔහු වහාම නිර්මලාට ඇය පෙන්වීය. කාන්තාව දුටු විගස නිර්මලාගේ මුහුණ සුදුමැලි විය. ඇගේ සර්වාඞ්ගයම ගැහෙන්නට වන.

"නිර්මලා මේ සුදු කාන්තාව ඔබ අඳුනනවා ද? දොස්තර විචාළේය.

"ඔව්," ඈ බියෙන් උත්තර දින.

"කවදා ද? ඔබ ඈ අඳුනාගත්තේ?"

නිර්මලා කල්පනා කරන්නට වූවාය. ලොකු බියක් ඇගේ මුහුණෙහි සඳහන් විය.

"ඔබ ඈ දුටුවේ කවදා ද? දොස්තරගේ හඬ එඩිතරය.

"මම ඈ සිහිනෙන් දුටුවා."

"සිහිනෙන් ඈ කුමක් ද නුඹට කළේ?"

"මා ගලෙන් පෙරලා දැම්මා."

"ඉතින්, ඔබට සිදුවූයේ කුමක් ද?"

කථාව නවත්වා ඈ ළදරුවෙකු මෙන් හඬන්ට වූවාය. "නිර්මලා මේ බලන්න, ඈ බෙරි මහත්තයාගේ දියණිය. ඈ මෙහි ආවේ ගිය සතියේ. ඈ සිහිනයකින්වත් ඔබට අනතුරක් කරන්නේ

UPLOADED BY ELIFE

නැහැ. ඔබ බිය වන්ට එපා. මාසය ඉකුත් වන්නට පෙර ඈ ආපසු යනවා."

"ආපසු යනවා?" නිර්මලා දොස්තරගෙන් ප්‍රශ්න කළාය.

"ඔව්."

"එවිට ඔබත් යනවා ද?" ඇගේ සිරුර සෙලවෙන්නට විය.

"නැහැ, මම ඔබ සමඟ සිටින්ටයි ආවේ."

මෙසේ කියත්ම නිර්මලාගේ මුහුණ අලුත ප්‍රබෝධමත් වූ පත්මයක් සේ ප්‍රාණවත් විය. ඒ අතරම ඇගේ ප්‍රකෘති තත්ත්වය ද ළඟා වී මඳක් සැහීමකට පත් වූවාය.

පතිරණ මහතා මෙයින් සැහීමකට පත් නොවී මේ ගැන විශේෂ පරීක්ෂණයක් කෙළේය. එදිනම නිර්මලාගේ මව්පියන් ගෙන්වා පැය කීපයක්ම ඔවුන්ගෙන් නොයෙකුත් ප්‍රශ්න අසා කරුණු රාශියක් අවබෝධ කොට ගත්තේය. දැන් ඔහු විසින් කළ යුත්තේ එක කරුණක් පමණය. එනම් ඇගේ ජීවිතයේ කැඩී බිඳීගිය රැන් පොටවල් පිළිවෙළට අමුණා ඈ ඉදිරියේ තැබීමය. වැඩි කල් නොගොස්ම මෙය ඉටුකළ හැකියයි පතිරණ මහතා කල්පනා කෙළේය.

නිර්මලා අලුත් මානසික විශේෂඥයාට භාරවී සවල්ප දිනකට පසුව එක්තරා බියකරු උමතු රෝගියෙකු එම ආරෝග්‍ය ශාලාවට ගෙනෙනු ලැබීය. විසිතුන් හැවිරිදි රීටා මදනායක නැමති මෙම තරුණ උන්මත්තකාව රෝහලට ගෙනෙනු ලබන අවසථාවේ දී ඈ නොයෙකුත් බලහත්කාරකම් කළාය. තදින්ම වියරු වූ රෝගියෙකු ඇතුළු වූ බව රෝහලේ සැම දෙනාටම ප්‍රත්‍යක්ෂ විය. ඇගේ සැඩ පරුෂකම් මැඩලිය නොහැක්කේ යදම්වලින් අත් පා බැඳ තැබීමට සිදුවිය. ඇතුළු වූ දින කීපය



UPLOADED BY ELIFE

තුළ ඇට තද නින්ද යාමට බෙහෙත් විද තුබූ බැවින් රීටා මදක් නිහඬ වූවාය. එහෙත් ඇට සාත්තු සප්පායම් කිරීමට ආ හෙදියනට බැණ අවස්ථා බොහෝය. තමන් ළඟ තිබෙන ඕනෑම දෙයක් කඩා බිඳ දමන්නටත් ඉදිරියේ සිටින ඕනෑම කෙනෙකුට බැණ වැදීමටත් අතට අසුවූ ඕනෑම භාණ්ඩයකින් අවට සිටිනවුන්ට පහර දීමටත් ඈ කිසිවිටෙකත් පසුබට නුවූවාය. ඇගේ උමතු භාවය කෙතරම් දරුණුදයත්, ඈ සිටි කාමරය නිරන්තරයෙන්ම අගුළු දමා තිබීමට සිදුවිය.

මුව තුළින් ඇට බෙහෙත් දීම නොහැකිවූ බැව් වටහාගත් පතිරණ මහතා උදේ සවස බටයකින් බෙහෙත් ශරීරගත කෙළේය. බෙහෙත් විදීමට පෙර ද දෙතුන් දෙනෙකු විසින් ඈ තරයේ අල්වාගනු ලැබීය. අසල හුන් අය සපා කෑ අවස්ථා බොහෝය. සාමාන්‍යයෙන් හඳ මෝරණ දිනයන්හි ඇගේ වියරුභාවය වඩා දරුණු විය. ඇගේ මව්පියන් ඈ සම්බන්ධ සියලුම කරුණු තත්ත්වාකාරයෙන් වෛද්‍යවරුන් ඉදිරියේ පැහැදිලි කළ හෙයින් දොස්තරවරුන්ට ඈ පරීක්ෂා කොට ප්‍රතිකාර කිරීම වඩා අසීරු කරුණක් නොවීය.

රීටා මදනායක ඉහළ පෙළේ පවුලක ධනවත් තරුණියකි. ඈ එම පවුලේ එකම දරුවා වූවාය. ඇට තිසි වයස් පැමිණි කල ඇගේ මව්පියෝ ඇට සුදුසු විවාහයක් ලෑස්ති කළහ. නමුත් ඊට මැගේ සතුටක් නොපෙන්විය. ඇගේ සිත අන් අදහස් වලින් පිරී ගියේය.

සැම්සන් අල්මේදා, තරුණයෙකුට හෙබි සකලාඞ්ගයකින්ම පරිපූර්ණ වූ කඩවසම් තරුණයෙකි. රීටා මදනායක ඔහු දුටු විගස, මොහු හැර අන් කිසිවෙකු සමඟ විවාහ නොවන බව තරයේ ඉටාගෙන ක්‍රියා කළාය. මව් පියාදීහු මේ බව දැන ගත්තෝය. නමුත් ඔවුනට ඊට විරුද්ධවීමට ඉඩක් නොතිබිණි. විවාහයට දිනයක් නියම කරගන්ට පෙර මේ දෙදෙන



නොයෙකුත් සමාජශාලාවල හැසිරෙමින් ශිෂ්ඨ නව සමාජය පිළිකුල් කරන බාල් නැටුම් ආදී නොයෙකුත් ක්‍රීඩාවන්හි යෙදෙමින් දවසේ වැඩි කාලයක්ම විනෝද සුවයෙන් කල් හැරියෝය. එක් දිනක හදිසියේම අල්මේදා මහතා රීටාගේ සුහද මිතුරියක සමඟ ලංකාව අත්හැර ගියේය. බලාපොරොත්තු සුන් වූ බැව් රීටා දැන ගත්තෙන් සිහි විකලව අමුතු දේවල් කරන්ට වූවාය.

සිහි විකල වූ රීටා පළමුවෙන්ම භූමිතෙල් දමා ඇගේ මඞ්ගල ඇඳුම් සියල්ලක්ම ගිනිබත් කළාය. මෙයින් නොනැවතී ඈ අතට අසුවන සියල්ල කඩා සුණු විසුණු කරන්ට වූවාය. අනතුරුව මානසික විශේෂඥයකු විසින් පරීක්ෂා කරනු ලැබූ ඈ තද වියරු සවභාවයකින් පෙළෙන බව නිගමනය කෙළේය.

පතිරණ මහතා උදේ සවස රීටා බලන්ට පැමිණීම ඇට නුරුස්නා කරුණෙක් විය. ඔහු දුටු කෙනෙහි ඈ දත් සපා කමින් ඇස් අයාගන දෙස්තර දෙස බලා සිටියාය.

"ඇයි ඔබ මේතරම් අමනාපයෙන් මා දෙස බලා සිටින්නේ? මා ඔබට කිසිම අවැඩක් කළේ නැහැ." වරක් දෙස්තර ඇගෙන් ප්‍රශ්න කළේය.

"ඔබ තමයි මගේ ජීවිතය කා දැමූ පුද්ගලයා" ඈ තවත් දත් සපන්නට වූවාය.

"ඇත්තෙන්ම කියන්න මම ඔබට කුමන හානියක්ද කළේ කියා." දෙස්තර විචාළේය.

"ඔබ නැතිනම් කව්ද? මා බඳින්න පොරොන්දු වෙලා මගේ යාළුවා සමඟ පැනල ගියේ."

දෙස්තර සිනාසෙන්නට විය. "නෑ නෑ මම කවුරුත් සමඟ පැනල ගියෙත් නෑ. මම තවම අවිවාහකයෙක්.

UPLOADED BY ELIFE

දෙස්තර කී වචන මඳක් තේරුම් ගියාක් මෙන් රීටා දෙතුන් වරක් ඔහුගේ පතුල සිට හිස දක්වා බලා සිට 'තූ' කියා කෙළපිඬක් ගසා ඔහුට පරිභව කෙළේය.

දොස්තරද ලේන්සුව ගෙන මුහුණ පිසදමා නහරගත කළයුතු ඖෂධ බටය පිළියෙළ කෙළේය.

තමාට තමා තත්වාකාරයෙන් හඳුනා ගැනීමට නොහැකි වීම තරම් අභාග්‍යයෙක් මේ ලෝකයේ තවත් නැත. පතිරණ මහතා ඒ සත්‍යය මැනවින් අවබෝධ කොට ගත්තෙකි. ඔහුද මහත් අනුකම්පාවෙන් ඈ දෙස බලා පිළියෙළ කොට තුබූ ඖෂධ බටය ඇගේ නහර ගත කොට වහා එතැනින් ඉවත්ව ගියේය.

සිව් මසක් ගතවිය. එක් උදයක මානසිකාගාරයෙහි ප්‍රධාන තැන්පත් බෙරි මහතා සහ පතිරණ මහතා අතර දීර්ඝ සාකච්ඡාවක් ඇරඹින. මානසිකාගාරය වැඩි දියුණු කිරීම සම්බන්ධව පුළුල් වැඩ පිළිවෙළක් බෙරි මහතා විසින් ඉදිරිපත් කරන ලදී. දැනට මානසිකාගාරයෙහි ඉඩකඩ ඇත්තේ විසිදෙනෙකුට පමණි. කවදත් කාමර හිස්ව නැත. සාමාන්‍යයෙන් මානසික දුර්වලත්වයෙන් ඇතුළුවූවෙකු අඩුම ගණනේ තෙමසක්වත් මෙහි නතර විය යුතු ය. ඉඩකඩ මඳකම නිසා දැනටමත් රෝගීන් භාරගන්නේ පිළියෙළ කරන ලද නාම ලේඛනයක් අනුවය. මානසික රෝගියෙකුට කිසිම අවහිරයක් වන පරිදි කටයුතු කිරීම ගැන බෙරි මහතා තරයේ විරුද්ධ ය. මෑතකදී ඉදිකිරීමට අදහස් කොට ඇති ගොඩනැගිල්ලෙහි තව ලෙඩුන් දහසය දෙනෙකුට පමණ ඉඩකඩ සැලසේය යන්න දොස්තරවරුන් දෙදෙනාම පිළිගත්හ.

පසුව සාකච්ඡාව මානසික රෝගීන් සම්බන්ධ විය. මෙහි රෝගීන් හඳුන්වනු ලබන්නේ ඔවුන්ට අයත් විශේෂ නොම්මරයකිනි. පතිරණ මහතා රෝහලේ වැඩ භාරගත්දා පටන්



මානසිකාගාරය තව තවත් රටේ ප්‍රසිද්ධ වී ගියේය. දිවයින පුරා ධනවත් පවුල්වල සිටින මානසික ශක්තිය දුබල වූවන් ඒ මහතා වෙත ගෙනෙනු ලැබුවේ ස්ථිර බලාපොරොත්තු සහිතවය. පතිරණ මහතාද පොදුවේ සිය යුතුකම් ඉටු කෙළේය.

"නොම්මර 16 රෝගියා සම්බන්ධව ඔබේ අදහස කුමක්දැයි" බෙරි මහතා ප්‍රශ්න කෙළේය. ඉහත සඳහන් නොම්මරය රීටා මදනායක සතුය.

"නොම්මර 16 රෝගියාගේ මොලය කම්පනය කිරීමට අපට කිසිම උවමනාවක් නැහැ. අප ඈ ගැන දැනගත යුතු සියල්ල වටහාගෙන ඉවරයි. ඇට ලැබිය යුතු ප්‍රතිකාරය හයමාසයක් තුළ ලබාගත යුතුයි. ඈට නියම කොට ඇති මෙම බෙහෙත් ලැයිස්තුව දුන් පසු ඇගේ තත්ත්වය ගුණ අතට හැරෙනු ඇතැ"යි පතිරණ මහතා උත්තර දුන්නේය.

"හයමසක් තුළ සම්පූර්ණ සුවයක් ලබාදිය හැකිදැයි ඔබ නිශ්චය කරන්නෙහි ද ?' යි බෙරි මහතා ප්‍රශ්න කෙළේය. පතිරණ මහතා ඊට නිසි පිළිතුරු දිනි.

"යම්කිසි අනිසි විපාකයකින් මොලයේ යම් යම් නහර දුර්වල වීමෙන් උමතුවීම ලෝක ස්වභාවයයි. ඒ අතරම මාන්නයත් අධික ක්‍රෝධයත් එක් වීමෙන් තත්ත්වය වඩාත් දරුණු විය හැක. මගේ සිතේ හැටියට නම් ඈට මානසික දුර්වල කමට වඩා බලපවත්වනුයේ සිතේ මැඩපැවැත්විය නොහැකි අධික ක්‍රෝධයක්. තමාට අත්වූ අභාග්‍ය කාලයත් සමඟම තමා ඉදිරියේ ඇති සැමටම උවදුරක් කිරීම ඇගේ සිතේ ඇති එකම බලපෑමයි."

"ඔබ කියන දේ හරියටම හරි" බෙරි මහතා පිළිතුරු දුනි. " මම ඊයේ උදේ ඇගේ කාමරය අසලින් ගිය විට ඈ මහත් සේ කන්නලව් කරමින් මගෙන් වතුර ස්වල්පයක් ඉල්ලා සිටියා. වතුර වීදුරුවක් දෙන ලෙස අසල හුන් හෙදියකට මා අණ

UPLOADED BY ELIFE

කළා. හෙදියද මගේ වචනය කඩ කළ නො හැකි නිසාම වතුර වීදුරුවක් ගෙන ගොස් දුන්නා, වීදුරුව අතටගත් විගස ඈ හෙදියගේ මුහුණට වතුර ගසා දැම්මා. මා ඉදිරියට නොපැමිණෙන්නට හෙදියට තවත් කරදර දෙනවා."

"ඇගේ ගතිගුණ ඉතාමත් අවිස්වාසදායකයි, අවිනිශ්චිතයි. වරක් හොඳනම් තව වරක් නරකයි" පතිරණ මහතා කියා සිටියේය.

බෙරි මහතා මඳක් හිස සැළීය. "මෙවැනි තත්ත්වයක් ඇගෙන් බලාපොරොත්තු විය යුතුමයි. ඈ පවුලේ එකම දරුවෙකු වූ නිසා ඇගේ මවුපියන් ඈට නොයෙකුත් දේ කිරීමට ඉඩකඩ දී ඈ නොමඟ යාමට අනුබල දී තිබේ. ඒ අනුව දැන් වුවද ඈ සිතන්නේ හරි හෝ වැරදි හෝ සියල්ලෝම ඇගේ අණට කීකරු විය යුතුය කියාය. සේවිකාවන් පවා ඈ ළඟට යාමට බියයි. මට ඊයේ මේ බව හොඳින් තේරුම් ගියා," බෙරි මහතා සිය අදහස් ප්‍රකාශ කළේය.

"උමතු වූවන් කරන කියන දෑයෙහි ගෙදර පරිසරය මහත් සේ බලපාන්නේය. සාමාන්‍යයෙන් දරදඬු පිළිවෙතක් අනුගමනය කරන්නා සිහි විකල් වූ විගස ඒ තත්ත්වය තව තවත් දරදඬු බවට පත්වෙයි." පතිරණ මහතා තවත් පහදා දුන්නේය.

රෝගීන්ගේ රපෝර්තු කීපය තව තවත් පෙරළා බලා බෙරි මහතා නොම්මර 12 තමා ඉදිරියට ගත්තේය. නොම්මර දොළහෙන් පෙන්නුම් කළේ දැනට වසකට අධික කාලයක් තුළ මහත් අසරණ තත්ත්වයක වැටී සිටින නිර්මලාය.

"මැයද පවුලේ එකම දරුවාය" පළමුවෙන්ම පතිරණ මහතා මෙසේ කීවේ, බෙරි මහතාට ඇනුම්පදයක් වශයෙනි.



"ඔබ කියන දේ මට හොඳින් වැටහුණා," කියමින් බෙරි මහතා සිනාසුනේය.

"පවුලේ එකම දරුවා වුවත් තිසි මඟින් ඈත්ව හැදෙන්ට උවමනාවක් නෑ" පතිරණ මහතාගේ ස්ථිර පිළිතුර විය.

"මම ඈ ගැන යමක් දැන ගැනීමට සතුටුයි. මානසිකාගාරයේ වැඩිම කාලයක් ගතකොට ඇත්තේ ඈ තමා. ඈ සුව කිරීමට තවම සිතලාවත් නැති පාටයි. ඔබ ඈට නියම කළ බෙහෙත් පිළිවෙළත් අත්හිටුවා තිබෙනවා. ඒ ඇයි ?" බෙරි මහතා පිළිවිසීය.

"මම එකවරක් පමණයි ඇගේ මොළය කම්පනය කළේ. ඒ අවස්ථාවේදී ඇගේ හෘදයේ ස්පන්දනය පවා අත් හිටියා. තව වරක් ඇගේ මොළය වෙහෙස කිරීමෙන් ඇගේ හෘදය සඳහටම නවතින්න පුළුවනි. එම නිසා මම අන් පිළිවෙළක් නියම කළා."

"ගිය සතියේ ඇගේ පියා අවුත් මා හමුවුනා. සුවයක් ලබා ගැනීමට පෙර ගෙදර ගෙනයාමට මම කිසිවිටෙකත් කැමති නෑ කීවාම ඔහු මගෙන් ඇසුවා ඈ සදහටම මෙහි නවතින්ඩ යනවාද කියලා, ඈ සදහටම මෙහි නවතින්ඩ උවමනාවක් නැති බවත් තව දෙමසකින් පමණ ඈට සුවය ලැබේ යයි මා බලාපොරොත්තු වන බවත් මම ඔහුට කීවා" යි බෙරි මහතා කීය.

"ඇගේ දුර්වල නහර ප්‍රබෝධ කිරීමට මම දවසකට දෙවරක් ඈට බෙහෙත් විදිනවා. ඊට වැඩියෙන් ප්‍රතිකාරයක් මා ළඟ නැහැ, මම ඈ ගැන කරුණු රාශියක් දැන ගත්තා. ඒ කරුණු උඩ මම තව තවත් ඈ ගැන පර්යේෂණ පවත්වාගෙන යනවා. ඇගේ මානසික දුර්වල තාවය කෙටි කාලයකින් සුව කළ හැකි නොවේ. එහෙත් එක බාධකයක් පමණක් මා නැතිකර දැම්මා." බෙරි මහතා මහත් උවමනාවෙන් පතිරණ මහතා දෙස බැලීය.

"කුමක්ද ඒ බාධකය?"

UPLOADED BY ELIFE

"ඈට දැන් කථා කරන්නට පුළුවනි."

බෙරි මහතා ඇස් අයා කට දල්වා ගෙන බලා සිටියේය.

"ඔබ ලොකු හපනෙක්! මා සිතුවා ඈ ප්‍රකෘති සිහිය ලැබුවත් කවදාවත් ඈට කථා කිරීමට නම් බැරිවේය කියා."

"මා සිතුවෙත් එසේම තමා! ඈට කථාකිරීමට හැකිවීම මගේ හපන් කමක් නොවෙයි. ඈට කථා කිරීමේ ශක්තිය ඉබේටම ඇති උනා."

"දැන් ඔබ ඇගේ රහස් සියල්ලම දන්නවා ඇති."

"ඔව්, මම මඳක් ඒ ගැන දන්නවා." පතිරණ මහතා තමා දත් තතු කියන්නට විය. "නිර්මලා රංජිත් නැමති එක් තරුණයෙකුට ආලය කරමින් සිටියදී ඇගේ පියා ඊට විරුද්ධ වී ඈ අන් කිසිවෙකුට විවාහ කර දුන්නා. අලුත් ගෙදරදී ඇති වූ මාරක සිද්ධියකින් සර්වාඞ්ගයම කම්පනය වී අතීතය සිහිකර දෙන සියුම් නහර වැල් අඩපණ වී ගියා, ඒ සමඟම ඇගේ කට හඬද නැතිව ගියා."

"අති භයානක සිද්ධිය කුමක්ද?" බෙරි මහතා කලබල විය.

"ඔබ ඒ ගැන දැන ගැනීමට කැමති නම් මම කියන්නම්. ඈ විවාහ වූයේ කලින් එංගලන්තයේදී විවාහ වී සිටි අයකු සමඟයි. ඉංග්‍රීසි ජාතික ඒ බිරිඳ සිය සැමියා සොයා ආවා. නිර්මලාට මෙවැනි තත්ත්වයක් ඇති වූයේ ඒ බව දැනගත් විගසයි."

"ඔබ කියන්නේ සත්‍යයක් ද?"

"ඔව්! මම ඇගේ දෙමව්පියන් ගෙන් මේ බව අසා තවත් තහවුරු කරගත්තා."



"අහෝ! අසරණ දරුවා! කාගේ පවක්ද ඈ ගෙවන්නේ? කොතෙක් කල් ඈට මෙසේ ඉන්ට සිදුවේද?" බෙරි මහතා සුසුම් හෙළීය. පතිරණ මහතා නැවත කථා කොට බෙරි මහතා අස් වැසී ය. මහතාණෙනි! නිර්මලාට සිදුවී ඇත්තේ මහත් අභාග්‍ය කලදශාවකැයි අප කවුරුත් පිළිගන්නවා. එහෙත් අතීතය අමතකවීම ඈට ස්වභාව ධර්මයා විසින් ඈ වෙත පිරිනමන ලද විශේෂ වරප්‍රසාදයක්. ඈට තිබෙන එකම බාධාව අතීතයත් වර්තමානයත් එකට ගලපා බැඳ ඇති සියුම් දුහුල් වලින් ගොතන ලද සිතිවිලි මාලාව කැඩී බිඳී යාම පමණයි. මෙසේ සිදුනොවී නම් කාලයාත් සමඟ ඈ දිරාපත් වී මරණය කරා ළඟා වන්නීය. ශරීරයට ඇතිවන කැලලක ලොකු කුඩාකම අවට සිටින්නන්ට පෙනෙණු ඇත. එහෙත් ජීවිතයට පහර දෙන මෙවැනි කැලැල් කිසිවෙකුට නොපෙනේ. එහි ගාම්භීරත්වය දැනෙන්නේ විඳිය යුත්තාට පමණි. දැන් නිර්මලා කිසිවෙකු කෙරෙහි නො තැබූ විශ්වාසයක් මා තුළ තිබෙනවා. එම විශ්වාසය උඩ මා ඇය සුව කිරීමට බලාපොරොත්තු වෙනවා."

"ඔබ ඇගේ විශ්වාසය දිනාගත්තේ කෙසේද?"

"ඇගේ වික්ෂිප්ත වූ සිතින් මා ඊට අවස්ථාව ලබා ගත්තා. මම දැන් ඈ ඉදිරියේ පෙනී සිටින්නේ, වරක් ඈ ආලය කළ තරුණයාගේ වේශයෙන්."

"අඃ," බෙරි මහතා කම්මුලට අත ගසා ගත්තේය.

"පතිරණ මහතාණෙනි! ඔබ කරන්නේ ඉතා වැරදි ක්‍රියාවක්, ඇයි ඔබ ඈ රවටන්නේ? කලින් එක් අයකු "ඈ- රවටා-"

"මා ඇය රැවටීමේ එකම පරමාර්ථය ඈ සුව කිරීමයි."

UPLOADED BY ELIFE

"මේ අන්දමින් ඔබ ඇ සුවකරන්නේ කෙසේද? එසේ වුවොත් මීටත් වඩා දරුණු තත්ත්වයකට ඇ භාජන වෙනවා නොවේද?"

"නෑ, නෑ, කිසිම අර්බුදයකට ඇ මුහුණ දීමට උවමනාවක් නෑ. මම ඇ වෙනුවෙන් සියල්ල විසඳා ඉවරයි."

"ඔබ රවටා තිබෙනවා නොවේද?"

පතිරණ මහතා අසුන මත කෙළින් වාඩිවී සිගරැට්ටුවක් දල්වා වරක් දෙකක් උරා දුම්යවා අනතුරුව බෙරි මහතා දෙස බැලීය.

"මහතාණෙනි! මෙතෙක් කල් මගේ සිතේ සඟවා තුබූ එකම රහස ඔබ ඉදිරියේ හෙළි කිරීමට කාලය එළඹී ඇත. මා නිර්මලාට සලකන්නේ අනිකුත් රෝගීන්ට සලකන්නාක් මෙන් නොවේ. මා ඇට ආලය කරනවා. ඇගේ සුවිනීත මෘදු භාවයත් අහිංසක ගුණයත් මා සිත තුළ තදින් බලපාන්ට වූවා. ඇ තරම් සුකුමාල කීකරු ලලනාවක් මගේ ජීවිතයේ කිසි දිනක කිසිම රටකදී හමුවූයේ නැහැ. මගේ ආදරයත් කරුණාවත් අනුකම්පාවත් මුසු කොට මෙතෙක් ඇට සහනය ලබා දුන්නා. මතුවටත් එසේම කිරීමටයි මගේ එකම බලාපොරොත්තුව. සුවය ලැබූ මානසික රෝගියකු නැවත ගෙදර බලා යන්නේ දූරිය නොහෙන අර්බුදයකට මුහුණ දීමටය. ඒ කාලයේදී මා ඇය රැකබලා ගැනීමට පොරොන්දු වෙනවා."

"ඔබ ඉතාමත් පුදුමාකාර පුද්ගලයෙක්! ඔබ ඇට ආලය කලත් ඇ ඔබට ආලය කරන්නේ නෑ නොවේද?"

"ඇයි ඔබ එසේ කියන්නේ! ඇ මා බලාපොරොත්තුවෙන් සිටින සැටි! ඉර බැස යන විට මා අසල නැති නම් මලක් පරවී යන්නාක් මෙන් ඇගේ මුහුණ මැලවෙන සැටි! මා දුටු විගස



චන්ද්‍ර කාන්තියෙන් ඔප වැටෙන ජලජ පුෂ්පයක් මෙන් ඇගේ මුහුණ විකසිත වෙන සැටි! මේ සිද්ධීන් ඇ මට ආලය කරන බවට හොඳ සාක්ෂි නොවේද?"

බෙරි මහතාගේ මුහුණ වැසි වලාකුලක් මෙන් අඳුරු විය. "ඔබ මෙසේ ලාමක වූයේ කෙසේද? ඔබට මඳක් කල්පනා කරන්නට බැරි ද? ආලයෙන් ඔද වැඩුනු ඔබට සත්‍යාසත්‍ය අවබෝධ නොවීම පුදුමයක් නොවේ. ඔබත් ඇයත් පා නඟන්නේ මිරිඟුවක් දෙසටයි. ඔව්! ඈත පෙනෙන මිරිඟුවක් දෙසට ඔබ දෙපොල පා තබන්නේය. මෙයින් අත්වන යහපතෙක් නම් නොපෙණේ. වහා ඔය ලාමක අදහස අත් හරින්න."

පතිරණ මහතාගේ මුහුණ සන්තාපයෙන් අඳුරු විය.

"ඇයි ඔබ මෙසේ කියන්නේ" ඔහු විචාළේ ය.

"නිර්මලා ප්‍රකෘති සිහිය ලබත්ම ඔබට තුබූ ආලය සිහිනයක් බඳු වෙනවා, එවිට ඔබ කළ ක්‍රියාවේ වරද පේනවා ඇත."

තරුණ දොස්තර අත් දෙක මත හිස රඳවා බිම බලාගත් වනම සිටියේය. දැන් ඔහුගේ සිත මඳක් චංචලය.

බෙරි මහතා ඔහුට උපදෙස් දෙන්නට විය.

"මහතාණෙනි! මෙවැනි අවස්ථාවකදී කවුරුත් ඉතා සුපරික්ෂාකාරීව වැඩ කළ යුතුයි. මා කිසිවිටකවත් ඔබේ අභිප්‍රායයන් මත අකුල් හෙළීමට අදහස් කරන්නේ නෑ. ඇ සිහි විකලයෙන් සිටිනා තෙක් ඔබ ඇගේ පුරුදු පෙම්වතාය යන හැඟීම් මාත්‍රයෙන් ඔබ කෙරෙහි යම් පැහැදීමක් ඇති කරගන සිටියත් ආපසු කල්පනා කිරීමේ ශක්තිය ලැබූ විගස මෙතෙක් ඇ වටලා තුබූ වැරදි හැඟීම් සියල්ලක්ම තුරන් වී යනු ඇත.

UPLOADED BY ELIFE

ඒ සමගම ඔබද ඇගේ සිතින් ඉවත් වේ. ඔබ මේ ගැන මඳක් වත් සිතුවාද?"

"නෑ! නෑ! එසේ සිදුවන්නේ කෙසේ ද?" කියමින් නිරාපේක්ෂ ලීලාවෙන් පතිරණ මහතා හිස ඔසවා වරක් බෙරි මහතා දෙස බැලීය.

"එය එසේ නොවේවා කියා ඔබ වෙනුවෙන් මා ප්‍රාර්ථනා කරනවා. එහෙත් මතක තබාගන්න මානසික රෝගීන් සම්බන්ධව මට ඇති පළපුරුදු ඔබේ දැන ගැනීමට වඩා විශාලයි."

පතිරණ මහතා අසුනෙන් නැගිට්ටේය. අන් කිසි දිනක නොතිබුණු දුක්මුසු බැල්මක් ඔහුගේ මුහුණෙහි පෙනිණ. තවත් එතැන රැඳී සිටීමේ නිශ්ඵල භාවය මෙනෙහි කරත්ම හෙතෙම වහා ඉවත් වී ගියේය.

"උමතු අදහස්! තරුණ භාවයටම පමණක් සීමා වූ උමතු අදහස්!" පතිරණ මහතා තමා ළඟින් ඉවත්ව යනවා දැක බෙරි මහතා තමාටම කියා ගත්තේය.

* * *

මසක් ඉකුත් වෙත්ම රීටා මදනායකට තරමක් සුවය අත්විණ. ඇගේ දරදඬු සවභාවයද මඳක් නතර විය. ඒ සමගම ඇ අත් විලංගුවෙන් මුදන ලෙස බෙරි මහතා අණ කෙළේය. ඇතැම් විට ඇ සිහි විකලත්වයෙන් කථා කළ නමුදු තවත් සමහර අවස්ථාවෙක ප්‍රකෘති සිහියෙන් කල් ගත කළාය. විලංගුන්ගෙන් මුදනු ලැබූ ඇ මානසිකාගාරයෙහි එහා මෙහා ඇවිදින්නටත් හමුවූ නොයෙක් අය සමග පිළිසඳරෙහි යෙදීමටත් පටන් ගත්තාය. බෙරි මහතා ඇගේ කුළුපග මිත්‍රයා වූ අතර පතිරණ මහතා සිය පස මිතුරා ලෙස ඇ සැලකුවාය.



මනා කඩවසම් රූපකින් හෙබි පතිරණ මහතා දුටු විගස ඈ ඇස් දෙක අයා බලා තදින් දත් සපා කන්ට වූවාය.

"ඇයි ඔබ මා කෙරෙහි පමණක් අමනාපයෙන් සිටින්නේ?" ඇසූ විට රීටා තවත් දත් සපමින් රෞද්‍ර බැල්මක් හෙළුවාය. පළමුකොට ඈ නිර්මලා කෙරෙහි යම් කිසි පැහැදීමක් ඇති කළ නමුදු පසුව ඇගේ සුහද හැඟීම් ක්‍රෝධයෙන් ව්‍යාකූල විය. එපමණක්ද නොව ඈ නිර්මලා සමග ඇති කරගත් අමනාපයට කරුණුද ඇගේ සාත්තු සේවිකාවට කීවාය.

"කවදද අර ඉස්සරහ ඉන්න කොමලිය මෙතනින් යන්නේ?" වරක් රීටා සාත්තු සේවිකාවගෙන් ප්‍රශ්න කළාය.

"අනේ එයාටත් තවම සනීප මදි ගෙදර යන්ඩ, රීටා හාමු වගේ තමයි. සනීප උනාම කවුරුත් මෙහි ඉන්නේ නැහැ. නිර්මලා හාමුත් හරිම හොඳයි. පොඩි ළමයෙක් වාගේ......"

"මම කැමති නැහැ එයා ඉන්න තැනකවත් ඉන්න." රීටා කීවාය.

"ඒ ඇයි." සේවිකාව ප්‍රශ්න කළාය.

"ඈ තමයි මා විවාහවන්නට සිටිය අය සමග හොරෙන් පැනල ගියේ. මට ඈ පෙන්නන්ඩ බෑ."

සිහි විකලවුන් සමග හරි වැරදි තේරුම් කර දීමට නොයා යුතුයයි අණ ලැබී තිබෙන බැවින් සාත්තු කාරිය නිහඬ වූවාය.

මීට දින කීපයකට පසු එක් සන්ධ්‍යාවක රීටා සිය කාමරය ඉදිරිපස සක්මන් කරමින් සිටිනාතර නිර්මලාගේ කාමරයට යෑමට මහත් ආශාවක් ඇතිවිය. අසල සිටි සාත්තුකාරිය මඟහරවා විගස ඈ එහි ගොස් අඩක් විවෘතව තුබූ දෙරින් එබී ඇතුළත

UPLOADED BY ELIFE

බලන්නට වූවාය. පතිරණ මහතා සහ නිර්මලා මියුරු තෙපුල් දෙඩමින් සිටිනවා ඇට පෙනිණ. නිරායාශයෙන්ම රීටාගේ මුවින් මහා හඬක් නිකුත් විය. හදිසියෙන්ම ඒ ඇසුණු වියරු හඬ කිමෙක්දැයි දැනගනු පිණිස වහා පතිරණ මහතා පිටුපස බැලීය. දිලිසෙන නෙත් යුවළ අඟුරුකැට දෙකක් මෙන් කරගත රාක්ෂ බැල්මකින් යුතුව රීටා තව තවත් කෑගසන්ට වූවාය. තරුණ දෙස්තර මහතා වහා නැඟිට ඇ තරයේ අල්වා හෙදියට භාරදුනි. හෙදියද ඇතිතාක් වෙර යොදා ඈ කාමරය වෙත ගෙන ගොස් එහි දමා දොරගුළු දැම්මාය.

තරුණ පතිරණ මහතා අන්දුන් කුන්දුන් විය. හේ නිර්මලාගේ කාමරයෙන් ඉවතට යාමට පෙර එක්තරා අනතුරු හැඟවීමක් කළේය. නිර්මලා සහ රීටා මොහොතක්වත් එක තට්ටුවේ වාසය කරවීම නොකටයුත්තකැයි තරුණ දෙස්තර කීවේය. එහෙත් මානසිකාගාරයෙහි තදබදය නිසාත්, නිර්මලා වෙන කාමරයකට යෑමට ඇති අකමැත්ත නිසාත්, දෙදෙනාටම එක තට්ටුවේ වාසය කිරීමට සිදුවිය. කව්රුත් අසලක නැති විටක රීටාගේ දොර අගුලු දමා වසා තබනු ලැබීය.

මෙසේ තවත් දින කීපයක් ඉකුත්විය. මානසිකාගාරයෙහි සිටි ලෙඩුන් කීප දෙනෙකුම නිත්‍ය සුවය ලැබී ආපසු සිය ගෙවල්කරා ගියෙන් තවත් සිහි විකලවූවන් කීපදෙනෙක්ම මෙහි අවුත් ලැගුම් ගත්හ. නිර්මලාට තවම සම්පූර්ණ සුවයක් අත් වී නැත. තව දෙමසකින් මානසිකාගාරයෙන් අස් කරන බැව් ඇගේ මව් පියන් විසින් දැනුම් දෙන ලද නමුත් නිර්මලා ගෙදරයාම තබා කාමරය මාරු කිරීමටවත් කැමති නැත.

"ඔබ ගෙදර යාමට කැමතිද"යි වරක් බෙරි මහතා ඇගෙන් ප්‍රශ්න කෙළේය.

"මේ මාගේ ගෙදර, මේ ගෙදර මට හොඳයි" යනු ඇගේ පිළිතුර විය. මෙසේ මව් පියන් ඈ ගෙදර එක්ක යෑමට ආ විට ද



නිර්මලා හඬන්ට වූවාය. "සිය දියණිය ඉතා ප්‍රීතියෙන් මෙහි කල් ගත කරන බැවින් ඈ ගෙදර ගෙන යාමේ තේරුමක් නැතැ"යි බෙරි මහතා කියා සිටියෙන් අතපත්තු මහතා දෙස්තරගේ වචනයට හිස නමා තව මසක් මෙහි නතර කිරීමට එකඟ වූයේය.

රීටා මදනායකගේ ප්‍රචණ්ඩ ගති බෙහෙත් විදීමෙන් සුව කළ නොහැකියයිද ඇට සම්පූර්ණ සුවය ලැබීමට නම් ඈ ශක්තිමත් පුද්ගලයෙකුට විවාහ කර දිය යුතු යයිද තරුණ දෙස්තර කියා සිටි මුත් කීප දිනක් ඈ මෙහිම රඳවා ගන්නා ලෙස ඇගේ මව්පියන් ඉල්ලා සිටියෙන් බෙරි මහතා ඊට එකඟ විය.

ප්‍රීතියෙන් ඔද වැඩුණු නිර්මලාගේ මුහුණ පුන්සඳක් මෙන් ප්‍රභාමත්ය. ඇගේ නෙත් යුවළ ඉඳුනිල්මිණි දෙකක් සේ බබලයි. ඇගේ සිනාවට වශී නොවූ අයෙකු මුළු මානසිකාගාරයෙහිම නොවීය. නිර්මලා ගැන නොයෙකුත් බලාපොරොත්තු ඇති කරගත සිටින තරුණ පතිරණ මහතා ද උදේ සවස ඈ සමඟ ප්‍රීති අල්ලාප සල්ලාපයෙහි යෙදෙමින් මහත් රසාස්වාදයක් ලබා ගත්තේය. ඇට සම්පූර්ණ සුවය ලැබෙන තෙක් ඔහුට ඉස්පාසුවක් නම් නැත.

එය එසේමැයි- තරුණ මදය සමඟ මිශ්‍ර වූ ආලයතෙම කොපමණ ශාස්ත්‍ර විශාරදයෙකු වුවද මානසික විශේෂඥයෙකු වුවද, මොහොතකින් වශී කරයි.

"නිර්මලාට ප්‍රකෘති සිහි ලැබුණ විට මා එපා වේද? යන පැණය මතු කරමින් ඔහු සිය චිත්තය සමඟ තර්කකළ අවසථාවන්ගෙන් අඩුවක් නැත. අන්තිමේදී තමාටම වාසි වන පරිදි තර්කය දිනා තමාම සැනසුණේය. නිර්මලා නොදක එක් දිනක්වත් ගත කළ නොහැකි තත්ත්වයක් දැන් ඔහුට ඇතිව තිබේ. නිර්මලාද උදේ සවස ඔහු එනතෙක් නොඉවසිල්ලෙන්

UPLOADED BY ELIFE

බලා සිටින්නීය. මඳක් ප්‍රමාද වුවද ඈ අධික සිත් තැවුලින් පීඩා විඳින්නීය. සැබෑ ආලයට මෙතරම් සාක්ෂියක් තවත් ඇත්ද?

තරුණ ස්ත්‍රියක් පුරුෂයෙකුට ආලය කිරීම සවභාව ධර්මයකි. ප්‍රකෘති සිහිය ලැබූ විගස සොබා දහමට පටහැනිව ක්‍රියා කිරීමට ඇට කිසිඳු උවමනාවෙක් නැත. තවද තෙමේ මෙය මෙතෙක් කල් මහත් උනන්දුවකින් හා විශේෂ ලැදියාවකින් ඈ සුව කිරීමට තැත්කළා යන හැඟීම් ඈ තුළ ඇතිවූ විගස කෙලෙහි ගුණ සැලකීමක් වශයෙන් තමාගේ අදහස මුඳුන්පත් කරනු ඇත. මෙවැනි දහසක් සිතුවිලි මාලාවන්ගෙන් තමාගේ සිත ප්‍රබෝධමත් කර ගනිමින් සරත් පතිරණ සිය ප්‍රියාව සමඟ අතිශයින් ප්‍රීතිවූයේය.

එදින සූර්යයා අස්ත ගතවන්ට පැය දෙකක් පමණ තිබියදී පතිරණ මහතා නිර්මලා හමුවීමට ආයේය. නිර්මලා මවිතයෙන් ඔහු දෙස බලන්ට වූවාය.

කාරණය අවබෝධ කොටගත් පතිරණ දොස්තර මහතා තමා කල් ඇතුව ආ කාරිය හැකි පමණ ලෙහෙසියෙන් පහදා දෙන්ට විය.

"නිර්මලා අද සවස හිරු බැසයන වේලෙහි එනම් හයට පමණ" (ඔහු මෙසේ කියා අසල මේසය මත තුබූ ඔර්ලෝසුවෙහි හය පෙන්වීය.) "මෙහි ලොකු උත්සවයක් තිබෙනවා. ඔව්, විශාල සෙනඟක් මෙහි රැස්වෙනවා. එහි උඩරට හා පහතරට නැටුම් පෙන්වනවා. ඔබත් එය නැරඹීමට කැමති නම් මා ඔබට විශේෂ අසුනක් පිළියෙළ කොට දෙන්නම්."

නිර්මලා ඒ ආරාධනය ප්‍රතික්ෂේප කරන්නාක් මෙන් හිස සලන්නට වූවාය. ඒ අතරම ඇගේ මුහුණ දුර්වර්ණ විය. නිරායාසයෙන්ම ඇගේ මුවින් දිගු සුසුමක් පිටවුණි.



"මම රෑ අටට පමණ මෙහි එන්නම්" මෙසේ කියා ඔර්ලෝසුවේ කටු කරකවා වේලාව අට දැක්වීය.

නොදැනුවත්වම ඇගේ ඇස් වලින් කඳුළු කැට වැටෙන්නට විය. ඈ ඔර්ලෝසුව අතට ගෙන නැවත වරක් වේලාව හය දක්වන සේ කටු ආපසු කැරකෙව්වේය.

දෙස්තර මහතා ඔර්ලෝසුව ඇගේ අතින් ගෙන නියම වේලාව දක්වා එය නැවතත් මේසය මත තබා ඇගේ අත් දෙක තරයේ අල්වා එක් කෙළේය.

"ඔබ අද එන්නේ නෑ. හිරු බැස යන වෙලාවට." නිර්මලා සුසුම් ලන්නට වූවාය.

"නිර්මලා," දෙස්තරගේ කටහඬ මහත් අනුකම්පාවෙන් බරවිය. අද මෙහි විශේෂ අමුත්තෙකු පැමිණෙනවා. ඔහු පිළිගැනීමට තිබෙන නිසා මට වෙනදා එන වෙලාවට මෙහි පැමිණෙන්ට ඉඩක් නෑ. මට සමාවන්න."

"ඔබට එන්ට බැහැ? ඉතින් ඔබ එන්නේ නැහැ." මෙසේ කියමින් නිර්මලා තවත් කඳුළු සලන්නට වූවාය.

"නිර්මලා, ඇයි ඔබ මා අවිශ්වාස කරන්නේ? මම එනවා ඔබ රාත්‍රියේ කෑම ගන්න වේලාවට" මෙසේ කියත්ම තරුණ දොස්තරගේ මුහුණෙහි මහත් චංචල සවභාවයක් ඇතිවිය.

"නෑ ඉඳින් ඔබ එන්නේ නෑ. මා බැලීමට, වැසි වැහැලා ගඟ පිරිලා ඔබේ ඔරුව පෙරළිලා ගියා."

"ඔබ මේ කුමක්ද කියන්නේ?" දොස්තර තුෂ්ණිම්භූතවී ඈ දෙසම බලා සිටියේය.

"ඊයේ රෑ මම දුටුවා."

UPLOADED BY ELIFE

"නිර්මලා ඔබ සිහිනයක් දැක තිබෙනවා. අහෝ මට මේ සියල්ලක්ම අවබෝධ කරදීමට හැකිනම්!" මෙසේ කියා හේ තදින් හුස්මක් පිට කෙළේය.

නිර්මලා නොනැවතීම කොඳුරන්නට වූවාය. "ඔව් ඔබේ ඔරුව පෙරළිලා ඔබ නැතුව ගියා. ඔව්, ඔබ නැතුව ගියා මා බලා සිටියදීම."

නිර්මලා මෙසේ කියත්ම නොකැඩී යන කඳුළු ධාරාවන් ගෙන් ඇගේ මුහුණ තෙත්විය.

අසරණ දොස්තරගේ සිත සොවින් ආකුලවී ඔහුට කිසිවක් කියාගත නොහැකි විය. නිර්මලාගේ සිත්හි පවතින බියාදු ගතිය සමනය කිරීමට එක් බෙහෙතක් ඇගේ නහරගත කිරීමට නියම කොට හේ එතැනින් ඉවත්ව ගියේය.

ලන්ඩන් නුවර වෛද්‍ය විශ්ව විද්‍යාලයෙහි මානසික රෝග විශේෂඥයෙකු වූ වෙල්ෂ් මහතා පිළිගැනීමේ උත්සවය එදින සවස හයට නියමිතව තිබිණ. පතිරණ මහතා එතුමාගේ ගෝලයෙකු විය. ගුරුගෝල හමුවෙන් නොයෙක් දේ ගැන සාකච්ඡා කිරීමට පතිරණ මහතා බලාපොරොත්තු විය. පසුදින උදයේ නිර්මලාද ඒ විශේෂඥයාට පෙන්වීමට පිළියෙළ කොට තිබුණේය.

සවස හයට වෙල්ෂ් මහතා පිළිගැනීමේ උත්සවය ඇරඹින. අමුත්තාට නැරඹීම සඳහා දක්ෂ නාට්‍ය කරුවන් ලවා උඩරට පහත රට නැටුම් කීපයක්ම පිළියෙළ කර තුබුණි. මානසික දුර්වලත්වයෙන් පෙලෙන කීපදෙනකුටම නැටුම් ගැයුම් බැලීමට විශේෂ ආසන පනවා තුබුණි. නිර්මලා, රීටා, ඇතුළු තව කීපදෙනෙක් පමණක් තම තමන්ගේ කාමරවලම නැවතී සිටියහ. නැටුම් ඇරඹූ වහාම මානසිකාගාරයෙහි සිටි සේවක සේවිකාවෝ සිය කටයුතු මඳකට නවත්වා රඟ මඬලට රැස්වන්නට වූහ.



රීටාගේ සේවිකාව ඇය කාමරයෙහි සිරකොට තමාද නැටුම් නැරඹීම සඳහා මඳක් ඈතට ගියාය. පහළ සිදුවන්නේ කුමක්ද වත් නොදත් නිර්මලා හිරු බැස යන තුරු කවුළුවෙන් බලා සිට නැවත ඇඳ මත දිගා වූවාය. සවල්ප වේලාවකට පෙර නහර ගතකළ බෙහෙත අනුව ඇට නිදිබර ගතියක් ඇති විය. මෙය දුටු ඇගේ සේවිකාව ද දොර මඳක් වසා සන්දර්ශනය නැරඹීම සඳහා පහළට ගියාය.

පහත භේරි තූර්ය වාදනයන්ගේ ශබ්ද ඇසෙත්ම රීටා කලබලවී දොර හරින්ට තැත් කළාය. දොර අගුල්ලා තුබූ බව දනගත් විගස ඈ සීනුව ශබ්ද කරන්ට වූවාය. සීනු හඬ ඇසූ හෙදිය රීටා බව දන වහා ඈ සිටි කාමරයට ගොස් එබී බැලුවාය. රීටා ගොරවමින් නිදා සිටියි. යම්කිසි වැරදීමක් යයි සිතූ හෙදිය නැවත දොර වසා අගුල් දමා ආපසු ගියාය. දෙවන වරටද සීනුව නාදවිය. එවරද හෙදිය දුව ගොස් රීටා නිදිබව දැක දොර අගුල් දමා ඉවත්ව ගියාය. තුන්වෙනුවද සීනුව නාදවිය. මහත් කෝපයෙන් කාමරයට දුව ආ හෙදිය රීටාට බැණ වදින්ට වූවාය. රීටාද මළාක් මෙන් ඇඳ මත සිටියාය. ඒ වර හෙදිය දොරගුළු නොදමා ඉවතට ගියාය. හෙදියට උවමනා වූයේ හීන් සීරුවේ අවුත් සීනුව ශබ්දකරන්නා අල්ලා ගැනීමටය. එහෙත් පහළ වේදිකාවේ පෙන්වන විකට ජවනිකාවක් මධ්‍යයේ ඈ විසින් කළ යුතු දෑ අමතක විය.

මඳ වේලාවක් නිදි මෙන් සිටි රීටා සිව්වන වරටත් නැගිට සීනුව අසලට ගියාය. ඒ අතරම අඩවල් කොට තුබූ දොර ඇගේ ඇසට ලක්විය. දොර දෙස බලත්ම අධික කෝප සහගත සිනාවක් ඇගේ මුවින් පිට වුනි. මාරක චේතනාවෙන් ඇගේ සිතද පිරී ගියේය. ස්වල්ප වේලාවක් දොර අසලට වී නිහඬව සිටි රීටා අසල කිසිවෙකු නුදුටුයේ වහා දොරින් පිටතට පා තැබුවාය. අවට කිසිවෙකු පෙනෙන්නට නැත, අඩි විසිපහක් පමණ ඈත තිබෙන කාමරයේ විදුලි එළිය දැල්වමින් තිබුණි.

UPLOADED BY ELIFE

විවෘතව තිබූ දොරින් එළිය පිටතට වැටී ඇත. එය නිර්මලා සිටි කාමරය බව රීටා දන්නීය. අඩක් හැර තිබූ දොර දෙස බලත්ම මහත් පළිගැනීමේ චේතනාවක් ඈට පහළ විය. මොහොතක්වත් ප්‍රමාද නොවී රීටා නිර්මලා සිටි කාමරයට පිවිසියාය. නිඳිමතින් ඇස් පියාගෙන සිටියද තමා අසලට කව්රු නමුත් ආ බැව් දැනගත් නිර්මලා ඇස් ඇර බලා මඳ බියකින් අසල හුන් හෙදියට කථා කළාය. කිසිවකු අසල නොවීය. ඒ බව දත් ඈ සයනයෙන් නැගිටින්ට වෑයම් කළද එයත් නිශ්ඵල විය.

සිය ගොදුර මත පතිතවූ ව්‍යාඝ්‍ර ධේනුවකගේ විලාශයෙන් රීටා නිර්මලාගේ ඇඟට කඩාපැන ඈ තරයේ අල්ලා ගත්තාය. ඒ සමඟම රුදුරු සිනාවක් ඇගෙන් පිටවිය.

"ඔබ මෙතෙක් කල් මගෙන් බේරිලා සිටියා. අද ඔබෙන් පළිගන්නවා" මෙය ඇසෙත්ම නිර්මලා මුළු වෙරම යොදා කෑගසන්නට වූවාය. එහෙත් පහළ බෙර හඬින් ඇගේ කෑ ගැසීම යටත් විය.

තනිව සටන් කළ යුතු බැව් දත් දුර්වල නිර්මලාට ඒ මොහොතෙහි අන් කිසිම අවස්ථාවකදීවත් ඇති නොවූ ප්‍රබල ශක්තියක් ඇති විය. රීටා ඇගේ බොටුවෙන් අල්ලන්ට තැත් කරත්ම නිර්මලා සියලු ශක්තිය යොදා ඇගේ ග්‍රහණයෙන් බේරෙන්ට තැත් කළාය. එහෙත් රීටා දූන් යක්ෂයෙකු ආරූඪවූවකු සේ හැසිරෙන්නීය.

"රංජිත්! රංජිත්!" නිර්මලා මරහඬ දෙන්නට වූවාය. රීටා රකුසියකුගේ ලීලාවෙන් අනාථයා බිමට ඇද ගත්තීය. මේසය මත ටික් ටික් ගාමින් කුඩා ඔරලෝසුව හඬදෙන්නට විය. එය අතට ගත් සාහසික ස්ත්‍රිය කිසිවෙකුගේ පිහිටක් නොලත් නිර්මලාට පහර දෙන්නට වූවාය.



නිර්මලා ප්‍රාණ භයින් වරක් හඬනගා එතැනම මූර්ඡා වී වැටුණි. වාසනාවකට මෙන් ඒ මොහොතේ බෙර හඬ නැවතී තිබිණ. කාගේදෝ මර ලතෝනියක් කන වැටුණු එක් හෙදියක් වහා රීටා සිටි කාමරය අසලට ගොස් ඈ එහි නොදක අසල තාප්පය ළඟ සිටි සේවක සේවිකාවන්ට කෑ ගැසුවාය. ඔව්හුද කලබලවී රීටා සෙවීමෙහි යෙදුනෝය. නිර්මලාගේ කාමරයට දුව ආ හෙදිය එහි වූ බිහිසුණු දර්ශනය දැක වහා අනතුරු අඟවන සීනුව ශබ්ද කළාය.

නිර්මලා මළාක් මෙන් බිම වැතිර සිටියාය. ජයග්‍රාහකයෙකුගේ ලීලාව රීටාගේ මුහුණෙහි පිළිබිඹු විය. සුණු විසුණු වී ගිය ඔරලෝසුවේ කැබලි කාමරය පුරා වැතිර තිබුණි. ලණුවකින් බඳිනු ලැබූ රීටා සේවිකාවන් විසින් ඇගේ කාමරයට ගෙනගොස් දොර වසා අගුල්ලන ලදී.

වේලාව රාත්‍රී අටය. උත්සවයද හමාරය. කලබලය කන වැටුණු පතිරණ දොස්තර මහතා වහා නිර්මලාගේ කාමරයට දුව ගොස් ඈ ඔසවා යහන මත තබා ඇගේ නාඩි පිරික්සන්නට විය. ඈ මරණාසන්නව වැටී සිටින බව දොස්තරට තේරුම් ගියේ එවිටය. වියරු වූවකු සේ හෙතෙම සී සී කඩ විසිවී තුබූ ඔරලෝසු කැබලි දෙස බලන්නට වූයේය.

පතිරණ මහතාට කථා කරන්ට හැකිවූයේ මඳ වේලාවකට පසුවය. "තුඹලාට මම දිනපතා කීවේ මේ ගැනමයි, මම දිනක් රීටා මදනායක ගැන කරුණු සියල්ල පහදා දුන්නා, ඊයේ සවසත් මම බෙරි මහතාට කියා සිටියේ මේ දෙදෙනා එක ළඟ ඉන්ට ඉඩ දෙන්න එපා කියා. එන සතියේ ඈ ගෙදර යවන බව කියා මේ දවස් කීපයටත් ඔහේ ඉන්ඩ දෙන්නය කියා, මට කීවා. අහෝ! මා මෙතෙක් කල් ඈ වෙනුවෙන් කළ සියල්ලක්ම වතුරට ගසා ගියා!" මෙසේ කියමින් කුඩා ළමයෙකු මෙන් දොස්තර මහතා හඬන්ට වූයේය.

UPLOADED BY ELIFE

ඇගේ හිසට වැදී ඇති පහරවලින් ලේ බිංදු ගලන්නට වන. ඒ බලා සිටි පතිරණ මහතාගේ ඇස් වලින් කඳුළු කැට සැලෙන්නට විය. තමාගේ දුර්වල කම සැඟවීමට තැත්කරමින්ම හේ, අසල සිටි හෙදියට අම්ලකර වායුව ඇගේ නාසයට ඇල්ලීමට අණ කෙළේය. ප්‍රාණ වායුව ඇගේ නාසයට අල්ලද්දීම ඇගේ කේස කලාපය කෙටිකර කපා වහා ඈ දැඩි පරීක්ෂණයට පිළියෙළ කරන ලෙස තවත් හෙදියකට කීයේය. පසු හේ ශල්‍යකර්මයෙහි විශේෂඥයෙකු සොයා පිටත් විය.

රාත්‍රියේ දොළහ වැදෙන්නට පෙර විශේෂඥයින් කීප දෙනෙක්ම නිර්මලා පරීක්ෂා කළහ. ඇට ශල්‍යකර්මයක් නුවමනා බව ඔවුන්ගේ අදහස විය. ලේ ධාවනය වන්නේ බාහිර තුවාල වලින් යයිද, තද පහර වැදී ඇගේ මොලය කම්පනය වීමෙන් ඈ මුසපත්වී ඇතැයිද ශල්‍යකර්මයක් කළත් නොකළත් ඈට තව ජීවත් විය හැක්කේ පැය විසිහතරක් පමණ යයිද දොස්තර විශේෂඥයින්ගේ සාමූහික හැඟීම විය. රෝගියාට කළ යුතු සියල්ලක්ම දැනටම පතිරණ දොස්තර මහතා අතින් කර තිබේයයිද ඔව්හු කියා සිටියහ.

මේ හදිසි අවසථාවෙන් මුළු මානසිකාගාරයම කම්පනය විය. කිසි කලෙකවත් නොවූ විරූ නිශ්ශබ්දතාවයක් අවට පැතිර ගියේය. මුව තරයේ වසාගත් සේවිකාවෝ සංඥාමාත්‍රයෙන් එකිනෙකාට කථා කරමින් එහා මෙහා සක්මන් කළහ. නිර්මලා අසලට කිසිවෙකුටවත් නොයෑමට දොස්තර අණ දී තිබුණි.

අසරණ නිර්මලාගේ මේ ලොවින් තුරන්වූවකු මෙන් සයන මත වැදහොත්තීය. අසල වාඩි වී සිටි හෙදිය ඉතා පරීක්ෂාවෙන් ඇගේ හුස්ම ඉහළ පහළ යනවා බලා සිටියාය. ප්‍රාණ වායුවේ ආධාරයෙන් ඇගේ හෘදය යම්තම් ස්පන්දනය විය.

මෙසේ පැය දොළහක් ගතවී ගියේය. නිර්මලාගේ තත්-ත්වයෙහි කිසිදු වෙනසක් නොවීය. සීනිමුසු දියරක් නොකඩවා



ඇගේ නහර ගත කෙළෙන් ලේ ගමන් කිරීමෙහි බාධාව මඟ හැරෙන්නට විය. එහෙත් ඈ දැනටමත් ජීවතුන් අතරින් තුරන් වූවකු බව ඈ දෙස බලන්නෙකුට පෙනී යන කරුණකි.

පසුදා පාන්දර ශල්‍යකර්ම විශේෂඥයින්ගේ රපෝර්තුව ළඟ ඇතුව බෙරි මහතා සහ පතිරණ මහතා දීර්ඝ සාකච්ඡාවක යෙදෙන්ට වූහ.

"නිර්මලාගේ තත්වය කියන්න තරම් අසාධ්‍ය නම් පැය දොළහක් ඉක්ම ගිය පසුත් තත්වය පෙරසේම වන්නේ කෙසේද?" බෙරි මහතා ප්‍රශ්න කෙළේය.

"ශරීර ගත කරන දියත් අම්ලකර ප්‍රාණ වායුවත් ඇගේ ප්‍රාණය අල්ලා සිටීමට හේතු වී තිබේ. එහෙත් ආපසු ඈ ඇස් නොහරී යන්න මගේ අදහසයි." පතිරණ මහතා පහත් ස්වරයෙන් කීවේය.

බෙරී මහතා තව තවත් ශල්‍යකර්ම විශේෂඥයාගේ රපෝර්තුව කියවීය. "රෝගියා මරණයෙන් ගැලවුනත් මුළු ජීවිතයටම ඇගේ මොලයෙන් ප්‍රයෝජන ගත නොහැකියයි සඳහන් කොට තිබෙනවා. ඔබ ඒ ගැන කුමක් සිතන්නේද?"

"මට ඒ ගැන කිසිවක් කියන්ට බැහැ. ඈ ජීවත්වේය කියා මගේ කිසිදු බලාපොරොත්තුවක් නැහැ." වේදනාත්මක කට හඬින් පතිරණ මහතා උත්තර දුන්නේය.

බෙරි මහතා තරුණ දොස්තරගේ සිත දිරිමත් කිරීමට තැත් කළේය. "ඔබ ඔය තරම් බියගුල්ලකු යයි මා සිහිනයකින්වත් සිතුවේ නෑ. මෙවැනි අවස්ථාවකදී අපි මහත් ධෛර්‍ය සම්පන්නව ක්‍රියා කළ යුතුයි. මගේ සිතනම් මහත් බලා-පොරොත්තු රාශියකින් දැනටමත් ප්‍රබෝධය ලබා ඇත. නිර්මලා දැන් තනිව ජීවිතයත් මරණයත් අතර මහා සටනක යෙදී සිටිනවා.

UPLOADED BY ELIFE

මරණයට යටත් වීමට නම් ඈ මෙතෙක් වේලා සටනෙහි යෙදෙන්නේ නෑ. මගේ එකම අදහස මරණය ඈ යටත් නොකරයි කියා. මේ රපෝර්තුව ලියා ඇති විශේෂඥයා ඈ කෙබඳු තත්වයක සිටියාද කියා නොදනී. ඔහු කියන්නේ ඈ මුළු ජීවිතයටම සිහිවිකලියක් වනු ඇතැයි කියායි. ඒ අනුව ඇගේ මෙතෙක් කල් නැතිව තිබූ සිහි බුද්ධිය ආපසු එතැයි කියා අපට සිතන්ට බැරිද?"

"ඔබ කුමක් කියන්නෙහිද?" පතිරණ මහතා ප්‍රශ්න කෙළේය. "ඈ කෙසේ සිහි බුද්ධිය ආපසු ලබා ගන්ටද?"

"පතිරණ මහතාණෙනි! මේ රටේ සිදුවනුයේ බලාපොරොත්තු රහිත දේමයි. හදිසි කම්පනයකින් ඇගේ මොලයේ සියුම් නහර දුර්වල වී ඇත කියා වරක් ඔබ කීවා නොවේද? එමෙන්ම කම්පනයකින් ඇති වූ බාධකයත් දුරුවිය හැක්කේ තවත් කම්පනයකින් යන්න ඔබේ අදහස නොවේද?" බෙරි මහතා මෙසේ කරුණු පහදන්නට විය.

මඳවේලාවක් කල්පනා කරමින් සිට පතිරණ මහතා නැවතත් මෙසේ කීයේය. "ඔව් මා එසේ කීවා, ඒ මගේ විශ්වාසයයි. එහෙත් එක් අවස්ථාවකදී ඇගේ මානසික ක්‍රියාකාරීත්වයට අයත් සියුම් නහර දුර්වලව කල්පනා ශක්තිය හීනවී තිබෙනවා. එහෙත් දැන් ඈට අත්වූයේ බාහිර කම්පනයක්. එනම් ඇගේ මොලයට තද පහරක් වැදී එයින් ඇති වූ ප්‍රතිඵලයයි."

බෙරි මහතා අසුනින් නැඟිට පතිරණ මහතා දෙස බලා හිස සැලීය. "වැඩිකල් නොගොසින්ම ඔබට මා කී දේ වැටහෙනු ඇතැ"යි ඔහුගේ මුවින් පිටවූ විගස හෙදියක් අවුත් නිර්මලා ඇස් ඇර වටපිට බලා නැවත ඇස්පියා ගත් බව දන්වූවාය.

දෙදෙනම කතාව අත්සිටුවා වහා නිර්මලා අසලට ගියහ.



ඝණවලාවකින් ආවරණය වී නොපෙණී ගිය චන්ද්‍ර බිම්බයක් වලාකුල තුනී වීමෙන් නැවත එම දර්ශනය ඇති වන්නාක් මෙන් නිර්මලාගේ කල්පනා ශක්තිය නැමති ආලෝක දහර ක්‍රියාකර වීමට බාධක වූ සිහි විකලත්වයේ ඝනවලාපටලය ඉවත්වී ඈට අතීතය තත්වාකාරයෙන් අවබෝධ වන්නට විය. දැන් නිර්මලා මෙතෙක් දිගු කාලයක් මානසිකාගාරයෙහි අනාථව විසූ නිර්මලා නම් නොවේ. ඈ දැන් අමුතුය. ඇස් පියාගෙනම ඕ තොමෝ පසුගිය කාලය නමැති මාර්ගය ඔස්සේ මනැසින් ගමන් කරන්නට වූවාය. ඒ සමඟම මෙතෙක් කල් කැඩී බිඳී ගිය සියුම් සිතුවිලිදාමයන් නිරායාසයෙන්ම එක්වී එකිනෙක පිළිවෙළට ගැලපෙන්නට වී. ඈ විවාපත් සිය සැමියා දැන් කොහේ සිටීදැයි ඇගේ සිත්හි බලපාන්නට විය. කොබ්බෑකඩුව මහතාගේ භාර්‍යාව තමායයි නිත්‍ය වශයෙන් කියා සිටි සුදු කාන්තාව ඇගේ සිතට නැඟෙත්ම නිර්මලා වේදනාවෙන් කොඳුරන්ට වූවාය.

"නිර්මලා!" පතිරණ මහතා ඈට ළංව කථා කරන්ට විය. "ඇයි ඔබ කෙඳිරි ගාන්නේ? ඔබට දැන් තිබෙන අමාරුව කියන්ට බැරිද?" හේ විචාළේය.

නිර්මලාද ඇස් ඇරපියා සෑහෙන වේලාවක් දොස්තර දෙසම බලා සිටියාය. අන්තිමේදී ඉතා පහත් හඬින් කථා කළාය. "මම මේ කොහෙද සිටින්නේ?"

දැන් ඇගේ බැල්ම අමුතුය. ක්ෂණයකින් පතිරණ මහතාට, එය වැටහිණ.

"නිර්මලා ඔබ සිටින්නේ ආරෝග්‍යශාලාවක. ඔබ දැන් අසනීපයෙන්."

මෙසේ කියත්ම දිග සුසුමක් හෙලා නැවත වරක් ඕ තොම ඇස් පියා ගත්තාය.

UPLOADED BY ELIFE

මේ මොහොතෙහි පතිරණ මහතාගේ චිත්ත සන්තානයෙහි ඇතිවූයේ මැඩලිය නොහෙන භීතියකි. ඇගේ නෙත් යුවළින් පෙන්වූ අමුතු විලාශය කිසිවිටෙකත් හේ බලාපොරොත්තු නොවීය. ඒ අතරම ඔහුට බෙරි දොස්තර මහතාගේ වචන මාලාව සිහියට නැඟෙන්නට වන.

සැම වෙරක් මම යොදා සිත දිරිමත් කොටගෙන පතිරණ මහතා ඇස් පියාගෙන සිටි නිර්මලා සමඟ කථා කරන්ට තැත් කෙළේය.

"නිර්මලා! ඇයි ඔබ ඇස් අරින්නෙ නැත්තේ? මම රංජිත්. ඔබට මා හඳුනන්ට බැරිද?"

නිර්මලාගේ නෙත් යුවළ තව වරක් ඇරින. ඉතා ඕනෑ කමින් ඈ පතිරණ මහතා දෙස මඳවේලාවක් බලා සිට සෙමින් කථා කළාය. "ඔබ රංජිත් නොවෙයි. අන් කෙනෙක්." මෙසේ කියා ඈ පතිරණ මහතා මෙතෙක් වේලා අල්වාගන සිටි අත මුදා ගැනීමට මෙන් තැත් කළාය. මැලවී ගිය ලාරිකිල්ලක් මෙන් තුබූ ඇගේ සුකුමාල හස්තය දොස්තර මහතා සෙමින් සයනය මත තැබීය. දැන් ඔහුට සියල්ල අවබෝධය. නිර්මලා ද සියල්ල තත්වාකාරයෙන් දන්නීය. ඈ රැවටීමට මේ මනුලොව කිසිවකුටත් බැරිය. ඈ නැවත වරක් ජීවතුන් අතරට පා තැබුයේ තමාට අමතක වී තිබූ සියල්ල මතු කරමින් ප්‍රකෘති සිහිය ලබාගෙනය.

පතිරණ මහතා ගේ සිත ගිනි වත් යවටක් මෙන් වේදනා දනෙන්නට විය. තවත් මෙහි සිටීමේ නිශ්ඵලතාවය දුටු හෙතෙම වහා කාමරයෙන් ඉවත්ව ගියේය.

මෙසේ සතියක් ඉකුත් විය. මඳ සුවය ලබා සිටි නිර්මලා සයනෙහි කොට්ට කීපයක් මත දිගා වී හෙදියගෙන් නොයෙකුත් ප්‍රශ්න අසන්නට වූවාය.



"මම මෙහි අවුත් කොපමණ කල්ද?"

"දැනට දහඅට මාසයක් ඉවරවෙලා." හෙදිය උත්තර දුනි." ඇයි ඔබට මතක නැතිද?"

"අනේ මට නම් හරියාකාර කිසිදෙයක් මතක නෑ. මෙය ලොකු සිහිනයක් වගෙයි මට පෙනෙන්නේ,"

"ඔබ මෙතෙක් කල් දුටුවේ සිහිනයක් තමයි, දැන් නම් ඔබේ ඇස් හොඳට ඇරිලා." හෙදිය සිනාසෙන්ට වූවාය.

"ඇයි මගේ කොණ්ඩය කපා දැම්මේ?"

හෙදිය සුසුම් ලෑවාය. 'ඔබේ කොණ්ඩය කපා දැම්මේ ආශාවකට නොවෙයි. දොස්තරගේ අණට කීකරුව, එය කපා දැමීමට සිදු වුණා.

ඒ වචනයෙන් ම නිර්මලා සතුටු වූවාය.

හෙදියද මෙතෙක් දින සැකසුරුවම් සහිතව සඟවා තිබූ කෙස් කලඹ ගෙනවුත් නිර්මලාට පෙන්වා මෙසේ කීවාය.

"ඔබ මෙතන සිටින්නේ තව සවල්ප දිනක් පමණය. එබැවින් ඔබව සිහිවීමට මේ දිගු වරලස මට දෙනවාද?"

"ඔබ මට මෙතෙක් කළ සාත්තු මා කෙසේවත් අමතක කරන්නේ නෑ. ඔබ මෙය තබාගන්න." තමා හිසින් වෙන්වූ දිගු කෙස්කලඹ බලමින් නිර්මලා සුසුම් ලෑවාය.

ප්‍රකෘති සිහිය ලැබූ නිර්මලා සිය මව්පියන් දකීමට ආශාවක් පළ කළාය. ඇගේ ඉල්ලීම පරිදි දිනපතා ඔව්හු ඈ බැලීමට පැමිණියෝය. ඈ දිග කලක් අසනීපයෙන් සිටිය බවෙක් කොයි ආකාරයකින් වත් කිව නො හැක. යම් කිසි අඩු පාඩුවක් ඇත්නම්

UPLOADED BY ELIFE

කෙටිකර කපා දමා ඇති වරලස පමණය. ලා රත් පැහැයෙන් පිරුණු දෙකම්මුල් අලුත පිපුණු රෝස මලක හැඩය ඇතිවිය. සුනිල්වන් රෝම රාජින්ගෙන් පිරි දෙබැම නියඹත් දෙකක් බඳුය. මෘගදේනුවක ගේ මෙන් දිගුවන් නෙත් සඟල ඉඳුනිල් මිණි දෙකක් සේ පැහැපත්ය. රතුවන් දෙතොල නාදළු මෙන් විය. උස් මිටි නොව පෙළට වැඩුන දසන් පංක්තිය සක් කැබලි පෙළක් මෙන් සුභවර්ණය. මෙම දන්ත පංක්තිය මඳක් දක්වා ඈ පහළ කරන සිනාව මනඃකල්පිත විය.

නිර්මලා දැන් ඕනෑම වේලාවක ගෙන ගිය හැකි බව බෙරී මහතා ඇගේ මව්පියන්ට කියා සිටියේය.

නිර්මලා මානසිකාරෝග්‍ය ශාලාවෙහි රැඳී සිටියේ තව සතියක් පමණි. දිනක් පතිරණ මහතා ඈ වෙත පැමිණ සිය අදහස් කියන්ට වූයේය.

"නිර්මලා ඔබට ප්‍රතිකාර කරන අවධියේ මගේ සිත ඔබ වෙත ඇදී ගියා. සිහිය විකෘතිව තිබියදී ඔබ එතරම් සෞම්‍ය නම් නැවත ප්‍රකෘති සිහිය ලබාගත් පසු ඔබ කොතරම් උසස් ගුණාංගයන්ගෙන් හෙබි තැනැත්තියක් ද යනු මා නිතරම කල්පනා කළා. ඇයි ඔබ මෙසේ මා පිටු පා ක්‍රියා කරන්නේ."

නිර්මලා තුෂ්ණිම්භූතව ඉවත බලා සිටියාය. කෙනෙකුගේ සිත රිදවීම ඈට බාලකල සිටම නුපුරුදුය. නුහුරුය. මේ අවස්ථාවේදී තමාට මෙපමණ ආදර සැලකිල්ලෙන් කටයුතු කළ අයෙකුට පිටු පෑම ගැන ඇගේ සිත තුළ ඇති වූයේ බලවත් තැවුලකි.

දොස්තර නැවත නැවතත් ආයාචනා කෙළේය.

"නිර්මලා වරක් මා දෙස බලන්න. හය මාසයක් තිස්සේ මා ඔබ ගැන ඇතිකර ගත් සෑම බලාපොරොත්තුවක් ම ඔබ වචනයෙන් බිඳ දැමුවා නොවේද? මට අනුකම්පා කරන්න. මේ



මාස කීපය තුළ ඔබ මට දුන් ප්‍රතිඥාව සනාථ කරන්න. ඔබ මට ආලය කරනවා කීවේ වරක් දෙකක් නොවෙයි. නැවත වරක් ඔබ මට ආලය කරනවා කියා මා සනසන්න."

පතිරණ මහතා ගේ ශෝකාත්මක වචන ඇසෙත්ම නිර්මලා ගේ සිත වෙඩරුපිඩක් සේ උණු වී ගියේය. ඇගේ නෙත් සඟලෙහි කඳුළු පිරිණ. ඔහුගේ බැගෑපත් ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම තමාට නම් ගිනි මැලයකට පනින්නාක් මෙන්ය. එහෙත් තමා ඉදිරියේ සිටින තැනැත්තා සැනසීමට ඈට කිසිසේත් නුපුළුවන. වරක් තමා ආලය නොකළ අයෙකු සමඟ ජීවත්වීමේ ආදීනව දැන් ඈට ඇඟිල්ලක් සේ ප්‍රත්‍යක්ෂය. දෙවන වරට ද එම වරද කිරීමට ඉදිරිපත් වීම ඈට කළ නොහැක. අන්තිමේදී ඈ කථා කළාය.

"මහතාණෙනි! ඔබ මා වෙනුවෙන් දිවා රෑ දෙක්හි ගත් වෙහෙස උදෙසා මම ඔබට මුළු හෘදයෙන්ම කෘතඥ වෙමි. එහෙත් ආලය සම්බන්ධව නම් මා සමඟ කථා නොකරනු මැනවි. මගේ හදවතෙහි ආලය නමැති ජීවය ගලා ආ උල්පත දැන් සිඳී ඇත. දැන් මගේ සිත එකම වියළි කාන්තාරයකි. එසේ තිබිය දී මා ඔබ සමඟ ප්‍රේම සම්බන්ධතාවයක් ඇතිකර ගන්නේ කෙසේද?"

"නිර්මලා ඔබ මා පිටු පා නොයන බවට පොරොන්දුවන්න. ඔබගේ ආලය මට දැන් නොලැබුණත් මතුවට එය ලැබෙනවා ස්ථිරයි."

"මහතාණෙනි! මා වරක් විවාහ වූයේ නොයෙක් අනාගත බලාපොරොත්තු සිතේ ඇතිකර ගනිමින්. දැන් ඒ සියල්ලක්ම මගේ කැඩීගිය ජීවිතය ඉදිරියේ සුන් වී ගොස් ඇත. ඔබ මා වෙනුවෙන් කිසි බලාපොරොත්තුවක් ඇති කරගන්න එපා. මා ළඟ නැති දෙයක් මා දෙන්නේ කෙසේද? යමකු ළිඳක් අසලට

UPLOADED BY ELIFE

යන්නේ එහි ඇති ජලය නිසාය. ප්‍රේමයෙන් තොර වූ විවාහය සිඳී ගිය ළිඳකට සමාන නොවේද?"

පතිරණ මහතාගේ මුහුණ ශෝකයෙන් ඉදිමී ගියේය. "නිර්මලා! එදා ඔබ මගේ ගෙල වැළඳ ඔබ අත්හැර නොයන ලෙස ආයාචනා කළා මතක ද? යන්න එපා රංජිත් ඔබ ගියහොත් ආපසු එන්නේ නෑ, ඔබ කීවේ මේ තත්වයේ පෙර නිමිත්තක් වශයෙන් ද?"

නිර්මලා ලජ්ජාවෙන් මඳ වේලාවක් බිම බලා සිටියාය. කඳුළු කැට ඇස් වලින් සට සට ගා හැලෙන්නට විය. පසුව ඇ හිස ඔසවා මහත් ආයාසයෙන් දොස්තර දෙස බලා සිටියාය.

"මහතාණෙනි! මා ගත කළ පසුගිය කාලය සිහිනයක් වැන්න. තවමත් මගේ තත්වය අවිනිශ්චිතය. මා ගත කළ කාලයත් මගේ අනාගත ජීවිතයත් අතර පරතෙරය මකා දැමීමට මා දැන් ප්‍රයත්න දරමි. එය මා විසින්ම කළ යුත්තකි මට ස්වල්පයක් ඉඩ දුන මැනවි."

"නිර්මලා! සිහි විකලව සිටියදී ඔබේ ජීවිතය නමැති නෞකාව කාලය නමැති නදියෙහි නොසෙල්වී තිබුණේය. දැන් ඔබේ ජීවිත නෞකාව ගමන් කරයි. එසේ ගමන් කිරීමේදී ඔබට නොයෙක් ගල්පර වල හැපෙන්නට ඉඩ තිබේ. ඔබේ ඉදිරි ගමන සාර්ථක කර ගැනීමට මා සහාය කොට ගන්න. ඔබට අත දීමට මට ඉඩ දෙන්ඩ."

"මහතාණෙනි! ඉදිරි ගමන බලා මගේ පසුගිය කාලය ඉවත ලෑමට හැකිද? මා විවාහ වූ කෙනෙකු බව ඔබ දන්නවා නොවේද?"

"නිර්මලා! ඔබේ ස්වාමි පුරුෂයා සාමකාමී ලෙස සඳහටම ඔබෙන් වෙන්වුණා. ඔහු එංගලන්තයට ගොස් පදිංචි වී තිබේ."



නිර්මලා තුළ මහත් තෘප්තිමත් භාවයක් ඇති වෙත්ම ඇ සුසුමකින් සිත සැහැල්ලු කර ගත්තාය.

"දැන් මගේ ඉදිරි ගමන ලෙහෙසියි." යන්න ඇගේ මුවින් පිටවිය. "මගේ සිතේ ඇතිවූ එකම බිය දුරුවුණා."

"නිර්මලා දැන්වත් අසරණ මට ඔබේ හෘදයේ ඉඩක් තිබේද?" පතිරණ මහතා බැගෑපත් ස්වරයෙන් ඇසීය.

"මහතාණෙනි! මගේ එක ඉල්ලීමකට පමණක් ඉඩ දෙන්න."

"ඒ කුමක්ද? නිර්මලා ඔබ කියන ඕනෑම දෙයක් මම නොවහලා ඉටු කරමි."

"මීට පසු කිසි දිනක අප දෙදෙනා හමු නොවීමට අවසර ඉල්ලා සිටීම මගේ එකම අයැදීමයි."

සෙන පහරක් ඇසුනාක් මෙන් දොස්තරගේ සිත කම්පා විය. ඒ අතරම හේ කකුලක් පිටුපසට ගත්තේය. ඔහුට කථා කිරීමට පවා නොහැකි විය. මඳ වේලාවක් ගල් ගැසී බලා සිටි ඔහු අන්තිමේදී මෙසේ කියා වහා ආපසු හැරී යන්ට ගියේය.

"ඔබගේ අභිප්‍රාය එය නම්, එසේම වේවා. ඔබේ ඉදිරි ගමනට මා කිසිසේත් බාධා කරන්නේ නෑ."

පසුදින උදෑසන නිර්මලා රෝහලෙන් පිටවී යාමට සූදානම් වූවාය. උදේ නවයට පමණ ඇගේ මව්පියෝ රෝහලට පැමිණියෝය.

මානසිකාගාරයෙහි උඩ පහළ ඇවිදිමින් නිර්මලා සෑම සේවක සේවිකාවක්ම මුණ ගැසී ඔවුන්ගෙන් සමු ගත්තාය. සේවිකාවන්ගේ නෙත් කඳුළු වලින් පිරී ගියේය.

UPLOADED BY ELIFE

"මට සුව වූයේ ඔබ සියලු දෙනාගේම සහාය ඇතුවයි." කඳුළු පිරි දෙනෙතින් නිර්මලා කීවාය.

පතිරණ මහතා පමණක් රෝහලෙහි නොවීය. ඔහු සතියක් නිවාඩු ගත කිරීමට කඳුකරය බලා ගොස් තිබුණි. බෙරි මහතා ඈ දරුවෙකු මෙන් වැළඳගෙන මෙසේ කීය.

"ඔබට යම්කිසි කරදරයක් ඇති වුවහොත් මා අමතක කරන්න එපා."

තමා දන්නා සිංහල වචන හැකි පමණ යොදා බෙරි මහතා නිර්මලාගේ මව්පියන්ටද අවවාද කෙළේය.

"නිර්මලා මෙතනින් ඉවත්ව යන්නේ සම්පූර්ණ සුවය ඇතුවයි. ඈ වෙනුවෙන් කිසිදු අමුත්තක් නොකළ යුතුයි. ඈට රිසිසේ ජීවිතය ගෙන යාමට ඉඩ හැරිය යුතුයි. ඈ තුළ යම්කිසි පැකිලීම් ඇති වුවද කාලයාගේ ඇවෑමෙන් එය අහෝසි වනු ඇත. ඈට පැමිණි මේ අභාග්‍ය කාලය කිසි විටෙකත් ඇගේ අනාගත ජීවිතයට බාධකයක් වශයෙන් බල නොපවත්වා! එය මගේ ඉත හිතින් කරන ප්‍රාර්ථනාවයි."

* * *

රෝගියෙකු සුවය ලබා ආපසු සිය ගෙදරට පා තඟන්නේ කාය චිත්ත විවේකය ලබා ගැනීමේ මහඟු අපේක්ෂාවෙනි. එහෙත් නිර්මලා ගෙදරට පා තබත්ම මිශ්‍ර අදහස් වලින් ඇගේ හද කකියන්නට විය. පළමු කොටම ඈ එක් කාමරයකට ගෙනයනු ලැබීය. මේ පළමුවෙන් පරිහරණය කළ කාමරය නොව ගෙදර අනිත් පැත්තේ තුබූ කාමරයකි. එය සුව පහසින් සකලාඞ්ගයන්ගෙන්ම පරිපූර්ණ කාමරයක් විය. නමුත් නිර්මලා එහි පා තබත්ම හිර කූඩුවකට දැමුවාක් මෙන් ඈට දැනෙන්ට



විය. රෝහලක වැඩකොට පුරුදු සේවිකාවක්ද ඇගේ සාත්තුව පිණිස ගෙන්වා ගෙන තිබුණි.

නිර්මලාට මේ කිසිවක් තේරුම් ගත නොහැකි විය. කුඩා කල සිට පුරුදු කාමරයෙන් ඈත් කොට මෙසේ කිසිවෙකු හටත් නොපෙණෙන ලෙස තමා ඉවත් කෙළේ කුමක් නිසාදැයි ඈට මහත් ප්‍රහේලිකාවකි. නිර්මලා කාමරයෙහි හොඳට පිළියෙළ කොට තුබූ සයනය මත දිගා වී වට පිට බලන්නට වූවාය. කාමරය තුළ ඇති සෑම භාණ්ඩයක්ම දැකුම්කළුය. කාමරයට තුබූ එකම කවුලුව ගලවා එතනට දොරක් දමා වැසිකිළියක්ද සාදවා තුබුණි. වටපිට බලා මේ සියල්ල දකිත්ම එක්තරා බිහිසුණු සත්‍යයක් ඈට අවබෝධ විය. එනම් ඇගේ මව්පියන් ඈ මෙහි සඟවා තැබීමට දරන ප්‍රයත්නයක් බවය. මෙය සිතට නැඟෙත්ම උණු කඳුළු කැට ඇගේ දෙනෙතින් ගලා කම්මුල් තෙත් විය.

සියඹලාගහවත්ත ඈට කොතෙක් පුරුදු වුව ද දැන් නම් ඈ එහි පදිංචියට පැමිණි ආධුනිකයෙකි. උද්ගතවී තුබූ අවස්ථාවේ ගැටලු දකිත්ම නිර්මලාගේ සිත මහත් සේ කළකිරුණු ස්වභාවයකට පත්විය. ඒ සමඟම ඈ යම් යම් අවස්ථාවන්හි මව්පියනට මඳක් අකීකරු වූවාය. වරක් ඇගේ මව ඈට මෙසේ කීවාය.

"ඔබ අසනීපයෙන් මානසික රෝහලක ඉන්න බව නෑදෑයෝ මිතුරෝ කව්රුවත් දන්නේ නැ. අපි ඔවුනට කීවේ උඹ පිටරට පදිංචිවී ඇතැයි කියා. එම නිසා උඹ වැඩිය කාටවත් පෙනෙන්ට එළියට එන්ට එපා."

මෙය ඇසූ නිර්මලා තවත් කල්පනා කරන්ට වූවාය. උමතු රෝගියෙකු වී කාලයක් එක් තැනකට වී ඉඳීම එකකි. දැන් ඉතින් කෙසේ නම් සිර කූඩුවක ලැගුම් ගන්ටද? දවසක් දෙකක්

UPLOADED BY ELIFE

නම් එය කළ හැක. සීමාවක් නැති කාලයක් මා මෙසේ තනිව ගත කරන්නේ කෙසේද?

නිර්මලා ගෙදරට විත් නොබෝ දිනක් යන්නට ප්‍රථම දස අතින් ඈ ගැන නොයෙකුත් ආරංචි පැතිර ගියේය. "ඈ උමතු වී කාමරයක වසා ඇති බවත් ඇගේ ස්වාමියා ඇගෙන් වෙන් වී ඇති බවත් යනාදී ආරංචි අතපත්තු මහතාගේ කන වැටෙත්ම ඔහු වියරු වූවකු මෙන් හැසිරෙන්නට විය. ඒ අතරම සියලු අවහිරයන්ම මැඩ ලමින් නිර්මලාද තමාට අත්වූ හිර අඩස්සියෙන් ඈත් වන්නට තැත් කළාය. ගෙමිදුලට බට ඈට දක්නට ලැබුණේ කට අයාගෙන මවිතයෙන් මෙන් ඈ දෙස බලා සිටින නා නා තරාතිරම්වල ගැහැනු පිරිමිය. කිසිවෙක් ඈ සමග කථා කිරීමට රුචියක් නොදක්වූහ. ඈ දුටු කුඩා දරු දැරියෝද ගෝනි බිල්ලෙකු මුණ ගැසුණාක් මෙන් බියවී ඈතට දුවන්නට වූහ.

"මා මෙතරම් භයානක උවදුරක් වුයේ කෙසේද?"යි නිර්මලා තමාගෙන් ප්‍රශ්න කළාය.

දැන් නිර්මලාට සියල්ල තත්වාකාරයෙන් අවබෝධ වී ඇත. සිය පියා රටුන්ට සත්‍යය සැඟවීමෙන් ඇති වී තිබෙන ප්‍රශ්න බොහෝය. මේ අන්දමින් තමාගේ කැඩී බිඳී ගිය ජීවිතයේ කැබෙලි කිසි කලෙකවත් එකට පෑස්සිය නොහැක. මේ කරුණු උඩ නිර්මලා සිය ගෙදර ආගන්තුකයකු වූවාය.

මව්පිය ආදර සැලකිලි ආදියෙන් කිසි අඩුවෙක් නැතත් ඈට ගතකරන්ට සිදුවූයේ ඉතා අවිනිශ්චිත කාලයකි. අතීතය ඈට අභිරහසෙකි. අනාගතයද ඝන පටලයකින් වැසී තිබේ. එමෙන්ම කිසිවෙක් ඈ සමග කථා කිරීමට ප්‍රිය නොකෙරෙති. නිර්මලාට සිදුවූයේ බිත්ති සතරකින් කොටුවූ කාමරයකට වී තනිව කඳුළු සැලීමටය. මේ අතරම අන් කිසි දිනකවත් ඇති නොවූ මානසික වේදනාවකින් ඈ පෙළෙන්නට වූයෙන් ශරීරයද



දුර්වල විය. කෑමද අරුචි විය. එයින්ම ඇගේ නහර ශක්තිය දුබල බවට පත්විය. ජීවිතය එපාවෙන තරම් සිත කලකිරුණු ස්වභාවයක් ඈට අත්විය. ඈ දැන් ආරෝග්‍යශාලාවේ සිටියාට වඩා බොහෝ වෙනස්ය.

සුවවීමත් සමඟම ඈට ඇති වූ කල්පනා ශක්තිය කරණ කොට ගෙන ඈ පසුගිය කාලය මෙනෙහි කරන්ට වූවාය. "ඔබට යම්කිසි විපතක් පැමුණුන විට මා ඔබ ළඟට එන්නම්" යයි එදා රංජිත් ඈ සමඟ කීවා මතකය. "දැන් රංජිත් කෝ? මට අනතුරක් වෙනවා දුටු හෙතෙම කෙසේ නමුත් මා ගෙදරින් ඉවත් කිරීමට තැත් කළා. එදින මා රංජිත් පසු පස ගියානම් මට මේ දෙය වෙයිද?" ඈ මෙනෙහි කරමින් සුසුම් ලෑවාය.

වරක් ඈ සිය මවගෙන් මෙසේ ප්‍රශ්න කළාය. "අම්මා! කියන්න පසුගිය දෑවුරුද්ද තුළ මට සිදු වූයේ කුමක්ද කියා?" කියමින් දිග සුසුමක් ගත්තාය.

"අනේ දුවේ! මට ඕව මතක් වන විටත් ඇඟ හිරි වැටෙනවා. උඹේ පියාට උවමනා උනේ බොරු නම්බුවත්, මාන්නයත්, ලොකුකමත් විතරයි. ඒවායේ විපාක තමයි අපි මේ විඳින්නේ! උඹ එලොව ගිහින් මෙලොව ආවා. මම මේ දැවුරුද්ද තුළම කිසිම සැනසීමකින් සිටියේ නෑ. නින්දක් නෑ. කල්පනාවමයි. මගේ හිතේ ගින්දර නිවුනේ ඔබට සම්පූර්ණ සුවය ලැබී තිබේයයි කියා දොස්තර මහතා එවා තිබුණ ලියමන දැකීමෙන් පසුවයි. දුව දැන් ඕවා මතක් කරන්ටවත් එපා. තව අවුරුදු දෙකක් විතර උඹට අපලයි කියනවා. ඊට පස්සේ එන කාලෙ හොඳලු. අපි එතකල් ඉවසාගන සිටිමු." මෙසේ කියා ඈ සිය දියණිය අස්වැසුවාය.

මව මෙසේ කියත්ම නිර්මලා දුක්බර මුහුණක් ඇතිකර ගත්තාය. "මට මතක ඇති දවස්වල සිටන් අම්මා කියන්නේ

UPLOADED BY ELIFE

තව අවුරුදු දෙකකින් හොඳ කාලයක් එනවා කියලා තමයි. ඔය අවුරුදු දෙක ගෙවීයන්නේ තව කොපමණ කාලයකින්ද?"

"දුව! උඹට තවම සනීප නෑ. ඒ නිසා තමයි උඹ ඔහොම කථා කරන්නේ?" මව පිළිතුරු දුන්නීය.

"අම්මා, මම ගෙදර ආවේ හොඳට සුවය ලබාගන තමයි. එහෙත් ගෙදර ආ වෙලේ පටන් මට නැති ලෙඩත් දැන් ඇතිවී තිබෙනවා. මෙහෙම ඉන්ඩ ගියොත් මට කුමක් වේද කියා කියන්ඩ බෑ. අම්මා මා ලොකු රහසක් කරගන තිබෙන්නේ කුමටද?"

මවද ඈ සමග හඬන්ට වූවාය. ඈද සිය දියණිය වෙනුවෙන් ඉතා දුක්මුසු කාලයක් ගත කරන බව ඇගේ මුහුණින් පෙනී ගියේය. දැන් නිර්මලා, පෙර සියල්ලන්ගේම සිත් වශීකරගත් නිර්මලා නම් නොවේ. තනිව ඉදීමට ඈ රුචියක් ඇතිකර ගත්තාය. ඒ අතරම අවට කිසිවකු හිඳීම ඇට තුරුස්නා කරුණෙක් විය. මර්තිනා නමැති පළපුරුදු සේවිකාව ඈ පිටුපස සිටීම ඇගේ කනස්සල්ලට තවත් හේතු විය. "මර්තිනා නුඹ මා පිටුපස ඉන්ඩ උවමනාවක් නෑ. මා පොඩි ළමයෙක් නොවෙයි." විටින් විට ඈ මර්තිනාට අවවාද කළාය.

දැන් නිර්මලාගේ තත්වය මාංචු දමා ඇති සිරකරුවෙකුට සමානය. මෙයින් මිදීමට නොහැක්කේ ඈ නොයෙක් අවස්ථාවන්හි සීමාව ඉක්මවා හැසිරෙන්නට වූවාය. වරක් සයනය මත දිගා වී මහ හයියෙන් හඬන්ට වූවාය. වරක් ඇට නිරාහාරව සිටීමට සිතුන විට දින කීපයක් වුවද ආහාර නොගෙන සිටීමට පුරුදුවූවාය. ගෙදර සිටි සේවක පිරිස ඇට තව වරක් පිස්සු හැදෙන්ට එනවා යයි කසු කුසු ගෑහ. නිර්මලා තවත් ගේ තුළ සඟවා ගත නොහැක්කේ, මව්පියෝ ඇට මඳක් වත්තේ සිටීමට ඉඩ හැරියෝය. වත්ත පහළ ගිය ඈ හිස ඔසවා බැලූ බැලූ තැන්වල පෙනෙන්නේ තමා දෙස ඇසි පිය නොහෙලා බලා සිටින අසල් වාසි ජනයාය. වරක් ඈ රඹුටන් ගසක් අසලට



ගොස් බර වී පහතට එල්ලී වැටී තිබුණ රඹුටන් ගෙඩිවල රස බලන්නට වූවාය. මඳ වේලාවකින් ඇගේ මව ඈ අසලට දුව ඇවිත් ඇගේ අත ළඟින් අල්වා ගෙදර ගෙන යාමට තැත් කළාය.

"අනේ දුව, ඇයි රඹුටන් ලෙලි කන්නේ? ඕවා තිත්ත නොවේද"යි මව අසත්ම නිර්මලා පුදුමයෙන් ඈ දෙස බලා සිටියාය. අවස්ථාවෙන් ප්‍රයෝජනය ගෙන සෑම දෙයක්ම නොපිට පෙරළා හාමිනේගේ කනට කෙඳිරීමට ලෑස්ති වී සිටි අය එමටය.

දිනක් වලව්වට පැමිණි එක් නෑදෑයෙක් අතපත්තු හාමිනේ සමඟ කථා කරමින් සිටියේය. නිර්මලාද වහා කාමරයෙන් එළියට අවුත් අසල පුටුවක වාඩි වී කථාවට සවන්දෙන්ට වූවාය. දෙදෙනාම එකවර නිහඬ වූහ. අමුත්තා ඇස්පිය නොහෙලාම කම්මුල මත අතක් ගසා ගන ඉතා බරවූ මුහුණකින් යුතුව නිර්මලා දෙස බලන්ට වූවාය. මෙය කොතෙක් ඉවසා සිටීමට නොහැකි වූ නිර්මලා ශබ්ද නඟා කෑ ගැසුවාය.... "මා දෙස රවා බලන්ට එපා, මට පිස්සු නෑ!" කීපදෙනෙක් දුව අවුත් ඈ කාමරයට ගෙන ගියහ.

"මට පිස්සු නෑ. මට පිස්සු නෑ." ඈ විටින් විට කෑගසන්ට වූවාය. ඊට පසුව ඇගේ තත්වය බරපතල අතට පෙරළෙන්නට විය. දැන් ඇගේ තතු කිසිවෙකුටවත් සැඟවීමට නොහැක. සියල්ලෝම ඈ ගැන විමසිල්ලෙන් බලා සිටිති. ඈ දෙස බලා අනුකම්පා කරන්නෝ එමටය. ඔවුන්ගේ අනුකම්පාව පවා නිර්මලාට දරිය නොහැකි සිත් වේදනාවකි. ඇට දැන් ගෙදර පෙනෙන්නේ අමු සොහොනක් මෙනි. අත්තෙන් අත්තට පනිමින් කෑ ගසන කුරුල්ලන් පවා ඇට සමච්චල් කරන්නාක් මෙන්ය දැන් පෙනී යන්නේ! ඇගේ යහපතට යමක් ඇතිවූවා නම් එය ඇට ලැබුණු කෙටි නින්ඳය. ගෙවී ගිය දවස ගැන ඈ සැනසුම් සුසුම් හෙලූ අතර උදාවන දිනය ළඟාවත්ම ඊට මුහුණ දීමට ඈ බිය වූවාය.

UPLOADED BY ELIFE

දිනක් වත්තට පිවිසුණු ඈ කුඩා වසු පැටවෙකු ලනුවේ පැටලී සිටිනවා දැක වහා වසු පැටවා ළඟට උගේ කරින් ලනුව ගලවා ඌ මුදා හැරියාය. ගෙදර ඇත්තෝ කලබල වී ඈ දෙසට දිව ආහ. ඈ ගසක එල්ලීමට ලනුවක් සොයනු ඇතැයි එක් කුඩා දැරියක් වහා දුවගොස් අතපත්තු හාමිනේට කියා සිටියාය.

"අනේ දුවේ උඹ මේ කුමක් කරන්නද හදන්නේ?" කියමින් මව ඈ ඉදිරියේ කඳුළු සලන්ට වූවාය. නිර්මලාද කිසිවක් කර කියා ගත නොහැක්කේ වට කරගත සිටි සෙනඟ දෙස බලමින්ම සෙමින් සෙමින් ගෙට ආවාය.

සියදිවි නසා ගන්නේ, කුමක් කියාදවත් ඈ නොදනී. ඇගේ එකම පරිශ්‍රමය ජීවත් වීමටය. ඈට වුවමනා වී ඇත්තේ නිදැල්ලේ ප්‍රකෘති ලෙස කාලය ගෙන යාමය. ඒ කිසි දෙයකටවත් ඈට ඉඩක් නොමැත. මෙසේ ඈ කරන සියල්ලක්ම පිස්සු වැඩ බව අවට සිටින්නන්ට පෙනේ.

නිර්මලා ගසක එල්ලී දිවිනසා ගන්ට තැත් කළායයි දශ දිසාවෙහිම පැතිර ගියේය. ඈ නිසා මුළු පවුලටම අත්වී තිබෙන්නේ ලොකු නින්දාවකැයි අයෙක් කීවෝය. පිස්සු හොඳ වෙන්නේ නැතුව ගෙනා වරද නොවේදැයි අසල්වාසීහු එක හඬින් කියන්නට වූහ.

ගතවන සෑම දිනයකම නිර්මලාට දැනෙන්නේ කාලාන්තරයක් මෙන්ය. අභිප්‍රෙතස්ථානයක් නොමැතිව නියමුවෙක් නැතිව නැවක් මහ සයුරේ ගල් පර මත ඒ මේ අත හැපී විනාශ වන්නේ යම්සේද, එමෙන්ම අසරණ නිර්මලාගේ ජීවිතය නමැති නෞකාවද කාලයා නමැති මහා සාගරයේ ඒ මේ අත වැනෙමින් විනාශය නමැති ගල්පර සොයා යුහුසුළුව යාත්‍රා කළාය. නිර්මලාට අත්වූ මෙම ව්‍යසනය පිළිබඳ පවුලේ එක් අයෙක් පමණක් මහත් සන්තාපයෙන් හා සැකයෙන් කල් ගත කළේය. ඒ තැනැත්තා අන් කිසිවෙකු නොව නිර්මලාගේ පියාය. සිය දියණිය මෙවැනි බියකරු අවස්ථාවකට මුහුණ



දුන්නේ තමා අතින් සිදුවූ වරද නිසායයි හේ විටින් විට මෙනෙහි කෙළේය. මේ කාලයෙහි ඔහු අවට රොක් වූ නක්ෂත්‍රාචාරීහු ද, භූතාචාර්‍යවරුද බොහෝ වූහ. නක්ෂත්‍රාචාර්‍යයෝ ඇගේ කේන්ද්‍රය ගැන බලා, "මෙය ඈට පැමුණුන මාරක අපලයක ප්‍රතිඵලයකැ"යි කියා සිටින අතර ඈට බියකරු භූතයෙකු ආවේස වී ඇතැයි ද ඌ දුරු නොකර කිසිම පිලියමක් හරියන්නේ නැතැයි ද, යකදුරෝ කියන්නට වූහ. අතපත්තු මහතාද මෙය අසා මඳක් ඒ ගැන කල්පනා කරන්ට විය.

සිය දියණිය සම්බන්ධව තමා ඇති කර ගත් කනස්සළු භාවයක් සමඟම අතපත්තු මහතා ඇගෙන් විටින් විට මඟ හැරියේය. දිනක් හේ වැදගත් ගමනක් යාම සඳහා උදෑසනින් ම ලෑස්ති වී මොටෝරිය වලව්ව ඉදිරියට ගෙන්වා ගත්තේය. නිර්මලා ද වහා ගොස් රියට නැඟ දොර වසා ගත්තාය. ගමන යාමට එළියට ආ පියා සිය දියණිය රියේ වාඩිවී සිටිනවා දැක මඳක් විශ්මිත විය. එහෙත් ඒ බව නො අඟවා සෙමින් කතා කළේය.

"දුව, තාත්තට ලොකු ගමනක් යන්න තියෙනවා. කරුණාකර රියෙන් බැහැල ගෙට යන්න"

"තාත්තා සමඟ මාත් එනවා, ඇයි මේ මොටෝරියේ මට ඉඩ නැද්ද?" අසමින් නිර්මලා එතැනම සිටියාය.

"මම වෙන දවසක දුව එක්ක යන්නම්. අද මට යන්න දෙන්නැ"යි පියා ඉල්ලීය.

"කෝ මට වෙනින් දවසක්, මට වෙන දවසක් නෑ. මම අදම යන්ඩ ඕනෑ, තාත්තා මා දුටුවාම මඟහරින්නේ ඇයි?" මෙසේ කියමින් ඈ ඉකි ගසමින් හඬන්ට වූවාය.

සැටවියට පා තැබූ අතපත්තු මහතාගේ ඉවසීමේ ශක්තිය මුළුමනින්ම අහෝසි විය. හේ මහ හඬින් ගුගුළේය. "හැතිරී!

UPLOADED BY ELIFE

ඔබ දරුවෙක් නොවෙයි, ජාති වෛර කාරියක්. බැහැපන් දැන්මම එළියට" මෙසේ තර්ජනය කොට තමා අත තුබූ කෙවිටෙන් ඇට පහරක් දින. අසල හුන් රියදුරා ඉදිරියට පැන කෙවිට අල්වා ගත්තේය. ශබ්දය ඇසුණු වැඩ කරුවෝ දුවවිත් රිය වටලා ගත්හ.

"අනේ මලක් වගේ හදපු දරුවාට නොවෙද මෙහෙම කරන්නේ?" කියමින් මැණියෝ ළඟට අවුත් සිය දියණිය වැළඳගෙන ගේ තුළට ගියාය.

අතපත්තු මහතා ද ගමන නොගොස් සිය කාමරයට වැද මුළු දවසම නිසලව සිටියේ ය. මෙවැනි සිද්ධීන් ඇති වීමෙන් වලව්වේ සාමයත්, උසස් භාවයත් මුළුමනින්ම ඇනසිටින. සිය කාමරයට පිවිසි නිර්මලා ද සම්පූර්ණ උපවාසයක යෙදින. මේ ගැන බියපත් වූ අතපත්තු මහතා විගස බෙරි මහතා ගෙන්වීය.

පළමුව නිහඬව සිටීමට සිතාගෙන සිටි නිර්මලාට බෙරි මහතා ඉදිරියේ එසේ නොකළ හැකිවිය. දෙකපෝලයෙන් ගලායන කඳුළු ධාරා මධ්‍යයේ ඈ සියල්ලක්ම කියා සිටියාය.

"මට උවමනා කළේ මගේ ප්‍රකෘති ජීවිතය ගෙනයාමටයි. මා උමතුවෙන් හැසිරෙන්නියක යයි සියල්ලෝම මා ගැන සැක කරනවා. මා එල්ලී දිවි නසා ගැනීමට තැත්කළා කියා වරක් මා චෝදනා ලැබුවා. මට කිසි විටෙකවත් ගඟ අයිනට යාමට අවසරයක් නෑ. මගේ මව්පියන් ප්‍රීතිවන එකම අවසථාව මා මේ කාමරය තුළට වී නිසලව සිටින විට පමණයි. මට මේ සියල්ලක්ම අමතක කර දැමීමට ඇතිනම් ඊට වඩා සැපතක් තවත් නෑ. මගේ මුළු ජීවිතයම මෙසේ ගත කිරීමට වේදෝ යන බියෙන් දිවා රෑ දෙක්හි මා පසුවෙනවා," මෙසේ කියා ඈ හඬන්නට වූවාය.

බෙරි මහතාට සියල්ල තේරුම් ගියේය. මව්පියන්ගේ වැරදි ක්‍රියාකාරීත්වය උඩ ඇට පැමිණි මාරක කාලය ගැන තත්වාබෝධයෙන් බෙරි මහතා ඇගෙන් මෙසේ ප්‍රශ්න කෙළේය.



"නිර්මලා ඔබ කැමතිද මා සමඟ ටික කලක් ගත කිරීමට? මගේ වැඩ රාශියක් තියෙනවා. යම් කිසි වැඩක යෙදුනහොත් ඔබේ මේ කනස්සලු භාවය මඟහැරෙනවා ඇති."

නිර්මලා මඳ වේලාවක් කල්පනා කරන්ට වූවාය. මානසිකාගාරයෙහි යම් කිසි සිඩින් සිහියට නැඟෙත්ම ඈ බෙරි මහතාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළාය.

ආපසු යාමට පෙර බෙරි මහතා අතපත්තු යුවළට තරයේ අවවාද කළේය. "නිර්මලා උමතුවෙන් කියා සිතීම වැරදියි. ඇගේ සිහි බුඩිය ඉතා ප්‍රකෘතිමත් ලෙස ක්‍රියා කරනවා. මේ අවුරුද්ද තුළ පුරුදු ජීවිතයක් ගෙන යාමට ඉඩ නොහැරීමෙන් ඈට මේ අසාධාරණය සිදුවී තිබෙනවා. ඇගේ ඥාන ශක්තිය මව්පියන් මැනගෙන තිබෙන සැටි වැරදියි. ඇගේ ශාරීරික ශක්තිය දැන් ඉතාමත් දුර්වල අවස්ථාවක, ශරීරයද ඉතා භයානක ලෙස කෘශයි. මේ හේතුවෙන්ම මේ අසරණ යහපත් ගතිගුණාංගයන්ගෙන් හෙබි රූපිකාව අකාල මරණයකට ගොදුරු වෙනවා නියතයි."

"අප සියල්ලක්ම කරන්නේ ඇගේ හොඳටයි. නමුත් ඈ අප නිතරම අවිශ්වාස කරනවා" අතපත්තු මහතා කීයේය.

"මෙතෙක් කළ දෙයින් ඈට කිසිම හොඳක් නොවී ඇතැයි මට ස්ථිර කොට කිය හැකියි,"යි බෙරි මහතා උත්තර දුන්නේය.

"නිර්මලාගේ ජීවිතයට යම් කිසි හානියක් කරගනිති යි අප හැම වේලේම බියෙන් සිටිනවා" යි අතපත්තු මහතා ප්‍රකාශ කළේය.

"කිසි දිනක වත් ජීවිතය හානිකර ගැනීමේ චේතනාවෙක් නිර්මලාට නැත. ඒ ගැන මට සහතිකය. නමුත් ඇගේ වටිනා ජීවිතය අනිත් අය නැතිකරන්ට යනවා යයි මගේ හැඟීමයි.

UPLOADED BY ELIFE

නිර්මලා සිය "ජීවිතය නැතිකර ගැනීමට උත්සාහ කරනවා නොව ජීවිතය යහපත්ව දිගුකලක් ගෙන යෑමේ සටනෙක යෙදී සිටින බව මම තරයේම කියමි. එහෙත් ඈ ඉදිරියේ ඇති බාධකයන් මධ්‍යයේ ඇගේ සිරුර දිරායන කිසියම් රෝගයකට භාජන වුවහොත් එය මහත් කනගාටුවට කරුණක් නොවන්නේද? රෝහලේ සිටි අවධියේ කෙතරම් පුෂ්ඨිමත් ලෙස ඇගේ ශරීරය වැඩී තිබුණාද?"යි දොස්තර අනතුරු ඇඟවීමක් කෙළේය.

"අපි කුමක් කරමුද? නොයෙක් රසමුසු බොජුන් දීමෙන් අප ඇට සංග්‍රහ කරනවා. එහෙත් ඈ ඒ සියල්ලම ප්‍රතික්ෂේප කරනවා" යයි අතපත්තු මහතා කී කල්හි දොස්තර මහතා සාවඥ බැලීමක් හෙලීය.

"අතපත්තු මහතාණෙනි! නිර්මලාට උවමනා වී ඇත්තේ රසවත් අහර නොවේ. සිතේ එකලස් භාවයයි. මිනිසාගේ සෑම කර්තව්‍යයක්ම සිත ප්‍රධාන කොට ඇත. සිත ප්‍රාණවත් නම් ඒ අනුව සකල ශරීරයෙහිම ඉන්ද්‍රියයන්ගේ ප්‍රාණ භාවය ඇතිවේ. එමෙන්ම සිත දුබලවී නම් එයින් පහර වදින්නේ ශරීරයේ ඉන්ද්‍රියයන්ටයි."

එදා උදේ බෙරි මහතා ආපසු ගියේ නිර්මලා වෙනුවෙන් ප්‍රත්‍යක්ෂ බෙහෙත් වට්ටෝරුවක් සකස්කොට දීමෙනි. එයින් සමහරක් නම්: "නිර්මලාට සම්පූර්ණ නිදහස තිබිය යුතුය. එය සීමාකොට පාවිච්චි කිරීමට ඈ දන්නීය. සේවිකාව කිසි විටෙකවත් ඇට බාධාවක් නොවිය යුතුය. ඇගේ වැඩ කටයුතු ඇට කර ගත හැකිය.

එමෙන්ම ඈ නිර්මලාට කීකරුව කටයුතු කළ යුතුය. ගඟ අද්දරට හෝ වත්තේ ඇවිදීමට හෝ එයිනුත් බැහැරට හෝ ඈ යෑමට කැමති වුවහොත් කිසිවකු ඊට හරස් කැපීම යුතු නැත. ඈ ජීවතුන් අතර සිටිනවා දකීමට කැමති නම් ඇට නුරුස්නා



බාධකයින් සියල්ලක්ම ඉවත් කළ මැනව. නිර්මලාට දන් ඇති කිසිම පිස්සුවක් නැත. මේ ගෙදර සිටින්නන් ඇට නැති පිස්සුවක් අමුතුවෙන් ආරූඪ කිරීමට තැත් කරන බව මට පෙනේ. නිර්මලාගේ වයස දන් විසිදෙකකි. ඈ තරුණය. ඕනෑම දෙයක් ස්වකීය විනිශ්චයෙන් නිගමනයකට බැසීමට හැකිවූ ඥාන ශක්තියක්ද ඇට තිබේ. ඈ ගෙයි තුළ සඟවා අධික ලෙස ආරක්ෂා කිරීමට යාමෙන් ඇට අනතුරක් විනා යහපතෙක් නම් නොවන්නේය."

මෙදා සිට නිර්මලාගේ ජීවිතයේ අමුතු පිටුවක් පෙරළුනි. බලාපොරොත්තු රහිතවම සම්පූර්ණ නිදහස ලැබූ ඈ හුදකලාව කාලය ගත කිරීමට ප්‍රිය කළාය. ඇතැම් විට අලුයම වත්ත පහළට ගිය ඈ පෙරලා ආපසු පැමිණියේ හිරු මුදුන් වූවාටත් පසුවය. නිතර නිතර ගඟ අද්දරටද ඇගේ ගමන මතක් විය. උණ පඳුර අසල තුබූ අසුන පෙරසේම ඇත. ඈ එහි ගොස් බොහෝ වේලා වාඩිවී සිටීමටද පුරුදු වූවාය. සමහර විට ඈ එතනින් ඉවත් වූයේ හිර බැස අවට අන්ධකාරය පැතිරෙන විටය. පළමුව නිර්මලාගේ මේ ක්‍රියාවන් මව්පියනට මහත් හිසරදයක් වූ නමුදු ඔවුහු ඇට කිසිවක් කීමට බියවූහ. කල්යෑමෙන් ඔවුහුද ඇගේ නව ඉරියව් වලට පුරුදු වූහ. සමහර විට නිර්මලා මර්තිනාත් සමඟ විහාරයට පවා යෑමට පුරුදු වූවාය. ගඟින් එගොඩද කුඩා විහාරයක් ඇත. එය නිසංසලය. වැඩි ජනකායක් එහි රැස් නොවෙති. තොටුපළ අසලට ගොස් ගඟින් එගොඩවී ඒ විහාරයටද යාමට ඈ පුරුදු වූවාය.

යමෙකුගේ ජීවිතය ප්‍රබෝධවී ඉදිරියට යෑමට රුකුල් දෙන්නේ ඒ තැනැත්තාගේ ජීවිතයේ ඇතිවන විවිධ සිඩීන් ඇසුරුකොට ගෙනය. නිර්මලාගේ ජීවිතය ප්‍රබෝධ කිරීමට කිසිදු සිඬියක් නොමැත්තේ ඇට ඉදිරිය බැලීමට කිසිදු රුචියක් නොවීය. මේ අයුරින් ඇගේ සිත් තුළ නොයෙක් විපයර්‍යාසයන් ඇතිවන්නට විය. ඒ හේතුවෙන් සිය ජීවිතය කෙරෙහි ඈ කුරිරු

UPLOADED BY ELIFE

බැල්මක් ඇතිකර ගත්තාය. කුහුඹුවෙකුටවත් හානියක් කිරීමට ඇගේ සිත් තුළ නැත. ඇගේ කුරිරු අදහස් එල්ල කිරීමට සිය ජීවිතය පමණක් සීමාකර ගත්තාය. ඇට මේ ව්‍යසනය පැමිණෙත්ම ඈ දෛවයට ශාප කලාය. එක් අයෙකුට එක විදියකටත් තව අයෙකුට තවත් විදියකටත් සලකන්නේ කෙබඳු අසාධාරණ දෛවයක්දැයි ඈ විචාළාය. ඒ සමඟම ඈ ශරීරයට නොයෙකුත් හිරිහැර දෙන්ට පටන් ගත්තාය. දුටු දන මන නයන ක නාලිය සිරි පැරයූ ඇගේ සිවුමැලි අත් යුවළෙහි දෛවයා විසින් දෙන ලද පහරවල් මතුවී තිබෙන්නාක් මෙන් නහර ඉපිලී සිටගත. වරෙක තරුණ භාවය කැපී පෙන්නූ රන් හස පැටින් දෙදෙනෙකු මෙන් ලැමද පුරා උස්ව සිටි පිරිපුන් පියයුරු සඟල, මින් පෙර කිසි කලෙකවත් නොවූ විරූ කුරිරු භාවයකට බියෙන් පලාගියාක් වැනිව ඇගේ ලැමද ලැල්ලක සිරි පෙන්වීය.

ඇගේ කාමරයෙහි හිස සිට දෙපා දක්වා එකවර පෙනෙන උස කණ්ණාඩියක් එක් පසෙක සවිකොට තිබුණේය. මෙය නිර්මලාගේ රූප ශෝභාව ඔපවත් කරගනු පිණිස අතපත්තු මහතා විසින් සපයන ලද එක් භාණ්ඩයකි. ටික කලකට පෙර නිර්මලා රෙද්දකින් කැඩපත වසා දැම්මාය. මෙය දුටු මව්පියෝ සිත් වේදනාවට පත්වූහ. වරක් ගඟ අද්දර බොහෝ වේලාවක් වේදනාවෙන් දෙදරා ගිය සිත් තැවුලෙන් යුතුව සිට ආපසු කාමරයට පිවිසි නිර්මලාවෝ සිය ශරීරයේ තත්ත්වය කෙබඳු දැයි හොඳාකාර බලා ගැනීමට වහා කැඩපත ඉදිරියේ තුබූ තිරය ඉවත් කළාය. ඒ සමඟම මහත් විශ්මයක් ඈ තුළ පහළ විය. මේ පෙනෙන්නේ ලොව එපාවී දුක් බරින් මිරිකී ගිය මුහුණක්ද? නැත. ඈ අපේක්ෂා කළේ එකකි. දැන් ඈ ඉදිරියේ ඇත්තේ ඊට ඉඳුරාම වෙනස් තත්ත්වයකි. නිලුපුල් මලක් පරයා සිටි ඇස් යුවළ දැන් පෙරටත් වඩා පැහැපත්ය. විශාලය. ඇගේ මුහුණෙහි තුබූ සුදුමැලි භාවය ඇගේ සියුමැලි සුන්දරත්වය වඩාත් පෙන්නුම් කෙළේය. රැළි සහිතව එකට ගෙතී බෙල්ල මත දක්වා වැටී තිබුණ නිල්වන් කොට කෙස්වැටිය ඇගේ සුන්දර මුහුණට නව



ආභරණයක් බඳුවිය.

"මෙය කිසි දිනකවත් මගේ මුහුණ නම් නොවෙයි. මගේ මුහුණ නම් මගේ සිත් තුළ ඇති වේදනා පෙන්නුම් කළ යුතුය. මෙය අනෙකක් නොව මගේ පරම හතුරා වූ දෛවය විසින් මට සමච්චල් කිරීමට මවාපාන මහත් විජ්ජාවකි." මෙසේ සිතත්ම දෛවයට පහර දෙන සිතෙක් ඈ තුළ පහළ විය. "මර්තිනා" ඇගේ සේවිකාවට ආමන්ත්‍රණය කළාය. "කතුරක් ගෙනෙන්න." මර්තිනාද යුහුසුළුව කතුර සොයා ගෙන ඈ ළඟට ආවාය.

"මර්තිනා! මගේ කෙස් වැටිය ඉතා කෙටි කර කපන්න."

මර්තිනා බියවී අඩියක් පස්සට ගත්තාය. "අනේ පුංචි හාමු! මට නම් ඒ වැඩය කියන්ට එපා. මේ ලක්ෂණට වැවීගන එන කොණ්ඩය කපා දමන්න කියන්නේ"

"මර්තිනා! නුඹ වරක් පොරොන්දු උනා නොවෙද, මා කියන දේ කරන්ඩ?"

නිර්මලා මෙසේ කියත්ම මර්තිනා කතුර ගෙන ඇගේ කෙස් වැටිය කපන්ට වූවාය.

"ඉතා කෙටි කර කපා දමන්න." නිර්මලාගේ කටහඬ අණදෙන සවරයක් ගති.

මර්තිනාද කතුර රැගෙන නළල සහ බෙල්ල මත වැටී කුඩු කෙස් කලඹ මුලින්ම කපා දැමුවාය. හිස මත ඇති වූ අප්‍රිය දර්ශන මුඩු භාවය කණ්ණාඩියෙන් බලත්ම නිර්මලාගේ මුහුණෙහි මඳ සැනසීම් සිනාවක් ඇති විය.

"දෛවය! ඔබ මට පහර දෙන්ට දෙන්ට, මමද ඔබට පහර දෙමි." ඈ සෙමින් කීවාය.

එක ගෙදර ජීවත් වුවද මව් පියන් සහ දුව හැසිරෙනුයේ

UPLOADED BY ELIFE

අමුත්තන් ලෙසටය. දුව අසලක සිටියද අතපත්තු මහතාට ඈ ගැන යමක් දැන ගැනීමට උවමනා වූ විට ඔහු ප්‍රශ්න කරන්නේ සේවිකාවගෙනි. මෙය දුන් මඳ වශයෙන් මවටද පුරුදු වී ඇත. එහෙත් ඔවුනොවුන්ගේ ආදර ගෞරවයෙන් මඳකුත් නො අඩුව බව ඔවුන් ගත කරන කනස්සළු භාවයෙන් යස රඟට පෙනුණි. 'ගිය නුවණ ඇතුන් ලවා වත් අද්දවන්ට බැරිය' යන ගැමි ප්‍රස්ථා පිරුළ මැනවින් දත් අතපත්තු මහතා නිර්මලාට සෙතක් ලබා දීමට නොගත් ප්‍රයත්නයක් නැත. නො දුරූ වියදමක්ද නැත. වරක් අතපත්තු මහතා මාතර පළාතෙන් දක්ෂ ඇදුරන් ගෙන්වා තෙමසක් තුළ පිළියෙළ කළ එක් මහානුභාව සම්පන්න යන්ත්‍රයක් ඇගේ ගෙල පැළඳ වීය. යන්ත්‍රය ජප කිරීමට තෙමසක් කාලය ගිය නමුත් ඇගේ ගෙලවට තිබුණේ එක් රැයක් පමණි. පසුදා පාන්දර ගඟ අසලට ගිය ඈ යන්ත්‍රය අතට ගෙන ජලයට වීසි කලාය.

"ඇයි දුව උඹ මෙවැනි වැඩක් කෙළේ?" කියා ඇසීමටත් මව්පියෝ බියවූහ. කල්යාමෙන් මව්පිය දරු පරතරය තවත් වැඩි විය. නිර්මලා හුදකලාව ජීවිතය ගෙන යෑමට පුරුදු වූවාක් මෙන්ම මව්පියෝ ඒ වෙනුවෙන් ඇට සෑම සහයෝගයක්ම ලබා දින.

කල් යෑමෙන් නිර්මලාගේ අධ්‍යාත්මික ජීවිතයාගේ ක්‍රියාකාරීත්වය සහමුලින්ම ඇණ සිටියේය. ඈ කවුරුවත් විසින් සාදන ලද රූකඩයක් මෙන් ක්‍රියා කරන්නට වූවාය. ඇගේ සිතට නැඟී එන්නේ ශෝකාත්මක සිතුවිලි පමණක් බැවින් ඈ ඊට කිසි විටෙකවත් ඉඩ නුදුනි. සමහර විට වත්තේ නිදැල්ලේ හැසිරෙන සිව්පාවෙකු නැතහොත් කූඩුවක දඟලන කුරුළු පැටවෙකු දෙස ඇගේ සිත් ඇදී ගිය අවස්ථා බොහෝය. දිනක් වත්ත පහළ සිටි ඇට පෙනුනේ ගැරඬියෙක් කුරුළු කූඩුවක් වෙත ඇදී එහි සිටින පැටවුන් ගිල දැමීමට දරන වෑයමය. නිර්මලා වෙහෙස ගෙන ගැරඬියා එලවා දමා අඩක් කඩා වැටී



තුබූ කූඩුව සාදා බිම වැටී සිටි කුරුළු පැටවුන් ආපසු එහි තැබුවාය. මෙය බලා සිටි අතපත්තු මහතා ගේ ඇස් කඳුලෙන් තෙත් විය: "අනේ මගේ දරුවාට ගිය කල!" හේ සෙමෙන් කීවේය.

තවද වරක් නිර්මලා ගේ මව අසනීපයකින් කාමරය තුළට වී කෙඳිරි ගාන්ට වූවාය. නිර්මලා වහාම ඒ අසලට ගොස් ඇගේ තතු විචාරා ඇට සුදුසු ඖෂධ සපයා දුන්නීය. "අද අම්මා කාමරයෙන් එළියට එන්ට එපා. තාත්තාගේ වැඩ මම කරන්නම්." මෙසේ කී විට මව ලෙඩ අමතක කර දමා ශෝකයෙන් වැලපෙන්නට වූවාය. එපමණක්ද නොව සිය මවට නියමිතව තුබූ සෑම වැඩක් ම නිර්මලා නො පිරිහෙලා ඉටු කළාය. අතපත්තු මහතා දැන් දියවැඩියා රෝගයෙන් පෙළෙන්නෙකි. ඔහුගේ කෑම පිළියෙල කිරීම වෙනම කළ යුතුය. නිර්මලා ඒ බව දැන සිටියාය. ගෙදර දොරේ වැඩ කටයුතු නියම පිළිවෙළට සිය දියණිය අතින් ඉටුවනු දුටු පියා සිය දරුවා කෙරෙහි අධික ස්නේහයක් ඇතිකර ගත්තේය. එහෙත් මේ ප්‍රසන්නතාවය තාවකාලික සිදුවීමක් පමණය. මව්පියන් සහ නිර්මලා සදහටම වෙන් කොට තබන උස ප්‍රාකාරයක් ඇත්තේය. එම ප්‍රාකාරය සිඳ බිඳ දමා සිය දරුවා ළංකර ගැනීමේ සියුම් මාර්ගය ඔව්හු නොදත්හ. නිර්මලාද තමාට අත්වූ දුඃඛිත කාලයට තමාම වරදකරු කොට ගනිමින් ජීවිතය තමා වෙත එල්ල කරන ගැරහුම් සියල්ලට ම හිස පාත් කර සිටීමේ පිළිවෙත අනුගමනය කළාය. මෙයින් අසරණ ඇගේ තත්වය වඩාත්ම බරපතල විය.

යම් සේ දසත සුවඳ විහිදෙන අලංකාර පුෂ්පයක් පිපී හාත් පස සුවඳ විහිදීමට පෙර, යම් කෲර හස්තයක් විසින් කඩා දමා එහි පිට නොවූ අලංකාරයෙහි රසවිඳ, එයින් ප්‍රාණවත් වූ විගස නැවත එය දූටුවන් අල්ලා විසිකොට දමා පියයිද, මෙහි අලංකාරයත් සුවඳත් ගැන කිසිදු අවබෝධයක් නොමැති පාදවලින් එය පාගා දමයිද? එමෙන්ම ආලෝකයෙන් පැහැපත්

UPLOADED BY ELIFE

දසදිග පැතිර යන්ට තුබූ නිර්මලා ගේ රසවත් ජීවිතයද වැරදි ක්‍රියා නමැති කෲර හස්තයෙන් කඩා බිඳ දමා හාත්පස සිටිනවුන්ගේ හැරහුම් නමැති දූවිලි වලින් මුසුව විනාශ වෙමින් පැවැත්තේය.

ඊට. ඈට පිළිසරණ වන්නේ කෙසේ දැයි කිසිවෙකු නො දත්හ. ඈ වෙත එල්ල කළ වැරදි හැඟීම් නැමති කටු බැද්දෙහි ඈ තනිව පටලැවී අනේක දුක්වලට භාජන වූවාය.

* * *

නිර්මලා විවාහ වීමට කීප දිනකට පෙර නැව් නැඟී ලන්ඩන් බලා ගිය රංජිත් තුන් අවුරුද්දක් ලන්ඩන් විශ්ව විද්‍යාලයෙහි ඉගෙනීම හදාරා ගණකාධිකාරී උපාධියක් ලබා ගත්තේය. ඒ අවුරුද්දේම "පෙරළෙන ලෝකය පිළිබඳ ආර්ථික තත්වය" නමින් ලියැවුණ රචනාවක් අනුව එම මහතාට ලන්ඩන් විශ්ව විද්‍යාලයෙහි අර්ථ විද්‍යාව සම්බන්ධ විශාරද නාමයක්ද අත්විණ. මෙවැනි උසස් තත්වයක් කිසි දිනකවත් රංජිත් අපේක්ෂා නොකෙළේය. ඔහුට අත්වුන ගෞරව උපාධියත් සමඟම කීප තැනකින්ම උසස් රක්ෂාවන් ඔහු වෙත පිරි නමන ලදී. මේ සියල්ලම හෙතෙම ප්‍රතික්ෂේප කළේය. එදින රංජිත් ලංකාවෙන් පිටත්ව ගියේ ආපසු නොඑන බලාපොරොත්තුවෙන්ය. තමාට නිර්මලා අත්නොවූ අභාග්‍යයට වඩා තෙමේ කල්පනා කළේ නිර්මලාට අත්විය හැකි අවාසනාවන්ත කල දශාවය. නිර්මලා වෙනුවෙන් තමාට කිසිවක් කළ නොහැකි බැව් දත් හෙතෙම ගම රට අත්හැර ගොස් පසුගිය කාලය අමතක කර දැමීමට ඉටා ගත්තේ දැඩි සිත් වේදනා මධ්‍යයේය. තවමත් ඔහුට ලංකාවට ඒමට සිතක් නැත. මේ අතරම වාසනාව ඔහු කරා ගියේය. දිනක් ඔහුට එංගලන්තයේ ලංකා නියෝජිතයාගෙන් ලියමනක් ලැබිණ. එය තමාගේ අතටම භාරදෙන ලද්දකි. ලියමන ලැබුණු වහාම රංජිත් ලංකා නියෝජිතවරයා හමුවීමට ගියේය. "තමා

UPLOADED BY ELIFE



ලංකාවේ වෙළෙඳ නියෝජිතයා වශයෙන් බොම්බායේ කාර්‍යාලයට පත්කර ඇතැයිද, එය ප්‍රතික්ෂේප නොකොට යුතුයයිද, හෙතෙම කියා සිටියේය. අන් රටක සිටියදී වුවද සියරට වෙනුවෙන් ජීවිතය පුදා වුවත් සේවයක් කිරීමට ලැබේ නම් එය තමාගේ ජීවිතයෙන් ලබා ගත හැකි මහඟු ප්‍රතිඵලයක් බව කල්පනා කල රංජිත් මේ වෙනුවෙන් වචනයක් දීමට දින තුනක් කල් ඉල්වා ගත්තේය. තෙදිනකට පසු හේ තානාපති කාර්‍යාලයට පැමිණ එම පදවිය භාර ගත්තේය.

එම පදවිය නොලැබුණත් ලංකාව බලා ඒම ගැන රංජිත් මඳක් අකමැති කළේ, තුන් වසකට පෙර තමාට අත් වූ කනගාටුදායක තත්වය අමතක කිරීමට නොහැකි වූ හෙයිනි. සිය මවද දූන් ජීවතුන් අතර නොමැති හෙයින් ගමරට බලා ඒමට ඔහුට කිසිදු ආශාවක් නැත. මෙවැනි පදවියක් රංජිත් කිසි දිනකවත් අපේක්ෂා නොකළේය. ඉන්දියාවත් ලංකාවත් අතර කෙරෙන සෑම වෙළඳ ගිවිසුමකටම ඔහුගේ මොලය යෙදවීමට සිදුවිය. රැකියාව භාර ගන්නාතෙක් ඔහු මෙපමණ භාරදූර කාර්‍යයකට අතගැසීමට සිදුවේයයි සිහිනයකින්වත් නොසිතුවේය. එහෙත් තෙමසක් නිකුත් වන්නට පෙර ඔහුගේ කාර්‍ය සූරත්වයත් සහජ දක්ෂතාවයත් අවඩික භාවයත් රාජකාරිය ගෞරව සහිතව මුදුන් පෙත්තෙන්ම ඉටු කිරීමට මහෝපකාරී විය. ලංකාවෙන් ගෙන්වන බඩු වලට වැඩි මිලකුත් ඉන්දියාවේ සිට ලංකාවට එවන බඩු වලට අඩු මිලකුත් ලබාගැනීමෙන් ඔහු සිය රටට කළේ මහඟු සේවයකි. එමෙන්ම ලංකාවේ නිපදවන දේවලට වෙළෙඳ පළවල් ලබාගැනීම ගැන හේ යුහුසුළුව ක්‍රියා කළේය. මෙසේ දෙවසරකට පසු තමාගේ වැඩ කොතෙක් වැඩි වූයේද කිවහොත් තමාගේ සහායට ලංකාවේ පළපුරුදු සිවිල් සේවකයෙකු එවන ලද්දේය. පර්සි ගුණරත්න මහතා සිය බිරිඳත් දරුවන් දෙදෙනත් සමඟ බොම්බාය බලා පිටත්ව ගොස් උප වෙළඳ කොමසාරිස් ධූරයේ වැඩ භාර ගත්තේය.

කොතෙක් කායශිලී වුවද ඍජු ගුණයෙන් අග තැන් වුවද රංජිත් තේනබදු එක් කරුණකින් පමණක් අඩුපාඩුවක් දක්වීන. තෙමේ අවිවාහකයෙකු වූ බැවින් විදේශීන් සංග්‍රහයනට කාන්තාවෙකු සිය මන්දිරයෙහි නොමැතිවීම ගැන කවුරුත් කථා කරන්ට වූහ. ගුණරත්න මහතා විටින් විට රංජිත්ට මේ ගැන සඳහන් කළ නමුදු හේ නිහඬව සිටියේය. පසුව වෙළෙඳ ආයතනයට රැස්වූ ප්‍රභූ ජනයා රංජිත්ට විහිළු කරන්නට පටන් ගත්හ. කඩවසම් හොඳ පෙනුමකින් හා මෙතෙක් බලගතු උසස් රැකියාවෙක් ඇති තැනැත්තෙකු අවිවාහකයෙකු වී සිටි අවදියක් මීට පෙර කිසි කලෙක අසා නැතැයි ද, මෙහි යම් කිසි රහසක් ගැබ්වී ඇතැයිද අයෙක් කීහ. එංගලන්තයේදී සුදු කාන්තාවක් විසින් ඔහුගේ සිත පොරොන්දු කඩ කිරීමකින් වේදනා වී ඇතැයිද, තවත් කෙනෙක් කීහ. මේ සියල්ලටම රංජිත් සිනාසුනා පමණි. එහෙත් රංජිත්ගේ ජීවිතයේ බල පෑ සත්‍ය කාරණය කිසිවෙක් නොදත්හ. මෙසේ සවල්ප කාලයක් ගතවී ගියේය. රංජිත්ගේ තත්වය පෙරසේම විය.

අවුරුද්ද අන්තිමේදි විදේශ සංචාරය පිණිස ලංකාවෙන් පිටත්වූ ගුණරත්න මහතාගේ මාමා සිය පවුල සමඟ බොම්බායට පැමිණියේය. ගුණරත්න මහතාගේ නෑනා (බිරියගේ සොහොයුරිය) කඩවසම් විසි වයස් තරුණියකි. ඇ බෙහෙවින්ම බටහිර සංස්කෘතිය අනුගමනය කළාය. ඇ කවදා නමුත් විවාහ වන්නේ බටහිර චාරිත්‍ර ප්‍රිය කරන අයෙක් සමඟ පමණක් යයි විටින් විට කියා තිබේ. වෘද කුරේ මහතාද සිය දියණියට සහකාරයකු සෙවීමේ කාරිය බෑනණුවන් වූ පර්සි ගුණරත්න මහතාට පැවරීය.

සති දෙකක නිවාඩුවට පසු කුරේ පවුල ආපසු ලංකාව බලා පිටත් විය. චාම් දිවිපැවතුම් ගරු කරන නිහතමානී රංජිත් තේනබදු කොයි ආකාරයකින්වත් සිය නෑනාට නොගැලපේය යන්න ගුණරත්න මහතාගේ අදහසය. එහෙත් පෙරළා ලංකාවට ගිය කුරේ මහතා වහා සිය බෑණාට ලිපියක් යැව්වේය. සිය



දියණිය රංජිත් තේනබදු කෙරෙහි පැහැදී ඇති බවත් එවැනි විවාහයක් ඉතා මැනවයි තමාද සිතන බවත්, ඒ මහතා යම් විදියකින් කැමති කරවා ගතහොත් මුදලින් රුපියල් ලක්ෂ දෙකක් දෑවැද්ද දෙන බවත්, විවාහය ගැන මනාල මහතා කියන ඕනෑම දෙයකට තමා සතුටු වන බවත් එම ලියමනේ සඳහන්වී තිබුණි.

ලියුම ලැබුණු වහාම ගුණරත්න මහතා එම ලියමන රංජිත්ට පෙන්වා තතු විමසීය. ගුණරත්න මහතා මෙසේද කීය: "මගේ බිරිඳත් ඒ දවස්වල බටහිර චාරිත්‍රවලට ගැතිව සිටියා. එහෙත් අපගේ විවාහයෙන් පසු මම සුදුසු අන්දමට ඈ පෙරලා ගත්තෙමි. දූන් ඈ හොඳ බිරිඳක්. ආදරවන්ත මාතාවක්. ලීලාමනීද යම් කලෙක ඔබට සුදුසු පරිදි හැඩගසා ගත හැක. ඔබ මෙය ගැන කුමක් කියන්නේද"යි හේ විමසීය.

රංජිත් තේනබදු මඳක් කල්පනා කරන්ට වූයේය. අනතුරුව හේ මෙසේ කීවේය: "බිරිඳක් විවා කර ගැනීමේදී මා කිසි විටෙකවත් දායාදයක් බලාපොරොත්තු නොවෙමි. එහෙත් මගේ ජීවිතය ගෙන යෑමට සහකාරියක් නැති පාඩුව මට හොඳින් පෙනේ. මේ ගැන වචනයක් දීමට පෙර මා මඳක් සිතා බැලිය යුතුය."

සතියක් ඉක්මිණ. දෙවන වරටත් ගුණරත්න මහතා මේ ගැන රංජිත්ගෙන් ඇසීය. මාමා තමාගෙන් උත්තරයක් බලා-පොරොත්තු වන බව හේ ප්‍රකාශ කළේය. අන්තිමේදී ලීලාමනී කුරේ සමඟ විවාහ ගිවිස ගැනීමට තෙමේ කැමැත්ත ප්‍රකාශ කළේය. කිසිම උත්සවයකින් තොරව චාම් ලෙස විවාහ ගැනුම කරනු ඇතැයි රංජිත්ගේ අදහස විය.

කුරේ මහතා රංජිත්ගේ අදහස හිස් මුදුනින් පිළි ගත්තේය. රංජිත්ද යම්කිසි වෙළෙඳ ගිවිසුමක් සඳහා කොළඹට පැමිණි ගමන් සිය අනාගත සහකාරියගේ ගෙදරට ගොස් ඇඟිල්ලේ මුදුවක් දමා විවාහයට දිනයක් නියම කර ගන්නා පිණිස ගුවන්

UPLOADED BY ELIFE

යානයකින් කොළඹ බලා පිටත්විය. කුරේ මහතාද ප්‍රීතියෙන් ඉපිලගියේ රංජිත් බලාපොරොත්තුවෙන් සිටියේය.

පස් වසකට පසු සිය මව් බිමෙහි පාතැබූ රංජිත් තේනබදු මහතා ප්‍රථමයෙන් තමා මතක ඇති කල සිට ආදර භක්ති ප්‍රේමයෙන් වැඳ පිදූ කැළණි විහාරයට ගොස් තෙරුවන් උදෙසා මල් පූජා කිරීමට ඉටා ගත්තේය. මෙසේ රාත්‍රී දෙකට කටුනායක ගුවන් තොටුපළෙන් මව් බිමට පාතැබූ හේ කොළඹ මහ හෝටලයේ ලැගුම් ගෙන පසුදින උදේ අටට පමණ කැළණි විහාරය බලා පිටත්විය.

කැළණි වෙහෙර අසළට ළඟාවෙත්ම රංජිත් මහත් අපේක්ෂාවකින් වටපිට බැලීය. කිසිම වැඩි දියුණුවක් ඒ අවට පෙනෙන්ට නැත. කැළණිය වැඳ පුදා ගැනීමට ඈත සිට එන බැතිමතුන්ගේ මුදල් ගරාගැනීමේ ව්‍යාපාරයන්හි යෙදී සිටින මල්, ඉටිපන්දම්, හඳුන්කූරු ආදිය විකුණන්නෝද සැදැහැවතුන්ගේ මුදල් මංකොල්ලයෙහි යෙදී සිටින හිඟන්නෝද කිසිම අඩුවක් නැතිව සිටියෝය. විහාරය වැටී තිබූ දිරාපත් තත්වය ගැන හෙතෙම මහත් ශෝකයට පත්විය.

වේලාව උදේ නවයට පමණ ඇත. පොහෝ දිනයක් නොවූ බැවින් එහි රැස් කකා සෙනඟද නොසිටියහ. එහෙත් තෙල් මල් රැගෙන විත් මුනිඳු පුදන සැදැහැවතුන්ගෙන්නම් අඩුවක් නොවීය. නෙළුම් මල් කලඹක් මිලදී ගත් රංජිත් පාවහන් ගලවා මළුවෙන් පිටත තබා අසල ළිඳ ළඟට ගොස් පැන් දොහොනය කරවා තෙරුවන් පුදනු වස් විහාර ගෙට පා තැබීය. අසල මහා සණ්ඨාවෙන් පිටවන නාදයත් මුනිඳු පුදන්නාගේ මුව තුළින් පිටවන බුදුගුණ ගාථාත් සුළඟෙහි පාවෙන අමා මී මෙන් රසවත් විය. සැදැහැවතුන් විසින් දෝත පුරා ගෙනවුත් පුදන ලැබූ නානා වණී, සුවඳ විහිදෙන සුපුෂ්පිත පුෂ්පයන්ගෙන් පිරුණු මලසුන් සහ තැන් තැන්වල දැල්වෙන පොල්තෙල් පහන් මුනිපුද පිණිස මනුලොවට බට සුරඟනන්ගේ දිලිසෙන සළුපටෙක සිරි ඉසිලීය.



සකල ලෝකයා කෙරෙහි මෙත් කරුණා එකලෙස පෑ ඒ අමා මෑණියන්ගේ නේත්‍ර විලාශය දෙස බලත්ම අපරිමිත බුධාලම්බන ප්‍රීතියෙන් වෙලාපත් රංජිත්, "පූජේමි බුධං" යන ගාථාව කියමින් අත තුබූ නෙළුම් මල කලඹ මල් අසුන්හි තබා දොහොත් මුදුන්දී වැඳ බුදු මැදුරෙන් ඉවත්වීමට අඩියක් ආපසු ගත්තේය. ඒ සමඟම පුරුදු මුහුණක් තමා ළඟ ඇතැයි යන්න සිතට නැඟෙත්ම ඔහුගේ සකල ශරීරය කිළිපොලා ගියේය. සිය සිත් සතන්හී මෙවැනි ප්‍රාතිහාර්‍යයක් ඇතිවූයේ කෙසේදැයි විමසමින් රංජිත් ආපසු ගත් අඩිය එතැනම තබා ගල් ගැසී අවට සිටි බැතිමතුන් එකින් එකා පිරික්සන්නට විය. මා සිතට ආ රූපය කවරෙක්ද? ඇත්තෙන්ම ඒ රූපය මගේ සිතට ආයේ කෙසේද? "රංජිත් දැන් ඔය සිතේ ඇතිවන රූප මෙනෙහි කරන වේලාව නොවේ. ඔබට ඇත්තේ අන් දෙයකි." මෙසේ සිතමින් හේ වහා වික්ෂිප්තවූ සිත දමනය කිරීමට තැත් කළේය. ඒ සමඟම බලගතු ආකර්ෂණ ශක්තියකින් මොහුගේ නෙත් සඟල ක්‍රියා කරන්නට වූයෙන් සියල්ල ප්‍රත්‍යක්ෂ ලෙස පෙනෙන්නට වන.

මේ කව්ද? මඳක් ඈතින් සිටිය මේ කාන්තාව කව්ද? නෑ; නෑ; මේ මා තුළ ඇතිවූ මානසික ප්‍රාතිහාර්‍ය නොව මේ ඉන්නේ ලේ, මස්, ඇට, කටු, නහර යන දෙයින් සමන්විතවූ මගේ - මගේම .... අනේ මට කියන්න බියයි. අහෝ! මා ප්‍රථම වරට මව් බිමට පා තැබුවේ කුමටද? "රංජිත්! ආපසු හැරී ගමන් කරන්න. මෙතන රැඳී සිටීමෙන් ඔබට වැඩක් නෑ." ඔහුගේ සිත කියන්නට විය. "නෑ මගේ සිතතුළ ඇතිවන නානා විකාසනයන්ට ඉඩ දෙන්නේ නෑ." මෙසේ කියා සුශීලත්වය මඳක් අමතක කර දමා ආපසු ගත් පියවර ඉදිරියට තබා පසෙකින් සිටි කාන්තාව හොඳින් පිරික්සන්ට වූයේය.

දැන් ඔහුට ඇගේ මුහුණ නිසියාකාර පෙණේ. අපරිමිත මෛත්‍රී කරුණාවෙන් තෙත්වූ බුදුරදුන්ගේ නේත්‍ර යුග්මය දෙසට

UPLOADED BY ELIFE

ඇගේ අහිංසක බැල්ම යොමුවී තිබුණි. තමාට අත්වූ යම්කිසි ආපදාවකින් මුදාගනු මැනවයි කියන්නාක් මෙන් ඇගේ බැගෑපත් මුහුණ ශෝකයෙන් බරවී ඇත. හදතුළ ඇති ශෝගින්න පිටවනුවස් ඇ විටින් විට සුසුම් ලෑවාය. ඇගේ නෙත් යුවළ පිට නොවූ කඳුළු වලින් පිරී තිබිණ. රංජිත් ගල්ගැසී කුළුනක් අයිනට වී නිසොල්මන්ව බලා සිටියේය. "නිර්මලා! නිර්මලා!" ඔහුගේ හදතුලින් පිටවිය. "ඔබට කුමක් සිදුවීද?" ගතවූයේ සවල්ප වේලාවකි. නිර්මලා හුන් තැනින් නැගිට්ටාය. තව වරක් අභියාචනා කරන්නාක් මෙන් ඇ බුදුරදුන්ගේ නේත්‍ර යුග්මය දෙසට නෙත් යුවළ යොමු කළාය. පසුව සෙමෙන් සෙමෙන් බිම බලාගනම විහාර මන්දිරය වෙතින් පිටතට පා තබන්නට වූවාය. මැදි වයස් ස්ත්‍රියක්ද ඇගේ පසු පස ගමන් ගත.

තමා ළඟ ඇති කිසිවෙකු දෙසවත් ඇගේ නෙත් යොමු නොවීය. වරක් රංජිත්ගේ හුස්ම පවා ඇගේ ශරීරය පිරිමදින්නට ඇත. ඒ බව ඇ නොදත්තීය. මෙලොව කිසිවකුට සම්බන්ධ නොවූ අයෙකුගේ නිරපේක්ෂ විලාශයක් ඇගේ සියුමැලි මුහුණෙහි උද්ගතව පෙනිණ. ඇගේ වියළී ගිය කෘශවූ ශරීරය ඉදිරියට යත්ම එය රූකඩයක විලස් පාන්නට වන.

රංජිත් ගල් ගැසී විහාර ගෙයින් ඔබ්බට යන නිර්මලා දෙස බලන්ට විය. දැන් ඔහුගේ සිත වැඩ කරන්නේ අමුතුම ක්‍රමයකටය. වෙන මොනම සිතුවිල්ලක් වත් ඔහු සිතට නොනැගේ. "නිර්මලා ඔබට කුමක් සිදුවීද? මා මේ බව කෙසේ දැනගන්නෙම්ද?" සිතමින් හේ දිගු කල්පනාවක නිමග්න වූයේය.

* * *

දවස ගෙවී සන්ධ්‍යා කාලයද එලඹ හිරු බැස ගොස් අන්ධකාරය සීඝ්‍රයෙන් ඇතිවන්නට විය. රාත්‍රි කාලය ගෙවනුවස් කාකයෝ රෑන් පිටින් අහසේ උතුරු දෙස බලා පියාසර කරති. මොවුහු කැළණි ගඟේ මෝය අසල පිහිටි කපුටුදූව නම් කුඩා



දිවයින කරා පියාසර කරන්නෝය. ස්වභාව ධර්මයාගේ දරුපැටවුන් සියල්ලම වාගේ නිදි කිරන අවස්ථාවය. ඉරු බැස ගිය බැව් පෙන්වීමට ගඟ හරහා දමා තිබූ රත්පලස දැන් ටිකින් ටික හැකිලී යනු ඇත. ඒ වෙනුවට දැන් ඇත්තේ තැනින් තැන ස්වෙත වර්ණයෙන් දිලිසෙන දියරැලි පමණය. ගඟ අසල තැන් තැන්වල කොළඅතු අතර දවල් කාලයෙහි සැඟවී සිටි පලගැටි ආදි රාත්‍රි කාලයේ හැසිරෙන කෘමින්ගේ කාලය දැන් එලඹී ඇත. ඔවුහු පමණක් නිශ්ශබ්දතාවය බිඳ හෙලීමට තැත් කළෝය. අසල බක්මී ගස උඩට රොක්වූ වවුලෝ මහා ශබ්දකර පියාපත් සලමින් බක්මී ගෙඩි ඇද දමන්ට විය. දවල් කාලයෙහි අසල පුළුන් ගස උඩ බක තපස් රකිමින් සිටි වවුලන්ය, මේ සැරෙන් පියා පත් සලන්නේ! මෙතෙක් වේලා හිරුට බියෙන්දෝ අහස් ගැබෙහි සැඟවී සිටි තාරකාවෝ දීප්තිමත් ඇස් හැර පහත බලන්නට වූහ. සිය රැස් හකුළුවාගන සිටි චන්ද්‍රයාද ආකාශ මස්තකයට වී මහත් අභිමානයෙන් සිය රැස් අවට පතුරුවන්නට විය.

හිරු බැස යන්ට මඳ වේලාවකට පෙර උණ පඳුර යට අසුනේ ලැගුම්ගත් නිර්මලා තවමත් එතැනමය. අවට දර්ශනයෙහි අලංකාරයෙත් සිසිල්භාවයෙත් ඇට කිසිදු තේරුමක් නැත. ඇ තනිව හුදකලාව කාලය ගත කිරීමට ප්‍රිය කරන්නාක් මෙන්ම ඊටම ඔබින උණ පඳුර යට අසුනටද ඇ ප්‍රියකරන්නීය.

කාන්තාවක් තනිව මෙසේ සිටීම අස්වාභාවික නමුදු නිර්මලාටත් ගෙදර සෙසු අයටත් මෙහි අමුත්තෙක් නැත. හාත්පස ඇතිවන ශබ්දයකට බිය වන්නේ කුමක් කියාදවත් ඇ නොදනී. එමෙන්ම ඇට බියවීමටද කිසිදු කරුණක් නැත. මේ ස්ථානය කවදත් රක්ෂාවරණය ඇති බිම් පෙදෙසකි. සියඹලාගහ වත්තේ එන අයෙකුට පමණය මෙතැනට ඒමට හැකි වන්නේ! ගඟ හරහා හමන ශීත සුළඟ ඇගේ ගත පිරිමදිත්ම නිර්මලා ඒ අනුව හුස්ම ඉහළ පහළ ගත්තාය. අවට ඒ මේ අත පියාඹා යන

UPLOADED BY ELIFE

නිශාචර පක්ෂීන්ගේ හඬ විනා වෙන හඬක් නැත. රාත්‍රිකාලය නිශ්චල සැනසිලි ප්‍රබන්ධයකින් පිරී ගියේය.

උණ අතු පතරින් සඳරැස් බිමට පතිත වී සුළඟට සෙලවෙන නානා හැඩහුරුකම් ගත් කාලවර්ණ සෙවනැලි නිර්මලා සැනසීමට ආ ප්‍රසන්න භූතයින් සමූහයක සිරි ඉසිලීය. සුදු වතින් සැරසී සිටි නිර්මලාද මහත් ගැඹුරු කල්පනාවෙක සිටින්නාක් මෙන් ඈත බලා සිටියාය. ඈ අසුනට ළඟාවූ අවතාරයක් නොවන බව හැඳින්වෙන එකම ලක්ෂණය ඇගේ සෙලවෙන නෙත් යුවළ පමණය.

පළමුව ඇගේ පිටුපස යම්කිසිවකුගේ අඩි ශබ්දයක් දැනෙන්නට වන. ඒ අන් කිසිවකු නොව මර්තිනා විය හැකියයි ඈ සිතා ගත්තාය. ඒ අතරම හද පැළීයන ශෝකාත්මක ශබ්ද විලාශයකින් කව්දෝ ඇගේ නම කියනවා ඇසින.

"නිර්මලා! නිර්මලා!!" එය පුරුදු කටහඬකි.

"අනේ ඔබට කුමක් සිදුවීද? ඔබ තනිව මෙතන කුමක් කරනවාද?" සිය කන්දෙක විශ්වාස කරන්ඩ බැරිවූවකුසේ නිර්මලා තිගැස්සී පිටු පස බැලුවාය. එකෙණෙහි ඇගේ සර්වාංගයම කිළිපොලා යත්ම යම් කිසිවෙකු ඇගේ දෙනෙතට ලක්විය.

"රංජිත්! රංජිත්!!" ප්‍රථම වරට ඈ බියෙන් මෙන් කථා කළාය. තමා ඉදිරියේ ඇති, රූපය තවත් අඩියක් ඉදිරියට ගත්තේය. භයින් මිරිකෙන මෘග පෝතකයෙකුමෙන් නිර්මලා හැසිරෙන්නට වූවාය. ඈ කතා කළේ ඉතා අමාරුවෙනි.

"කියන්න, ඔබ රංජිත්ද? නැතහොත් මා බිය වැද්දීමට එන අවතාරයක්ද?" නිර්මලා අසත්ම, සෙමින් තව අඩි දෙකක් ඉදිරියට විත් නිර්මලා පසෙක රංජිත් සිට ගත්තේය. "මා අවතාරයක් නොවෙයි. නිර්මලා! භය වෙන්න එපා. මා රංජිත්, එදා ඔබෙන් වෙන් වූ රංජිත්! ඔබට මා අඳුනන්නට බැරිද? ඇයි නිර්මලා, මා දැක ඔබ බියෙන් මෙන්?"



දූන් නිර්මලාට කථා කළ නොහැකිය. ඈ ගල්ගැසී බලා සිටියාය. ජලයෙන් ඉවත්කළ පරඬැල් රාශියක් මෙන් වියළිව තුබූ ඇගේ හස්තය රංජිත් අල්වාගෙන ඈට සෙමින් කථා කරන්නට විය.

සිය හස්තය රංජිත්ගේ අත්ලෙහි රඳවත්ම මෙතෙක් කල් වියළී ගිය ඇගේ රෝම කූපයෝ පවා එකිනෙක පණ ලබන්නට විය. ඇගේ මුළු ශරීරයටම අමුතු ප්‍රාණ ජීවයක් ලද්දාක් මෙන් දැනෙන්නට වන. වියළී ගිය සෑම නහරයක් පාසාම නව ජීවය නැමති අමෘතය ගලායන්නට වූයේය. ඇගේ නෙත් යුවළට කඳුලෙන් පිරී නිරායාශයෙන්ම කඳුළු ධාරාවෝ ගලාවුත් මෙතෙක් දිරාපත් භාවයට පත්ව තුබූ කම්මුල් තෙමූහ. රංජිත්ගේ අත්දෙක සිය මස්තකය වෙත ගෙනයමින් ඈ ඉකිගසමින් හඬන්ට වූවාය. රංජිත් ඇගේ කන දෙසට නැඹුරු වී ඈ සනසන්නට විය.

"නිර්මලා හැඬීම නවත්වා මා සමඟ කථා කරන්න. ඔබ මෙතෙක් කල් හඬා වැලපුනා ඇති. මා ආවේ ඔබ මේ දුකින් බේරා ගැනීමටයි."

නිර්මලාද හඬමින් වැලපෙමින්ම කථා කරන්ට වූවාය. "එසේනම් රංජිත් වහා මෙතනින් ඉවත්වන්න. මට පැමිණි තිබෙන විපතින් මා බේරා ගැනීමට සමතෙකු මේ මිහිපිට නෑ." මෙසේ කියා තව වරක් ඈ හඬන්ට වූවාය.

"මට එදත් ඔබව බේරාගන්ට තුබුණා. අදත් පෙර සේම පුළුවනි." මෙසේ කියා රංජිත් අතීතය මනැසින් බලා සුසුම් හෙළීය.

UPLOADED BY ELIFE

කඳුලින් පිරි නෙත් යුවළ මඳක් ඔසවා නිර්මලා රංජිත් දෙස බලා මෙසේ කීවාය. "ඔබ මට සිදුවූ විපත කුමක් කියාදවත් නොදැන, මා බේරාගැනීම ගැන කථා කරන්නේ කෙසේද? අනේ රංජිත් මට සිදුවූයේ කුමක්ද? කියා මමවත් දන්නේ නෑ."

"නිර්මලා ඔබට සිදුවූයේ කුමක්ද කියා මා දන්නවා. මම මේ බව දැන සිටියා. ඉදින් එදා මම ඒ බව කීවානම් කවුරුත් මා පිළිගන්නේ නෑ."

"රංජිත් දැන් ඔබ ආවා ප්‍රමාද වැඩියි. වහා මෙතනින් ඉවත්ව යන්න. මා වෙනුවෙන් ඔබට කළ හැකි කිසිවක් නෑ. මේ මොහොතේ මා බේරා ගැනීමට තැත් කිරීමෙන් ඔබත් අන්තරාවට පත්වෙනවා විතරයි, යම්කිසි උවදුරකින් ඇත් වන්නාක් මෙන් මා අත්හැර යන්න. මා දුක් විඳින්නේ මගේ කම්ඵල විපාකය අනුවයි. ඊට ඔබ හවුල් වන්නේ කුමටද?"

"නිර්මලා! මා දැන් ආවේ ඔබ මෙතනින් රැගෙන යන්ඩයි. ඔව්, අර පෙණෙන ඔරුවෙන් අප දෙදෙනා ගඟ හරහා යමු." රංජිත් එඩිතරව කියා සිටියේය.

"ඔබ ආවේ මා රැගෙන යන්ඩ?" නිර්මලා මෙසේ කියමින් ඇගේ විශ්මයානුකූල මුහුණ රංජිත් දෙසට හරවා ඔහු දෙසම බලා සිටියාය.

ගස් අතු පතරින් සිදුරු වී චන්ද්‍ර කාන්තිය ඇගේ මුහුණ මත පතිත වීමෙන් ඇගේ ශොභාව තව තවත් ප්‍රබෝධමත් කෙළේය.

"ඔබ මා රැගෙන යන්ටයි ආවේ?" තව වරක් ඇගේ මුවින් නික්මින.

"ඇයි නිර්මලා ඔබ මේ තරම් පුදුමයෙන්මෙන්, මා ආවේ ඔබ රැගෙන යන්ඩයි. ඔබට ලබා ඇති අඳුරු කාලයෙන් ඔබව මුදු ගන්ටයි."



නිර්මලා සුසුම්ලෑවාය. "මට ලබා ඇති අඳුරු කාලය නැති කිරීමට සමතෙක් නෑ. එයින් මට ගැලවීමෙක් නෑ. අනේ රංජිත් ඔබ දැන් මෙතනට ආවේ ඇයි? මේ ඔබගෙන් අපලයක් වත්ද?"

"නිර්මලා මතකද එදා ඔබට දුන් ප්‍රතිඥාව? ඔබට යම්කිසි විපතක් පැමිණුනහොත් මා ඔබ ළඟට එනවා කීවා මතකද? නිර්මලා! ඒ පොරොන්දුව ඉටුකිරීමට මා මීට කලින් එනවා. මේ කිසිවක් මා දැනගන සිටියේ නෑ. පස් අවුරුද්දකට පසු මා ලංකාවට පා තැබූයේ ඊයේ රාත්‍රියේ පමණයි."

නිර්මලාගේ හිස ඉබේටම සැලෙන්නට විය. "ඔව්, ඔව් මට මතකයි. එදා පස් අවුරුද්දකට කලින් ඔබ මා බේරාගැනීමට ඉදිරිපත් වූ විට මා ඔබ පිටුපා ක්‍රියා කළ හැටි මට හොඳට මතකයි." මෙසේ කියත්ම කඳුළු ධාරාවන් නොකඩවා ඇගේ නෙත් වලින් ගලන්නට විය.

රංජිත් ඈ ළඟින් වාඩි වී ඇගේ අත් දෙක අල්වා සිය ලය මත තබා ගත්තේය. "ශෝක නොවන්න නිර්මලා! ඔබ එදා පිටුපා ක්‍රියා කළාට මම වඩාත් ඔබට ආලය කරනවා."

"රංජිත් ඔබ මට තවත් ආලය කරන්නේ කෙසේද? මා එදා ඔබ රැවටුවා නොවේද?"

"නිර්මලා! ස්ථිර ආලය අමරණීයයි. එය කිසිකලෙකවත් නැති වී යන්නේ නෑ."

ඈ කඳුළු සැලීම මඳක් අත්හිටුවා මෙසේ කොඳුරන්ට වූවාය. "රංජිත් එදා පටන් ඔබ තුළ තුබූ අනුකම්පා සහගත සිත දැන් මාවෙත ඇතිකරගෙන තිබෙන නමුදු එය ස්ථිර ආලයක් වන්නේ කෙසේද? මගේ සැබෑ තතු ඔබ නොදන්නවා වෙන්ට පුළුවනි. මා මානසිකාරෝග්‍ය ශාලාවකින් පිටමං කරනු ලැබූ අයෙක්! මට සමාජයේ කිසිම ඉඩක් නෑ. බලන්න මගේ අත්දෙක, දිරාපත්ව

UPLOADED BY ELIFE

නහර මතුවී වියළී ගිය මේ අත් දෙක ගසකින් වෙන්වී ගිය කෝටු කැබලි දෙකක් වාගේ නොවේද? මුහුණේ වළ තුල ගිලී ගිය මගේ ඇස්දෙක දෙස බලමින් කෙසේ ඔබ ආලය ගැන සඳහන් කරන්නෙහිද? ඔබ ආදරයෙන් පිරිමැදපු මගේ කෙස්වැටියවත් දැන් මට නෑ. රංජිත් ඔබට වැරදීමක්. ඔබ මට ආලය කරන්නේ නෑ. මගේ බැගෑපත් තත්ත්වය දෙස බලමින් ඔබ මට සමච්චල් කරනවා, පමණයි. වහා මෙතනින් ඉවත්ව යන්න, අසරණ භාවයෙන් පතුල දක්වා සිඳීගිය මගේ සිතෙහි ඔබට ඉඩක් නෑ." මෙසේ කියා අසුන මත ඇගේ හිස තබා ඉවත බලා ගත්තාය.

"නිර්මලා!" රංජිත්ගේ හඬ දැන් මහත් ආයාචනයෙකි. " පස්වසරකට පෙර තුබූ සුකුමාල හස්තය නොවේද දැන් වුවද ඔබට ඇත්තේ? සත්‍යතාවයෙන් උතුරාගිය බැල්මක් ඇති නෙත් යුවළ නොවේද ඔබට දැනුත් තිබෙන්නේ! එද අපි දෙදෙන එකිනෙකා කෙරෙහි ඇති කරගත් ප්‍රේමය නොවෙද දැනුත් අප තුළ ඇත්තේ. නිර්මලා කථා කිරීමෙන් කාලය ගෙවී යනවා පමණයි. ඉක්මන්කර මා සමඟ යෑමට සතුටුවන්න."

"අහෝ, රංජිත්! මගේ අසරණකම මට තනිව ගෙනයාමට ඉඩ නොදී ඔබ මෙතනට ආවෙ කුමන පාපයකටද?"

"කෝ ඔබේ පියා?" රංජිත් ප්‍රශ්න කෙළේය.

"අම්මාත් තාත්තාත් ඊයේ සවස අනුරාධපුරය බලා ගියා පොසොන් වඳින්ටය කියලා, මටත් අඬගැසුවා, මම කැමතිවූයේ නෑ."

"ඔබ තනිව දමා දෙමව්පියන් එහෙමෙහෙ යනවා?"

"මට තනිව ඉඳලා හොඳට පුරුදුයි. මට හිතුනොත් අනුරාධපුරයට වුවත් තනියම යෑමට බැරි නෑ."



"ඔව් නිර්මලා! ඒ බව නම් මට පේනවා. තනිව හිඳීමෙන් ඔබේ ජීවිතය නසාලන පිළිකාවකින් දැන් ඔබ පෙළෙනවා."

"තනිව ඉඳීම මට දැන් ලොකු ප්‍රීතියක්"

"ඔව් වෙන කුමක් කියා ඔබ සිත සනසා ගන්ඩද? නිර්මලා! මා සමඟ එන්ඩ, අප දෙදෙන එකතුව ජීවිතයේ සැඩ පහරට මුහුණ දෙමු. අවසාන වරටත් මා විශ්වාස කරන්න. ඔබ නොමැති මගේ ජීවිතය හිස් පාළු ගෙයක්! මේ අවුරුදු පහ තුළ මා විවාහ නුවූයේත් ඔබ මගේ සිතින් ඉවත්කර ගැනීමට බැරිවූ නිසයි."

"රංජිත්! මා විවාහ වූ තැනැත්තියෙක්. එමෙන්ම ජීවිතයේ කටුක අවස්ථාවන්ට මුහුණ දුන් තැනැත්තියෙක්. එසේවූ අසරණ මා ජීවිතයාගේ එලබරින් පිරීගිය ඔබ වැන්නකු සමඟ කෙසේනම් එක්ව විසිමුද?"

"නිර්මලා මේ ගඟ දෙස බලන්න. කාලයාගේ ඇවෑමෙන් එහි කිසිම අඩුවක් සිදුවී තිබේද? එහි ජලය පෙරටත් වඩා වැඩියෙන් පහළට ගලා යන්නේ නොවේද? ආලයත් මේ ගංගාව වගේමයි. කල් යන්ට යන්ට අසරණ වෙන්ට වෙන්ට නියම ස්ථිර ආලය වැඩි වැඩියෙන් උජ්ජලිත වන්නේය. මෙහි සත්‍යය අපි වටහා ගනිමු."

"නිර්මලා ඔබ මට දැන් ආලය නොකරන්නෙහි නම් මා ගැන අනුකම්පා කරන්න." මෙසේ කියත්ම ඔහුගේ හඬ ලය පලායන තරම් ශෝකාත්මක විය. නැවතත් නිර්මලාගේ දෙනෙතින් කඳුළු ගලන්නට වූයේය.

"රංජිත්! ඔබේ ප්‍රේමය ලබාගැනීමට මට කිසිදු අයිතියක් නෑ. මා ඔබ සිතන තරම් සත්‍යවාදි නෑ. අහිංසක නෑ. සිහිවිකලත්වයෙන් පෙළෙන එක් අවස්ථාවක ඔබයයි වරදවා සිතා මා මානසිකාගාරයෙහි එක් දොස්තර කෙනෙකුට ආලය කළා. එය මට සිතෙන විටත් ලැජ්ජයි."

UPLOADED BY ELIFE

රංජිත් නිර්මලා තවත් ළංකොට ගත්තේය. "ඔබේ පියා ඔබ වෙනුවෙන් කළ එම සුදුසු ක්‍රියාව නම් ඔබට, 'නිර්මලා' කියා නම දමූ එක පමණයි. නිර්මලා නිර්දෝෂභාවයෙන් ලෙලදෙන මගේ පුෂ්පය! ඔබ මේ කුමක්ද කියන්නේ? සිහිමඳ අවස්ථාවකදී සිදුවූ වරදට ඔබ කුමක් කරන්නද? අද උදේ විහාර භූමියෙහිදී ඔබ දුටුයේ නැතිනම් මමද එක්තරා නාඳුනන කාන්තාවක් සමඟ විවාහ ගිවිස ගැනීමට බලාපොරොත්තුවෙන් සිටියා. එහෙත් එය ප්‍රේමය මුල්කරගත් විවාහයක් නොවේ.

මෙතෙක් වේලා නිදිමෙන් තුබූ ඇගේ සිත හදිසියෙන් ප්‍රබෝධමත් විය. ඈ හිස ඔසවා මහත් සේ ඇස් ඇර රංජිත් දෙස බලන්නට වූවාය. "ප්‍රේමයෙන් තොරවූ විවාහයක්? ඔබ නො හඳුනන කාන්තාවක්! රංජිත්! එසේ නොකළ මැනව. මා ඔබට ආදරෙයි. ඔබ යන්නේ කොහේද? මාද ඔබ පසු පස ගමන් කරනවා. මගේ ජීවිතය ඔබේ ජීවිතයෙන් කොටසක් වෙත්වා! කියා මා ප්‍රාර්ථනා කරනවා. මා ඔබ කෙරෙහි ඇති ආලයෙන් අල්ප මාත්‍රයක් වත් අන් ස්ත්‍රියක් ඔබට පුදන්නේ කෙසේද?"

"ඔබට කරුණු තේරුම් ගියේ දැන්ද? නිර්මලා! මෙතෙක් කල් මහත් කෲර අන්දමින් අප වෙන් කළ දෛවය නැවත වරක දැඩි ප්‍රේමයෙන් අප එක් කලා නොවේද? අපි දෛවයට තුති පුදමු."

ඈත යම් කිසිවකු ගේ හඬක් ඇසිණ. රංජිත් කලබල විය.

"කලබල වෙන්ට දෙයක් නෑ රංජිත්, ඒ මර්තිනා, මගේ සේවිකාව ගේ කට හඬ. ඈ මා ළඟට කවදාවත් එන්නේ නෑ.

"ඔබ කොපමණ වේලා මෙසේ සිටිනවාද?" රංජිත්ගේ ප්‍රශ්නය විය."

UPLOADED BY ELIFE



"හඳ ඇති දිනවල මම ආපසු ගෙදර යන්නේ බොහෝ රෑ වූවාට පසුවයි. මම ගෙදර ගිහින් කුමක් කරන්ඩද?"

රංජිත් සියල්ල තේරුම් ගෙන සුසුමක් හෙළීය. "නිර්මලා! අපි රෑ වනතෙක් මෙතන සිටින්නේ කුමටද? අර පෙනෙන ඔරුවේ නැඟී ගඟ හරහා ගොස් අපි එගොඩ වෙමු. ඔව්, මොහොතක් වත් ප්‍රමාදවන්ට වුවමනාවක් නෑ. දෛවය ඉතා චපලයි. වරක් හොඳ මුහුණ පෙන්වතොත් වරක් නරකක් කිරීමට තැත් කරයි."

ඒ මොහොතේ රංජිත් තමාට දුන් අත තරයේ අල්වා ඔහු කී ආකාරයට ඔරුවේ නැඟී ගඟින් එතර වූවා නම් සුරංගනා ලොවෙක සිදුවන කථාවක් මෙන් රසවත් ලෙස මොවුන්ගේ විවිධ සිද්ධීන්ගෙන් යුක්තවූ කථාවත් නිමවන්ට ඉඩ තිබුණි. රංජිත්ගේ අකමැත්තෙන් ම නිර්මලාගේ සිතට තවත් අදහසක් ඇති විය.

"රංජිත්!" ඇගේ කට හඬ පැහැදිලි විය. "අප මේ වේලාවේ ගඟ හරහා යාමට කලබල වන්නේ කුමටද? මම අද රෑ ගෙදර නැවතී හෙට රෑ ඔබට හමුවීමට එන්නම්."

"නිර්මලා! ඔබට කුමන අදහසක් මේ මොහොතේ ආවාද? කාලයා විසින් අප වෙන් කිරීමට ඉඩ තබන්නේ ඇයි? අහෝ නිර්මලා! ඔබ මා කීවරක් හිස් අතින් ආපසු අරින්නද?"

"රංජිත් ඔබ එදා මගේ පියාට කී දෑ මට මතකයි. ඔබේ දුව රැගෙන යාමට කිසි දිනකවත් මම ගඟින් එතර වන්නේ නෑ කීවා. එය ඔබට අමතක වෙලාද?"

"ඒ එදා, නිමාලි! එදා සිට අද වනතෙක් මේ ගඟේ ජලය කොපමණ මුහුදට ගලා ගොස් ඇතිද?"

"ඔබට මේ වචනය කඩ කිරීමට මම ඉඩක් තබන්නේ නෑ. හෙට රෑ ඔබ සොයා ගඟින් එතර වන්නේ මමයි."

රංජිත් භ්‍රාන්ත විය. "ඔබ මා සොයා එන්නේ කෙසේද?"

"පුදුම වන්න එපා, රංජිත්! මගේ ජීවිතය මුහුණ පෑ අවසනාවන්ත කාලයත් සමඟම මගේ පුද්ගලික නිදහසත් අත්වූවා. දැන් මට අණ දීමට කිසිවකුත් නෑ. මම මගේ ස්වාමියා." මෙසේ කියත්ම වචන ගිලී කඳුළු මැද යට පත් විය.

"නිර්මලා ඔබේ ඒ නිදහස මා වෙත පුද මා සමඟ දැන් එන්න. මොහොතක් වත් ඔබ හැර යාමට මම බියයි."

"රංජිත් ඔබ මා අවිශ්වාස කරනවා නොවේද? වරක් ඔබ මා රැවටු නිසා ඔබ මා ගැන සැක හිතනවා."

"එසේ කියන්ඩ එපා නිර්මලා! අන්‍යොන්‍ය ප්‍රේමය නමැති ආලෝකය මධ්‍යයේ අවිශ්වාසය නමැති අඳුරට කිසිදු ඉඩක් නැහැ. මා තුළ ඇත්තේ එක්තරා බියක් පමණයි. අපට මෙතෙක් ඉඩ දුන් දෛවය හෙට කුමක් කරයිද යන සැකය පමණයි මා තුළ ඇත්තේ."

"අප දෙදෙනා වෙන් කරන්නේ මේ ගංගාව පමණයි. ඉදින් අප බිය වන්නේ කුමටද? හෙට රෑට ගඟ ඉහළ ඇති ඇටඹ ගහ තොටුපොළ කැළණි විහාරයට එන පොසොන් වන්දනා කරුවන් ගෙන් පිරිල ඇති. රෑ දහයට පමණ මමද ඒ සැදැවතුන් සමඟ එන්නම්. ඔබ ගඟින් එගොඩ ඇති නුග වෘක්ෂය ළඟ මා එන තෙක් බලා සිටින්න."



වෙනදටත් වඩා වේගයෙන් අහස් කුස මුදුන් වූ චන්ද්‍රයා සිය රශ්මි මාලාව පෙම්වතුන්ගෙන් මුහුණු නාවමින් තුරුලිය අතු අතරින් එබී බලන්ට වූවාය.

වියෝ වීමට අකමැත්තෙන් වුවද දෙදෙනම හුන් තැනින් නැගිට අඩි කීපයක් වැල්ලදෙසට ගමන් ගත්හ. "ගඟේ පළලත් කාලයාගේ දිගත් දෛවයේ බලපෑමත් අපව තව වරක් ඈත් කිරීමට තැත් කරනවා නොවේද? නිර්මලා! සෑම බාධකයක්ම අභිබවා ඔබ මාවෙත එනවා නොවේදැ"යි රංජිත් අවසාන වරට ද ඇගෙන් ප්‍රශ්න කෙළේය.

"අපි සෑම බාධකයක්ම අභිබවා සටනින් ජයගනිමු. චන්ද්‍රයා අහසේ පායා අප වෙත අනුකම්පාවෙන් දක්වන රශ්මි ධාරාවන් සත්‍ය නම් මා ඔබ වෙත එන ගමන වැළැක්විය නොහැක."

"අද ඇතිවී තව දවසක අඩුව නැතිවී යන චන්ද්‍රයා ගේ රශ්මි ධාරාවන් දෙස බලා ඔබේ ස්ථිර තාවය දක්වෙන්නේ කෙසේද?" රංජිත් අයැදීය.

"එසේ නම් මගේ අවංක භාවය කෙසේද ඔබට අඟ වන්නේ?"

"නිර්මලා! මේ ගඟ දෙස බලන්න. අප කුඩා කල සිටම ආදරයෙන් නැලවූ, අපේ දුක් සැප සියල්ල ගැන යථාවබෝධයක් ඇති අපගේ ඇස් වලින් ගලා ආ කඳුළු මුසුවී ඇති මේ ගඟේ ජලය දෙස බලා ඔබේ අවංක ස්ථිර භාවය ප්‍රකාශ කරන්න."

කුඩා දරුවකු මෙන් නිර්මලා රංජිත් අසල තුරුළු වී ගඟ දෙසට නෙත් යොමු කළාය.

"යම් සේ මේ ගඟ නොවෙනස් පිළිවෙතින් මුහුද කරා ගලායයිද, එසේම දැඩි අධිෂ්ඨානයෙන් හෙට රෑ මා ඔබ සොයා

UPLOADED BY ELIFE

එන්නෙමි. මා ඔබ ළඟට නො ආවොත් මේ ගඟද ආපසු හැරී ගලා යනු ඇත."

සඳ දෙව්දුව පෙම්වතුනට ඉඩ දෙනු වස් දූඩි කළු වලාකුළු පලසකින් සිය දේහය වසා අවට අඳුරු තාවයක් පතුරුවන්ට වූවාය. දූන් පෙම්වතුන් අතර සිදුවූ දේ විස්තර කිරීමට සුදුසු රසවත් වචන නොමැත.

"රාත්‍රියේ අන්ධකාරය කොතෙක් දූඩි වුවත් කිමද? උදවන්නේ සූර්‍ය්‍ය ලෝකයෙන් නම්" රංජිත් ඇගේ කනට කොඳුරන්නට වූයේය.

"අපව තව මොහොතකින් වෙන් කරන මේ විසිහතර පැය මට අතේ පිඩු කොට ගන්න ඇත්නම්! කාලයේ වේගය දශ ගුණයෙන් සිය ගුණයෙන් වැඩි කරන්ට ඇත්නම්! අහෝ ඔබ නොමැති මේ දවස මා ගෙවන්නේ කෙසේද?"

"ඉවසන්න රංජිත්! ඉවසන්න. පස් අවුරුද්දක් වියෝ වීමෙන් අධික පීඩනයට භාජන වූ අපට එක දවස කාරියක්ද?" ආලයෙන් පිනාගිය නිර්මලා සිය පෙම්වතා සනසන්නට වූවාය.

දෙවන වරටද කටහඬ ඇසුනි. දූන් ඇසෙනුයේ මඳක් කිට්ටුවෙනි. "හාමු කවදාවත් මෙච්චර පරක්කු උනේ නෑ. දූන්නම් පේන්ඩත් නෑ."

"එනවා මර්තිනා! ඉක්මනට එනවා" නිර්මලා කියත්ම රංජිත් සිය හස්තය දූඩි අකැමත්තෙන්ම වෙන් කොට වහා ගඟ අසලට ගොස් ඔරුව දියට දමා ගඟ හරහා පදවන්නට වූයේය.

නිර්මලාද වරක් සන්තාපයෙන්ද වරක් අභිමානයෙන්ද ඔරුව නොපෙනී යන තෙක් බලා සිට ආපසු වලව්ව දෙසට ගමන් ගත්තාය.



එදින මුළු රාත්‍රියේම නිදි වර්ජිත නිර්මලා සයනයට වී අතීත ස්මරණය නැමති සාගරයෙහි කිමිදෙන්නට වූවාය. ඈට පසුගිය සිද්ධීන් නැවත සිහියට නැගෙන්නේ අධික ප්‍රමුදිතාවයකින්ය. ඈට යම්තම් නින්ද යනවිට වේලාව හතරත් පසුවිය.

පසුදින අමුතු පණක් ලද්දාක් මෙන් නිර්මලා අවදි වූවාය. අවදි වූ විගස තමා රංජිත් ඉදිරියේ පොරොන්දු වූ භාරදූර කාර්‍ය්‍යය සිතට නැගින. කෙසේ නමුත් රෑ දහයට පමණ ඈ අනිකුත් වන්දනා කරුවන් සමඟ ගඟින් එතර විය යුතුය. ඒ සමඟම ඈට කදිම උපායක් පහළ විය. එනම් වෙස් වලාගෙන රංජිත් අසලට ගියහොත් මැනවැයි යන කල්පනාවය. ඇගේ කෙසේ වැටිය ඉතා කෙටි කර කපා දමා ඇති බැවින් ඈට ලෙහෙසියෙන්ම පිරිමි වෙසක් ගත හැකිය. ඊට සරිලන ඇඳුම් කට්ටලයක් ඈ සොයන්ට වූවාය. වාසනාවකට මෙන් ඇඳුම්ද ඈ ඉදිරියේ තිබිණ. වෙසක් මස ගං වතුරෙන් අනාථ වූ දුගී ජනයාට බෙදාදීම සඳහා විශාල ඇඳුම් පාර්සලයක් කොළඹ සමාජ සේවක ආයතනයකින් ලැබී තිබිණ. එම පාර්සලය දිග හැර අත් දිග කමිසයක් සහ කලිසමක්ද තෝරා ගත්තාය. පාන්දරින්ම ඈ දොර අගුල් දමා ඇඳුම් කුට්ටම හැඳ කැඩපතින් බැලුවාය. නිර්මලාට විශ්වාස කිරීමට බැරි තරම්ය. කැඩපතින් පිළිබිඹු රූපය කෙට්ටු හීන්දෑරි ඉලන්දාරියෙකුගේ මිස වෙස් වලාගත් කාන්තාවක් බව කාටවත් කිව නොහැකිය.

වෙස් වෙලාගෙන සිය ගෙදරින් නික්මීම නම් කිසිසේත් කළ නොහැක. ගෙදර සිටින සෑම වැඩ කරුවෙකුම ඈ දෙස අමුතු ආකාරයකින් බලති. මර්තිනාද පාන්දර සිටම ඈ පසු පසමය. ඈද සිය ස්වාමි දුවගේ විපරිත දර්ශනයක් දක්නට ඇත.

UPLOADED BY ELIFE

මෙතෙක් තමාට එරෙහිව සිටි තවත් දෙයක් නම් අහස වැසි වලාවන්ගෙන් බරවී තිබීමය. උඩහ වැසි ඇතිවීමෙන් ගඟ ඉතිරී යන බව කියනවා තමාට ඇසුණි. ගඟේ කොතෙක් වතුර වැඩි වූවත් වන්දනා කාරයන්ගෙන් නම් අඩුවෙක් නැත.

උදාවූ ඒ දිනය නිර්මලාට කාලාන්තරයක් මෙන් දිගු විය. පුරා පැය දෙළහක් අහස් ගැබ මත සැරිසැරූ ගමන් ගත් සූර්යයාද ක්ෂිතිජය මත මැලි කමින් රැඳෙන්නට වන. කෙටි තාප්පය අසලට අන්තිම වරට ගිය ඇ ක්ෂිතිජය මත තුබූ මඳ එළිය දෙස බලමින් මෙසේ කීවාය. "නැවෙන්න, හිරු දෙවියනි, බැස නොගොස් ඔබට වුවමනා වේලා රැඳී සිටින්න. ඔබ මට දඬුවම් කරන්ට තැත් කරනවා නොවේද? එහෙත් හෙට උදෑසන ඔබ දෙස මා බලන්නේ ඔබේ තේජස් සියල්ල මැඩ ගෙන බව දැනගන්න."

එදින සවස නිර්මලා අනුරාධපුරයට යෑමට උවමනා බව වැඩ කාරියට කියා සිටියාය. මර්තිනාද ඒ අනුව ගමන යෑමට ලැස්ති වූවාය. අනුරාධපුරයට පළමු වැනි පඞ්ක්තියේ ප්‍රවේශ පත්‍රයක් ගැනීම පිණිස සැමී ලහි ලහියේ දුම්රිය පළ බලා ගියේය. මීට කලින්ද ඇ තනිව අනුරාධපුරය බලා ගොස් ඇත. මව්පියන්ද වන්දනාවේ ගොස් අනුරාධපුරයේ නැවතී සිටි බැවින් සේවකයෝද මේ ගැන වැඩි කල්පනාවක් නොකළෝය. කල් ඇතිව ප්‍රවේශ පත්‍රයක් ගැනීම සඳහා කැළණි දුම්රියපළට ගිය සැමී සිය ස්වාමිදුව වෙනුවෙන් නිදන දුම්රිය මැදිරියක්ද වෙන් කරවා ගත්තේය. මර්තිනාට තුන්වන පඞ්ක්තියේ ප්‍රවේශ පත්‍රයක් ද මිලදී ගන්නා ලදී.

කැළණියේ දුම්රියේ නැවතුම් පොළින් යාපනය බලා යන දුම්රිය පිටත් වන්නේ රාත්‍රි නවයයි කිස්පහටය. මේ වෙලාව නිර්මලාට කදිමය. කල් ඇතිවම ඇ මැදිරියට වී දොරගුළු දමා ගත්තාය. පසුදින පොසොන් පසළොස්වක වූ බැවින්



අනුරාධපුරය බලා යන වන්දනා කරුවන්ගෙන් තුන්වන පඞ්ක්තිය කාමර අතුරු සිදුරු නොමැති විය. ඇගේ මැදිරිය ඇ විශේෂ මුදලක් ගෙවා වෙන්කොට තුබූ බැවින් කිසිවකුට එහි ඇතුල්වීමට අවසර නොලැබිණ.

මැදිරියට වී දොරගුළුලා වටපිට බලා තමා තනිවූ බව දැනගත් ඇ ලහිලහියේ ඇඳුම් මාරුකර ගත්තාය. කලිසම තදවන සේ ඉන පටියක්ද බැඳගත්තාය. දුම්රිය පිටත්වීමට ඇත්තේ තව විනාඩියකි. ඒ බව හැඟවීමට හූවක්ද ඇසුණි. රෝද පීලි උඩ සෙලවෙනවාත් සමඟම ඇ වහා පිටුපස දොර හැර බිමට බැස සෙනඟගෙන් හිස්ව ගිය පාර අයිනේ ගමන් ගත්තාය.

රාත්‍රියේ හඳ අහසෙහි තුබූ නමුදු තද වැහිකළු බරින් අවට අන්ධකාරය ඇතිවන්නට විය. නිර්මලාද වේගයෙන් ගඟ දෙසට පා නඟන්ට වූවාය. තොටුපළ දෙසට ළංවත්ම ගඟින් එගොඩ යන සෙනඟ වැඩි වන්නට විය. නිර්මලාද ඔවුනට එක්වී ගමන් ගත්තාය. සිහින් වැසි පොද බිමට වැටෙන්ට විය.

නිර්මලා මෙසේ ගමන් කරත්ම දහසක් සිතිවිලි වලින් ඇගේ හදවතට නම් කිසිම ඉඩක් නොවීය. රංජිත් ඇට පාඩම් උගන්වන අවස්ථාවක දී රොසලින්ඩ් නම් එක්තරා තරුණ කාන්තාවක් වෙස් මාරු කරගන සිය පෙම්වතා සොයා යාමේ පුවත සිතට නැඟෙත්ම ඇ තුළ ඇතිවූයේ මහත් චකිතයකි. මම නම් කිසි විටෙකවත් එසේ තනිව කැලෑ ගත නොවන්නෙමියි, එදින ඇ රංජිත් ඉදිරියේ කියා සිටිය බවද මතක් විය. තව ද, "මෙපමණ සතුටුදායක නිවසක සිට ඔබට එසේ කරන්ට උවමනා නැතැ"යි රංජිත් කීවාද ඇට මතකය. දැන් ඇ කරන්නේද රොස්ලින්ඩ් කළ දේමය. දැන් රංජිත් තමා දුටුවිට කුමක් කියයිද? ඇට නිශ්චය කොටගත නොහැකි විය.

UPLOADED BY ELIFE

තමා තනි වුවද, රාත්‍රිය අන්ධකාර වුවද, රංජිත් හමුවීමේ බලාපොරොත්තුව නමැති ප්‍රදීපය ඇගේ ගමන ආලෝකමත් කළේය.

තොටුපොළ ළඟ ගඟ හරහා යන පාරු ඇත්තේ දෙකක් පමණි. ගඟ මෙගොඩ හා එගොඩ පාරුව එනතෙක් සියයකටත් වඩා පෙළගැසී බලා සිටිති. පිරිමි එක් පෙළකය. ගැහැණු තවත් පෙළකය. එක් මහළු ස්ත්‍රියක් නිර්මලාට පිරිමි පෙළ පෙන්නුවාය. කලබලයේ ඇට එයද අමතක වී තුබුණි.

විනාඩි පහළොහක් පමණ නිර්මලාටද පාරුව එනතෙක් පෙළගැසී සිටීමට සිදුවිය. අන්තිමේදී පාරුවට නැගීමට ඇටද අවස්ථාව ලැබිණ. පාරුවට වූ ස්ත්‍රීන් හිඳගත්හ. පිරිමි සිටගෙන සිටියහ. නිර්මලාද මහත් චකිතයෙන් සහ නොඉවසිල්ලෙන් පිරිමි උදවිය සමඟ පාරුවේ එක් තැනක හිට ගත්තාය.

"තව පැය කාලකින් මා ගඟින් එගොඩ වෙනවා. එවිට මෙතෙක් මට විඳිනට සිදු වූ සියලු අවහිරයන්ම රංජිත් ඉදිරියේ හිරු දුටු පිණි බිඳුමෙන් නැතිවී යනවා. තව පැය කාලක් මෙසේ දුක් විඳින්න." නිර්මලා තමාටම කියා ගත්තාය මහත් සීරුවෙන් පාරුව උඩ සිටගෙන කඹය අදින මිනිහා කොයි වේලේ එය නවත්වයි දැයි කල්පනා කරමින් සිටි ඇ දෙදෙනෙකුගේ කථාවකින් මඳක් කලබල වූවාය. ඔවුන් එකළඟ ගෙවල් දෙකක සිටින රියදුරන් බව ඔවුන්ගේ කථාවලින් පෙනී ගියේය.

"මම ඊයේ ඉඳලා නිවාඩු දැම්මා. මම හෙට උදේ යනවා අනුරාධපුරයට පොසොන් වඳින්ඩ." එකෙක් කීය.

"මම නිවාඩු ඉල්ලුවා ගමට යන්ට. ලැබුණේ නෑ. වලව්වේ ටිකක් කලබල තියනවා." අනෙකා උත්තර දුනි.

"ඒ මොකද?" පළමු රියදුරා ඇසීය.



"ඇයි දන්නේ නැද්ද? තමුසෙගෙ ගෙදරින් නම් ආරංචිවෙලා ඇවිත් ගියා. අපේ මහත්තයාගේ බාල මිසී බඳින්ඩය කියලා ඉන්දියාවෙ ඉඳලා මහත්තයෙක් ආවා. ගොඩ බැස්සේ බඳින්ඩ බෑ කියාගෙන තමයි."

"ඒ මොකද?" පළමු රියදුරා කලබල විය.

"අනේ මන්ද ඕවා අපට කියනවායැ කවදාවත්! ඔය මමත් කාගෙවත් කටින් වැටුණු දෙයක් තමයි දන්නෙ! මාසයකට ඉස්සර වෙලා තාත්තලා දූරු ගියා බොම්බයාට! එහිදී රංජිත් තේනබඳු කියලා ලොකු රක්ෂාවක් කරන කෙනෙකුට දූව අහලා තියෙනවා ඉතින් බඳින්ඩ කැමති වෙලා පෙරේදා රෑ ලංකාවට ඇවිල්ලා තියෙනවා මුදු මාරු කරන්ඩ, ඊයෙ දවල් ඇවිත් කියලා තියෙනවා එහෙම බෑ කියලද කොහෙද?"

"ඉතින් කුරේ මහත්තයා මොකද කළේ?"

"කුරේ මහත්තයා හරිම වස සතෙක් බව දන්නෙ නැතිද! මේ මඟුල ජෝඩු කළේ ලොකු බෑණා. ඊයේ රෑම බොම්බායට කතාකරලා මේ බව කීවා. අද රෑ දෙකට එනවා කටුනායක ගුවන් තොටුපළට. මම් යන්ඩ ඕනෑ රෑ එකට මහත්තයා එක්ක එන්ඩ. හොඳ වෙඩි ඇහෙන්නෙ ගුණරත්න මහත්තයා ආවයින් පසුවයි."

"කුරේ මහත්තය හිතනව හැමදාම දිණුම් කණුව අත ළඟ තමයි කියලා. වැරදෙන දවසකුත් එන්ඩ එපායැ." පළවෙනි රියදුරා තමාටම කියා ගත්තේය.

"අපේ මහත්තයාට ඕකෙන් වැරැද්දක් වෙන්නෙ නෑ. වරදක් වෙතොත් පොරොන්දු කඩකරපු මනමාලයාට තමයි."

UPLOADED BY ELIFE

පාරුව ශීඝ්‍රයෙන් ගඟ හරහා යන්ට වූයේය. ඒ අතරම පොද වැටිල්ල තවත් වැඩිවිය. රියදුරන් දෙදෙනාගේ කථාව අසා සිටි නිර්මලාගේ සර්වාඞ්ගය ගින්නකින් දැවෙන්නාක් මෙන් වේදනාවන්ට විය. වෙස්වලා සිටි ඇගේ ගතත් සිතත් සුළඟට ලෙලදෙන ලහෝපල්ලක් මෙන් වෙව්ලන්ට වූයේය.

"රංජිත්!" ඈ කථා කරන්නට මෙන් තැත් කළාය. එහෙත් ඈට කථා කිරීමටවත් ශක්තියක් නොමැති ලෙස ඇගේ ගත සැලෙන්නට වන.

ඉකුත් දෙදින තුළ සිදුවූ සියල්ල ඈට සක්සුදක් සේ අවබෝධ විය. පාරුව මත හිඳිගෙන සෙලවෙන ජලය දෙස බලමින්ම ඈ මෙසේ කොඳුරන්නට වූවාය.

"රංජිත්! අහෝ රංජිත්! ඔබගේ මතු ජීවිතය ගැන බිඳක් නොතකා මා වැටී තිබෙන විපතින් බේරනු වස් නිර්භීත ලෙස මෙවැනි දැඩි පියවරක් ඔබ ගත්තෙහිය. අසරණ මා උදෙසා, ඔබ ඇතිකරගත් ගිවිසුම පවා කඩ කරන්නෙහිය. ඔබ ජීවිතය පුද මා බේරන්ට ගත් වෑයම මෙන්ම මගේ මේ නිස්සාර ජීවිතයද ඔබ වෙනුවෙන් පිදීමට ඉඩ දෙන්න. රංජිත් ඔබට සිදුවන්නට යන අපකීර්තියෙන් බේරාගැනීමේ එකම මාර්ගය මගේ මේ ජීවිත පරිත්‍යාගයයි. "ආලයේ පරමාර්ථය අනුන් උදෙසා කැපවීම" කියා එද ඔබ කීවේ පරම සත්‍යයක් නොවේද? මගේ මේ නිස්සාර ජීවිතය ඔබ වෙත කැප කරන්නේ හුදෙක් ඔබගේ අනාගත ජීවිතය සඵල වේවා යන පරම අධිෂ්ඨානයෙනි. මෙවැනි ප්‍රීතිමත් මොහොතක් මගේ මුළු ජීවිතයේම අත්වූයේ නෑ. රංජිත් මා දුන් ඔබ වෙත නොපැමිණි විට මොහොතකටවත් මා චපලියක කියා සිතන්ට එපා."

වේලාව අශ්ව වේගයෙන් දුවන්නේය. දැන් පාරුව ගඟ හරහා අඩක් ගෙවී ඇත. ඈ ජලය දෙස බලමින් මෙසේ අයැදීය.



"මෙතෙක් කල් මගේ දුක සැප එක ලෙස වටහාගෙන මා සැනසූ පෙම්බර මෑණියනි! ඔබේ ජල හස්තය ඔසවා මා ඔබේ තුරුලට ගන්න. ඔබට බිලිවී මම මගේ පෙම්වතා බේරා ගනිමි. එය මගේ ජීවිතයේ එක ම ප්‍රාර්ථනාවයි"..................... ගංගා තොමෝ සිය ජල හස්ත යුග්මය අහසට විසිකොට නිර්මලා සදහටම තුරුළුකොට ගත්තාය.

"අපොයි මෙතන හිටිය අර ඉලන්දරිය වතුරට වැටුනා." අසලසිටි මහල්ලෙක් මහ හයියෙන් කෑ ගසන්නට විය. එතෙකින් ඔරුවේ සිටි ගැහැණු පිරිමි සියල්ලෝම එක හඬින් කෑ ගසන්නට වූහ. එතකුදු වුවත් ගඟට පැන ජීවිතයක් බේරා ගැනීමට සමතෙක් පාරුවෙහි නොවූහ. අඩි පණහක් පමණ ඈතින් මතු වූ නිර්මලා ආපසු සදහටම නොපෙනී ගියාය.

අමුතු බලාපොරොත්තු මුදුන්පත්කර ගිනිමින් කල් ඇතුවම නුග ගස මුලට සැපත් වූ රංජිත් මහත් විමසිල්ලෙන් යුතුව ගොඩට එන ඔරු පාරු පිරික්සන්නට වූයේය.

රෑ දහයමාරට පමණ ගොඩට ආ පාරුවේ සිටි සියල්ලෝම ජලකුරුසාට බිලිවූ අසරණ තරුණයා ගැන එක හඬින් ශෝක වනු අසා මඳක් තැතිගත් නමුදු ඒ ගැන කිසිවක් කළ නොහැකි බව රංජිත් දත්තේය. ගඟ උඩහ වැසි ඇතිවීම කරණ කොට ගෙන බලා සිටියදීම ගඟේ ජල ප්‍රවාහක අධික විය. බෙදවාචකය ඇසූ රංජිත් වහා පාරුව අසලට ගොස් එක් පුද්ගලයෙකුට කථා කළේය. "ඔබ හොඳට දුටුවාද ගඟට වැටුනේ කවුද කියලා?"

"මේ මොනවද අහන්නේ! කැළණි විහාරයේ ඉඳල ඒ ඉලන්දරියා ආවේ අපිත් එක්කමයි." වෘදයා උත්තර දුනි.

මෙවැනි අවස්ථාවන්හිදී දුටු දෙය දෙගුණ තෙගුණ කොට කීම කාගේත් පුරුද්දකි. මේ ඇසූ රංජිත් මඳක් සැනසීමට පත්විය.

UPLOADED BY ELIFE

පසුදින පොසොන් දින වූ නමුදු චන්ද්‍රයාගේ ඡායාවක්වත් අහස් ගැබෙහි නොවීය. කොයි වේලේ කඩා වැටෙද්දෝ බලා සිටින පහතට බර වූ තද වලාකුල් පියැස්සකින් මුළු අහස් තලයම වැසී ගියේය. රාත්‍රියේ දහය පසු වූ වේලාවේ පටන් ඇතිවූ මඳ වැසි පොදින් රංජිත් මහත් පීඩා ලැබුවේය. දූන් දූන් සීඝ්‍රයෙන් රාත්‍රිය ගෙවෙත්ම ඔහුගේ චිත්ත සන්තාපය ශාරීරික පීඩාව යටපත් කරන්නට විය. දැන්නම් ඔහුගේ බලාපොරොත්තු සියල්ල සුන්වී ඇත. මෙතෙක් වේලා හේ මුදුන්පත් කරගත සිටි සෑම අපේක්ෂාවක්ම භග්න වී ඇත. තව දිනකුත් ලබා ඇති බව ඔහුට පෙණුනේ අත තුබූ වේලාව බැලුවාට පසුවය.

කොතෙක් රාත්‍රිය ගෙවී ගියද තොටුපළ දෙපස සෙනඟගෙන් අඩුවෙක් නම් නැත. හදිසියෙන් ගඟට වැටී අතුරුදහන් වී ගිය ගැටවරයා කව්දැයි කවුරුත් නොදත්හ. රාත්‍රිය නික්මයත්ම බලාපොරොත්තු රහිතව අතරමං වූ රංජිත්ගේ සිතෙහි ඒ ගැටවරයා ගැන මහත් සැකයක් ඇතිවිය. කිසිවෙකුටත් නොකියාම තනිව හේ එයින් පීඩා වින්දේය.

ඔහුට සිදුවී ඇත්තේ මහත් අකරතැබ්බයකි. නිර්මලා ගැන යමක් දැන නොගෙන ඔහුට මෙයින් ඔබ්බට යා නොහැක. ඈ දන්නා අඳුනන කෙනෙකු වුවද අසලකවත් නැත. පාරුවද විසිගමනක් පමණ ගඟ හරහා එහා මෙහා ගියාය. පන්දහසකට අධික ජනකායක් ගඟින් එගොඩ මෙගොඩ විය. එහෙත් නිර්මලාගෙන් පණිවුඩයක්වත් නැත්තේ මන්දැයි කියා රංජිත්ට කල්පනා වන්නේ දූන්ය. "නිර්මලාට එන්ට බැරිකමක්වත් ඇද්ද? එසේනම් ඇගෙන් යම්කිසි පිළිතුරක් මට ලැබිය යුතු නොවේද? 'හෙට රෑ නික්මීමට කලින් මම ගඟ හරහා ඔබ සොයා එමි. මම නාවොත් ගඟේ ජලය ආපසු ගමන් කරනවා ඇති. නිර්මලා මෙසේ කීයේ මොන තරම් අධිෂ්ඨානයකින්ද?"

දවසක් ගෙවී රාත්‍රියද නික්මීම වස් අරුණෝදයද ඇති වන්නට විය. පැලදිග අහසෙහි ඇත්තේ මඳ එළියක් පමණි.



හිරු උදාවීමේ පෙර නිමිති ඇතිවෙත්ම රංජිත් දහසක් දේ ගැන කල්පනා කරන්නට වූයේය. දියෙහි ගිලීගිය තරුණයා ගැන ඇතිවන වේගවත් සිතුවිලි ඔහු යටපත් කරන්නේ මහත් වේදනාවෙනි.

බලා සිටීමේ කාරියක්ද නැත. ආපසු පා නගා යන්ටත් බැරිය. මෙසේ විසඳිය නොහැකි උභතෝකෝටික ප්‍රශ්නයකින් තෙමේ වෙලාගත්තේයි මඳක් උමතු වූවෙකු සේ ඔහු ගඟ ඉවුර දිගේ එහා මෙහා සක්මන් කරන්ට විය.

හොඳටම එළිය වැටිනි. අසල තුබූ කුඩා තේ හල් උදේ කෝපි සොයා එන්නන්ගෙන් පිරී ගියේය. මා බලා සිටින අන්තිම පාරුව කියමින් රංජිත් ගං ඉවුරට එන පාරුව දෙස මහත් ආයාසයෙන් බලා සිටින්නට විය. මොහොතකින් ඔහුගේ මුහුණ මහත්සේ පැහැපත් විය. වහා දුවගොස් හේ පාරුවෙන් ගොඩට එන්නවුන් පසුකොට සැමී ඉදිරියේ සිටගත්තේය. කෙසෙල් කැනක් කරටගෙන හිමිදිරියේ කඩපිලට ආ වැඩකරුවාද පුදුමයෙන් රංජිත් දෙස බැලීය.

"සැමී කෝ නිර්මලා හාමු? ඈ මට පණිවුඩයක් දුන්නේ නැද්ද?" රංජිත්ගේ මුහුණ කුතුහලයෙන් මත්විය.

සැමී කථා කළේය. "හනේ මේ රංජිත් මාත්තියා නොවේද? මොකද මේ කරන්නේ? උදේ පාන්දර සිටම."

රංජිත් ඔහුට කථා කිරීමට ඉඩ නුදුනි. "කෝ නිර්මලා හාමු. කෝ ගෙදරද? ඉක්මනට කථා කරපන්."

"මම මේ ශත පා ගෙවලා පාන්දර ඇවිල්ලා කෙසෙල්මල විකුණා ලොකු මාත්තියට සල්ලි ගීන් දෙනව. කවදවත් මම මේ සල්ලි ගන්නේ නෑ අපිලා බොරු නේ."

UPLOADED BY ELIFE

"කෝ නිර්මලා ඇ මට පණිවුඩයක් දුන්නේ නැද්ද?" රංජිත් ගුගුළේය.

"අපොයි නිර්මලා හාමු ඊයේ රේ තමයි අනුරාජපුරේ ගියේ. ඔව් මම් තමයි ටිකැට් අරන් දුන්නා. මර්තිනා ආමිත් එක්ක තමයි ගියේ. මෙලාකට අනුරාජපුරේ ඇති."

රංජිත් භ්‍රාන්ත විය. "ඔය ඇත්තද?"

"එත්තද ආනවා. එන්දේවෙ අතට තමා කීවා මම යනවා අනුරාජපුරේ කීලා. වැඩිය ගෙවලා තමයි නිදගන්න කෝච්චි පෙට්ටි තමයි ආමුට මම අරන් දුන්නේ! ආමු කීනයෙක කරන්ඩ කීල අපිලාට කීල තියෙනවානේ."

රංජිත් බිම බලාගත්තේය. නිර්මලා ජීවතුන් අතරය. මෙතෙක් වේලා මැඩ පවත්වා ගත නොහැකිව තුබූ බියකරු තත්වය දැන් ආහෝසිය. ඒ ගැන හේ සැමීට ගැතිවිය. මෙතෙක් වේලා කර ගසාගන තුබූ කෙසෙල්මල බිම තබා සැමී තවත් කථා කරන්නට වූයේය.

"මම ඊයේ කීවා නේද මාත්තියාට ආමු දැන් අරිම වසයි කීලා. කීන දේම කරන්ඩ ඕනේ කීලා ඉස්සර තුබුණු අරිම පිස්සු, දෙන් තමයි තීන්නේ ටික ටික පිස්සු."

රංජිත් මොහොතක්වත් නොරැඳි වහා එතනින් නික්ම ගියේය. සුළු වේලාවකින් හෝටලයට පිවිසි හෙතෙම සයනය මත දිගාවී දැන් ඉතින් කුමක් කළයුතු දැයි කල්පනා කරන්ට විය. ඔහුට දැන්නම් සිදුවී ඇත්තේ විශාල කැලලකි. තත්වයට මහත් මදිකමකි. කිසිවක් ඔහුට කල්පනා කළ නොහැකිය. කොයිම අරමුණක්වත් සිතට නොනැගෙන්නේය. ඔහුගේ සිත පොළඹවන එකම කාරියනම් පසුගිය දවස තුළ ඇති වූ දෑ සිහිනයක්ද,



නැතහොත් සැබෑවක්ද යන බවය. මඳ වේලාවකින් සිත දමනය කරගැනීමට තැත් කළ ඔහුට පසුගිය කාල පරිච්ඡේදය කැඩපතකින් පෙනෙන්නා සේ මනැසට දෘශ්‍යමාන විය. මීට පස් වසකට ඔබ්බෙහි සඳ එළිය ඇති රාත්‍රියක ගඟේ එක් අද්දරකට වී බලා සිටිය සැටි තමාට සිහිවිය. ඊයේ රෑ ගඟේ අනිත් අද්දරට වී සිටිය සැටිත් ඔහුගේ සිහියට නැගින. දෙවාරයකම ඔහු එසේ කරනු ලැබුවේ එක් අරමුණක් සඳහාය. එනම් නිර්මලා, තමාගේ පෙම්වතිය, තමා ළඟට ඒය යන දැඩි බලා-පොරොත්තුවෙන්ය. හොඳ සිහිකල්පනාවෙන් එදා ඈ දුන් පොරොන්දු කඩවූවානම් මඳ සිහියෙන් යුතුව මේ වේලාවෙහි ඈ දුන් පොරොන්දුව කෙසේ නම් කඩ නොකරයිද? රංජිත් තමාටම කියා ගත්තේය.

මෙසේ සුළු වේලාවක් කල්පනාවෙහි යෙදී සිටි ඔහුට කාමරයෙහි සීනුව වැදෙනවා ඇසිණ. මහත් බලාපොරොත්තු හා අපේක්ෂාවෙන් රංජිත් වහා දෙර හැරියේය. ගුණරත්න මහතා දෙර අසල විය. අධික චිත්ත පීඩාවෙන් පෙළෙන බව ඔහුගේ මුහුණින් පෙනී ගියේය.

"ඔබ කවදද ආවේ?"රංජිත් විචාළේය. "නිවාඩු ගත්තේ කොහොමද?"

"නිවාඩු ගන්නේ කෙසේද ඔබ මෙහෙ සිටින වෙලාවේ? එහෙත් නැවිත් සිටින්නේ කෙසේද මෙවැනි අවස්ථාවකදී?" මෙසේ කියමින් ගුණරත්න මහතා පුටුවක් මත වාඩිවී මඳක් වේගයෙන් හුස්ම ඉහළ පහළ හැරීය.

රංජිත් සිතේ ඇතිවූ සැකය දුරුකරනු වස් ඉවත බලා සිටියේය. ගුණරත්න මහතා රංජිත්ගේ මුහුණ දෙසම බලන්ට විය.

UPLOADED BY ELIFE

"මහත්මයාණෙනි!" අන්තිමේදී අමුත්තා ප්‍රශ්න කිරීමට සැරසුනි. "ඔබ අසනීපයකින් පෙළෙනවාද?"

"නෑ, නෑ," රංජිත් උත්තර දුනි. "මට කිසිම අසනීපයක් නෑ."

"එසේ නම් ඔබ යම්කිසි සිත් තැවුලකින් පීඩා විඳිනවාද?"

"නෑ" කියමින් රංජිත් දිග සුසුමක් හෙලීය.

"එසේ නම් ඔබ ආ කාරිය ඉටු නොකළේ මන්ද?"

වරදට අසුවුනු කුඩා දරුවෙකු එම වරද ගැන ක්ෂමාව ඉල්ලන්නාක් මෙන් බැගෑපත් ලීලාවෙන් රංජිත් අනෙකා දෙස බැලීය.

මඳ වේලාවක් දෙදෙන නිහඬව එකිනෙකා දෙස බලා සිටියහ. පසුව ගුණරත්න මහතා මෙසේ ප්‍රශ්න කෙළේය.

"තේනබදු මහතාණෙනි! ඊයේ රාත්‍රියේ දහයට මගේ මාමා මට කථා කොට කීවා ඔබ ප්‍රස්ථාව අත්හැර දමා ඇති බව. මා එනතෙක් කිසිවක් කරන්ට එපා කියා මම රාත්‍රියේ එකොළහට ගුවන් යානයෙන් පිටත් වන බව කියා සිටියා. එකොළහට බොම්බායෙන් පිටත් වී රෑ දෙකට කටුනායකට පිවිසුනා. එවක් පටන් මම ඔබව සොයනවා. මා මෙතනට ආ තුන්වන වාරය මේ තමයි. මගේ මාමා පිස්සෙකු වාගේ මට චෝදනා නගනවා." ගුණරත්න මහතා අඩියක් ඉදිරියට ආයේය.

"මහත්මයාණෙනි, අපි මේ සම්බන්ධව ක්‍රියා කළේ නියම මහත්මා ගති ඇත්තවුන් අතර ඇතිකර ගන්නා ගිවිසුමක් ලෙසටයි. ඔබ මගේ නෑනා බඳිනවා කියා කිසිම ලියවිල්ලකින් පොරොන්දුවක් වී නැහැ. මෙවැනි අවදනම් තත්වයකින් ඔබ



ප්‍රයෝජන ගත්තා නොවේද? මෙයින් මහත් ලෙස නින්ද විඳිය යුත්තේ මමයි."

රංජිත් කථා කෙළේය. "කිසිවෙකු රැවටීමේ බලාපොරොත්තුවක් මා තුළ නෑ. එවැනි චෝදනාවකට භාජන වූයේ මගේ ම අවාසනාව විය යුතුයි. මට ස්වල්පයක් සිතා බලන්ඩ ඉඩ දෙන්න."

"මහතාණෙනි, සිතා බලන්ඩ දෙයක් නැහැ. මේ මොහොතෙහි මා වැටී ඇති ප්‍රපාතයෙන් ගලවා ගනු මැනව. එය කළ හැක්කේ ඔබට පමණයි."

රංජිත් නිහඬ වී කල්පනා කරන්නට වූයේය.

ගුණරත්න මහතා රංජිත් දෙස බැලීය. මහත් ඛෙදවාචක බැල්මක් ඔහුගේ මුහුණෙහි රැඳී තිබුණි.

"තේනබදු මහතාණෙනි, ඔබට වෙන දෙයක් බැරිනම් මා බේරා ගන්න. මෙය මට සිදුවූ පුද්ගලික විපතක්. එයින් මා බේරා ගැනීමට හැකි ඔබට පමණයි." ගුණරත්න මහතා අයැදීය.

අන්තිමේදී රංජිත් කථා කෙළේය. "මා ඔබ කියන ඕනෑම දෙයකට එකඟ වන්නම්." ගුණරත්න මහතාගේ සිත්හි ඇති වූ ප්‍රබෝධයත් සමඟම මුහුණ පැහැපත් විය.

හදිසියේම ඔහු මේසය මත ටිකැට් පත් දෙකක් දිටීය.

"මේ මොකද? අද රෑට බොම්බායට යාමට ටිකට් පත් දෙකක්?" ගුණරත්න මහතා ප්‍රශ්න කෙළේය.

රංජිත් නිහඬ විය.

ගුණරත්න මහතාට නොයෙක් දෑ ගැන හාරා අවුස්සා බැලීමක් උවමනා නැත. ඔහු මෙසේ කීය. "ඔබ මා වෙනුවෙන්

UPLOADED BY ELIFE

පළමු තීරණය කළ පරිදි අද සවස විවාහය ලියා පදිංචි කරන්න. අද රෑ දෙකට අපි දෙදෙනාම බොම්බාය බලා යමු. දෙමසක් ඇතුළතදී විවාහය සිදු කළ හැකිය. මා වෙනුවෙන් ඔබ මීට එකඟ වන්න."

රංජිත් එකඟ විය. විශාල වෙළඳ ගිවිසුමක් මඟ හැරී යෑමෙන් ඇති වූ සිත් වේදනාවකින් රංජිත් තේනබදු පෙළෙන්නෙහි යයි ගුණරත්න මහතා සිය මාමණ්ඩියට සඳහන් කළේය. කුරේ මහතාද ඒ බව හිස් මුදුනින් පිළිගත්තේය.

එදින සවස හතරට පමණ කැළණි ගඟ අද්දර පිහිටි සමනල නම් සුවිසල් මන්දිරයෙහි කුඩා උත්සවයක් විය. වැඩි කලබලයක් නොමැතිව කුරේ මහතාගේ බාලදියණිය වන ලීලමනී දෙමසකින් විවාහ වන බවට රංජිත් තේනබදු විසින් ගිවිසුම් කර ගන්නා ලදි. වැඩි කථාවක් නොමැතිව ගැඹුරු කල්පනාවකින් සිටි මනාල මහතා අසනීපයෙන් බව ඇඟවීමට ගුණරත්න මහතා නොකළ පරිශ්‍රමයක් නැත. සුළු වුවද එම සම්භාෂණය නිම කොට මනාලියට ස්වල්ප වශයෙන් කථා කොට ආපසු සිය හෝටලයට යනවිට රාත්‍රී නවය පසු වී තුබුණි. ඉකුත් දිනය පුරා බරවී තුබුණු අහස් ගැබෙහි අඳුරු වලාවන් ඇරියාක්මෙන් ප්‍රචණ්ඩ ලෙස වැසි වසින්නට විය. නොකඩවා ඇසෙන මහා මේඝ ගර්ජනාවත් අනතුරුව ගසන විදුලිධාරාවනුත් මහා වෘක්ෂ පවා බිඳ දමන චණ්ඩමාරුතයත් තත්වය තව තවත් බියකරු කළේය. හෝටලයට පිවිසි රංජිත්ට ප්‍රථම වරට ලැබුණේ ගුවන් යානා කාර්යාලයෙන් එවා තුබුණු විදුලි පණිවුඩයකි.

ලංකාවේ වයඹ හරහා හමන මහ මුහුදේ විශාල කුණාටුවක් ඇතිවූ බැවින් පසුවද පෙරවරු හතවනතුරු ගුවන්යානාව පිටත් නොවන බව එහි සඳහන්ව තිබුණි.

අඩපණවූ සිනාවකින් මුහුණ සරසා ගනිමින් රංජිත් සිගරැට්ටුවක් දල්වා ගුවන් විදුලි යන්ත්‍රය කරකවා ඇඳ මත



දිගාවී විශාල සිතුවිලි මාලාවක නිමග්න වූයේය. ඒ අතරම හදිස්සි කුණාටුවක් නිසා අහස් යානය නියම වේලාවට පිටත් නොවන බව ගුවන් විදුලියෙන්ද කියවින. විදුලි ප්‍රචාරය නිම කිරීමට පෙර එක්තරා නිවේදනයකි. වසා දමන්ට පෙර රංජිත් ඒ නිවේදනයට කන්දී සිටියේය.

"ඊයේ රාත්‍රියේ කැළණියේ ඇටඹ ගහ තොටුපළෙන් පාරුවට නැග යන විට ගඟට වැටී ජීවිතක්ෂයට පත්වූ තරුණියා අන් කිසිවකු නොව සියඹලාගහ වලව්වෙහි පදිංචි අතපත්තු මහතාගේ එකම දියණිය වන නිර්මලා අතපත්තුය. මේ මරණය ලොකු අභිරහසක්ය. මද අසනීපයකින් පෙළුණු ඈ රාත්‍රියේ නවයට පමණ අනුරාධපුරයට යාමට කැළණියේ දුම්රිය ස්ථානයෙන් දුම්රියට නැග තිබේ. මේ ගැන ප්‍රශ්න කිරීම සඳහා ගෙදර සේවය කරන සැමී නමැත්තෙකු පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන ඇත. මේ ගැන ආරංචියක් දිය හැකි පුද්ගලයෙකුට අතපත්තු මහතා විසින් විශාල මුදලක් පරිත්‍යාග කරනු ලැබේ."

වියරු වූවක් සේ රංජිත් වහා ඇඳෙන් නැගිට්ටේය. රේඩියෝවෙන් එම නිවේදනයම නැවතද කීවේය.

අඳුරු ඝන වලාකුළු වලින් නොකඩවා බිමට පතිත වන වැසි ධාරා දෙස බලමින් කවුළුව මත සිටගෙන කුඩා දරුවෙකු මෙන් රංජිත් හඬන්ට වූයේය.

"නිර්මලා! නිර්මලා!! මගේ අත ඔබ වෙත මෙතෙක් දිගු කර තිබියදීත් ඔබට කුමක් සිදුවීද? පාරුව නුපුරුදු ඔබ දියට ලිස්සා වැටුනා ද? නැතහොත් කවුරුත් ඔබ දියට තල්ලු කර දැම්මාද? මා මේ බව දැනගන්නේ කෙසේද?"

"දෛවය! ඔබ මෙතරම් කෲර ඇයි? මගෙන් පළි ගැනීමට නොහැකි වූ ඔබ අසරණියකගෙන් පළි ගත්තා නොවේද? මහත් අභිලාශයෙන් අපට දෙවන වරටද හමුවීමට ඉඩ දුන් ඔබ ඈ

UPLOADED BY ELIFE

ගඟින් එතර වන තෙක් ආරක්ෂාව නුදුන්නේ මන්ද? දෛවය! මා ඔබ කෙරෙහි විශ්වාසයක් තැබුවේ නෑ. එහෙත් අසරණ නිර්මලාට ඔබ මෙතරම් සාහසික කමක් කරාවිය කියා සිහිනෙකින්වත් සිතුවේ නෑ. ඈ ආවේ වෙස් වලා ගෙනයි. ගඟ හරහා මගේ හස්තය වෙත ඒමට ඈ තුළ කොපමණ බලාපොරොත්තුවක් තිබෙන්නට ඇද්ද? දැන් ඉතින් කුමක් කටයුතුද? බියකරු සිහිනයක් දුටුවකුසේ වහා ඇඳුම් මාරු කොට කාමරයෙහි දෙර හැර තෙමේ එළියට ආවේය. තද වැසි වලාවක් ඇති වී නැවතුණා පමණය. තව වැසි වලාවකට පාර පෙන්වමින්දෝ නොකඩවා පොද වැටෙන්නට විය. රංජිත් පාරට බැස අසල තුබූ මොටෝරියකට නැග ඉක්මනින් කැළණි ගඟ අසලට යාමට රියැදුරාට අණ කෙළේය.

සියඹලා ගහ වලව්වට යන පාර යට වී තිබුණෙන් මොටෝරියට යා නොහැකි විය. ආපසු ඇවිත් රංජිත් ගඟ අද්දරට පැමිණියේය. කෙසේ නමුත් ගඟ හරහා යා යුතුය. අධික ලෙස ගඟ පිරී තුබූ නිසා පාරුද යාම නවත්වා ඇත. මේ අවස්ථාවේදී ඉතා අවශ්‍ය කරුණු තුනක් රංජිත්ට භාරය. එම කරුණු තුන ඉටු කිරීමට කෙසේ නමුත් ඔහු විසින් සියඹලා ගහ වලව්වට යා යුතුමය. එයින් පළමුවැන්න නිර්මලා සම්බන්ධ අභිරහස හෙළිකොට සැක කරුවන් නිදහස් කිරීමය. දෙවැන්න මෘත දේහය සියැසින් බලා තමාගේ ශාඞ්කාව දුරුකර ගැනීමය. තුන්වැන්න මේ තීරණාත්මක අවස්ථාවේදී අතපත්තු මහතා ඉදිරියේ පෙනීසිටීමය.

ගඟ අද්දර සිටි තොටියාට රංජිත් මහත් ආයාචනයක් කෙළේය. ගඟේ වේගය ඉතා සැරයයි කියමින් තොටියා පසුබට විය. ගඟ අද්දර කුඩා ඔරුවකි. මහත් බියකරු අන්දමින් දෙපස සූරා දමමින් පහළට ගලායන ජන වේගය ගැන කිසිත් නොතකා තෙමේ විගස හබල අතට ගෙන ඔරුව පදවන්නට විය.

ඇටඹ ගහ තොටුපොළ ළඟින් ඉතා අමාරුවෙන් ගොඩ වූ රංජිත් වලව්ව දෙසට පා නැගීය. වේලාව රෑ දහයට පමණ විය.



වලව්ව තුළ පිරී ඉතිරී ගිය සෙනඟ ගැන කිසිත් නොතකා තෙමේ, ගෙයි මැද තැන්පත් කොට තුබූ නිර්මලාගේ මල සිරුර දෙසට ගොස් පහතට වැටීතුබූ ඇගේ සීතල අත් දෙක අල්වාගෙන ඇසිපිය නොහෙලා ඈ දෙස බලා සිටියේය.

දැන් නම් සියල්ල අවසානය. රංජිත්ට ඒ ගැන කිසිදු සැකයක් නැත. අඩක් විවෘතව තුබූ මුව තුළ වචන සොයන්නාක් මෙන් රංජිත් සෙමින් කොඳුරන්ට විය.

"නිදාගන්න නිර්මලී! දැන් ඉතින් සැනසී නිදාගන්න. ඔබේ නිශ්ශබ්දතාවය ඔබ මුවින් පිට වූ දහසක් වචනයන්ට වඩා චතුරයි. ඔබ නොකීවත් මා වෙනුවෙන් ඔබේ ජීවිතය පුද ඇති බව ඔබේ මුහුණෙන් ප්‍රකාශ වෙනවා."

ස්වල්ප වේලාවක් මෙසේ නිහඬව බලා සිටි රංජිත් හදිසියෙන් පිටුපස බැලීය. අතපත්තු මහතා ඔහු අසලය. අධික මාන්නය පෙරටුව තමාම ඇරඹූ යුද්ධයක අන්ත පරාජය ලැබූවකුගේ ශෝකාත්මක විලාශය ද, ගං වතුරක් බැසගිය කල ගොඩ ඉතිරිවන සුන්බුන් රොත්තක නිස්සාර භාවය ද, ඔහුගේ මුහුණෙහි සඳහන් වී තිබුණේය. අනුකම්පාව දුරැර මහත් අභිමානයෙන් අතපත්තු මහතා ඉදිරියේ පෙනී සිටීමට වෑයම් කළද වෙඬරු පිඩක් සේ තමාගේ ලය තෙත් විය.

ඔහු සෙමෙන් කථා කළේය. "නිර්මලාගේ මරණය සම්බන්ධව කිසිම අභිරහසක් නෑ. නිර්මලා ගඟින් එගොඩ වීමට ගියේ මා හමුවීමටයි. මා බලාපොරොත්තු වූයේ ඈ රැගෙන යාමටයි. මෙහි යම් කිසි වරදක් ඇතොත් ඊට මුහුණ දීමට මම ලෑස්තියි.

අතපත්තු මහතා මේ කිසිත් නෑසුනාක් මෙන් රංජිත්ටම කථා කළේය. "පුතා දැන් ඉතින් සියල්ල අවසානයි. මේ සියල්ලම ඔබට බාරයි. යට ගියාව අමතක කරමු."

UPLOADED BY ELIFE

රංජිත් වරක් අතපත්තු මහතා දෙස බැලීය. එක බැල්මෙන් ඔහුගේ සිත්හි මෙතෙක් බල පෑ සියල්ලක්ම ප්‍රකාශ විය.

ගස් රෑරා ඉදිරි වැටෙන කුණාටුවක හඬ ඇසෙන්නේය. රංජිත් ඒ කිසිත් නොතකා එළියට බටුයේය. අතපත්තු මහතා වියරු වැටුනෙකුසේ හඬ නගන්ට විය.

"රංජිත්, පුතා, යන්ඩ එපා, ඔබ කුණාටුවට අසුවෙයි." වලව්වේ සේවකයෝ දුව අවුත් සිය ස්වාමියා අල්වා පුටුවක හින්ද වූහ. රංජිත්ට දැන් අතපත්තු මහතාගේ වචන ඇසෙන වේලාවක් නොවේ. ආපසු නොබලාම හේ පාර ගෙවා ගඟ අද්දරට ගියේය.

කීප දෙනෙක්ම ඔහු අල්වා නතර කිරීමට තැත්කළේය. ඒ කිසිත් නොතකා හේ ඔරුව ඉදිමීගිය ජලය මත දමා හබල ක්‍රියා කරවන්නට විය. හඳ අහසෙහි නොපෙනුනද මඳ ආලෝකය කරණකොටගෙන රාත්‍රියේ බියකරු තත්වය මොනවට පැහැදිලි කළේය. රංජිත් ඔරුව පැද ගඟ හරහා යෑමට ගත් වෙරත් සමඟම ඔහු ඔරුවෙන් ගඟ පහළට ඇදී ගිය සැටි එහි අවට රැස්වූ කීප දෙනෙකු විසින්ම දක්නා ලදී.

එදින රාත්‍රියේ කැළණිය අසලට වැදුණු චණ්ඩමාරුතය මීට පෙර කිසි දිනකවත් නොවූ විරූ තරම්ය. ගඟ ඉහළ ඇති වූ ධාරානිපාතය කරණ කොට ගෙන ගඟේ ජලය උඩ නෙරා දෙපස ගලා ගියේය. පසුදින උදයේ කැළණියේ ගඟ අසල තුබූ සියලුම පාරවල් යටවී තිබුණි. අන් කොයිම දිනකවත් නොවූ වීරූ අන්දමෙන් ජලය සියඹලා ගහ වත්ත පාමුල උණ පඳුර තෙක් විසිරී තිබිණ. පාන්දර වත්ත පහළට ගිය වලව්වේ සේවකයන් විසින් දෙපළුවී ගිය ඔරුවක් උණ පඳුර අසල දක්නා ලදී. තවත් සොයා බැලූ ඔවුනට දක්නට ලැබුණේ උණ පඳුර මත පටලැවී තුබුණ රංජිත්ගේ මල සිරුරය.

UPLOADED BY ELIFE



කැළණි ගඟ අද්දර පිහිටි සියඹලා ගහ වත්තෙහි මේ සිද්ධිය සිදුවී පස්වසක් ගෙවී ඇත. මෙම අවුරුදු කීපය තුළ තවද නොයෙකුත් විපර්‍යාසයන් වලව්ව තුළ සිදුවිය. මඳ අසනීපයෙන් පෙළෙමින් සිටි අතපත්තු මුදලි තුමා නිර්මලාගේ මරණය තෙවසක් ඉක්ම ගියෙන් මෙලොවින් චුතවිය. අවට ගම්වාසීහු ගමේ ප්‍රභූවරයෙකුට දියහැකි සෑම අවසාන ගෞරව සම්මානයක්ම දක්වමින් එම මෘතදේහය සියඹලා ගහ වලව්වේ පසෙක ආදාහන කළෝය.

මෙතරම් විශාල ගෙදරක පදිංචිවීමට නොහැකි බැවි වටහාගත් අතපත්තු හාමිනේ වලව්ව අත්හැර දමා සිය ගම බලා ගොස් පදිංචි වූවාය. වලව්ව කුලියට ගෙන ආ එක් මහතෙකුගේ එකම දියණියද තෙමසක් ඇතුළදී ජලරකුසාට බිලිවිය. එවක් පටන් කවුරුත් සියඹලා ගහ වලව්වට පදිංචියට ඒමට බියවූහ. වත්ත භාරව වැඩකළ ලියන මහතා පමණක් එක් කාමරයක් තමාගේ ගණන් පොත් තැබීමට වෙන්කොට ගත්තේය. විශාල රමණීය වලව්ව මෙයින් පාළු බවට පත්වෙත්ම උගුඩුවෝ, වව්ලෝ යනාදීහු මෙය වාසභූමි කොට ගත්තෝය. වරක් ඇති රමණීය උද්‍යානයක සිරි ඉසිලූ සියඹලා ගහ වත්ත දැන් පාළු වී ගිය කැලෑවකි. වත්ත අසල පදිංචිවී සිටි රොබෝසිඤ්ඤෝ, ලූසිහාමි, ඇලිස් අක්කා යනාදි ඇත්තන් දැන් මහළුය. යන එන මන් නැති සැමී තවමත් ලියන මහතාගේ වැඩ කටයුතු වලට උදව් වෙමින් මුදල් ටිකක් හම්බකරගනී.

මේ අතර එක් කථාවක් වත්ත අසල පදිංචිවී සිටි මිනිසුන් අතර මැදින් මද පැතිර ගියේය. දැන් එය ගම පුරා ප්‍රසිඬය. එනම් චන්ද්‍රාලෝකය පිරී තිබෙන රාත්‍රියක එක් කුඩා ළමයි දෙදෙනෙකු සියඹලා ගහ වත්ත පාමුල ගඟ අද්දර ප්‍රීතියෙන් සෙල්ලම් කරමින් සිටින බවය. මෙය පළමු වරට දකිනු ලැබූයේ සැමී විසින්ය. පළමුව ඔහු කී ද කිසිවෙක් විශ්වාස නොකළහ. ඉක්බිති වත්ත අද්දරට ආ කීප දෙනෙකු විසින්ම මේ දර්ශණය දක්නා ලදී.

දිනක් රෑ බෝවී ගඟ අසලට ගිය ලියන මහතා මේ බැව් සියසින් දුටු බව කියා සිටියේය. ගඟ හරහා හමන සුළං සමඟ එන ඔවුන්ගේ සිනහව ඉතා පැහැදිලි ලෙස ඇසේ. එහෙත් ඔවුන් කථාකරන්නේ කුමක්ද කියා තේරුම් ගත නොහැක.

"මම ගඟට වැටුණොත් අයියා මොකද කරන්නේ කියන්ඩ?"

"මම ගඟට පැනලා කොහොම හරි නංගිව බේරාගන්නවා."

"හොඳයි මාව බේරගන්ට බැරි උනොත්?"

"එහෙනම් මමත් වතුරට වැටිලා නංගි පස්සේම යනවා." ඔවුන්ගේ සුරතල් මුව තුලින් පිටවනුයේ මෙවදන්ද?

වෙනස්වීම්, පෙරලීම්, ඇතිවීම්, නැතිවීම් ලෝක ස්වභාව ධර්මයෝය. පසුගිය අවුරුදු කීපය තුළ සියඹලා ගහ වත්තෙහි ඇති වූ විවිධ සිද්ධීන් අනුව ඒ බව මැනවින් සනාථ වේ. එහෙත් කාලයාගේ පහරින් නොවෙනස්ව එඩිතරව ඉදිරියට පා නගන අයකු වත්ත පාමුල සිටී. සොබා දහමේ පීඩාවන්ගෙන් ඈ තව පණ ලබන්නීය. කාලයාගේ ඇවෑමෙන් තව වරක් නාඹර වන්නීය. ඈ නම් අනෙකකු නොව ජගත් රූවිරාණියකගේ වේශයෙන් සිය සැමියා නමැති මහා සාගරය සොයා එඩිතරව ඉදිරියට ගලා බසින කල්‍යාණි ගංගා නදී තොමෝය.

නිමි.

SLU NOVELS
UPLOADED BY ELIFE
ELIFE @ sl-unlimited